Then, Sir, regarding the Ministry of Sports, I wish to say that the appointment of sports officers to cover all the AGA Divisions to implement the proposals is a must and it is very necessary. You have sports offices now for certain AGA Divisions. But the increased number have not been filled with sports officers. Then, where women sports officers are concerned you have only got a few of them in certain areas. I would request that especially for sports like netball you increase the number of sports officers to be appointed to AGA Divisions.

I must also congratulate your Deputy Minister for ably assisting you in putting forward a proposal or plan for the development of sports clubs. I have read this entire proposal because I happen to be a member of the Advisory Committee on Parliamentary Affairs and Sports. In this proposal the Hon. Minister has suggested that each Member of Parliament do allocate sum of Rs. 25,000 from the decentralized budget. I think you have been very fair, but actually if we want to develop sports in this country, we should even increase the amount from Rs. 25,000 to Rs. 50,000. Like building houses, providing employment and irrigation facilities, it is very important that the younger generation of this country, however poor we may be, be given an opportunity for sports, which you have been doing very ably in your own capacity.

Although there are several organisations doing sports, it is the Ministry which is in charge of sports and thus it is your responsibility to improve the standard of sports in this country, and for this purpose the Ministry must appoint more coaches. The Hon. Minister might say that there are no funds, but, I think, the Government has to take this Ministry fairly seriously and allocate more funds. In certain countries, the Sports Ministry is one of the most important Ministries because they consider the importance of the youth. If the youths do not take to sports, you can be assured that they will be diverted in certain other directions which will never be beneficial to the country. Even today, the younger generation, the school children, who do not have the opportunity, or where the parents do not encourage them, to do sports, very unfortunately have taken to very dangerous things like even taking marijuana and other narcotics. This is going to be a serious threat to the younger generation of this country. So, I kindly appeal to the Hon. Minister of Finance and the Government to see that more money is allocated to the Ministry of Sports.

I would also like to know whether we are participating in the Olympics next year. If we are participating we must select the teams right now and train them. I do not think that the allocation given to the coaching camps or the grant given to the controlling bodies of sports is sufficient to undertake such a porgramme. In case we are seriously participating in the Olympics the money that has been allocated for the purpose is quite insufficient. I kindly appeal to the Goverment to see that this Ministry is allocated more money if we are going to take it up very seriously. If we are not going to be very serious about the whole thing, then we can say that we are not participating. But the Hon. Minister tells this House that we are participating. So, I hope that more money would be allocated.

Then, Sir, the money allocated for the acquisition of sports equipment is not sufficient. With the introduction of customs duty and the turnover tax the prices of sports material are bound to go up. However the financial provision has not been increased. You will agree with me, Sir, that the sports goods are so expensive that even a child from a middle-class family is not able to purchase them on his own. So, I think, it is the duty of the Government to see that we allocate more money for the purchase of goods if we are to improve the standard of sports. The creation of a Sports Ministry or having a Minister and Deputy Minister and officials would not solve this problem. The most important thing is that we have to provide more money to the Hon. Minister so that he will be able to implement the good proposals that he has put forward.

Also, Sir, the money allocated for playgrounds, I think, is in the region of one million rupees. The Minister himself said that the Hon. Prime Minister spent Rs. 30 million on the redevelopment of just one stadium, the Sugathadasa Stadium. Mr. Chairman how can you expect the Hon. Minister to develop the playgrounds in our country with one million rupees ? For just one stadium in Colombo, the Sugathadasa Stadium, the Hon. Prime Minister had to raise Rs. 30 million. And what can you expect the poor Minister of Parliamentary Affairs and Sports to do with one million rupees ? This is completely inadequate and again I would say that if you are serious about this business, immediately more funds will have to be allocated to the Hon. Minister, especially for the development of playgrounds.

The Hon. Minister also spoke about what he has done for the Members of Parliament. I must very candidly say that right along his career as Minister of Parliamentary Affairs and Sports he has always fought for the rights of Members of Parliament. Not only that ; this time he has given us a typewriter. Whenever it came to a question where the rights of Members of

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Parliament are infringed, I must very frankly say that the Hon. Minister always fought for the rights of Members of Parliament. I am only sorry that the Minister of Parliamentary Affairs and Sports is not allocated more work. If they are given the responsibility of more work, I am sure, the Minister and his Deputy would do an excellent job of it.

When I attended the Inter-Parliamentary Union Meeting at Seoul I was made to understand that the Ministry of Parliamentary Affairs is a very important Ministry in other countries. Today our Minister has to confine himself–(*Interruption*). Answering questions, on behalf of other Ministers ? Definitely, Sir, more work should be allocated to the Minister.

Let me once again thank the Hon. Minister of Parliamentary Affairs and Sports for the excellent performance and for all that he told the House about the work carried out by his Ministry. With limited funds and facilities he has done his best to see that the standard of sports is improved in this country, especially to cater for the poor children of our country.

ශ්‍රියානි ඩැනියල් මෙතෙවිය (හේවාහැට)
(செல்வி சிறியாணி டானியல்—ஹேவாஹெஹெற்ற)
(Miss Sriyani Daniel–Hewaheta)

ගරු සභාපතිතුමනි, පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශයේ වැය ශීර්ෂ ගැන යාකච්ජා කරන මේ අවස්ථාවේදී මටත් වචන ස්වල්පයක් ප්‍රකාශ කිරීමට අවස්ථාව සලසාදීම ගැන මා පළමුකොටම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය ඉතාම වැදගත් අමාත්‍යාංශයක්. මා එසේ කියන්නේ මේ අමාත්‍යාංශය මේ රටේ විනය ගරුක ජ වාගේම ඉවසීමේ හැකියාවක් තිබෙන තිරෝගී ජනතාවක් බිහි කිරීමට උත්සාහ කරන නිසයි.

ගම්බද ප්‍රදේශයක් නියෝජනය කරන මන්ත්‍රීවරියක හැටියට මා ප්‍රකාශ කරන්නට ඕනෑ, අද ගම්බද ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට තම ක්‍රීඩා කටයුතු යම්බන්ධයෙන් සැහෙන ප්‍රශ්නවලට මුහුණපාන්නට සිද්ධ වී තිබෙන බව. ඒ කියන්නේ, ඒ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට අවශ්‍ය ක්‍රීඩා භාණ්ඩ ලබා ගැනීමට අද ඒ අයට හැකියාවක් නැහැ. ඒ වාගේම ක්‍රීඩා කිරීම සඳහා ඒ අයට ක්‍රීඩා පිටි නැහැ. එවැනි ප්‍රශ්න ඇති වී තිබෙන්නේ මෙම අමාත්‍යාංශයට වෙන් කරන මුදල් ප්‍රමාණවත් නොවීම නිසයි. හැම මැතිවරණ කොට්ඨාශයකින්ම ක්‍රීඩා කටයුතු සඳහා විමධ්‍යගත අයවැයෙන් රු. 25,000 බැගින් වෙන් කරන ලෙස තමා යෝජනාවක් කර තිබෙන බව ගරු ක්‍රීඩා කටයුතු ඇමතිතුමා දැන් ප්‍රකාශ කළා. මට පෙර කථා කළ ගරු මන්ත්‍රීවරුන් කිව්වා වාගේ මේ කාරණයෙහි ඇති වැදගත්කම සලකා බලා ගරු ඇමතිතුමාගේ ඉල්ලීම පරිදි හැම ගරු මන්ත්‍රීවරයකුම තමන්ගේ විමධ්‍යගත අයවැය මුදල්වලින් තමන්ගේ කොට්ඨාශවල ක්‍රීඩා කටයුතු සඳහා රු. 25,000 බැගින් වෙන් කරනු ඇතැයි මම බලාපොරොත්තු වෙනවා. ඒ අනුව මුදල් වෙන් කළොත් ලබන වර්ෂයේදී අපේ ප්‍රදේශවල තරුණ තරුණියන්ට අවශ්‍ය ක්‍රීඩා භාණ්ඩ ලබාදී එමගින් අපේ තරුණ තරුණියන්ගේ ක්‍රීඩා දක්ෂතා දියුණු තියුණු කිරීමට ගරු ඇමතිතුමාටත් නියෝජ්‍ය ඇමතිතුමාටත් අමාත්‍යාංශයේ කාර්‍ය මණ්ඩලයටත් වාසනාව ලැබෙවායි ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා.

මර්වින් ජේ. කූරේ මහතා (පානදුර)
(திரு. மேவின் ஜே. குரே — பாணந்துறை)
(Mr. Mervyn J. Cooray Panadura)

ගරු සභාපතිතුමනි, මා ඉතාම යතුටු වෙනවා, පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශයේ වැය ශීර්ෂ යටතේ වචන ස්වල්පයක් කථා කරන්නට අවස්ථාව ලැබීම පිළිබඳව. ක්‍රීඩාවෙන් සම්පූර්ණ මිනිසකු බිහිකළ හැකි බව අපි දන්නවා. ක්‍රීඩාවල නීති රීති චාරිත්‍ර චාරිත්‍ර පිළිපදින්නට පුරුදු වුණොත් විනයානුකූල දර්ශනයක් ඇති ජන ජීවිතයේ කැපී පෙනෙන පුද්ගලයකු අපට බිහි කරන්නට පුළුවනි. ක්‍රීඩාව තුළින් නායකත්වයට ගරු කරන්නට පුහුණු වෙනවා තමි ක්‍රීඩාවේ නීති රීතිවලට ගරු කරන්නට පුහුණු වෙනවා තමි යම් කෙනෙකුට ජන ජීවිතයේදීත් ඉතාම හොඳ තැන්පත් පුද්ගලයකු හැටියට ජීවත්වීමට අවස්ථාව ලැබෙනවාය කියන එක මා මතක් කරන්නට ඕනෑ.

මට පෙර කථා කළ ගරු මන්ත්‍රීවරු කිප දෙනෙකුම කිව්වා වාගේ ක්‍රීඩා අමාත්‍යාංශයට සැහෙන පමණින් මුදල් ප්‍රතිපාදනය කර නැති නිසා කටයුතු රාශියක් අතපසු වී තිබෙනවා. ඒ කාරණය අප කාටත් පිළිගන්නට සිද්ධ වී තිබෙනවා. සියලුම ප්‍රාදේශීය උප දිසාපති කොට්ඨාශවලට තවම ක්‍රීඩා නිලධාරීන් පත් කරන්නට පුළුවන්කම ලැබී නැහැ. තවම ක්‍රීඩා උපදේශකවරු පත් කරන්නට පුළුවන්කම ලැබී නැහැ. ඉදිරි වර්ෂයේදී මේ අමාත්‍යාංශයට අතිරේක මුදලක් ලබාගන්නට පුළුවන් වුණොත් මේ රටේ ක්‍රීඩා කටයුතු දියුණු කරන්නට පුළුවන් වේය කියා අපි කල්පනා කරනවා.

ගරු සභාපතිතුමනි, පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවේ සාමාජිකයකු හැටියට මා කටයුතු කරනවා. ඒ උපදේශක කාරක සභා රැස්වීමකදී අපි අදහසක් ඉදිරිපත් කළා, හැම මන්ත්‍රී කොට්ඨාශයකම ක්‍රීඩා සංවර්ධන පදනමක් ආරම්භ කරන්නය කියා.එය යම් උපදෙස් මාලාවක් මත ව්‍යවස්ථා මාලාවක් මත වක්‍ර ලේඛනයක් මගින් සියලුම මන්ත්‍රීවරුන්ට දනුම් දී තිබෙනවා.

අප කල්පනා කළ යුත්තේ ක්‍රීඩා කටයුතු කොයි ආකාරයෙන් දියුණු කරනවාද කියායි. විශේෂයෙන්ම ක්‍රීඩා කටයුතු ග්‍රාම සේවා මට්ටමෙන් දියුණු කර, ප්‍රාදේශීය උප දිසාපති මට්ටමට ගෙනැවිත්, ප්‍රාදේශීය උප දිසාපති මට්ටමෙන් දිසාපති මට්ටමට ගෙනැවිත්, දිස්ත්‍රික් මට්ටමෙන් ජාතික මට්ටම දක්වා දියුණු කිරීමේ වැඩ පිළිවෙළකුයි ඒ සඳහා යෝජනා කර තිබෙන්නේ. එම නිසා තමන්ගේ මනස ක්‍රීඩා කටයුතුවලට යොමු කර, ක්‍රීඩා දියුණු කිරීමටත්, මේ රටේ නායකත්වය භාර ගන්නට සිටින අපේ තරුණ-තරුණියන්ට එමගින් හොඳ අවස්ථාවක් ලබා දෙන්නටත් කටයුතු කරන්නය කියා සියළුම ගරු මන්ත්‍රීවරුන්ගෙන් මම ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, මම සඳහන් කළ ඒ වක්‍ර ලේඛයෙන් එක්තරා යෝජනාවක් කර තිබෙනවා. තම තමන්ගේ මැතිවරණ කොට්ඨාශ තුළ ක්‍රීඩා කටයුතු දියුණු කිරීම සඳහා විමධ්‍යගත අයවැයෙන් අඩු තරමින් රුපියල් විසි පත් දහසක් බැගින්වත් ලබා දීමට මන්ත්‍රීතුමන්ලා ඉදිරිපත් වෙනොත් සුදුසුය යන්නයි කර තිබෙන යෝජනාව. මම හිතන හැටියට, මේ රුපියල් විසි පත් දහස ප්‍රමාණවත් නොවෙන්නට පුළුවනි. එම නිසා කොළඹ දිසා ඇමතිතුමා කිව්වා වාගේ ගැකි තම් එය රුපියල් ලක්ෂය දක්වා වැඩි කරන්නට ගරු මන්ත්‍රීතුමන්ලා උනන්දු වේවායි මම ප්‍රාර්ථනා කරනවා.

මේ වැඩ පිළිවෙළ ගම් මට්ටමෙන් දියත් කිරීමෙන් අප බලාපොරොත්තු වෙන්නේ, ගමේ ගොඩේ ජීවත් වන අපේ හැම තරුණයෙක්ම, තරුණියක්ම ක්‍රීඩා කටයුතුවලට තමන්ගේ මනසත් යොමු කරවා නිරෝගී සම්පන්න පිරිසක් අනාගතයේදී බිහි කරවීමටයි. අපේ දිසා ඇමතිතුමා කිව්වා වාගේ විනයානුකූල, තැන්පත් එමෙන්ම නායකත්වයට ගරු කරන තරුණ පිරිසක් බිහි කිරීම සඳහා ක්‍රියා කිරීම අපේ යුතුකමක්ව තිබෙනවා, මන්ද? කවද හෝ මේ රටේ නායකත්වය භාර ගන්නට සිටින්නේ මේ තරුණ පිරිස බව අපි කවුරුත් පිළිගන්නවා.

ගරු සභාපතිතුමනි, ක්‍රීඩා කටයුතු නැංවීම සඳහා විශාල මුදල් සම්භාරයක් සොයා ගැනීමට සිද්ධ වෙනවා. අපේ ගරු ඇමතිතුමා ලබන අවුරුද්දේදී බලාපොරොත්තු වෙනවා, ක්‍රීඩා කටයුතු දැනටත් වඩා හොඳින් සංවිධානය කර, දියුණු කරන්නට. මේ සඳහා ක්‍රීඩා අරමුදලක් ඇති කළ යුතුය කියා මම යෝජනා කරනවා. මේ අරමුදලට තොයෙකුත් ආයතනවලින් ආධාර ලබාගන්නට පුළුවන් වෙනවාය කියා මම විශ්වාස කරනවා. එම නිසා ඒ අරමුදල වහාම ආරම්භ කිරීමට කටයුතු කරන්නටය කියා මේ අවස්ථාවේදී මම යෝජනා කරනවා.

අවසාන වශයෙන්, ක්‍රීඩා කටයුතු දියුණු කිරීම සඳහා මේ මුදල් අමාරුකම් මධ්‍යයේ ගරු ඇමතිතුමාත්, නියෝජ්‍ය ඇමතිතුමාත්, ලේකම්තුමා ඇතුළු සියලුම නිලධාරී මණ්ඩලයත් දරන ලද උත්සාහය ගැන එතුමන්ලා සියලු දෙනාටම ස්තුති කරමින් ලබන වර්ෂයේදී ගරු ඇමතිතුමා අදහස් කරන පරිදි මේ වැඩ කටයුතු රාශිය කරගෙන යාමට ශක්තියක් ධෛර්යයක් එතුමාට ලැබෙවා කියා ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසන් කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සභාපතිතුමා
(தலைவர்)
(The Chairman)

Order, please ! The Deputy Speaker will now take the Chair.

අතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත්වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [හෝමන් වෛද්‍යරත්න මහතා] මූලාසනාරූඪ විය.

அதன் பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்திலிருந்து நீங்கவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [திரு. ஹோமன் வைத்ய ரத்ன] தலைமை வகித்தார்கள்.

Whereupon MR. SPEAKER *left the Chair, and* MR. DEPUTY SPEAKER [MR. NORMAN WAIDYARATNA] *took the Chair.*

ෂෙල්ටන් රණරාජ මහතා (නියෝජ්‍ය අධිකරණ ඇමතිතුමා)
(திரு. ஷெல்டன் றணராஜா — நீதி பிரதி அமைச்சர்)
(Mr. Shelton Ranaraja Deputy Minister of Justice)

Mr. Chairman, I am in total agreement with the views expressed by hon. Members of this House in regard to the allocation made for the development of sports. A very small allocation has been made, and I must say it is most inadequate. However, I must congratulate the Hon. Minister and his Deputy for the endeavour made to develop sports in this country. It appears that he is getting assistance particularly from the Prime Minister, who has been very helpful in developing football in this country. I think every Member of this house will agree that he has been able to develop football in this country–(*Interruption*). I do not think so. He has not done so. I think everyone will appreciate what he has done for the development of the Sugathadasa Stadium. A sum of Rs. 30 million has been allocated for that purpose through his endeavours, and as a result I think we have for the first time in this country an international football ground. We never had such a good football ground in our country.

At the same time I must also congratulate the Hon. Minister of Lands & Land Development and Minister of Mahaweli Development. If not for his efforts I do not think we would have had such first-class cricket grounds in our country. He has been responsible for developing Asgiriya which has been brought to an international standard–(*Interruption*). I dare say, but there are other grounds that he has developed. Now he has developed an indoor cricket stadium in Colombo. It is for the first time in this country that we have an indoor stadium. Also, he has brought the Radella ground to international standards.

I must also congratulate and thank the Hon. Prime Minister for having made an allocation of Rs. 1 million for the development of the Bogambara grounds. If you come to the Bogambara grounds today you will see that it has been improved. That was purely because of the efforts of the Prime Minister.

It is true that the Hon. Minister of Sports has not got enough money, but other Ministers as well are co-operating with him to develop sports in this country. So I want to make use of this opportunity to thank both the Prime Minister and the Minister of Lands & Land Development for having assisted the Minister of Sports in developing sports in this country.

හරීන්ද්‍ර කොරයා මහතා (නියෝජ්‍ය රාජ්‍ය පරිපාලන ඇමතිතුමා)
(திரு. ஹரிந்திர கொறயா — பொது நிர்வாகப் பிரதி அமைச்சர்)
(Mr. Harindra Corea Deputy Minister of Public Administration)

May I just say a few words ? Today in the Christmas season we have heard hymns of praise sung, which I think no Member in this House will disagree with, and also tales of woe related–not enough money. I think we all agree with that. We like more funding.

Sir, I would particularly like to refer to the remarks made by the hon. Third Member for Colombo Central (Mr. Haleem Ishak). I cannot agree with him. He is aware that the Gleneagles Agreement has been signed, that we are a signatory to that agreement and that the non-aligned world and all independent countries in the Non-Aligned Movement are against any kind of connection with South Africa as far as sports are concerned. So when he says that he would like a pardon to be given to those 14 cricketers, I cannot agree with that.

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

Then you should not trade with South Africa.

හරීන්ද්‍ර කොරයා මහතා
(திரு. ஹரிந்திர கொறயா)
(Mr. Harindra Corea)

That is a different matter. We have signed the Gleneagles Agreement. At the time we were going to sign it we should have said, "We are trading with South Africa therefore let us not sign it." Of the 14 cricketers, maybe three or four of them could have gone on to win further international honours. But consider the situation apart from that. One of the 14 cricketers was the captain of the Sri Lanka cricket team. We had just gained test status, and many things were expected of Bandula Warnapura. But for an undisclosed sum of money–not taxable and probably deposited in a bank somewhere–he and 14 other cricketers went to South Africa. Recently a West Indian cricketer was thrown out of a railway carriage on a suburban train going from Johannesburg to Durban. He received that treatment. Some of these 14 players who have earned this money have got to that status because they are supported by club cricketers.

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

I would like to ask the hon. Member a question. This Government prardoned Rohana Wijeweera who was found guilty by the Supreme Court for trying to overthrow the Government. Why can you not pardon these cricketers in a similar manner ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

හරින්ද්‍ර කොරයා මහතා
(திரு. ஹரிந்திர கொறயா)
(Mr. Harindra Corea)

Sir, I am talking of cricket and the hon. Leader of the opposition is bringing up a matter which is not quite cricket as far as this Debate is concerned.

අනුර බණ්ඩාරතායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

Not cricket, but apply the principle of *Dharmishta* and pardon them !

හරින්ද්‍ර කොරයා මහතා
(திரு. ஹரிந்திர கொறயா)
(Mr. Harindra Corea)

He is bowling me a ball which I will leave alone. I will raise my bat and let it go past.

අනුර බණ්ඩාරතායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

Do not raise your bat too often, you might get bowled. do not leave all the balls alone.

සභාපතිතුමා
(தலைவர்)
(The Chairman)

Order, please ! There are two more hon. Members to speak.

හරින්ද්‍ර කොරයා මහතා
(திரு. ஹரிந்திர கொறயா)
(Mr. Harindra Corea)

I completely disagree with the statement of the hon. third Member for Colombo Central (Mr. Haleem Ishak). I do not think the Board of Control or the government should pardon the 14 cricketers. There is the question of the immense payments they have received. They have got to that stage because others played club cricket with them. They got to that stage because owing to the efforts of so many other people we got test status and it is only because we got test status and Sri Lanka cricket was lifted to such a level that the South African authorities could get a Sri Lankan team to come to South Africa and try to sell them. But they could not sell them ; their performance was very shoddy. I regret what these 14 cricketers have done. They have sold out their own country by going and playing in South Africa for commercial gain. I disagree entirely with the hon. Member when he says that they should be pardoned. But I agree with him on the other matter he raised, and that is that more funds should be raised for this Ministry.

As far as stadia are concerned, it is true that Rs. 30 million was spent on the Sugathadasa Stadium. I know that when a country wants to host the Asian Games or the Commonwealth Games they spend vast amounts on the construction of stadia. I do not think the hon. Member came to New Delhi with us. I remember that when I was in New Delhi vast sums were being spent for the sports centre there. I think it is quite correct that there should be more money spent on stadia and more money invested in sports.

එම්. හලීම් ඉෂාක් මහතා
(ஜனாப் எம். ஹலீம் இஸாக்)
(Mr. M. Haleem Ishak)

But this Ministry gets only Rs. 1 million.

හරින්ද්‍ර කොරයා මහතා
(திரு. ஹரிந்திர கொறயா)
(Mr. Harindra Corea)

I agree with the hon. Member. I think Rs. 100 million or Rs. 150 million should be given to this Ministry. I have given a lakh of rupees from my decentralized budget.

එම්. වින්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)

To whom ?

හරින්ද්‍ර කොරයා මහතා
(திரு. ஹரிந்திர கொறயா)
(Mr. Harindra Corea)

For sports equipment.

එම්. වින්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)

Where ?

හරින්ද්‍ර කොරයා මහතා
(திரு. ஹரிந்திர கொறயா)
(Mr. Harindra Corea)

You gave me Rs. 25,000. I gave Rs. 25,000 and for the balance Rs. 75,000 I distributed sports equipment to various sports clubs in my electorate who were registered with the Ministry. I agree that the allocation should be increased and would like to reiterate what hon. Members have said, that not only where sports and parliamentary affairs are concerned but also where mankind is concerned the Hon. Minister is the most popular Minister in the House.

Thank you.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා (කළුවාන)
(திரு. சரத் முத்தெட்டுவெகம — கலவான)
(Mr. Sarath Muttetuwegama-Kalawana)

ගරු සභාපතිතුමනි, අපි දන්නවා පාර්ලිමේන්තු හා ක්‍රීඩා අමාත්‍යාංශයට ආණ්ඩුවෙන් හොඳ ක්‍රීඩකයෙක් පත් කර තිබෙන බව. ඊයෙ පෙරේදා බිත්තිවල පොස්ටරයක් ගහල තිබුණා "හිතත් හොඳයි වැඩත් හොඳයි" කියලා. මම හිතුවා මේ අපේ ඇමතිතුමා ගැන මොකක් හෝ කතන්දරයක් වෙන්න

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ඉනැතපිටුවෙගම මහතා]

ඇත කියා. පස්සෙ බැලිත්තම් ඒක චිත්‍රපටියක්. නමුත් ඒ තම එතුමාට හොඳට ගැලපෙනවා. [බාධා කිරීම්] ඒ මොකද, පාර්ලිමේන්තු කටයුතු ගැන. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ප්‍රශ්න ගැන, ඒ වාගේම සේවකයන්ගේ ප්‍රශ්න ගැන එතුමා හුගාක් උනන්දුවෙන් කටයුතු කරන ඇමති කෙනෙක් හැටියට අපි දන්න නිසයි.

කරුණු දෙක තුනක් පමණ කෙටියෙන් සඳහන් කරන්නයි මම අදහස් කරන්නෙ. එකක් ඒයෙ පෙරේදා ලංකාවට සිම්බාබ්වේ ක්‍රිකට් කණ්ඩායමක් පැමිණි වෙලාවෙ පැවති නිල නොවන ටෙස්ට් තරගයට ලංකාවෙන් ඉදිරිපත් කළ කණ්ඩායම පිළිබඳව නොයෙක් මතභේද තිබෙනවා. ශ්‍රී ලංකාව ටෙස්ට් තත්ත්වය දිනාගන්න කලින් ඕස්ට්‍රේලියාව, එංගලන්තය, ඉන්දියාව, පාකිස්තානය යන රටවල තරගයට ගියා ඒ හැම අවස්ථාවකම ඒ රටවල ප්‍රධාන පෙළේ ක්‍රිකට් කණ්ඩායමකට ශ්‍රී ලංකාවට මුහුණ දෙන්න සිද්ධ වුණා. එහෙනම් මම දන්නෙ නැහැ මොන ප්‍රතිපත්තියක් අනුවද කියලා, පිටරට ක්‍රිකට් කණ්ඩායමක් ලංකාවට ආවාම, පළවෙනි පෙළේ ක්‍රිකට් කණ්ඩායමක් සමග ඔවුන්ට එක තරගයකටවත්—එක් දින තරගයක් නොවෙයි—මුහුණ දෙන්න සූදානම් කරන්නෙ නැත්තෙ? එය මට හිතාගන්න අමාරුයි.

අනික් කාරණය ගම්බද පළාතක් තියෝජනය කරන මන්ත්‍රීවරයෙක් හැටියට වොලිබෝල් ක්‍රීඩාවට රජයෙන් මීට වඩා ආධාර දිය යුතුව තිබෙනවා. යම් යම් පහසුකම් සලස්වන්න අමාත්‍යාංශය උත්සාහ කරනවා. මුදල් නැතිකම කියන එකත් අපි දන්නවා. එතුමාට නොවෙයි, ඒ විශේෂයෙන් රජයට. අද ගම්බද පළාත්වල ක්‍රීඩා කරන්න කිසිසේත් පුළුවන්කමක් නැහැ. කවුරු හෝ දානපතියෙක් නෙට් එකක් එහෙම නැත්නම් බෝලයක් අරන් දෙන්න ඕනෑ. ඒ නිසා තමුන්නාන්සේගේ අමාත්‍යාංශයෙන් යම්කිසි උපකාරයක් මේ උදවියට දෙන්න ඕනෑ.

අනික් කාරණය, අපි රටක් වශයෙන් යම්කිසි ඉලක්කයක් තියාගන්න ඕනෑ මොකක් හෝ එක ක්‍රීඩාවක් අපේ දස්කම් පෙන්වන ක්‍රීඩාවක් වශයෙන් සකස් කරගන්න. ලංකාවේ තත්ත්වයේ හැටියට එක ක්‍රීඩාවක්වත් දියුණු කරන්න අපි උත්සාහ කරන්න ඕනෑ. අපි හැම එකටම දඟලන්න හදනවා. නමුත් එකක්වත් ගරියට කරන්නෙ නැහැ. ඒ නිසා ඇමතිතුමා ඒ ගැන අවධානය යොමු කළ යුතුයි. ගරු ඇමතිතුමාටත් තියෝජ්‍ය ඇමතිතුමාටත් අපි ස්තුතිවන්ත වෙනවා, මේ කරගෙන යන වැඩ සම්බන්ධයෙන්. නමුත් කුමක් හෝ වැඩි වියදමක් යන්නෙ නැති එක ක්‍රීඩාවකට—බයිසිකල් ධාවනය වෙන්න පුළුවන් එහෙම නැත්නම් වොලිබෝල් ක්‍රීඩාව වෙන්න පුළුවන්—අපේ සම්පූර්ණ ප්‍රමුඛත්වය දී ජාත්‍යන්තර තරගවලින් නමක් ගන්න පුළුවන් වන විධියේ උත්සාහයක් දරනවා ඇතැයි බලාපොරොත්තුවෙමින් මම නිහඬ වෙනවා.

එම්. ඩී. ප්‍රේමරත්න මහතා (නියෝජ්‍ය පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා ඇමතිතුමා)

(திரு. எம். டீ. பிரேமரத்ன — பாராளுமன்ற அலுவல்கள், விளையாட்டுத்துறை பிரதி அமைச்சர்)

(Mr. M. D. Premaratne–Deputy Minister of Parliamentary Affairs & Sports)

ගරු සභාපතිතුමනි, පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය පිළිබඳ වැය ශීර්ෂය සාකච්ඡා වන මේ අවස්ථාවේදී ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේත් ගරු මන්ත්‍රීවරුන් ඉතා වැදගත් කරුණු රාශියක් ඉදිරිපත් කළා. ඒ කරුණු එකින්-එක සම්බන්ධයෙන් පිළිතුරු දීමට අවස්ථාවක් නොමැති වීම ගැන මම කණගාටු වෙනවා. නමුත් දෙපාර්ශ්වයේ ගරු මන්ත්‍රීවරුන් ඉදිරිපත් කළ කරුණු ගරු ඇමතිතුමාත් අප හැමදෙනාත් අමාත්‍යාංශයත් ඉතාම ඕනෑකමින් සලකා බලා ඉදිරි අවුරුද්දේ ඒ ගැන විශේෂ අවධානය යොමු කිරීමට කටයුතු කරන බව පළමුවෙන් මතක් කරන්න ඕනෑ. ඒ සමගම, දෙපාර්ශ්වයේම ගරු මන්ත්‍රීවරුන්ට අපගේ ස්තුතියත් ගෞරවයත් පුද කරන්නට කැමතියි.

මේ අවස්ථාවේදී ඉදිරිපත් වුණු කරුණු කීපයක් පිළිබඳව ගරු ඇමතිතුමාගේ උපදෙස් පරිදි පාර්ලිමේන්තු උපදේශක කාරක සභාව රැස්වී සාකච්ඡා කොට, ඉදිරි අවුරුද්දේ සහ ඉන් ඉදිරියේදීත් අපේ අමාත්‍යාංශය මඟින් ක්‍රීඩා පිළිබඳව ග්‍රාමීය මට්ටමෙන් කරන්නට බලාපොරොත්තු වන කටයුතු පිළිබඳ සැලැස්මක් සකස් කොට එය දිස්ත්‍රික්ක මට්ටමෙන්, ආසන මට්ටමෙන් හා ජාතික මට්ටමෙනුත් සකස් කිරීමට කටයුතු කොට ඒ පිළිබඳ විස්තර සියලුම මන්ත්‍රීවරුන්ට අපි ලැබෙන්නට සැලැස්සුවා. එයින් අපි බලාපොරොත්තු වන්නේ මේ ක්‍රීඩා කටයුතු සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ උපදෙස් ඇතිව මීට වඩා විශේෂ දියුණුවක් ඇති කිරීමටයි. ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් වුණු අදහස්වලට විරුද්ධ පාර්ශ්වයේත් ආණ්ඩු පක්ෂයේත් ගරු මන්ත්‍රීවරුන් සම්පූර්ණයෙන්ම එකඟ වී තිබෙනවා.

ප. භා. 11.15

ඒ කටයුතු කරන්නට ගරු මන්ත්‍රීවරුන්ගේ විමධ්‍යගත අයවැයේ මුදල්වලින් අඩු වශයෙන් රුපියල් විසි පන්දහ බැගින්වත් ලබා දෙන ලෙස අපි ඉල්ලීමක් කළා. එහෙම වුණොත් සාර්ථක වැඩ පිළිවෙළක් දියත් කරන්නට අපට පුළුවන් වෙනවා. ඒ අනුව ආසන මට්ටමෙන් ඇති වන සංවිධාන එක පදනමක් මත සකස් කොට ඒවා ඊට පසු ඒවා දිස්ත්‍රික්ක සංවිධානක් හැටියට ඒකරාශී කරන්නට ඒ දිස්ත්‍රික් සංවිධාන මුළු ලංකාවම වැළඳ ගත්තා වැඩ පිළිවෙළක් මඟින් පුළුල් කොට මුළු ලංකාවේම සහභාගිත්වය ඇති කරන්නට පුළුවන් ජාතික මට්ටමේ, සමස්ත ලංකා මට්ටමේ වැඩ පිළිවෙළක් ඒ තුළින් දියත් කරන්නටත් අපි බලාපොරොත්තු වෙනවා.

අපට ලැබෙන මුදල් ප්‍රමාණය මදිය කියා බලා තොසිට අපට පුළුවන් හැටියට මේ අමාත්‍යාංශය තුළින් ඒ වැදගත් කාර්යය ඉෂ්ට කිරීම සඳහා අපි තමුන්නාන්සේලාට ඒ යෝජනා ඉදිරිපත් කළා. අපගේ පාර්ලිමේන්තු උපදේශක කාරක සභාව එය සම්පූර්ණයෙන්ම අනුමත කළා. දැන් තමුන්නාන්සේලාගේ කතාවලිනුත් ඒක අනුමත වුණු බව අපි මේ අවස්ථාවේදී ඉතාම සන්තෝෂයෙන් පිළිගන්නට ඕනෑ. එය ක්‍රියාත්මක කිරීමට සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේත් දිසා ඇමතිවරුන්ගේත් සම්පූර්ණ සහයෝගය අපි බලාපොරොත්තු වෙනවා.

අක්මීමන ගරු මන්ත්‍රීතුමා (රිවඩ් පතිරණ මහතා) උප දියාපති කොට්ඨාශ මට්ටමේ ඇති වී තිබෙන පුරප්පාඩු ගැන කරුණු මතක් කළා. ක්‍රීඩා නිලධාරීන් පත්කිරීම පිළිබඳව කටයුතු කරන ලෙස එතුමා ඉල්ලීමක් කළා. ඒ ගැන අපි දැනටම කටයුතු කරගෙන යන බව ගරු සභාපතිතුමා තුළින් ඒ ගරු මන්ත්‍රීතුමාට මතක් කරන්නට ඕනෑ. මුදල් අමාත්‍යාංශය සමග සාකච්ඡා කොට, අපට ලැබී තිබෙන අවස්ථා අනුව, හිස් වී ඇති ඒ පුරප්පාඩු පුරවා කාඩර් එක වැඩි කර ගැනීමට ගරු ඇමතිතුමාත් අමාත්‍යාංශයත් කටයුතු කරගෙන යන බව මම මතක් කරන්නට ඕනෑ.

ඒ වාගේම ක්‍රීඩා පිටටනි ගැන කරුණු සඳහන් වුණා. මම ඒ ගැන විශේෂයෙන් කරුණක් මතක් කරන්න ඕනෑ. අපට ලැබී තිබෙන මුදල් ප්‍රමාණය අනුව, ආසන මට්ටමෙන් ක්‍රීඩා පිටටනි සකස් කිරීම සඳහා මුදල් දෙන්නට ගියොත් එක් ආසනයකට රුපියල් හය දහකවත් ප්‍රමාණයක් වෙන් කරන්නට බැරි වෙනවා. අප සකස් කර තිබෙන සැලැස්ම අනුව ඒ වැඩ පිළිවෙල දියත් කර ගන්න පුළුවන් වුණොත් මේ ප්‍රශ්නය විසඳා ගන්නට පුළුවන් වෙයයි මම මතක් කරන්නේ ඒ නිසායි. අධ්‍යාපන අමාත්‍යාංශය, ජාතික තරුණ සේවා සභාව ක්‍රීඩා පිටටනි දියුණු කිරීමට නොයෙක් අංශවලින් මුදල් ලබා දෙනවා. අපි ක්‍රීඩා පිටටනි ගැන කල්පනා කර බැලුවොත් දැනට ඒවා දහය, පහළොව, විස්ස බැගින් සමහර ආසනවල ඉඳ වී තිබෙන බව පෙනෙනවා. නමුත් අංග සම්පූර්ණ, සුදුසු තත්ත්වයේ ක්‍රීඩා පිටටනි එකක්වත් නැහැ. එහෙම නම් අපේ ගරු මන්ත්‍රීවරුන් ඒ ගැන විශේෂ අවධානයකින් කල්පනා කරන්නට ඕනෑ. ඒ අනුව තමතමන්ගේ කොට්ඨාශවල එක් මධ්‍යස්ථානයක එක් ක්‍රීඩා පිටියක්වත් වර්ෂ කීපයකින් හෝ පියවර කීපයකින් පිළිවෙළක් ඇතුව දියුණු කර ගන්නට අපි තීරණයක් ගන්නට ඕනෑ. අධ්‍යාපන අමාත්‍යාංශයත් ජාතික තරුණ සේවා සභාවත් හැම අංශයකින්ම දෙන මුදල් එම ස්ථානයට යොද, ක්‍රියා කලොත් ආසන මට්ටමෙන් අංග සම්පූර්ණ ක්‍රීඩා පිටටනියක් අවුරුදු කීපයකින්, පියවරෙන් පියවරට, සකස් කර ගන්නට අපට පුළුවන් වෙයි. ඒ නිසා ඒ ගැන තමුන්නාන්සේලාගේ අවධානය විශේෂයෙන්ම යොමු කරන හැටියට මා ඉල්ලා සිටිනවා.

එමෙන්ම පුහුණුකරුවන් පිළිබඳවත් මම මතක් කරන්නට ඕනෑ. අපේ අමාත්‍යාංශයේ ඒ අඩුපාඩුව තිබෙනවා. එහෙත් මේ හැම අඩුපාඩුවක්ම තිබියදීත් ක්‍රීඩා අංශයෙන් මේ රටේ යම්කිසි වැඩ කොටසක් කරන්නට අපට පුළුවන්කම ලැබී තිබෙනවා. ඒ ගැන අපට සතුටු වන්නට පුළුවන්. මුදල් අඩුපාඩුකම් හා නෙයෙකුත් ප්‍රශ්න තිබියදීත් මේ හැම දෙයක්ම මේ තරම්වත් කරන්නට අපට පුළුවන් වීම ගැන තමුන්නාන්සේලා අපට ප්‍රශංසා කිරීම පිළිබඳව අපි සන්තෝෂ වන්නට ඕනෑ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මැද කොළඹ තුන් වන ගරු මන්ත්‍රීතුමා (එම්. හලීම් ඉෂාක් මහතා) ක්‍රිකට් කණ්ඩායම පිළිබඳව මතක් කළා. අපේ විදේශ ප්‍රතිපත්තියත් වෙනත් නොයෙකුත් ප්‍රශ්න පිළිබඳවත් කල්පනා කර බලා ක්‍රිකට් පාලක මණ්ඩලය ඒ තීරණය අරගෙන තිබෙනවා. එමෙන්ම ඒ තහනමට ලක් වූ ක්‍රීඩකයින්ගෙන් මේ වන තුරුත් අපට අභියාචනයක් ලැබිලත් නැහැ. යම් අභියාචනයක් ලැබුණොත් ඒ අනුව අපේ අමාත්‍යාංශය ඉතාම කාරුණිකව ක්‍රියා කරනවා ඇති. අපේ ඇමතිතුමා හැම විටම ඉතා කාරුණිකව කටයුතු කරන ඇමතිවරයෙක්. ඒ නිසා යම්කිසි ඉල්ලීමක් ලැබුණොත් ඒ ගැන ක්‍රිකට් පාලක මණ්ඩලයේ අධ්‍යක්ෂක සභාව රැස්වීමක් කැඳවා සාකච්ඡා කරන්නට ගරු ඇමතිතුමා ඉදිරිපත් වෙනවාට කිසිම සැකයක් නැහැ.

ඔලිම්පික් ක්‍රීඩාවලට සහභාගී වන්නට අපි තීරණයක් අරගෙන තිබෙනවාද කියන ප්‍රශ්නයත් මතු කළා. ඔලිම්පික් ක්‍රීඩා තරඟවලට සහභාගී වීම ගැන අපි තවම තීරණයක් අරගෙන නැහැ. නමුත් එයට සහභාගී වීමට සිටින අයගේ හැකියාව සහ ඔවුන්ගේ කුශලතාවයන් පිළිබඳ අමාත්‍යාංශය දැන් සලකා බලා ගෙන යනවා. ඒ අනුව ඔවුන්ගේ හැකියාවන් සහ කුශලතාවයන් පිළිබඳව ලැබෙන වාර්තා අනුව ඔලිම්පික් ක්‍රීඩාවලට සහභාගී වෙනවාද නැද්ද කියන එක ගැන යථා කාලෝචිත තීරණයක් ගන්නා බව මා තමුන්නාන්සේලාට මතක් කරන්න කැමතියි.

හේවාහැට ගරු මන්ත්‍රීතුමිය (ශ්‍රියානි ඩැනියල් මෙතෙවිය) අලුත් මන්ත්‍රීතුමියක් හැටියට කරුණු රාශියක් ඉදිරිපත් කළා. ලබන අවුරුද්දේ අපේ අමාත්‍යාංශයට වැඩිපුර මුදල් ලැබෙවායි එතුමිය ප්‍රාර්ථනා කළා. ලබන අවුරුද්දට ලැබෙන මුදල දැන් ලැබී අවසානයි. කිසි වෙනසක් වී නැහැ. නමුත් අලුත් මන්ත්‍රීවරියක් හැටියට එතුමිය ඉදිරිපත් කළ කරුණු ඉටු කර දීමට අපි පුළුවන් මහත්සියක් ගන්නවා. එතුමිය ඉදිරිපත් කළ කරුණු ගැන අපේ විශේෂ අවධානය යොමු කරන බව මම මතක් කරන්න කැමතියි.

ක්‍රීඩා සංවර්ධන පදනම ගැන පානදුරේ ගරු මන්ත්‍රීතුමා (මර්වින් ජේ. කුරේ මහතා) මතක් කළා. ඒ සම්බන්ධයෙන් අපේ පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවේ අනුකාරක සභාවක් පත් කර තිබෙනවා. ඒ කාරක සභාව ඉදිරිපත් කරන වාර්තාව කෙසේ හෝ ක්‍රියාත්මක කරන්නයි, අපි බලාපොරොත්තු වන්නේ. සමස්ත ලංකාවම ක්‍රීඩා පිළිබඳව දක්වන ආකල්පය අනුව අපේ අමාත්‍යාංශයට මගින් ලබන අවුරුද්දේදී මීට වඩා වැඩ කොටසක් කරන්නත් කෙරෙන කටයුතු දියුණු කරන්නත් උත්සාහ ගන්නා බවත් මේ අවස්ථාවේදී මතක් කරන්න සතුටුයි.

කාලය තැති තියා කරුණු ඉදිරිපත් කරන්න වේලාවක් නැහැ. මේ අපහසුකම් මධ්‍යයේ මේ අමාත්‍යාංශයේ වැඩ කටයුතු සාර්ථකව කර ගෙන යන්නට අපේ ඇමතිතුමා ඉතාමත්ම ඕතැකමින් කටයුතු කරනවා. ක්‍රීඩාව දියුණු කර ගත්තොත් නොයෙක් ජාතීන් අතරත් රටවල් අතරත් විශේෂ ස්ථානයක් මේ අමාත්‍යාංශය තුළින් අපට ලබා ගන්නට පුළුවන්. එමෙන්ම අද රටේ උද්ගත වී තිබෙන මේ ජාතික අසමගිය තැති කර ගන්නට පුළුවන් යම් අමාත්‍යාංශයක් තිබෙනවා නම් ඒ ක්‍රීඩා අමාත්‍යාංශයයි, කියන එකත් මම මතක් කරන්න කැමතියි. ක්‍රීඩාවලට වන සහභාගිත්වය දෙස බලන විට ජාති ආගම් කුල වශයෙන් භේදයක් නැතිව ක්‍රීඩකයින් මේවාට සම්බන්ධ වන බව කාටත් පෙනෙනවා. දෙවුන්දර තුඩුවේ සිට පේදුරු තුඩුව දක්වා සිටින සෑම ක්‍රීඩකයෙක්ම ජාති ආගම් කුල ආදී කිසිම භේදයක් නැතිව ක්‍රීඩාවලට සහභාගි වන බව ඒවාට යන අවස්ථාවලදී අපට පෙනෙනවා. ඒ ස්ථානවල ඔවුන් එකට ලැගුම් ගන්නවා; එකට ක්‍රීඩා කරනවා; තරඟවලට සහභාගි වෙනවා. ඒ නිසා රජය මේ අමාත්‍යාංශය කෙරෙහි මීට වඩා දැඩි සැලකිල්ලක් දක්වා තමුන්නාන්සේලාගේ ඉල්ලීම් අනුව කටයුතු කළොත් මෙය ජාතික සමගිය ගොඩනඟන්නට සුදුසු ස්ථානයක් වන බව මම මතක් කරන්න කැමතියි. ඒ සම්බන්ධව තමුන්නාන්සේලා දක් වූ උනන්දුව ගැනත් මගේ විශේෂ ස්තුතිය ගරු ඇමතිතුමා වෙනුවෙන් මේ අවස්ථාවේ පළ කර සිටිනවා.

මා හිතන විධියට ලබන අවුරුද්දේ අයවැය කාරක සභා අවස්ථාව වන විට මේ අමාත්‍යාංශයේ ලේකම්තුමා එම තිලයේ නොසිටින්නට පුළුවන්. ඒ නිසා මෙතුවක් කල් මේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හැටියට මඩුගල්ලේ මැතිතුමා ක්‍රියා කළ ආකාරය ආදර්ශමත් බව මම මේ අවස්ථාවේ මතක් කරන්න ඕනෑ. එතුමාගෙන් ලැබුණු උපදෙස් අනුව ඉදිරියටත් ඒ කටයුතු කර ගෙන යන්නට එතුමාගේ සහයෝගය අපට ලැබෙවා කියා මා ප්‍රාර්ථනා කරනවා.

එමෙන්ම අතිරේක ලේකම්තුමා ඇතුළු අනික් නිලධාරී මහත්වරුන්ටත් අපේ ස්තුතිය පළ කරන්න කැමතියි. ක්‍රීඩා නිලධාරී මහත්වරුන්ගේ හා දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරී මහත්වරුන්ගේ වේතන ප්‍රශ්නයක් තිබෙනවා. ඒ ගැන අපේ විශේෂ අවධානය යොමු කරන බවත් මේ අවස්ථාවේදී මා ප්‍රකාශ කරනවා. ඒ සියලුදෙනාම ඇතුළුව අමාත්‍යාංශයේ ඉහළ මට්ටමේ සිට පහළ මට්ටම දක්වා සිටින හැම නිලධාරී මහත්මයෙකුටමත් සේවක මහත්මයෙකුටමත් ගරු ඇමතිතුමා වෙනුවෙන් හා අමාත්‍යාංශය වෙනුවෙන් මා ස්තුතිය පළ කරනවා.

මේ ගරු සභාවේ දෙපාර්ශ්වයේම ගරු මන්ත්‍රීතුමන්ලා ඉදිරිපත් කළ කරුණු ගැන තැවත වරක් මගේ ගෞරවය පිරිතමන අතර හැකි තරම් ශක්තිය අරගෙන පුළුවන් තරම් ඉක්මණින් ඒ කරුණු ක්‍රියාත්මක කරන්නට අපි බලාපොරොත්තු වන බව මතක් කරමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසාන කරනවා.

"168 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 1,73,30,000 ක මුදල් උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සහ සම්මත විය.

168 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 168, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 1,73,30,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 168, நிகழ்ச்சித்திட்டம் 1, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 17,330,000, for Head 168, Programme 1, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 168, Programme 1, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

1 වන වැඩ සටහන—ක්‍රීඩා කටයුතු වර්ධනය කිරීම—මූලධන වියදම්, රු. 30,00,000

நிகழ்ச்சித்திட்டம் 1.—விளையாட்டு அலுவல்களின் மேம்பாடு—மூலதனச் செலவு, ரூபா 30,00,000

Programme 1. Promotion of Sports Activities Capital Expenditure Rs. 3,000,000

"168 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම් සඳහා රු.30,00,000 ක මුදල් උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සහ සම්මත විය.

168 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 168, நிகழ்ச்சித்திட்டம் 1, ஆக்கப்பொருட் செலவுக்கான ரூபா 30,00,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 168, நிகழ்ச்சித்திட்டம் 1, ஆக்கப்பொருட் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 3,000,000 for Head 168, Programme 1, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 168, Programme 1, Capital Expenditure, ordered to stand part of the Schedule.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

175 වන ශීර්ෂය—පේෂකර්මාන්ත අමාත්‍යවරයා

1 වන වැඩ සටහන—පේෂකර්මාන්ත නගාසිටුවීම හා සංවර්ධනය කිරීම—පුනරාවර්තන වියදම, රු. 26,87,000

தலைப்பு 175.—புடைவைக் கைத்தொழில்கள் அமைச்சர்

நிகழ்ச்சித்திட்டம் 1.—புடைவைக் கைத்தொழில்களின் அபிவிருத்தி மற்றும் பேணற்பாடும்—மீண்டுவருஞ் செலவு, ரூபா 26,87,000

HEAD 175. MINISTER OF TEXTILE INDUSTRIES

Programme 1. Promotion and Development of Textile Industries Recurrent Expenditure, Rs. 2,687,000

සරත් මුත්තෙට්ටුවෙගම මහතා (කලවාන)
(திரு. சரத் முத்தெட்டுவெகம — கலவான)
(Mr. Sarath Muttetuwegama-Kalawana)

ගරු සභාපතිතුමනි, "වැඩ සටහන රු. 10 කින් අඩු කළ යුතුය" යි මා යෝජනා කරනවා.

මගේ කාලය මම සීමා කරන්නට බලාපොරොත්තු වෙනවා කරුණු එකක් දෙකක් ගැන පමණක් කථා කරන්නට. මේ ආණ්ඩුව බලයට පත්වී දැන් අවුරුදු 6 ක් ගතවී තිබෙනවා. ඒ අවුරුදු හය තුළ පේෂ කර්මාන්ත ඇමතිතුමෙක් හිටියට, මට බොහොම කණගාටුයි කියන්න, පේෂ කර්මාන්තයක්, දේශීය පේෂ කර්මාන්තයක්, තිබෙනවාද, නැද්ද කියාවත් දැන් උසාවිගත්ත අමාරු බව. මෙහෙම වෙලා තිබෙන්නේ ඇමතිතුමාගේම වරදක් නිසා නොවෙයි, මේ රජයේ ප්‍රතිපත්තිය නිසයි. නොයෙකුත් හාණ්ඩ, විශේෂයෙන්ම රෙදි, ආනයනය කරන්නට පටන්ගන්නාට පසුව, කලින් විශේෂ දියුණුවක් තිබුණු පේෂ කර්මාන්තය, අද ඉතාමත්ම පිරිහුණු තත්ත්වයකට ඇවිත් තිබෙනවා. ඒ ගැන තමුන්නාන්සේලාට කථා කරලා වැඩක් නැහැ. ඒක රජයේ සමස්ථ ප්‍රතිපත්තියේ ප්‍රතිඵලයක්. නොයෙකුත් අමාත්‍යාංශ පිහිටෙව්වාට, ඒ අමාත්‍යාංශවලට කරන්න වැඩක් නැති තත්ත්වයට යථා කාලයේ දී ඒවා පත්වෙනවා.

මේ අමාත්‍යාංශය යටතේ කථා කරන්නට විශේෂ කාරණා කීහිපයක් තිබෙනවා, තමුන්නාන්සේලා බලයට පත්වුණාට පසුව, ප්‍රාදේශීය වශයෙන් තිබුණු බලවේග පේෂ කර්ම මධ්‍යස්ථාන පුද්ගලයන්ට භාර දුන්නා, විදේශිකයන්ට භාර දුන්නා. රට පුරාම විසිරී තිබුණු බලවේග පේෂ කර්මාන්ත මධ්‍යස්ථානවල අද තත්ත්වය කුමක්දැයි ඇමතිතුමාගෙන් පැහැදිලිව දැනගන්නට කැමතියි. ලාංකික පාලනයක් යටතේ තිබුණු ඒවායින් සමහරක් ඉන්දියන් කාරයන් අරගෙන තිබෙනවා. තවත් සමහරක් වෙන වෙන පුද්ගලික ව්‍යාපාරිකයින් අරගෙන තිබෙනවා, ඒ ඇතැම් තැන්වල වැඩ කරන සේවක සේවිකාවන්ට හරියාකාර දීමනාවල් ලැබෙන්නේත් නැහැ. සමහර තැන්වල කලින් සිටි මුළු සේවක සංඛ්‍යාවම ආපසු වැඩට අරගෙනත් නැහැ. මම දන්නවා යටියන්තොට බලවේග පේෂකර්ම මධ්‍යස්ථානය වහනවිට එතැන සේවය කරමින් සිටි සේවක සේවිකාවන් ගණනාවක් ආපසු සේවයට අරගෙන නැහැ. මම දන්නා තරමින් ඒ වාගේමයි කුරුවිටත්. තමුන්නාන්සේලා කුරුවිට ගැන තමන් හරියට කියන්න මම දන්නේ නැහැ. එසේ වුවත් යටියන්තොට තමා තත්ත්වය ඒකයි.

විජයපාල මෙන්ඩිස් මහතා (පේෂකර්ම ඇමතිතුමා)
(திரு. விஜயபால மெண்டிஸ் — புடைவைத் தொழில் அமைச்சர்)
(Mr. Wijayapala Mendis-Minister of Textile Industry)

බලවේග පේෂකර්මාන්ත මධ්‍යස්ථාන කිසිවක් විදේශිකයින්ට දීලා නැහැ.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

මම දන්නා හැටියට එක්කෙනෙක්වත් ඉන්නවා එක්කො විදේශිකයෙක් නැත්නම්, පුරවැසිකම් ලබාගත් කෙනෙක්.

විජයපාල මෙන්ඩිස් මහතා
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)

පුරවැසියන්ට පමණයි දුන්නෙ.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

හොඳයි හොඳයි. ඒ තත්ත්වය ගැන ඒ ස්ථාන අරගෙන ඒවායේ සිටි සේවකයින් නොගැනීම ගැන ඇමතිතුමා සොයා බලා මේ සේවකයින්ට හිඟ වැටුප් සමග නැවත සේවය ලබාදීමට කටයුතු කරන්න කියා මම ඉල්ලා සිටිනවා.

අනෙක් කරුණ තුල්හිරිය කර්මාන්ත ශාලාවේ තිබෙන තත්ත්වය ගැනයි. තමුන්නාන්සේ දන්නවා එතැන පාලකයින් අනුගමනය කළේ ඉතාමත්ම කැත වැඩපිළිවෙළක් බව. මුලිනුම ඒ වැඩපොළ වැහුවා. වැඩපොළ වහලා එතැන සේවයේ යෙදී සිටි සේවකයින් සියලුදෙනාවම අස් කළා. දැන් ඒ අය සියලුදෙනාම මහපාරේ. මේ අය පාලනයට විරුද්ධව කම්කරු උසාවියේ නඩුවක් දැම්මා, තම තමන්ගේ සම්මති මාර්ගයෙන්. ඒ නඩුවටත් එහෙත් මෙහෙත් උප්පරවැට්ටි දලා නඩුව අහළත්, තීන්දුවක් දුන්නේ නැති තත්ත්වයකට පත් කළා. මූලික විරෝධතාවයක් අරගෙන, ඇපැලක් අරගෙන සුප්‍රීම් උසාවියේ කොහේදෝ ඒක හිරවෙලා තිබෙනවා. ඒ අවස්ථාව පාවිච්චි කර තමුන්නාන්සේලා එතැන ප්‍රතිසංවිධානයක් කළා. ප්‍රතිසංවිධානයේ ප්‍රතිඵලයක් හැටියට එය පාලනය කරන්නට ඉන්දියානු සමාගමකට දුන්නා. මම අහන්නේ මොකටද මේ ඉන්දියානු සමාගමකට දුන්නේ? තමුන්නාන්සේලාට සමාගමකට දෙන්න වුවමනා නම් ඒ සඳහා ලාංකික සමාගමක් තිබුණෙ නැද්ද? [බාධා කිරීමක්]

විජයපාල මෙන්ඩිස් මහතා
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)

ලාංකයන්ට ඉස්සෙල්ලා දුන්නා

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

ඉතිරි ඒවා දෙන්න ලාංකිකයන් ඉතුරු වුණේ නැද්ද? ඒවායේ පාලනය හාර දෙන්න ලාංකිකයන් ඉතුරු වුණේ නැද්ද?

තුල්හිරිය අග්තිදිග ආසියාවේ තිබෙන රෙදි නිෂ්පාදනය කිරීමේ ලොකුම කම්හලක්. එය ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී ජනරජයෙන් දුන් ත්‍යාගයක්. එය ශ්‍රී ලංකාවේ ආණ්ඩුවක් විසින් ඉල්ලල ලබා ගත්ත දෙයක්. ඒ කියන්නේ යම්කිසි ප්‍රතිපාදනයක් දෙන්න තිබූ අවස්ථාවකදී මෙම කම්හල අපට අවශ්‍යයි කියා තෝරා ගත්තා. ඒ අනුව තමයි ජර්මන් ප්‍රජාතන්ත්‍රවාදී ජනරජය විසින් එය ත්‍යාග කළේ. අපේ රට සමාජවාදී රටක්. මෙම ලැබුණු ත්‍යාගය අරගෙන එය පෞද්ගලික කොම්පැනියකට පාලනය කරන්න දුන්නාම එහි තේරුම මොකක්ද කියා මම අහනවා. එහි සේවය කරන සේවකයන් සියලු දෙනාම පාරට දමලා මේ පිළිබඳව තිබෙන නඩුවෙන්වත් යම් සහනයක් ලැබෙයි කියා බලාගෙන ඒ මිනිසුන් තවමත් ගෙවල්වලට වෙලා ඉන්නවා.

මොන විධියේ බලපෑම් යටතේද මේ විධියට කටයුතු කළේ කියා කියන්න මා දන්නේ නැහැ. එය මට නම් හඳුන්වන්න පුළුවන් වන්නේ අමානුෂික ක්‍රියාවක් හැටියට පමණයි. මොකද, එහි සිටියා ඉතාමත් බුද්ධිමත් තරුණ සේවක පිරිසක්. එහි සමහර සේවකයෝ විශ්ව විද්‍යාලවලට ගිහින් සේවක පාඨමාලාව හදාරමින් සිටි අයයි. ඇත්ත වශයෙන්ම, කර්මාන්ත ශාලාව නිසා පමණක් නොවෙයි, දිවිතිය අධ්‍යාපනය සම්පූර්ණ කළ සේවක පිරිස් එහි සිටි නිසා කර්මාන්තයේ තාක්ෂණික දැනුමක් ලබා ගෙන ඉදිරියට හොඳ වර්ගයේ රෙදි නිපදවන්නට පුළුවන්කම අපට තිබුණා. තමුන් තමුන්නාන්සේලා මොකක්ද කෙළේ? ඒ මිනිසුන්ව එලියට දැම්මා. ඉන්පසුව තින්දිත කොන්දේසිවලට ඒ අය ලවා අත්සන් කරවා ගෙන, යූඑන්.පී. එකට පත්දම් අල්ලන්න ඕනෑ උදවිය ටික දෙනෙක් පමණක් නැවත සේවයට ගත්තා.

ජාතික සේවක සංගමය එහි රජ කරනවා. ජාතික සේවක සංගමයේ කිසිම අනුදැනුමක් නොමැතිව එහි කිසිම වැඩක් කරන්න බැහැ. තමුන්නාන්සේලා මහ ලොකුවට ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරනවා. සමාජවාදී ජනරජයක්ය කියා කියනවා. ධර්මිෂ්ඨයි කියා කියනවා. තමුන් මොකක්ද මෙහි තේරුම? එහි සේවය කළ ගැහැණු, පිරිමි විශාල සේවක සංඛ්‍යාවක් ඉන්නවා තවමත් රැකියා නොමැතිව. ඒ වාගේම තමයි පුගොඩ සහ මිත්තේරිය කම්හල්වලත්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මිත්තේරිය කම්හල දැන් සම්පූර්ණයෙන්ම වහලා. මිත්තේරිය අතුරු මැතිවරණය ළඟදී තියන්නේ නැති බව අපි දන්නවා. මැතිවරණයක් තිබ්බොත් එම වැඩපොළේ සියලු දෙනාම තමුන්නාන්සේලාට විරුද්ධව වැඩ කරයි. තමුන්නාන්සේලා ඒකටත් මොකක්හරි බජට්වක් දමලා, ඒ ආයතනයත් දිනා ගන්න උත්සාහ දරයි. ජනමත විචාරණයේදී කලා වාගේ මේකෙදිත් මොකක් හරි කරයි. මෙය තමයි ඇත්ත තත්ත්වය. දැන් මිත්තේරිය කම්හල වහලා, පූගොඩ කම්හල කාටද භාර දීලා –

සභාපතිතුමා
(தலைவர்)
(The Chairman)
Order, please ! The word "bajawwa"–

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)
The word 'bajawwa' is a very good word. It is impossible to express what I wish to say by any other word in the Sinhala language. That is a sanskrit word.

සභාපතිතුමා
(தலைவர்)
(The Chairman)
I will take your word for it.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)
මෙම ස්ථානයේ ගාථාවක් කියන්න බැරිද ? එහි තේරුම ගන්න වෙනත් වචනයක් සිංහල භාෂාවේ නැහැ.

සභාපතිතුමා
(தலைவர்)
(The Chairman)
We accept your explanation.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)
මේ ආණ්ඩුවේ වැඩපිළිවෙල විස්තර කරන්න පුළුවන් හොඳම වචනය ඒකයි. එක වචනයකින් මේ ආණ්ඩුවේ වැඩපිළිවෙල විස්තර කරනවා නම් එය තමයි "බජට්ට" කියන වචනය. ජේෂ්ඨ කර්මාන්ත ඇමතිතුමාත් දැන් ඒ කාසිවල් එකට එකතු වී වැඩකටයුතු කරගෙන යනවා. නමුත් මේ වැඩකටයුතු මේ විධියට කරන්න බැහැ. මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ තුල්හිරිය කම්හලේ සේවකයන්ට නැවත වැඩ දෙනවාද නැද්ද කියා අවසන් වචනයක් කියන ලෙසයි. එක එක විධියේ කොන්දේසි අක්සන් කරන්නය කියා ඒ අයගෙන් ඉල්ලන්න එපා. ජාතික සේවක සංගමයේ බලපෑම්වලට මෙහි ඉඩ තියන්න එපා. දැන් එහි වැඩ කරන පාලකයින්ගෙනුත් ලොකු ප්‍රශ්න තිබෙවා. පූගොඩ කම්හලේ වැඩ කරන ඒ පාලකයින්ටත් ජාතික සේවක සංගමය ප්‍රශ්නයක් වෙලා. ජාතික සේවක සංගමය වෘත්තීය සම්තියක් නොවෙයි. එය ආණ්ඩුවේ එක්තරා අංශයක්. එම නිසා මේ සියල්ලක් ගැනම තමුන්නාන්සේ අවධානය යොමු කර එහි සිටි සේවකයන්ට හිඟ වැටුප් සමග පඩි ලබා දෙන්නය කියා ඉල්ලා සිටින අතර, රාජ්‍ය අංශයේ තිබූ වැඩපොළවල් නැවත් රාජ්‍ය අංශයට පවරා ගන්නය කියා ඉල්ලා සිටිනවා. "අර කාලයේදී මෙපමණ පාඩු තිබුණා, දැන් මෙහෙමයි" කියා ගණන් හිලවු පියවා මේ ප්‍රශ්නය විසඳන්න බැහැ. එය මේ ප්‍රශ්නයට පිළිතුරක් නොවෙයි. එයට වෙනත් විවිධ හේතූන් තිබෙනවා. ඒ කාලයේදී පාඩු විඳින්නටත්, ඉන්පසුව කාලයේදී ලාභ ලබන්නටත් විවිධ හේතූන් තිබෙනවා. එක එක්කෙනාට පොඩි ප්‍රශ්නයක් තිබෙන විට පෞද්ගලික අංශයට භාර දී එය විසඳන්න යනවා නම් තව ටික කාලයක් යන විට ආණ්ඩුවේ දෙපාර්තමේන්තුත් පෞද්ගලික අංශයට භාර දෙයි. තැපැල් සේවාවත් දෙවි. දුම්රිය සේවාව දෙවි. ගන්න මිනිස්සු නැති තිසයි ඒවා ඉතිරි වෙලා තිබෙන්නේ. එම නිසා රාජ්‍ය අංශයේ තිබුණු දේපළ නැවත රාජ්‍ය අංශයට භාර ගන්නය, එතැන හිටි සේවකයන් හිඟ වැටුප් සමග ආපසු සේවයට ගන්නය කියන මේ ප්‍රධාන ඉල්ලීම් දෙක ඉෂ්ට කර දෙන ලෙස මම තමුන්නාන්සේගෙන් ඉතා ඕතැකමින් ඉල්ලා සිටිනවා.

ලක්ෂ්මන් ජයකොඩි මහතා (අත්තනගල්ල)
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி — அத்தனகல்ல)
(Mr. Lakshman Jayakody–Attanagalla)
ගරු සභාපතිතුමනි, ඉතාමත් වැදගත් කාරණා රාශියක් ගැබ් වූ කලවාතේ ගරු මන්ත්‍රීතුමාගේ කථාවෙන් පසුව මම ගරු ඇමතිතුමාගෙන් එක කාරණයක් අහන්න කැමතියි. මම කොයෙක්වර මෙම ගරු සභාවේ ඉල්ලන දෙයක් තමයි, මිත්තේරිය, තුල්හිරිය, මත්තෙගම , වෙයන්ගොඩ, පූගොඩ යන මේ ස්ථානවල කළමනාකරණ කොන්දේසි ටික මේ ගරු සභාවට ඉදිරිපත් කරන්නය කියලා. මේ කොන්දේසි ටික තිබුණා නම් මම හිතන්නේ කලවාතේ ගරු මන්ත්‍රීතුමාට ඔය ප්‍රශ්නය තගන්නට ඕනෑ කරන්නේ නැහැ.

ඒයේ පෙරේදා මා විසින් මිත්තේරිය ගැන තමුන්නාන්සේගෙන් ප්‍රශ්නයක් අහන්නට යෙදුණා. "ඇයි මිත්තේරිය වසා දැමීමේ ?" කියලා. රෙපරේරු සදහාය කියා තමුන්නාන්සේ කිව්වා. අපේ ආණ්ඩුව කාලයේ විනයත් සමඟ මේ සම්බන්ධ ගනුදෙනු සියල්ලම ඇති කළා. මා හිතන්නේ 1979 වර්ෂයේ අළුත්ම අළුත් මැෂින් ගෙනැවිත් සවි කර, මිත්තේරිය පේෂ කර්මාන්තශාලාව ආරම්භ කළා. අවුරුදු 3 යි, ගියේ. මොනවාද කරන රෙපරේරු ? ඔය කියන මැෂින් හොඳට තබන්නු කළා නම් හොඳට තෙල් දමා තිබුණා නම් මා හිතන්නේ කිසිම ප්‍රශ්නයක් නැතිව අවුරුදු 5 ක් යනතුරු දිවා රෑ වැඩ කරන්න තිබුණා. රෙපරේරු නොවෙයි මෙතැන තිබෙන ප්‍රශ්නය. මෙතැන තිබෙන්නේ මෙයයි. මෙය පරිපාලනය කරන්න "කොම්බේ ඩයිත්" එකට නැත්නම් මොකක් හරි කොම්පැනියකට දුන්නා. මම දන්නේ නැහැ මොකක්ද කොම්පැනිය කියලා. ඉන්දියානු කොම්පැනියකටයි දුන්නේ. මෙහෙම තිබෙද්දී තමුන්නාන්සේ දනට මාසයකට දෙකකට ඉස්සෙල්ලා ගිහිල්ලා, විත මහජන සමූහාණ්ඩුවේ තානාපති කාර්යාලයත් සමඟ "ජොයින්ට් වෙන්චර්" එකක් ගැන කථා කෙළේ නැද්ද. ඇයි එහෙම කෙළේ ? එතැන පරිපාලනය හරියට තිබුණා නම් නැවත ගිහිල්ලා විත සමූහාණ්ඩුවත් සමඟ කථා කරන්න තියෙන්නේ මොනවාද ?

කාරණා දෙකක් තිබුණා. එක කාරණයක් මම දන්නවා. මම හිතන විධියට ඔය ණය අරගෙන අවුරුදු 10 ක් වෙනවා. දැන් හෙට අනිද්ද වන විට අවුරුදු 10 අවසාන වන්නට ඉඩ තිබෙනවා. නමුත් තමුන්නාන්සේට වුවමනා කර තිබුණා, ඉන්දියානු සමාගම අසාර්ථකව කරගෙන ගොස් තිබෙන තිසා දැන් විනයත් සමඟ සමූහික ගිවිසුමකට ඇතුළත්වී මේ කටයුත්ත කරන්න පුළුවන්ද කියලා දනගන්න. කොපමණ කිව්වත් තබන්නු කිරීමට, අලුත් මැෂින් සවි කරන්නට මෙය වසා දමීමාය කියල තමුන්නාන්සේ කියනවා. ඇයි එහෙමතම් මේ 800 දෙනා අස්කෙළේ ? බාගෙට පඩි ගෙවා දැන් අස්කර තිබෙනවා. සමහරු බාගෙට පඩි ගෙවලා අයින් කර තිබෙනවා. [බාධා කිරීමක්]. පරණ උදවියගෙන් අයින් කර අළුත් ගිවිසුමකට එන්නට පුළුවන් වෙයිදෝ කියල තවම බලාගෙන ඉන්නවා. මට ආරංචි විධියට විනය "බැහැ" කියලා තිබෙනවා. එක්තරා කොන්දේසියක් උඩයි ඒක දීලා තිබෙන්නේ. ඒ මිස එහාට මෙහාට දෙන්න නොවෙයි. ජාතික පේෂකර්ම සංස්ථා මඟින් මේ කටයුත්ත කරන්න ඕනෑය කියලයි විනය තීරණය දී තිබෙන්නේ. ණය අනුව දී තිබෙන නිසා ඒ අය ඒමට කැමැත්ත දක්වා තිබෙනවාද නැද්ද කියලා මම හරියට දන්නේ නැහැ. නමුත් ඔය තත්ත්වය තමයි වෙයන්ගොඩයි තුල්හිරියෙයි හැම තැනම වාගේ තිබෙන්නේ. එම නිසා අපි ගරු ඇමතිතුමාගෙන් ඉතා ඕතැකමින් ඉල්ලා සිටින්නේ කරුණාකර කොන්දේසි ටික ඉදිරිපත් කරන්නය කියලයි. මම මේ කොන්දේසි ටික ඉදිරිපත් කරන්නය කියලා කියන්නේ වෙන කිසිවක් නිසා නොවෙයි. වර්ෂයෙන් වර්ෂයටයි වෙනදා පේෂකර්ම නිෂ්පාදනවල මිල ඉහළ ගියේ. දැන් බොහොම ඉක්මනින් මාසෙන් මාසෙට ඉහළ නගිනවා. දෙසැම්බර් 18 වැනිදා "දිවයින" පත්‍රයේ තිබුණා, මෙන්න මේ විධියට :

"රෙදි සඳ නූල් මිල ඉහළ නඟී. මෙරට විදේශික රෙදිපිළි කර්මාන්ත ශාලාවල කපු රෙදි මීටරයක මිල ඉකුත් සතියේ සිට රුපියල් 1.30 කින් වැඩි කර තිබේ.

ඒ සමගම නූල් කිලෝ එකක මිලද රුපියල් දහයකින් පමණ වැඩි කොට ඇත. මේ නිසා අත් යන්ත්‍ර පේෂකර්මාන්ත ව්‍යාපාරයට බලවත් පහරක් වදින බව එම කර්මාන්තයේ නියැලී සිටින්නෝ පවසති.

මිල ගණන් වැඩිවී ඇත්තේ මෙසේය. කලින් කොගම්ල රුපියල් 16.85 ක්වූ විත්ත වර්ගයක් පීරිවැටුම් බදු සියයට හතරක් අය කර රුපියල් 17.45 ට අලෙවි කරන ලදී. දැන් රුපියලක් වැඩිකොට රුපියල් 17.85 ට වැඩිකර ඇති මෙම රෙදි මීටරයක් සඳහා පීරිවැටුම් බදු සියයට හයක් අය කොට මීටරය රුපියල් 18.84 බැගින් අලෙවි කරයි.

30 මානයේ නූල් කිලෝ කිලෝ එකක් කලින් රුපියල් 65 ක්වූ අතර දැන් මිල රුපියල් 75 කි. රුපියල් 65 ට එකතු කළේ සියයට 4 ක පීරිවැටුම් බදුය. රුපියල් 75 ට සියයට 6 ක පීරිවැටුම් බදු අය කරයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලක්ෂ්මන් ජයකොඩි මහතා]

මේ අතර මීටරයක නිෂ්පාදන වියදම රුපියල් 10 ක් තරම් වන අමු රෙදි නොගයක් පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව මඟින් මීටරය රුපියල් 7.54 බැගින් අලෙවි කර ඇතැයි කියති."

අපේ කාලේ මිල ගණනුයි, මේ කාලේ මිල ගණනුයි අතරේ වෙනස කොයි තරම්ද කියා තමුන්නාන්සේලාට පෙනෙනවා. අපේ කාලේ රුපියල් දහයකුත් ගණනට තිබුණු එක දත් රුපියල් හැත්තෑපහක් වී තිබෙනවා. අපේ රටේ හිටිය අත් යන්ත්‍ර පේෂකාර්මිකයන්ට ඒ නූල් ලැබුණේ රුපියල් දහයකුත් ගණනටයි. ඒ දවස්වල ජාතික පේෂකර්ම සංස්ථාව නූල් ගෙන්නුවා. පොද්ගලික අංශයේ කුමාර් ඒජන්සි එක වගේ අයත් නූල් පරිහරණය කළා. 60 මානයේ, 30 මානයේ—60 counts, 30 counts—නූල් වර්ග තිබුණා. එම නිසා අර රපෝර්තු ටික කරුණාකර ඉදිරිපත් කරන්නය කියා මා ඉල්ලා සිටිනවා.

අපට ප්‍රශ්නය තිබෙන්නේ මේ ගැනයි : නූල් මිල වැඩි වෙනවා. රෙදි මිල වැඩි වෙනවා. එම නිසා අවසානයේදී ගරු ඇමතිතුමාට පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ, රෙදි ටික විකුණා ගන්න. මේවා ගන්න මහජනයා ළඟ සල්ලි නැහැ. රු. 18.85 ක් කියන්නේ එසේ-මෙසේ නොවෙයි. ඒ "දිවයින" පත්‍රයේ තවත් විස්තර තිබෙනවා. පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුවේ තිබෙන අර අමු රෙදි ටික රු. 7.54 ගණනේ දෙන්නේ ඇයි ? ඒවා දෙන්නේ කාටද ? මොන හේතුවක් උඩද ඒ තරම් අඩු ගණනකට ඒවා දෙන්නේ ? ඒ රෙදි ගොඩගැහී තිබෙන්නේ මොන හේතුවක් උඩද ?

පේෂකර්මාන්තයට අදළ වැදගත් මිල ගණන් දෙකක් තිබෙනවා. එකක් රෙදි මිල. අනෙක නූල් මිල. 'බී.ටී.ටී.' ආදී වශයෙන් ඒ සේරම එකතු වෙලා "මෙන්න මේ විධියට නූල් යකස් වී තිබෙනවාය" කියා ගරු ඇමතිතුමා අපට විස්තර ඉදිරිපත් කරන්න ඕනෑ.

ඒ කාලයේ පේෂකර්ම සංස්ථාව අනාවැකියක් කිව්වා, තව ටිකක් කල් යන කොට නූල් මිල වැඩි වෙය කියා. ඒ අනුව ඒ කාලයේදී පේෂකර්ම සංස්ථාව කොයි තරම් දූර්දර්ශීව කටයුතු කළාද කීවොත් සුඩානයට ගිහින් සුඩාන රජයත් සමඟ "ජොයින්ට් වෙන්චර්" එකක් ඇති කර ගන්නා. එහේ කපු වැවීමේ ව්‍යාපාරය සඳහා ලංකාවෙන් මුදල් දීලා මෙහාට කපු ගෙන්වා ගැනීමේ වැඩ පිළිවෙලකුත් තිබුණා.

It was a joint venture with Sudan in order to put our money with the Sudanese Government, then grow the cotton there and get the raw cotton down here for spinning and weaving in our mills. Now this is what we should do. That was the proposal. But what did we do ? We just started growing the raw material again. The proposal came in 1975—he was not in Parliament then. I know this whole thing because it went through the Economic Affairs Division of the Ministry of Foreign Affairs. That is how I know that there was such a proposal.

Not only with them. There was a proposal with the Pakistani Government. Pakistani yarn is not so good and at that time it was said that the best yarn you can get was the South Korean yarn. I am just throwing my mind back the South Korean yarn was good, Egyptian yarn was excellent and the Sudanese yarn was also very good or excellent. But the Pakistani yarn was not so good. We wanted to do that, Sir, but ultimately it never ended that way. (*Interruption.*) Yes, you get the cotton straight here, you invest out and get the cotton here and if there is a profit you will get the profit here. We do not want full control of all that—it will be in the control of that Government—but we have a share in it, we have a stake in it. You must go out like that, instead of just keeping your money here. Go out like that and then obtain your raw material. If you do not, the price of your raw material will go so high that you will have to close down the factories. That is what will happen if you have no stake in your raw material production. Why do you think the foreigners come here ? Because they know that the raw material is here, they know that the rubber raw material is here, they know that certain raw materials come under the NSD and they could get it cheaper here than in their own countries. So they come here to open up factories. Likewise, it should be our policy to go out into their area and have our factories there and pump the money back here—the profit as well as the raw material whatever the organisation is. Therefore, I hope the Hon. Minister will consider it.

The hon. Member for Kalawana spoke of certain power looms. You had the co-operative Power Looms. One was at Polgolla. There were so many. You gave them out on tender.

විජයපාල මෙන්ඩිස් මහතා
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)

Those were departmental ones.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

You gave your power looms under certain conditions. After you got the first instalment you gave the whole thing. But after the first instalment did you check whether the second, thrid and the fourth instalents were paid to the bank ? If you look into it you will find that no instalment was paid other than the first instalment. Not only that : you got workers there, who were under you, to sign another agreement with the new owners. I remember that agreement. Do you know that the agreement that they signed for tickets and things like that—

විජයපාල මෙන්ඩිස් මහතා
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)

May be from the companies, not from us.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

Exactly ; but you did this transaction with the companies and bound the workers down to those conditions. After the workers were bound down, none of the companies adhered to the workers' conditions. It is your fault. If you want I can tell you more about the Polgolla Power Loom, but I do not want to do so because there is no time. Therefore, I would like first and foremost to speak about the management fee, and secondly, about the activities of these foreign companies and how these power looms are operating in these areas.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Now let me also ask the Hon. Minister about another matter. As you know, the garment quota is not a problem now. That problem has ended. But a problem has come up, Sir, due to the delays that take place with regard to export orders. You are earning a lot of money on garments. There is a substantial delay in export orders. As I saw the other day, the reason for this delay is that when you get some raw materials down, say, accessories or cloth, or whatever it is, for four days Friday, Saturday, Sunday and Monday–it gets stuck in the wharf or in the airlines. Why these exporters want the cloth or accessories by air is because they want to clear up their export orders. What we find is that there is no co-ordination for this type of activity. The Ministry, the Customs, the Bank, the Import Control, the Port and the Air Port, all these come in. And if we want to keep the garment factories and the garment industry going in this country, we have to have that co-ordination. I know your Ministry has very competent people. They know that job very well and have performed very well. Therefore, special arrangments must be made with regard to the clearing of all these textiles that are coming into the country for the manufacture of garments, so that we can keep up to our quota as well as the non-quota orders that have come in. I hope the Hon. Minister will at least pay overtime or work out a system of overtime even at the Customs and see that these raw materials are cleared, because if we do not keep to time we might lose and this project is going to be very, very important as far as Sri Lanka is concerned. It is up to you to work out some arrangement with the other Ministries.

Now, Sir, I want to find out what is happening–

ගරු සභාපතිතුමනි, අපට "ටෙක්ස්ටයිල් ඩෙමොන්ස්ට්‍රේටර්" වරුන් දෙදහක් පමණ සිටිනවා. මේ දෙදාහෙන් අපි මොනවාද බලාපොරොත්තු වුණේ ? ජේෂකර්ම සේවා මධ්‍යස්ථානවල සේවය කරන්නය කියා මේ අයට කිව්වා. ඒ ජේෂකර්ම සේවාව කියන එකෙන් අපි බලාපොරොත්තු වුණේ මොනවාද ? අපි බලාපොරොත්තු වුණු සේවාවක්ගෙන් එකක් තමයි, පොද්ගලික ජේෂකර්ම ආයතනවල සේවාවන්. ඒ වාගේම සමුපකාර ජේෂකර්ම ආයතනවල සේවාවන්. මුළු ලංකාවේ තිබුන එක් ලක්ෂ දස දහසක් වන අත් යන්ත්‍රවලින් සියයට විසි පහක් පමණ තිබුණේ දිවුලපිටිය, කටාන සහ අත්තනගල්ල යන මේ මැතිවරණ කොට්ඨාශ තුනේ බව ගරු ඇමතිතුමා දන්නවා. ඒවාට අද මොකද වෙලා තිබෙන්නේ ? ලංකාවේ තිබුණු අත් යන්ත්‍රවලින් සියයට විසි පහක් පමණ වූ සංඛ්‍යාවෙන් අද එක අත් යන්ත්‍රයක්වත් වැඩ කරනවාද කියා ගරු ඇමතිතුමා කල්පනා කර බලන්න. මේවායේ ලක්ෂයකට වැඩි පිරිසක් රැකියාව කළා. හිදහස් වෙළඳ කලාපයේ විසි පන් දහසකට රැකියාවන් දුන්නාය කියා අපි කෑ ගහනවා ; පුන පුනා කියනවා. නමුත් එක පැන් පහරකින් අවුරුදු දෙකකින් නැත්නම් එක අවුරුද්දකින් ලක්ෂයක් පාරට දමීමා. ලක්ෂයක් පාරට දැමූ එක විසි පන් දහසකට රැකියාවන් දීමෙන් කොහොමද හදන්නේ ? අද අන් යන්ත්‍රවලට සිදු වී තිබෙන්නේ ඔන්න ඔය ටිකයි.

ඒ වාගේම රුපියල් කෝටි හතරක් දීලා "ෆිනිෂින් ප්ලාන්ට්ස්" හතක් ගත්තා මට මතකයි. අද ඔය "ෆිනිෂිං ප්ලාන්ට්ස්" එකකවත් වැඩ කරනවාද ? ඒවා සේරම දැන් වහලා දමලා. මේවා අපේ සල්ලි. මේ රටේ විනාශ වී ගිය දේවල් ඔන්න ඕවා තමයි. කිසිම සැලැස්මක් නැතිවයි වැඩ කරන්නේ. "ෆිනිෂිං ප්ලාන්ට්ස්" එකක්වත් වැඩ කරන්නේ නැහැ. ඇයි දෙවියනේ මේ තරම් මුදල් ගෙවලා මේවා ගෙනාවේ ! වැඩ පිළිවෙලක් තිබුණාද ?

අනික් කාරණය මෙන්න මේකයි. මේ රටේ අත් යන්ත්‍ර ජේෂ කර්මාන්තය ආරක්ෂා කරන්නට ගත් පියවරවල් මොනවාද ? අමෙරිකා එක්සත් ජනපදය, ඊ. ඊ. සී. එක 'ක්වෝටා' දැම්මේ ඇයි කියන එක තමුන්නාන්සේලා දන්නවා. එහෙම කළේ ඒ ගොල්ලන්ගේ කර්මාන්ත ආරක්ෂා කරන්න. ඒ වාගේම අපේ කර්මාන්ත ආරක්ෂා කරන්නටත් අපි පියවරවල් ටිකක් නොගන්නේ ඇයි? අපේ කර්මාන්ත සියල්ලක්ම විනාශ වෙලා ගියා. 'ක්වෝටා' අනුව දියල්ලා කියා ඒ උදවිය අපට කියනවා මේ 'ක්වෝටා' එකෙන් එහා ලංකාවෙන් ගන්නට බැහැ. ඒ උදවිය ආරක්ෂා කරනවා. ලෝක බැංකුව අපට එක බණක් කියනවා. ගරු ඇමතිතුමා පියවරක් ගත්තා. මේ රටට පිටරටින් රෙදි ගෙන්වන්නේ නැහැයි කියා ගරු ඇමතිතුමා කිව්වා. මේ ගරු සභාවේදීත් කිව්වා. පත්තරවලිනුත් කිව්වා. එහෙම කිව්වාට පස්සේ මොකද වුණේ ? පසුවදා ඒ කියපු කියමන ඉල්ලා අස්කර ගත්තා.

විජයපාල මෙන්ඩිස් මහතා
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)
මම ඉල්ලා අස්කරගත්තේ නැහැ.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)
තමුන්නාන්සේ ඉල්ලා අස්කරගත්තේ නැහැයි කියනවා. තමුන් දැන් රෙදි ගෙන්වනවා. ගරු ඇමතිතුමාට මම කියන්නේ ඒක තමයි, මේවා කරන්නට බැරි දේවල්. මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාගේ හොඳ හිතක් තිබෙන බව අපි දන්නවා. තමුන් තමුන්නාන්සේට මේ වැඩට ලෝක බැංකුව ඉඩ දෙන්නේ නැහැ. තමුන්නාන්සේට කිසි කෙනෙක් ඉඩ දෙන්නේ නැහැ. තමුන්නාන්සේට පියවරක් ගන්න පුළුවන්. "ටැරිෆ්" ගණන තග්ගන්න කියා කියයි. එහෙම කරලා ආරක්ෂා කරන්න කියයි. තමුන් තමුන්නාන්සේට මේ රටට රෙදි ගෙන්වන එක නම් නවත්වන්නට පුළුවන්කමක් නැහැ. අවසානයේදී සිදු වන්නේ මොකක්ද ? දැන් අපේ ගම්වල රැකීරක්ෂා ප්‍රශ්නය බොහොම උග්‍ර වෙලා තිබෙනවා.

ඒ වාගේම "විස් ක්ලෝත්" හදන්නය කියා ඊයේ පෙරේදා අපේ පැත්තේ ඉන්න නිෂ්පාදකයින්ට කියා තිබෙනවා. 'විස් ක්ලෝත්' කියා රෙදි වර්ගයක් තිබෙනවා. "සත් කෝතල්" එකට දෙන්න 'විස් ක්ලෝත්' හදන්නය කියා තිබෙනවා. ඒ ගතුදෙනුව මොකක්ද කියන්නට මම දන්නේ නැහැ.

විජයපාල මෙන්ඩිස් මහතා
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)
පිටරට යවන්න.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)
පිටරට යවන්නය කියා කියනවා. තමුන්නාන්සේ මේ ගනුදෙනු කරන්නේ මොනවාටද කියන්න මම දන්නේ නැහැ. නමුත් ඕට වඩා ජේෂ කර්මාන්තය ගැන, සැලකිල්ලක් වෙනත් වෙනත් අංශවලින් තිබෙන බව අපට දකින්නට ලැබී තිබෙනවා. තමුන්නාන්සේගේ අමාත්‍යාංශයට වඩා මේ ගැන සැලකිල්ලක් වෙනත් අමාත්‍යාංශවල තිබෙනවා. දැන් ගරු වෙළඳ ඇමතිතුමා ජේෂ කර්මාන්තය සම්බන්ධයෙන් 'එක්ස්පෝර්ට් විලෙජස්' කියා ක්‍රමයක් හදගෙන යනවා. තමුන්නාන්සේ නොවෙයි. හැබැයි, 'ටෙක්ස්ටයිල් මිනිස්ටර්' තමුන්නාන්සේ තමයි. නිෂ්පාදනයේ පටන් වෙළඳාම දක්වා හැම දෙයක් ගැනම අයිතිවාසිකම තිබෙන්නේ තමුන්නාන්සේට බව ඇත්ත. නමුත් දැන් ගරු වෙළඳ ඇමතිතුමා ඒ විධියේ දෙයක් පටන් ගෙන තිබෙනවා. ඒ වාගේම ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන ඇමතිතුමාත් "ආර්ට ලයින් සෙන්ටර්" එකකුයි. "ඩිසයිනිං සෙන්ටර්" එකකුයි පටන්ගෙන තිබෙනවා. මේ 'ඩිසයිනිං සෙන්ටර්' එක සම්පූර්ණයෙන්ම මේ රටේ තිබෙන්නා වූ දේශීය දේවල් සැකසුම් කිරීමට කිව්වාම "ටෙක්ස්ටයිල්" එකත් එයට ඇතුළත් වෙනවා. එම නිසා මොකක්ද, වෙලා තිබෙන්නේ ? අන්තිමේදී ඇමතිතුමාට කිසිම දෙයක් ඉතුරු වෙන්නේ නැහැ. මහා කර්මාන්ත එහෙන් දුන්නා, විනයෙන් ලැබුණු සුළු කර්මාන්ත ගණයේ 'පවර් ලූම්ස්' දහෙන් කියන් හෝ ඉතුරු වී තිබුණා නම් ඒ ටිකත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලක්ෂ්මන් ජයකොඩි මහතා]

ටෙන්ඩර් මාර්ගයෙන් විකුණා දමා තිබෙනවා. ඒ වගේම, අත්යන්තු ටිකත් වසා දමා තිබෙනවා. දැන් පිටරට රෙදි ගෙන්වනවා. මේ රටේ රෙදි නිෂ්පාදනය සම්පූර්ණයෙන්ම විනාශ වේගෙන යමින් තිබෙනවා. එම නිසා මේ ගැන ටිකක් ඇහැ ඇරල බලන්න ඕනෑ. අර 'පවර් ලූම්ස්' දුන්නාට පස්සේ වෙලා තිබෙත්තේ මොකක්ද ?

රෙදි නිෂ්පාදනය පිළිබඳව සම්පූර්ණ සැලැස්මක් හැදිය යුතුව තිබෙනවා. [බාධා කිරීම්] ඇමතිතුමා ඒ වෙලාවට බෙරෙන්න ක්ෂණිකව කියනවා, 'අපි රෙදි ගෙන්වන්නේ නැහැ' කියා. නමුත් ඒ ප්‍රකාශය බොරුවක් නේද ? පිටරටින් රෙදි ගෙන්වනවානේ ? නමුත්නාන්සේ ඔළුව වනනවා. මේ ඇමතිතුමා තම් පිටරටින් රෙදි ගෙන්වන්නේ නැති බව ඇත්තයි. නමුත් ගෙන්වන නැත් තිබෙනවා.

විජයපාල මෙන්ඩිස් මහතා
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)

කවුද, ගෙන්වන්නේ ?

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

'සළු සල' ගෙන්වනවා.

විජයපාල මෙන්ඩිස් මහතා
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)

කවදද, අත්තිමට ගෙන්නුවේ ?

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

කවදද අත්තිමට ගෙන්නුවේ කියන්න මම දන්නේ නැහැ. ඇමතිතුමා කියන්නේ දැන් මේ රටට රෙදි ගෙන්වන්නේ නැහැ කියලාද ?

විජයපාල මෙන්ඩිස් මහතා
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)

ඇඟලුම් කර්මාන්තය සඳහා තම් ගෙන්වනවා. ඒවා ඇඟලුම් වශයෙන් ආපසු පිටරට යවනවා.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

ඇඟලුම් කර්මාන්ත සඳහා පමණක් නොවෙයි, රෙදි ගෙන්වන්නේ. ඇමතිතුමාගේ නීතිය තිබෙන්නේ තම් ඒ සඳහා පමණක් ගෙන්විය යුතුය කියා තමයි. නමුත් සමහර තැන්වල ගොඩගසා තිබෙනවා, පිටරටින් ගෙන්වූ රෙදි 'බේල්ස්' පිටින්.

විජයපාල මෙන්ඩිස් මහතා
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)

'ස්මග්ල්' කරන ඒවා තිබෙනවා.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக්ෂ්මන් ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

'බේල්ස්' දහස් ගණනින් ගොඩගැසී තිබෙන්නේ 'ස්මග්ල්' කරපු ඒවා පමණක්ද ?

විජයපාල මෙන්ඩිස් මහතා
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)

එච්චර නැහැ.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக්ෂ්මන් ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

ඇමතිතුමනි, නිකම් ඒ වෙලාවට බෙරෙන්න උත්තර දෙන්න එපා. මේ තත්ත්වය නිසා පහර වදින්නේ ඇමතිතුමා යටතේ තිබෙන කර්මාන්තයටයි. මම කලින් කිව්වා වගේ දැන් පේෂකර්මාන්තයේ විශාල කොටසක් දිලා ඉවරයි. හැම එකක්ම දිල අවසාන වෙලා දැන් ඇමතිතුමාට අත්තිමට ඉතුරු වෙලා තිබෙත්තේ හපය පමණයි. මේ තත්ත්වය යටතේ පේෂ කර්මාන්තය පිළිබඳ නියම පාලනයක් කරන්න ඇමතිතුමාට හැකියාවක් ලැබෙන්නේ නැහැ.

වෙනත් කර්මාන්ත වගේම පේෂ කර්මාන්තයත් කළ යුත්තේ මේ රටේ ජනතාවයි. මේ රටේ තිබෙන හැම කර්මාන්තයක්ම රජය මගින් හෝ වේවා, සමුපකාරය මගින් හෝ වේවා, පෞද්ගලික අංශයෙන් හෝ වේවා කෙරිය යුත්තේ ලාංකිකයන් විසිනුයි. දැන් තිබෙන තිහින-දිහින, කැත පුරුද්දක් තමයි, ලංකාවේ ධනය 'මැනේජ්මන්ට්' ක්‍රමය මගින් පිටරට යැවීම. හෝටල් ව්‍යාපාරය හෝ වේවා, වෙනත් ඕනෑම ව්‍යාපාරයක හෝ වේවා, තමන්ට කරගන්න බැරි නම් පිටරටින් ගෙන්වා ගනිමු කියනවා. ඔන්න ඔය ප්‍රතිපත්තිය තිසාම, බලන්න මහවැලියට මොකද වෙන්නෙ කියල. ලංකාවේ ඉන්න ඉංජිනේරුවරුන් එක් කෙනෙක්වත් ගත්තද ? ඔය විදේශිකයන් ඔය වැඩ ටික කරල තව ටික දවසකින් යන්න යයි. අවසානයේදී 'අස්වාන් ඩැම්' එකට සිදු වුණු දේ තමයි අපටත් වෙන්නෙ. ඇයි ? මෙහේ ඉන්න ඉංජිනේරු මහත්වරුන් මේ කිසිම දෙයකට සම්බන්ධ කරගන්නෙ නැහැ. ඔය වැඩේ නිසා—මේ ප්‍රතිපත්තිය නිසා, මේ මූලික ප්‍රතිපත්තිය නිසා—මොකද වෙන්නෙ ? අපේ දියුණුව ගැන හිතනවා නම් අපේ ව්‍යාපාර අපිම ආරම්භ කරන්න ඕනෑ. ඒ ගොල්ලන්ගේ විශේෂඥ දැනුම අපි අපේ ප්‍රයෝජනයට යොදු ගනිමු. ඒකට කමක් නැහැ. ඒක වෙනම දෙයක්. නමුත් 'මැනේජ්මන්ට්' එක විතරක් පිට අයට දෙන්න එපා. අපේ පරිපාලනය—පාලනය කිරීම—පිටතට දෙන්න එපා මොනවා කිව්වත් දේශීය මිනිහා දේශයට අදිනවා. විදේශීය මිනිහා විදේශයට අදිනවා. විදේශීය මිනිහා ලංකාවෙන් ගෙනියන්න පුළුවන් දෙයක් තිබෙනවා නම් ගෙනියනවා. අපි මේ ගැන බොහොම තදින් ඉන්න ඕනෑ. අන්න ඒකටයි ජාතිවාත්සල්‍යය කියන්නෙ. ඒකයි ජාතිමාමකත්වය කියන්නෙ. අපි මෙතැනට ඇවිත් කියනවා, අර තරම් නිෂ්පාදනය කළාය, මේ තරම් නිෂ්පාදනය කළාය කියා. නමුත් ඊට වඩා වැදගත් වෙන්නේ ජාතික නිෂ්පාදනයක් දීමයි. ජාතිය විසින් කරන ලද නිෂ්පාදනය තමයි ඊට වඩා වැදගත් වෙන්නෙ. ජාතික නිෂ්පාදනයක් දෙන්න පුළුවන් නම් අපට ඊට වඩා දෙයක් නැහැ. ඒ නිසා මම ගරු ඇමතිතුමාගෙත් ඉල්ලා සිටින්නේ පරදේශ ගනිය, පරදේශිකයන් ගෙන්වා ගැනීමේ ගනිය හිතින් අයින් කරගෙන දේශකත්වය ගැන ටිකක් කල්පනා කරන්න කියලයි.

1933 දී වරකය කරකවන්න පටන් ගත්තා. ඒ වගේම එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක ශ්‍රීත් වගේ උදවිය නිසා තමයි අපිත් රෙද්ද බැනියම අඳින්න පටන් ගන්නෙ. ඒ නිසා තමයි මේ රෙද්ද බැනියම මේ ගරු සභාවටත් ආවෙ. එද, ඒ යුගයේ සිටි උදවිය පටන් ගත් ඒ දේ තමයි, මේ. ඒ නිසා අපි අපේම දේ පටන් ගන්න ඕනෑ. කොටටලීන් පටන් ගත් අර වරකය කොයි තරම් දුර ගියාද බලන්න. ඒක තමයි ජාතිවාත්සල්‍යය කියල කියන්නෙ. කෙලින්ම කිව්වොත්, ජාතිවාදය කියා එය ඒ තරම් ශ්‍රේෂ්ඨ දෙයක් නොවෙයි. ජාතිවාදය ඕනෑ කෙනෙකුට ඕනෑ විධියකට ගත්තට පුළුවන්. නමුත් ජාතියට ළැදියාවක් අවශ්‍යයි. ජාතික කැක්කුමක් තිබෙන උදවිය අපි සොයා ගන්න ඕනෑ. ප්‍රශ්නයට මුහුණ දෙන්න පුළුවන් වන්නේ එවැනි උදවියටයි. ප්‍රශ්නය ඉදිරියට ගෙන යාමට හැකියාවක් තිබෙන්නේ එවැනි උදවියටයි. අන්න ඒකයි අපට වුවමනා කරන්නෙ. පරගැනි භාවයෙන් අපි ඇත් වෙන්න ඕනෑ. නමුත් අද ක්‍රමානුකූලව අපට තිබෙන දේත් දිල සුසුම් හෙළන තත්ත්වයට අප පත්ව සිටිනවා. එකම ව්‍යාපාරයක්වත් සුදුසු විධියට ක්‍රියාත්මක වෙන්නේ නැහැ කියා අපට සුසුම් හෙළන්නට සිදු වී තිබෙනවා. අන්න ඒ නිසා මේ අත් යන්ත්‍ර ව්‍යාපාරය දියුණු කරන්නය කියා මම ගරු ඇමතිතුමාගෙත් ඉල්ලා සිටිනවා.

මම හිතනවා, මේ ඊයේ-පෙරේදා 'ඩිසයිනි සෙන්ටර්' කියල එකක් ඇති කළා. ඒ 'ඩිසයිනි සෙන්ටර්' එකේ කරන්නෙ ඇඟලුම් කර්මාන්තයත්, රෙදි විවීම පුහුණු කිරීම කියල මම හිතනවා. අන්න එතැනදීත් වැදගත්ම කොටසක් අත්හැරියා. ගරු ඇමතිතුමාට පෙනෙන්න ඇති, එතුමා ඒ කරුණට එකඟ වුණා. මම ඒගැන තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙනවා. අත් යන්ත්‍රකරුවන්ගෙත් එක් පුද්ගලයෙක් එයට ඇතුලත් කර තිබුණේ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නමුත් එය වැරදි බව ගරු ඇමතිතුමා පිළිගත්තා. ඒ අවස්ථාවේදීවත් ඒ මනුෂ්‍යයා කෙරෙහි මතය යොදන්නෙ නැහැ. ඒ මනුෂ්‍යයා ශ්‍රේෂ්ඨයි කියල අපි පිළිගන්නෙ නැහැ. අපි පුරුදුවෙලා තිබෙන්නෙ ඒ විධියටයි. විදේශිකයා පරගැතියා තමයි මිතිහා. ඒ මිතිහා තමයි ශ්‍රේෂ්ඨවන්නයා. ඒ මිතිහාට කෝටියක් දුන්නත් කමක් නැහැ. ඔන්න එය වගේ ගතියක් දැන් ඔළුවට වැටිල තිබෙනවා. සමහරුන් නැම දෙයකටම ඉල්ලන්නෙ 'ෆෙපාරින් දේවල්' ගම්වල ඉන්න මිනිහාත් අහන්නෙ 'ෆෙපාරින් දේවල්' මෙන්න මේ පරගැති භාවය නිසා තමයි, යම් දවසක අපි අමාරුවේ වැටෙන්නෙ. ස්වාධීනත්වයක් කියා දෙයක් තිබුණා නම් ඒ ස්වාධීනත්වය දැන් නැතිව ගොස් තිබෙනවා.

අපේ පළාත්වල තිබුණු අත් යන්ත්‍ර මධ්‍යස්ථාන සියල්ලම වහගෙන වහගෙන ගියා. එක පාරටම ඒ යන්ත්‍ර දරට පලල ගන්න සිදු වුණා. අද ඒ එකක්වත් වැඩ කරන්නෙ නැහැ. තමුන්නාන්සේගේ කොට්ඨාශයේත්, මගේ කොට්ඨාශයේත්—අත්තනගල්ල කොට්ඨාශයේ—දිවුලපිටිය කොට්ඨාශයේත් අත් යන්ත්‍ර එකක්වත් වැඩ කරන්නෙ නැහැ. අපට තිබුණේ එය රැක ගන්නටයි. විදේශිකයින් රැක ගන්නවා නම් Protectionism කියල. අපිත් අපේ දේ රැකගන්න ඕනෑ. අපි ඒ විධියට නොකිරීම නිසා තමයි අමාරුවේ වැටෙන්නෙ. ඒ නිසා තමයි, අපේ ආර්ථිකයත් අමාරු තත්ත්වයට පත්ව තිබෙන්නෙ. රෙදි මිල ඉගිල යන්නෙත් ඒ නිසා තමයි. අපට ස්වයංපෝෂිත භාවයක් ලැබෙන්නෙ නැත්තෙත් ඒ නිසා තමයි.

සභාපතිතුමා
(தலைவர்)
(The Chairman)

Order, please ! The Sitting is suspended till 2 p.m.

රැස්වීම ඊට අනුකූලව කාවකාලිකව අත්සිටුවන ලදින්, අ. භා. 2 ට නැවත පවත්වන ලදී.

அதன்படி அமர்வு பி. ப. 2 மணிவரை இடைநிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று.

Sitting accordingly suspended till 2 p.m. and then resumed.

ආර්. එම්. ධර්මදස බණ්ඩා මහතා (නියෝජ්‍ය ජේෂකර්ම ඇමතිතුමා)
(திரு. ஆர். எம். தர்மதாச பண்டா — புடைவைக் கைத்தொழில் பிரதி அமைச்சர்)
(Mr. R. M. Dharmadasa Banda Deputy Minister of Textile Industries)

ගරු සභාපතිතුමනි, ජේෂ කර්මාන්ත අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ මෙතෙක් විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් දෙපොලක් කතා කරන්නට යෙදුණා. විශේෂයෙන්ම බලයේ සිටි ආණ්ඩුවල ප්‍රබල මන්ත්‍රීවරුන් දෙදෙනෙකු හැටියට එතුමන්ලා ජේෂකර්මාන්තය සම්බන්ධය ඉතාම හොඳ විවේචනයක් කරයි කියා අප බලාපොරොත්තු වුණා. අවසානයකට වාගේ පළමුවෙන්ම කතා කළ කලවාතේ ගරු මන්ත්‍රීතුමා (සරත් මුත්තෙට්ටුවෙගම මහතා) අපේ ආණ්ඩුව බජව් පාටියකට උපමා කර කතා කළා. එතුමා හිතන හැටියට අපි පසුගිය අවුරුදු දහයක කාලය තුළ බජව්වක් තටපු එක ඇත්ත. නමුත් අද එතුමන්ලා රෙදි පිළි ඇදගෙන මේ ගරු සභාව තුළ කතා කරන්නට පුළුවන් වීම ගැන අප සන්තෝෂ වෙනවා.

ගරු සභාපතිතුමනි, 1977 ට පෙර ඒ අයගේ ආණ්ඩුව අනුගමනය කළ ජේෂකර්ම ප්‍රතිපත්තිය ගැන, බොහොම වර්ණනා කළා. අඩුවට නූල් දුන්නාය, රෙදිපිළි දුන්නාය කිව්වා. නමුත් ඒ කාලයෙදි අපේ රටේ ජනතාව රෙදිපිළි ලබා ගත්තේ කොයි ආකාරයෙන්ද කියා කවුරුත් දන්නවා. ඒ කාලයේ එක් අයකුට ලබා ගත හැකි රෙදි ප්‍රමාණය යාර දෙකකට සීමා කර තිබුණා. ඒක ලබා ගන්නටත් පෝලිමේ යන්න සිදු වුණා. ඒ ආණ්ඩුවේ රෙදිපිළි ලබා දීමේ වැඩපිළිවෙල ගැන දිවංගත අපේ ආහාර සහ සමුපකාර ඇමතිතුමා දැන්වූ උදාහරණයක් මේ අවස්ථාවේදී මට මතක් වෙනවා. මම ඒ ගැන දැන් කියන්නට යන්නේ නැහැ. කෙසේ වුණත් අපේ අමාත්‍යාංශයෙන් දැන් කිසිම වැඩක් නැති බව කලවාතේ මන්ත්‍රීතුමා සඳහන් කළා. ඇත්තවශයෙන්ම අපේ අමාත්‍යාංශයෙන් කරන්නට දැන් වැඩක් නැති තත්ත්වයට රටේ රෙදි පිළි තිබෙනවා නම්, අපට ඒ ගැන සන්තෝෂ වෙන්නට පුළුවනි.

ගරු සභාපතිතුමනි, 1977 දී මෙම අමාත්‍යාංශය අලුතෙන් ඇති කළාට පස්සෙ, මාස කීපයක් තුළදී එම අමාත්‍යාංශය අපේ මේ ගරු ඇමතිතුමාට භාර ගන්න සිදු වුණා. එදා සිට මේ අමාත්‍යාංශයේ ප්‍රගතිය සඳහා කොයිතරම් වැඩ කර තිබෙනවාද කියා මෙයට පෙර අයවැය ලේඛන විවාදවලදීත් වෙනත් ස්ථානවලදීත් අප පැහැදිලි කර දී තිබෙනවා. නමුත් දැන් කලවාතේ ගරු මන්ත්‍රීතුමා ගෙන හැර පාත්තට උත්සාහ කළා. ජර්මනියෙන් ලැබුණු දැනට තුල්හිරියේ පිහිටුවා ඇති කම් රෙදි කර්මාන්ත ශාලාව සම්පූර්ණයෙන්ම විනාශ කර දමුවාය කියා. එතුමාගේ මේ කතාවට මට පුදුම හිතුණා. අපේ දක්ෂ කාර්මිකයො හිටියාය කියා එතුමා කියනවා. එතරම් දක්ෂ කාර්මිකයන් අපට සිටියා නම්, රෙදි නිෂ්පාදනයේ මේ තරම් අඩුවක් ඇති වෙන්නට හේතුව මොකක්ද කියා සිතා බලන්න ඕනෑ. එද රටට වුවමනා කරන රෙදිපිළි නිෂ්පාදනය කරන්නට ප්‍රමාණවත් තරම් නූල් කැටීමේ ධාරිතාවක් තිබුණේ නැහැ. රෙදි විවීමේ ධාරිතාවක් තිබුණේ නැහැ. ඒ වාගේම තිමවුම් කිරීමේ මුද්‍රණය කිරීමේ ධාරිතාවක් තිබුණේ නැහැ. අද ඒ තත්ත්වය සම්පූර්ණයෙන්ම වෙනස් කර රටට අවශ්‍ය ප්‍රමාණයට වඩා නූල් කැටීමේ ධාරිතාවක් ඇති කිරීම පිණිස අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර සවි කර තිබෙනවා. එපමණක් නොවෙයි, රාජ්‍ය සංස්ථා අංශයෙනුත්, පෞද්ගලික අංශයෙනුත් රෙදි විවීම මෙන්ම තිමවුම් කිරීමත් මේ රටට වුවමනා කරන ධාරිතාවටත් වැඩියෙන් නිෂ්පාදනය කිරීමට දැනට වැඩ පිළිවෙළ යොද තිබෙනවා.

ගරු සභාපතිතුමනි, තුල්හිරිය කර්මාන්ත ශාලාවේ සේවකයන් අස් කිරීම වැරදිය කියා එතුමා කියනවා. තුල්හිරිය සම්බන්ධ සම්පූර්ණ කතන්දරය එතුමා දන්නවා ඇති. 1971 සිට තුල්හිරිය කම්හලේ හරිහැටි පාලනයක් තිබුණේ නැහැ. එනැත එක් එක්කෙනාට ඕනෑ හැටියට කටයුතු කළා. කලවාතේ ගරු මන්ත්‍රීතුමා ජාතික සේවක සංගමය විවේචනය කරනවා. අපි ඇත්ත වශයෙන්ම ජාතික සේවක සංගමයට ස්තුතිවන්ත වෙනවා. ඒ කර්මාන්ත ශාලාව පවත්වාගෙන යන්නට අපට උදව් වුණේ ජාතික සේවක සංගමයයි. කලවාතේ මන්ත්‍රීතුමා නියෝජනය කරන පක්ෂයේත් අනික් පක්ෂවලත් වෘත්තීය සමිතිකාරයින් ඒක කඩාකප්පල් කරන්නට ගදන කොට අපට උදව් කළේ ජාතික සේවක සංගමයේ පිරිස්.

ජාතික සේවක සංගමයේ පිරිස් අපට උදව් කළ නිසා එවැනි කර්මාන්ත ශාලාවල ඒ අය කැපී පෙනෙන්නට පටන් ගත්තා. අද කියනවා ඒ අය ඒ තැන්වල පාලනය හාර අරන් තිබෙනවාය කියා. නැහැ. ඒ අයට පාලනය හාරදී නැහැ. ඒ අයට හාරදී තිබෙන්නේ කර්මාන්ත ශාලා ගෙන යන්නට අපට උදව් කිරීමේ කාර්යයි. ගරු ඇමතිතුමා මාසයකට වරක් ඒ වෘත්තීය සමිති නියෝජිතයන් ගෙන්වා-ජාතික සේවක සංගමයේ උදවිය පමණක් නොවෙයි අනික් අයත් ගෙන්වා-ඒ තිබෙන ප්‍රශ්න ගැන සාකච්ඡා කර ඒවා තීරවුල් කරනවා. ඒ සාකච්ඡාවලදී ජාතික සේවක සංගමය ප්‍රමුඛස්ථානය ගන්නවා. කලවාතේ මන්ත්‍රීතුමාගේ පක්ෂයේ සාමාජිකයන් යන එන මං තැනිව කළ වැරදි නිසා යන එන මං තැනිව කළ පාපතර ක්‍රියා නිසා අන්තිමේදී ඒ වෘත්තීය සමිතියෙන් ඉවත්වී ජාතික සේවක සංගමයට බැඳී සිටින බව මා කලවාතේ ගරු මන්ත්‍රීතුමාට මතක් කරන්නට ඕනෑ. එහෙම ජාතික සේවක සංගමයට බැඳුණු විශාල සංඛ්‍යාවක් ඉන්නවා. ජාතික සේවක සංගමය නියම පිළිවෙළට අපට උදව් කරගෙන යනවා ඒ කර්මාන්ත ශාලාවල පාලනය ගෙන යන්නට. එසේ වුණේ අපි කළ වරදක් නිසා නොවෙයි. කලවාතේ මන්ත්‍රීතුමාගේ පක්ෂයේ වෘත්තීය සමිතිවල හිටපු සාමාජිකයන් අද අපේ වෘත්තීය සමිතියේ තිලතල දරනවා

දේශීය කර්මාන්ත ඔක්කොම විනාශ වී ගෙන යනවාය කියාත් කලවාතේ ගරු මන්ත්‍රීතුමා කිව්වා. එතුමාගේ දැනගැනීම සඳහා අපේ අමාත්‍යාංශය යටතේ තිබෙන එක දේශීය කර්මාන්තයක් පිළිබඳව මොන ආකාරයේ දියුණුවක් ඇති වී තිබෙනවාද කියා මා කියන්නම්. ඇඟලුම් රෙදි කර්මාන්තය පිළිබඳ මේ රටේ විශේෂ උනන්දුවක් දැන් තිබෙනවා. අප බලයට එන කොට මේ රටේ ඇඟලුම් කර්මාන්ත නිෂ්පාදනයන් අපතයනය කර උපයා ඇති විදේශ විනිමය ප්‍රමාණය රුපියල් දස ලක්ෂ 131. 1982 වර්ෂයේ අවසානය වන විට ඇඟලුම් කර්මාන්තයෙන් අද උපයා තිබෙනවා දස ලක්ෂ 3912.4 ක විදේශ විනිමයක්. කලවාතේ ගරු මන්ත්‍රීතුමා කියන විධියට ජේෂකර්ම අමාත්‍යාංශය ඒ තරම් ප්‍රපාතයකට වැටුණා නම් ඇඟලුම් කර්මාන්තයෙන් පමණක් උපයන ලද දස ලක්ෂ 131 දස ලක්ෂ 3912.4 ක් දක්වා ඉහළ ගියේ කොහොමද කියන ප්‍රශ්නය මා එතුමාගෙන් අහනවා. දස ලක්ෂ 3912 ක විදේශ විනිමයක් උපයා තිබෙන මේ අපතයනයන්වලට හිදහස් වෙළඳ කලාපයේ නිෂ්පාදයනුත් අයිතියි. අමාත්‍යාංශය යටතේ, හිදහස් වෙළඳ කලාපයෙන් පිටස්තරව පවත්වාගෙන යන ඇඟලුම් කම්හල්වල අපතයනයන් ගෙන් දස ලක්ෂ 2000 කට වැඩි විදේශ විනිමයක් උපයා ගෙන තිබෙනවා. 1983 ජනවාරි සිට මේ අවුරුද්දේ අගෝස්තු දක්වා අපි දැනට උපයා තිබෙනවා විදේශ විනිමය දස

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. එම්. ධර්මදාස බණ්ඩා මහතා]

ලක්ෂ 3060.4 ක්. ඒ අනුව බලනවිට කිසිම සැකයක් නැතුව මේ අවුරුද්දේ දෙසැම්බර් 31 වන විට ගිය වුරුද්දේ ඉලක්කයටත් වඩා එහාට ගොස් අපට රුපියල් දස ලක්ෂ 4000 කට වැඩි විදේශ විනිමය ආදායමක් උපය ගන්නට පුළුවන් වෙනවා ඇති. පේෂකර්ම අමාත්‍යාංශය තුළින් මේ රටේ ඇහලුම් කර්මාන්තය ඒ අන්දමට නංවා තිබෙනවා නම් කලවානේ ගරු මන්ත්‍රීතුමා තවත් මොනවා බලාපොරොත්තු වෙනවාදැයි මා දන්නේ නැහැ.

ගරු සභාපතිතුමනි, ඇහලුම් කර්මාන්තයට වඩා මේ රටේ විදේශවිනිමය උපයන එකම කර්මාන්තය තමයි තේ කර්මාන්තය. එසේ නම් ඇහලුම් කර්මාන්තය මුළු ලංකාවේම විදේශ විනිමය උපයන ආදායම් මාර්ගවලින් දෙවන තැනට පත්ව තිබෙනවා. තේ කර්මාන්තයෙන් විදේශ විනිමය රුපියල් දස ලක්ෂ 6342 ක් අප උපයා තිබෙනවා. රබර්වලින් දස ලක්ෂ 2322 ක් උපයා තිබෙනවා. පොල්වලින් දස ලක්ෂ 1499 ක් උපයා තිබෙනවා. ඇහලුම් කර්මාන්තයෙන් දස ලක්ෂ 3912 ක් උපයා තිබෙනවා. ඇහලුම් කර්මාන්තයෙන් අපි ඒ තරම් විදේශ විනිමය ආදායමක් මේ රටට උපයා දෙනවා.

මේ රටට විදේශ ධනය ගලා එන කොට සමහර විට කලවානේ ගරු මන්ත්‍රීතුමාට ටිකක් අමාරු ඇති. නමුත් මම කලවානේ ගරු මන්ත්‍රීතුමාට කියන්නට කැමතියි, අනෙක් අංශ අමතක කළත් විදේශ විනිමය ඉපැයුම්වලින් පමණක් පේෂ කර්මාන්ත අමාත්‍යාංශය ඉතාම වැදගත් අමාත්‍යාංශයක් බවට පත්ව තිබෙනවාය යන්න.

අනික් කරුණු ගැනත් එතුමන්ලාට කියා දෙන්නට ඕනෑ. කලවානේ ගරු මන්ත්‍රීතුමාත් (යරත් මුත්තෙට්ටුවෙගම මහතා) ජවාගේම අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමාත් (ලක්ෂ්මන් ජයකොඩි මහතා) ඇසුවා, ඇයි විදෙශීන්ට මේවා දෙන්නෙ කියල. අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා ඉතාම පලපුරුදු මන්ත්‍රීවරයෙක්. අපි මේ එක පේෂ කර්මාන්තශාලාවක්වත් විදෙශීන්ට විකුණා නැහැ. මේවා අවුරුදු කීපයකට—අවුරුදු ගතකට—පරිපාලනය කරන්නට, රෙදිපිළි නිෂ්පාදනය කරන්නට ඒ අයට හාර දී තිබෙනවා පමණයි. ඒවායේ සම්පූර්ණ අයිතිය ලංකාණ්ඩුව සතුයි. එතුමා කියනවා අපි මේවා විදෙශිකයන්ට හාර දීපු එක වැරදිය කියා. එතුමා ඇසුවා මේවා දේශීය සමාගම්වලට දෙන්න බැරි ඇයි කියා. අපේ ඇමතිතුමා මෙම අමාත්‍යාංශය හාරගත් හැටියේම වාගේ මේවායේ හරිගස්සන්න පුළුවන් ස්ථාන හරිගස්සන්න පුළුවන් තැන්වලට හාරදීලා අනික් තැන්වල පරිපාලන කටයුතු හා නිෂ්පාදන කටයුතු කරන්න කියා දේශීය සමාගම්වලට හාර දුන්නා. ටික කලක් යන විට එතුමාට පෙනීගියා ඒක ටිකක් අසාර්ථකයි කියා. අපි දෙස් කියන්නෙ නැහැ, ඒ දේශීය සමාගම්වලට. නමුත් එසේ පෙනී ගිය නිසා ඊළඟට මේක ගොඩනඟන්නනම් විදේශික සමාගම්වලට හාර දිය යුතුය කියා එතුමා තීරණය කළා. ඒ අනුව එතුමා 1980 ජූලි මාසෙ ඒවා විදේශික සමාගම්වලට හාර දුන්නා.

ඒ මන්ත්‍රීතුමන්ලා දෙපළගේත්, පාර්ලිමේන්තුවේත්, රටේත් දනගැනීම සඳහා, එසේ හාර දුන්නාට පස්සෙ ඇති වී තිබෙන ප්‍රගතිය මම ටිකක් පැහැදිලි කරන්න කැමතියි. 1980 ජූලි මාසෙ හාර දෙන විට අපේ වෙයන්ගොඩ කර්මාන්තශාලාවේ නූල් කැවීමේ නිෂ්පාදනය දස ලක්ෂ .98 යි තිබුණෙ. 1981 ජූලි මාසෙ වන විට දස ලක්ෂ 1.38 ක් නිෂ්පාදනය කරන්න පුළුවන් වුණා. තුල්හිරිය, වෙයන්ගොඩ, පූගොඩ, මත්තෙගම සහ මින්තේරිය යන කර්මාන්තශාලා පහේම අපි 1980 ජූලි මාසෙ හාරගත්තා විට දස ලක්ෂ 4.91 ක්ව තිබුණු නිෂ්පාදනය 1981 ජූලි මාසෙ වන විට දස ලක්ෂ 7.82 දක්වාද වැඩි වී තිබෙනවා. 1982 ජූලි වන විට දස ලක්ෂ 7.74 හාර දීමෙන් පසු පලමුවෙනි අවුරුද්දේ වැඩි වීම සියයට ගණනකින් බැලුවොත් සියයට 59.2 ක් වැඩි වී තිබෙනවා. නමුත් මේ ගොල්ලන් කියනවා හාර දීම නරකයි කියා.

ඊළඟට වෙයන්ගොඩ, තුල්හිරිය, පූගෙඩ විවිත් අංශ ගැන බැලුවොත් ඒ කර්මාන්තශාලා තුනේම 1980 ජූලි වන විට — හාර දෙන අවස්ථාව වන විට — නිෂ්පාදනය කර තිබුණේ රෙදි මීටර් දශ ලක්ෂ 16.48 යි. 1981 ජූලි මාසෙ වන විට එය දස ලක්ෂ 20.75 දක්වා වැඩි වී තිබෙනවා. මේ වැඩි වීම අනුව අපට පේනවා ඒ කර්මාන්තශාලාවල විවිත් අංශයෙන් සැහෙන ප්‍රගතියක් ලබාගෙන තිබෙනවාය කියා.

ඊළඟට තිමහම් පිළිබඳ තත්ත්වය බලමු. 1980 හාර දෙන අවස්ථාවේ තිමහම් කිරීමට පුළුවන්ව තිබුණේ මීටර් දස ලක්ෂ 14.98 යි. 1981 වන විට මීටර් දස ලක්ෂ 23.46 දක්වා වැඩි වී තිබෙනවා. මේ සම්පූර්ණ කාලය තුළ වැඩි වීම සියයට ගණනින් බැලුවොත් තිමහම් කිරීම සියයට 8.86 කින් වැඩි වී තිබෙනවා. ඔය විධියට රෙදි නිෂ්පාදනය ආදි සෑම අංශයකට හාර දුන්නට පස්සෙ නිෂ්පාදනය වැඩි වී තිබෙනවා. ප්‍රගතියක් පෙන්වා තිබෙනවා. සමහර විට සමහරකට මේවා හිසරදයක් වෙන්න පුළුවනි. අපේ අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) මේවා ඔක්කොම දේශීය අයට දෙන්න ඕනෑය, දේශීය අය පමණක් මේවාට යොදන්න ඕනෑය කියා බොහෝම හොඳ කථාවක් කළා. එතුමා කිව්වා ජාතික මමත්වය ජාතික අභිමානය ආදි ඔක්කොම ඇති කරන්න ඕනෑය කියා. බොහෝම හොඳයි. අපි ඒවාට කීසි දෙයක් කියන්නෙ නැහැ. නමුත් මෙහි පරස්පර විරෝධයක් තිබෙනවා. එතුමා අපේ අමාත්‍යාංශයට යොජනාවක් ගෙනාවා, අපි දන්නෙම නැතුව. එතුමන්ලා ඉන්න කාලෙ — 1975 දීද කොහේද — සුඩාත් රජයක් සමග සාකච්ඡාවක් කරගෙන ගියාලු අපේ ධනස්කන්ධය එහාට යවා එහෙ කපු වවා මෙහාට ගෙන්වන්න. මම අහන්න කැමතියි එතුමාට යම් විධියකින් අපි කපු වවන්න එහාට සල්ලි යැවිවා නම් ප්‍රතිපත්තියක් අනුව එය පාලනය කරන්නේ කවුද කියා. ශ්‍රී ලංකාවෙන් ගිහිල්ලා පාලනය කරනවාද ? එසේ කපු වැවීමත් අපේ සල්ලි පාලනය කිරීමත් සුඩාත් රටේ මිනිසුන්ට දෙනවාද ? ඒ මන්ත්‍රීතුමා එහෙම යෝජනා කරනවා. අනික් පැත්තෙන් කියනවා මේවා පරිපාලනය කරන්න පිට රට මිනිස්සු මෙහාට ගේන්න එපාය, අපේ රටේ මිනිසුන්ට දෙන්නය කියා.

එපමණක් නොවෙයි ගරු සභාපතිතුමනි, ඊයේ පෙරේදා පත්‍රවල බොහෝම ලොකු ප්‍රසිද්ධියක් දී තිබුණා එතුමා නියෝජනය කරන පක්ෂයේ ගරු නායිකාව පිටරටකට ගිහින් ආපසු පැමිණීම ගැන. ඒ ගිහින් තිබෙත්තේ අසනීපයක් සඳහා ප්‍රතිකාර ගන්නයි. අසනීපය සුව කරගෙන මෙහෙ ආවාය කියා තිබුණා. ඒ ගැන අපි බොහෝම සන්තෝෂයි. අපි ප්‍රාර්ථනා කරනවා එතුමියට අපත් සමග තව බොහෝ කාලයක් මේ දේශපාලන හුමියේ ඉන්නට ලැබෙවා කියා. මේ එතුමා අදහන නායිකාවත් අසනීපයක් සැදුනාම පිටරටවලට ගිහින් සනීප කරගෙන එන්න යනවා. එතුමා අනික් පැත්තෙත් මෙතන ඇවිත් කියනවා අසනීපයක් ඇදී තිබෙන පේෂ කර්මාන්තය වෙනුවෙත් පිටරට විශේෂඥයන් ගොයාගෙන යන්න එපාය මෙහේ විශේෂඥයන්ට දෙන්නය කියා. මට තේරෙන්නෙ නැත්තෙ මේකයි. අඩු ගණනේ නායිකාවවත් අනුගමනය කරන්න. නායිකාවට අසනීපයක් සැදුණා. නායිකාවට ඕනෑ වුණා වෛද්‍ය ප්‍රතිකාර ගන්න පිටරට යන්න. අපි විවේචනයක් කෙළේ නැහැ. එතුමිය පිටරටකට ගියා වෛද්‍ය විශේෂඥ උපදෙස් ගන්නට. එතුමිය බොහෝම හොඳට සනීප වී ආවා.

එතුමියට ඕනෑ කර තිබුණේ සනීප වෙන්න. එතුමියට තිබුණේ දේශීය, විදේශීය විශේෂඥ ප්‍රශ්නයක් නොවෙයි. තමන්ගේ අසනීපය සනීප කරගන්නයි එතුමියට ඕනෑ කර තිබුණේ. එතුමියට ඒ වැඩේ කර ගන්නට පිටරට යන්න හොඳයි. අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමාගේ (ලක්ෂ්මන් ජයකොඩි මහතා) නායිකාව. ඒක වැරදියයි අපි කියන්නේ නැහැ. නමුත් එතුමා කියන හැටියෙන් මට පෙන්නේ එය වැරදි බවයි. මොටද ? අපි විදේශීය කට්ටිය මෙහාට හාර ගන්නා විට, පේෂකර්ම අමාත්‍යාංශය යටතේ ලෙඩ හැදී මැරෙන්ඩ වැටුණු ලෙඩෙක් වාගේ සිටි මේ විශාල කම්හල් පහ ගොඩ ගන්නට මේ පිළිබඳ විශේෂඥයන් අපි පිටරටින් ගෙන්වන විට එය වැරදියයි අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා කියන නිසා. අපි කළේත් එතුමාගේ නියිකාව කළ වාකමයි. අපේ ලෙඩා බෙරා ගන්නට පුළුවන් විශේෂඥයන් ඉන්නේ කොහේදයි අපි සොයා බැලුවා. සොයා බලා ගරු ඇමතිතුමා ඒ විශේෂඥයන් ගෙන්වා ඒ අයට ලෙඩා බාර දුන්නා. දැන් ඒ ලෙඩේ හොඳ වේගෙන එනවා. මෙය දියුණු වේගෙන එන බව මම සංඛ්‍යා ලේඛනවලින් පෙන්නුම් කළා.

අ. හා. 2.15

එපමණක් නොවෙයි. දැන් ඒ තත්ත්වයේ රෙදි ගැන රටේ ජනතාව තුළ සැහෙන ආශාවක්, ලොකු කැමැත්තක් තිබෙනවා. සන්තෝෂයක් තිබෙනවා. දේශීය නිෂ්පාදනවල තත්ත්වය මේකයි කියා හැඟීමක් තිබෙනවා. ඒ නිසා හිතේ එකක් තියාගෙන වෙන දෙයක් කතා කරන්න හදන්න එපායයි මම අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමාට කියනවා. තමන්ගේ ප්‍රතිපත්තිය කියන්න.

දේශීය වශයෙන් අපේ තාක්ෂණික විශේෂඥයන් මේ රටේ බෝකරන්න අපි දන් සූදානම් වෙනවා. ගිය ආණ්ඩුව එය කර තිබුණේ නැහැ. ගිය සුමානයේ අපි පනත් දෙකක් සඳහා මේ පාර්ලිමේන්තුවෙන් අවසර ගත්තා. එයින් එකක් අපේ සේවකයන් පුහුණු කිරීම සඳහා. අනෙක් එකෙන් අපි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තමුන්නාන්සේලාගේ විශේෂ අවසරය ගත්තා, ඇහැළුම් කර්මාන්තය සහ පේෂකර්ම අභ්‍යාස සහ සේවා මධ්‍යස්ථාන දෙකකට. ඒ දෙකෙන් අපි බලාපොරොත්තු වන්නේ අපට වුවමනා කරන තාක්ෂණික විශේෂඥයන් බිහිකිරීමටයි.

ඊට අමතරව අපි කටුබැද්දේ විශ්ව විද්‍යාලයේ පේෂකර්මාන්තය පිළිබඳ සේවක පාඨමාලාවක් දමා තිබෙනවා. එකේ දැනට කට්ටිය පුහුණු වෙනවා, අධ්‍යාපනය හදාරනවා. ඒ පිරිස එළියට ආ විට ආණ්ඩුවේ හෝ වේවා පෞද්ගලික අංශයේ හෝ වේවා, රෙදි කර්මාන්තයට යම්කිසි අධාරයක් ඒ අයගෙන් ලැබෙනවා. ගිය ආණ්ඩුව තිබුණු කාලයේ එහෙම එකක් කළේ නැහැ.

පෙබරවාරියේදී නැත්තම් මාර්තුවේදී අපි සේවා මධ්‍යස්ථාන, ඇඟැළුම් නිෂ්පාදන මධ්‍යස්ථාන ආරම්භ කරනවා. පේෂකර්ම අභ්‍යාස මධ්‍යස්ථානයක් පෙබරවාරියේදී නැත්තම් මාර්තුවේදී විවෘත කරන්නට කටයුතු සූදානම් කර තිබෙනවා. දැනටත් ඒ පිළිබඳ පාඨමාලා පවත්වාගෙන යනවා. දැනටත් ඒ සඳහා සේවකයන් පුහුණු කරනවා. දැනටත් අපේ කර්මාන්තශාලාවල සිටින අය අරගෙන පුහුණු කරනවා. ඒ අය පුහුණු වෙලා යම් දවසක මේ කර්මාන්තය බාර ගත් දවසට අපටත් කියන්නට පුළුවන් පිටරට විශේෂඥයන් අපට වුවමනා නැහැ, අප රටේ විශේෂඥයන් සිටිනවාය කියා. ඒ ටික කර ගන්න අපි මේ අමාත්‍යාංශය දැන් වැඩ කරගෙන යනවා. අපි එහෙම වැඩ කිරීම වැරදියයි කලවාතේ මන්ත්‍රීතුමා (සරත් මුත්තෙට්ටුවෙගම මහතා) කියනවා.

අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමන්ලා බලයේ ඉන්න කාලයේ තුල් මිල රුපියල් දහයයි එතුමා කිව්වා. මට පුදුමයි මේ ගැන. මම තුල් මිල ගැන ටිකක් හොයා බැලුවා. රුපියල් දහයට තිබිලා නැහැ. 1977 අපි ආණ්ඩුව බාරගන්න විට 20/2 මානයේ තුල් රුපියල් දහ තුනයි ශත හැත්තෑවයි. කිලෝ එකක් තොවෙයි, රාත්තලක්. 30 මානය රුපියල් පහළවයි ශත අසූ පහයි. 40 මානය රුපියල් දාහතයි ශත පහළවයි. 50 මානය රුපියල් විසි හතරයි. 30/2 මානය රුපියල් දහයයි ශත හැත්තෑවයි. මේ රාත්තලක මිල පමණයි. එතුමා කිව්වා රුපියල් දහයට තිබුණ කියා. මොනවද මම දන්නේ නැහැ. මෙන්න ඒගොල්ල ආණ්ඩුව බාර දෙන විට තිබුණු තුල් මිල.

අපි තුල් කිලෝ එකක මිල හදිසියේම රුපියල් දහයකින් වැඩි කළායයි එතුමා කිව්වා. ඒක ඇත්ත. දැනට අපට වුවමනා කරන කපු ඔක්කෝම වාගේ සියයට අනූ පහක්, අනූ හතත් විතරම ඒ අතරතුර ගණනක්, පිටරටින් අපි ගෙන්වන්නේ. කපු මෙහේ වවන්නේ ඉතාම ස්වල්ප වශයෙන් නිසා පිටින් ගෙන්වන්න වෙනවා. ලෝක වෙළඳ පොළේ කපු මිල සම්පූර්ණයෙන්ම තැග්ගා. පසුගිය ජූලි මාසයේදී වැඩි වුණා. ගිය මාසයේ, නොවැම්බර් මාසයේ සියයට 25 කින් වැඩි වුණා. පරණ තිබුණු මිලෙන් සියයට 25 කින් කපු මිල වැඩි වුණා. එහේ කපු මිල වැඩි වන විට අපට මෙහේ මිලත් වැඩි කරන්නේ නැතිව බැහැ. දැනට අපි රුපියල් හැත්තෑවක් ගෙවනවායයි ඒ ගරු මන්ත්‍රීතුමා කිව්වා. ඒ රාත්තලට තොවෙයි, කිලෝ එකකට. අපි දැන් මේවා විකුණන්නේ කිලෝ ගණත්වලින්. කිලෝ එකකටයි ඒ ගණන වැඩි වුණේ. ලෝක වෙළඳ පොළේ අපි කපු ගත්ත රටවල කපු මිල වැඩි වුණා. එහේ මිල වැඩි වෙන කොට අපට මෙහේ දරාගෙන ඉන්නට බැහැ. අපිත් ඒ මිල එකතු කරන්න ඕනෑ, අපේ නිෂ්පාදන මිලට.

ඒ මන්ත්‍රීතුමා කී පිළිවෙළට රෙදි මිලත් රුපියලකින් නැත්නම් 1.30 කින් පමණ වැඩි වී තිබෙනවා. අපි එය පිළිගන්නවා. තුල්වල මිල වැඩි වන විට රෙදිවල මිලත් ඒ ආකාරයෙන් වැඩි විය යුතුයි. අත්‍යන්ත පේෂ කර්මාන්තයට එය බොහොම ලොකු අමාරුවක් වී තිබෙනවා යයි එතුමා කිව්වා. එහෙම දෙයක් වේයයි මම නම් හිතන්නේ නැහැ. අත්‍යන්ත පේෂ කර්මාන්තයට සිදු වී තිබෙන්නේ ඒක නොවෙයි, වෙන දෙයක්. නමුත් මේ මිල වැඩිවීම මත අත්‍යන්ත පේෂ කර්මාන්තයට අපි පුළුවන් තරම් පහසුකම් දෙනවාද. ඒ පහසුකම් මත ඒ කර්මාන්තය ගෙන යන්න පුළුවන්ය කියන විශ්වාසය අප ළඟ තිබෙනවා.

අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) කිව්වා, අත්‍යන්ත පේෂ කර්මාන්තය ඔක්කොම ඉවරයි කියා. එතුමාට මිට කලින්ත් මම මේ කාරණය මතක් කර දී තිබෙනවා. මේ රටේ තිබෙන අත්‍යන්ත පේෂ කර්මාන්තයෙන් සියයට 45 ක් අයිති සමුපකාර සමිතිවලටයි. පේෂ කාර්මිකයින්ගේ සමුපකාර සමිති කියා සමිති 34 ක් මේ රටේ තිබෙනවා. දිස්ත්‍රික්කයකට එක බැගින් තිබෙනවා. සමහර දිස්ත්‍රික්කවලට දෙක තුන බැගිනුත් තිබෙනවා. ඒ පේෂ කර්මාන්ත සමුපකාර සමිති 34 නමයි, මේ රටේ අත්‍යන්ත පේෂ කර්මාන්ත මධ්‍යස්ථානවලින් සියයට 45 ක් පාලනය කරන්නේ. ඒවායේ බලයක් අපට නැහැ. අපි ඒ අයට ආධාර වශයෙන් ප්‍රදර්ශිකාවන් දී තිබෙනවා. එමෙන්ම මැෂින් හා ගොඩනැගිලි දී තිබෙනවා. නමුත් විවිම හා විකුණා ගැනීම කළ යුත්තේ ඒ සමුපකාර සමිති විසිනුයි.

ඒ සමුපකාර සමිතිවලට අපි පුළුවන් තරම් උදව් දී තිබෙනවා. වෙන අපට කරන්නට දෙයක් නැහැ. සමුපකාර සමිති පාලනය කිරීමට අපේ අමාත්‍යාංශයට කිසිම බලයක් නැහැ. ඒ සමුපකාර සමිති අද දුර්වල තත්ත්වයකට පත් වී තිබෙනවා. ඒ නිසාම සමහර මධ්‍යස්ථාන වැසෙන තත්ත්වයකට පත් වී තිබෙනවා. ඒ නිසා ගරු ඇමතිතුමා ඊයේ පෙරේදා සැම මන්ත්‍රීවරයෙකුටම ලියමනක් යැව්වා, ඒ අන්දමේ සමුපකාර සමිති දුර්වලතාවයක් නිසා තම තමන්ගේ ජන්ද කොට්ඨාශවල තිබෙන පේෂකර්ම මධ්‍යස්ථාන වැසී යනවා නම් ආරම්භක පළමු වන පියවර වශයෙන් එයින් මධ්‍යස්ථාන 3 ක් ආරම්භ කර දෙන්න අපි ලැහැස්තියි ඒ නිසා එසේ කර දෙන්නට ඕනෑ මොන මොන මධ්‍යස්ථානදැයි කරුණාකර යෝජනා කර එවන්නය කියා. ඒ මධ්‍යස්ථාන ආරම්භ කරන්නේ පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව මාර්ගයෙන්. පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ඒවා පාලනය කරනවා ඇති. ඊට පසුව ඒවා වැසෙන තත්ත්වයකට එන්නේ නැහැ. ඒ ස්ථානවලට අපි තුල් සපයනවා. ඒ ළමයින්ට පඩි ගෙවනවා. ඒවායේ නිෂ්පාදන විකුණා ගැනීමටත් පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ කටයුතු කරනවා ඇති. ඒ හැර වැසී ගොස් තිබෙන සමුපකාර සමිතිවල මධ්‍යස්ථාන සම්බන්ධයෙන් වග කියන්නට අපි සූදානම් නැහැ. එහෙත් එය බලා ඉන්නට බැරි නිසා අපි අර විධියේ පියවරක් ගන්නවා. මේ තත්ත්වය අපට තේරුම් ගිය නිසා 1978 දී හෝ 1979 දී සමුපකාර සමිති සතුව තිබුණු මධ්‍යස්ථාන සියල්ලම දෙපාර්තමේන්තුවට පවරා ගන්නට ගරු ඇමතිතුමා තීරණය කළා. ඒ අනුව වැඩ පිළිවෙල සකස් කර ගෙන යන විට "එය ලොකු අසාධාරණයක් ඒක කරන්න එපා" යයි කියමින් සමුපකාර සමිති ලොකු ව්‍යාපාරයක් ගෙන ගියා. ඒ නිසා අපි එය නවත්වා සමුපකාරවලටම ඒවා ගෙන යන්න ඉඩ දුන්නා. දැන් තැවත වරක් සමුපකාරවලට එය කර ගෙන යන්න බැරි වී තිබෙනවා. ඒ නිසා තමයි, අපි මේ පියවර ගත්තේ.

පළමු පියවර වශයෙන් මධ්‍යස්ථාන කීපයක් ගත්තවා. ඊට පසුව දෙපාර්තමේන්තුව මගින් විවෘත කළ යුතු තවත් ඒවා තිබෙන බව පෙනී ගියහොත් අපි තවත් කීපයක් විවෘත කරනවා. එවිට අත්‍යන්ත පේෂ කර්මාන්තකරුවන්ට කිසිම අයුක්තියක් හෝ අසාධාරණයක් සිදු වන එකක් නැහැ. අනික් සියයට 55 ගෙන යන්නේ දෙපාර්තමේන්තුව මගින් හා පෞද්ගලික අංශය මගින්. ඒ කිසිම තැනකට කරදරයක් සිදු වී නැහැ. දෙපාර්තමේන්තුව මගින් පවත්වා ගෙන ගිය කිසිම මධ්‍යස්ථානයක් වසා තැහැ. ඒවා තවත් වැඩි කර තිබෙනවා. සේවා මධ්‍යස්ථාන තමන් ඇති කර තිබෙනවා ; ජනසල තමන් මධ්‍යස්ථාන ඇති කර තිබෙනවා. තවත් නිෂ්පාදන ඒකක කීපයක්ම ඇති කර තිබෙනවා. අපි ඒවා වැඩි කර ගෙන යනවා. සමුපකාර මධ්‍යස්ථානත් ආවාට පසුව ඒ සියල්ලක්ම හොඳට පාලනය කරන්න අමාත්‍යාංශයට පුළුවන්කම ලැබෙනවා. දැනටමත් අර සියයට 55 හොඳට වැඩ කරනවා. අපනයනයත් කරනවා. ඒවා ගැන වචනයක්වත් කථා කරන්නේ නැහැ. එතුමන්ලා හන් අවුරුදු පාලන කාලය තුළ කොපමණ අපනයනය කර තිබෙනවාද කියා මම අහන්න කැමතියි. අපි දැන් අත්‍යන්ත පේෂ කර්මාන්තයෙන් අපනයන කටයුතු කරනවා.

ගිය සභයේ ගරු ජනාධිපතිතුමා අපනයනකරුවන්ට සම්මාන දුන්නා. අපනයනකරුවන් 9 දෙනෙකුට දුන්නා එයින් එක්කෙනෙක් තමයි සඵසල. පසුගිය අවුරුද්දේ සඵසල අපනයනය කර තිබෙනවා ලක්ෂ 12 ක් වටිනා අත්‍යන්ත රෙදිපිළි. නමුත් අපේ පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව ලක්ෂ 25 කට වඩා වටිනා අත්‍යන්ත රෙදිපිළි අපනයනය කර තිබෙනවා. එහෙත් වැඩියෙන්ම අපනයනය කර තිබෙනවා කියන්නේ සඵසලයි. මම ඒ ගැන තර්ක කරන්න යන්නේ නැහැ. නමුත් මේ අමාත්‍යාංශය යටතේ තිබෙන දෙපාර්තමේන්තුවෙන් ලක්ෂ 25 කට වඩා වටිනා රෙදිපිළි අපනයනය කර තිබෙන බව කියන්නට ඕනෑ. ඊට අමතරව තවත් ලක්ෂ 26 ක පමණ රෙදිපිළි වකු විධියෙන් අපනයනය කර තිබෙනවා. ඒ ගරු මන්ත්‍රීතුමා කී විධියට "විස්කලෝන්" හද, කෝතල් සමාගමෙන් ඒවා සම්පූර්ණයෙන්ම අපනයනය කර තිබෙනවා. ඒ අනුව ලක්ෂ 55 කට කිට්ටු වන මුදලක අත්‍යන්ත රෙදිපිළි පමණක් පසුගිය අවුරුද්දේ අපි අපනයනය කර තිබෙනවා. මේ අවුරුද්දේ ඒ ප්‍රමාණය අපි වැඩි කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. එම්. ධර්මදස බණ්ඩා මහතා]

අපි තවත් අපතයන ගිවිසුම්වලට එළඹෙනවා. අපි ඒවා වැඩි කරනවා. නමුත් එතුමන්ලා අත් යන්තු පේෂ කර්මාන්තය විනාශයි කියා අද විලි ලජ්ජා නැතිව කථා කරනවා. අපි පිළිගන්නවා විනාශයි කියා එක අංශයකින්. එතුමන්ලා කියනවා මේ පේෂ කර්මාන්තය සඵසල කරනවාය, වෙළඳ අමාත්‍යාංශය කරනවාය, නොත්ඩමන් ඇමතිතුමාගේ සුළු කර්මාන්ත දෙපාර්තමේන්තුවෙන් "ආට් ලයින්" කියා කරනවාය ආදී වශයෙන්. ඒ ඔක්කොම ඇත්ත. ඒ සැම තැනකින්ම රෙදි නිෂ්පාදනය වෙනවා. පෞද්ගලික අංශයෙනුත් කෙරෙනවා, සමුපකාර අංශයෙනුත් කෙරෙනවා. නමුත් එතුමන්ලාට පොඩ්ඩක් මතක නැතිවුණා. අපි මේ සියයට 55 ක් කරන්නෙ පෞද්ගලික අංශයෙන් බව. දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන ආයතනත්, වැඩි දියුණු වෙලා දැන් සෑහෙන රෙදි ප්‍රමාණයක් පිටරට යවා තිබෙනවා. එක ආයතනයක් ජනාධිපති සම්මානත් ලබා තිබෙනවා.

එපමණක් නොවෙයි, නමුත්නාත්සේට මතක් කර දෙන්නට ඕනෑ. අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා විවේචන කළා අපේ අමාත්‍යාංශය මේ බලවේග මධ්‍යස්ථාන ටික ඔක්කොම විකුණලාය කියල. ඔක්කොම විකුණලා නැහැ. දෙපාර්තමේන්තුවෙන් ටිකක් දැනටමත් දුවවනවා. කිහිපයක් පෞද්ගලික අංශයෙටත් දී තිබෙනවා. එතුමා කිව්වා පෞද්ගලික අංශයට දුන්නු එක වැරදියි කියා. සමහර දේවල්වල වැරදි ඇති. කරුණාකරලා එහෙම ඒවා අපට කියන්න. එතුමා කිව්වා ඒ සේවකයින් සේවා කොන්දේසි අත්සන් කළා කියා. නමුත් ටෙන්ඩර් කර හාර දෙනවිට අපි දමූ කොන්දේසියක් තමයි එක් සේවකයකුවත් අස් කරන්න බැහැ කියන එක. ඒ අනුව සෑම සේවකයකුවම සේවයට ගත්තා. එසේ ගත්තාට පසුව සේවකයින්ගේ වරදින් වෙන්නට පුළුවන්, සමහර වෙලාවට ආයතනයේ තිබෙන දඩි නීතිරීති නිසා වෙන්නට පුළුවන් සමහර අය අස්වෙනවා. එවැනි යම් යම් කරදර තිබෙනවා නම් අපට කියන්න. පැමිණිළි කළ ආයතන සම්බන්ධව අපි කටයුතු කර තිබෙනවා. නමුත් එතුමා කිව්ව විධියට අපි දන්නෙ නැහැ කොහෙද තවත් කරදර වෙලා තිබෙන්නෙ කියා. එතුමා කිව්වා අවිස්සාවේල්ලෙ හා තවත් තැනක එවැනි කරදර සිදුවුණා කියා. නමුත් ඒවා ගැන අමාත්‍යාංශයට ආරංචි ලැබී නැහැ. මම එතුමාට කියනවා කරුණාකර ලියා එවන්න කියා.

ඒ වාගේම අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා කිව්වා, බලවේග කම්හල් දුන් එක වැරදියි කියා. නමුත් එතුමාට මම කියනවා ඊයේ පෙරේදා පුවත්පත් බලන්න කියා. අපි ඒ දුන් එක ආයතනයක්, එතුමා විවේචනය කළ එක ආයතනයක්, පොල්ගොල්ල ආයතනය. ඒ ආයතනයෙන් කළ අපතයන් සඳහා ජූවෙල් ආට්ස් සමාගම ජනාධිපති සම්මානයක් ලබා තිබෙනවා. අමු රෙදි අපතයනය කර සම්මානයක් ලබා තිබෙනවා. ඉස්සර අමු රෙදි අපතයනය කළේ නැහැ. හුඟ දෙනෙක් ඉල්ලුවේ අමු රෙදි පිටරටින් මෙහාට ගෙන්නවන්නයි. නමුත් දැන් මෙහෙන් අමු රෙදි පිටරට යවනවා. පසුගිය අවුරුද්දේ මෙහෙන් නූල් එහාට යවලා ජනාධිපති සම්මානත් ලබාගත්තා. ඒ වාගේම අත් යන්තු රෙදි යවා මෙවර ජනාධිපති සම්මාන ලබාගෙන තිබෙනවා. ඒ අත්දමට මේවා දියුණු කරගෙන එන බව මම අපේ අත්තනගල්ලේ මන්ත්‍රීතුමාට මතක් කරන්න ඕනෑ.

ගරු සභාපතිතුමනි, මම මීට වඩා නමුත්නාත්සේලාගේ කාලය ගන්නට බලාපොරොත්තු වෙන්නෙ නැහැ. නමුත් මේ ටිකත් මතක් කරන්නට ඕනෑ. මේ පේෂ කර්මාන්ත අමාත්‍යාංශයේ බලාපොරොත්තුව තිබුණේ එද සිටම අපේ රටට වුවමනා කරන රෙදි ටික බලවේග කම්හල් මගින් වේවා, විශාල කර්මාන්ත ශාලා මගින් වේවා, අත් යන්ත්‍ර මගින් වේවා නිෂ්පාදනය කර දෙන්නටයි. ගරු ඇමතිතුමා කී විධියටම ඒවා දියුණු කරගෙන ඇවිත් තිබෙනවා. අවුරුද්දක් පාසාම අපට පුළුවන් වී තිබෙනවා දේශීය නිෂ්පාදන, දේශීය අවශ්‍යතාවයට සරිලන තත්ත්වයකට ගෙනෙන්නට. එතුමා කී විධියට, ඔක්කොම ඉල්ලන්නෙ "ෆෙපාරින්, ෆෙපාරින්" කියලයි. ඒ ගැන අපට කරන්නට දෙයක් නැහැ. නමුත් දැන් අපි හදුනාගෙන තිබෙනවා මොනවද මේ "ෆෙපාරින්" කියා ඉල්ලන්නේ කියා. ඒවා දෙන්න අපි දැන් සූදානම්. අත්තගල්ලේ මන්ත්‍රීතුමා අපට දෙස් කිව්වා, අපි මිත්තේරිය වහලා දමා තිබෙනවා කියා. මිත්තේරිය නැවත විවෘත කළාම එතුමාට පෙනේවි තත්ත්වය මොකක්ද කියා. කෘත්‍රිම නූල් එහි නිෂ්පාදනය වෙනවා. "ෆෙපාරින්" කියා මේ ඉල්ලමක් තිබෙන්නේ කෘත්‍රිම නිෂ්පාදන වලටයි. ඒ නිසා ඒ කෘත්‍රිම රෙදි වැඩියෙන් නිෂ්පාදනය කරන්නට අපි කටයුතු කරගෙන යනවා.

මේ තිබෙන්නේ අපි පූගොඩ කර්මාන්ත ශාලාවේ නිෂ්පාදනය කර තිබෙන දේවල්. කාගේත් දැන ගැනීම සඳහායි මේ කියන්නෙ. අත්තනගල්ලේ මන්ත්‍රීතුමා දන් මෙතැන තැතිවීම ගැන මම කණගාටු වෙනවා. ගරු සභාපතිතුමනි, මේවා මාර්කට් එකේ විකුණන්නේ "ෆෙපාරින්" කියලයි. ඒ නිසා අපි සැම එකකම පූගොඩ කියලා ගහලා තිබෙනවා. මොකද මේ ඔක්කොම "ෆෙපාරින්" කියා රුපියල් හතරක් පහක් වැඩියෙන් විකුණනවා. මෙතැන තිබෙන හොඳම වැඩේ අපේ තියෝජිතයන්ටම මේවා "ෆෙපාරින්" කියලා විකුණන එකයි. අපි දැන් ඒගොල්ලන්ට කියලා තිබෙනවා එහෙම අය ආවාම මෙන්න ඔවාම අපි ලඟ තිබෙනවා, මේ "ලෝකල්" කියලා දෙන්න කියා. දැන් ඒ නිසා ටිකක් අර "ෆෙපාරින්" කියන කැගැහිල්ල නැතිවී තිබෙනවා. එද සිටම ලංකාවේ හැම දෙයක්ම විකුණුවේ "ෆෙපාරින්" කියලා. අපේ මේ පූගොඩ රෙදින් විකුණන්නෙ එහෙමයි. ඒක තමයි අර මන්ත්‍රීතුමා කිව්වෙ, හරියට "ෆෙපාරින්" රෙදි ගොඩ ගැහිලා මාර්කට් එකේ තිබෙනවා කීවා. ඒක ඇත්ත, මේවා තමයි ගොඩගැහිලා තිබෙන්නෙ.

ගරු සභාපතිතුමනි, කොයෙක් වැරදි ආකාරවලින් පිටරටවලින් මෙරටට රෙදි එනවා ඇති. නමුත් පේෂ කර්මාන්ත අමාත්‍යාංශයට ඒ ගැන කිසි දෙයක් කරන්න බැහැ. අපට දී තිබෙන වගකීම රෙදි නිෂ්පාදනය කිරීමයි. අපි එය කර තිබෙනවා. පුළුවන් තරම් දුරට අඩුම මිළකට දිම සඳහා අපි රෙදි නිෂ්පාදනය කර තිබෙනවා. අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) කිව්වේ මොකක්ද ? එතුමා කිව්වා, " රෙදි මිල වැඩියි " කියා. 1977 දී රෙදි මිලත් අද රෙදි මිලත් සංසන්දනය කර බලන්න. නිකත් බඩු සමග සංසන්දනය කර බලන්න. මේ කාලය තුළ අඩුම ගණනකින් මිල වැඩි වී තිබෙන්නේ රෙදිවල පමණයි. අනික් සෑම දෙයකම මිල ඊට වඩා වැඩි වී තිබෙනවා. නමුත් අපි උත්සාහ කරන්නේ පුළුවන් තරම් රෙදි අඩු මිලකට දෙන්නයි. මේ නිසා " කර්මාන්ත ශාලාව ගෙන යන්න බැහැ, පාඩුයි, රෙදි සඳහා වෙනත් මිලක් දෙන්න " කියා රෙදි නිෂ්පාදනය කරන අය කෑ ගහනවා. අපි පුළුවන් තරම් උත්සාහ දරන්නේ ඒ අය සමග සුහදව සාකච්ඡා කර, පාලනය කර ගෙන පුළුවන් තරම් අඩුම මිලකට පාරිභෝගිකයාට රෙදි ලබා දෙන්නයි. " රුපියල් 16 මිල වැඩියි " කියා පැමිණිලි කරන්නට තවම පාරිභෝගිකයන් ආවේ නැහැ. නමුත් ඒ මිල වැඩියි කියන පුද්ගලයන්ම එය හිඳහසට හේතුවක් කර ගන්නවා විදේශ රෙදි ගැනීමට. නමුත් විදේශ රෙදි ගන්නේ කීයටද ? මම ඒ මිල ගැන කිසි දෙයක් කියන්න යන්නේ නැහැ. මම කිව්වේ, සැම අංශයකින්ම අපි මිල වැඩි කර ගෙන ආ බවයි.

අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා කිව්වා, අපනයන කරුවන් සමග අපේ සම්බන්ධීකරණයක් – Co-ordination – නැතැයි කියා. අපතයන කරුවන් සම්බන්ධයෙන් අපේ අමාත්‍යාංශයෙන් කොයිම වේලාවක හෝ ප්‍රමාදයක් සිදු වී නැති බව මා එතුමාට කියා සිටිනවා. අපනයන කරුවන් හාණ්ඩ නිෂ්පාදනය කර ගෙන යන විටයි අපෙන් ඉල්ලීම් කරන්නේ. එවිට අපි ඒ අවස්ථාවේදීම අපේ ඉන්ස්පෙක්ටර්ස්ලාව යවනවා, වුවමනා කරන ඕනෑම වේලාවක අපනයන බලපත්‍ර දීමට අපි සූදානම්. අපෙන් කිසිම ප්‍රමාදයක් නැහැ. මා හිතන හැටියට බැංකුවලින් හරි, එහෙම නැත්නම් ෂිපින් ඒජන්ට්ස්ලාගෙන් හරි එහෙමත් නැත්නම් කස්ටම් එකෙන් හරි ප්‍රමාද වෙනවා නම් ඒවා ඒ තැන්වලින් බලා ගත්ත. සමහර විට ප්‍රමාද වීමට හේතුවක් තමයි නියම විධියට ලිපි ලේඛනාදිය සකස් නොකිරීම ; ගණන් හිලව් නියම විධියට සකස් කර නැහැ. බොහෝ වේලාවට ඉලක්කම්වල වැරදි තිබෙනවා. එවැනි දේවල් නිසා පොඩි ප්‍රමාදයක් සිදු වෙනවා. නමුත් ඒවා අපේ වැරදි නොවෙයි. ඒවා අපතයන කරුවන්ගේ වැරදි. අපේ අමාත්‍යාංශයෙන් ප්‍රමාදයක් වෙන්නට ඉඩ තබා නැහැ. සමහර වේලාවට ඒ අය, එයාර් ප්ලයිට් එකෙන් යවන්න බලපත්‍ර ඉල්ලනවා. එවැනි අවස්ථාවල පැය 1/2 ක් බලපත්‍ර ලබා දී තිබෙනවා. අපට පුළුවන් ඉක්මනින් අපි ඒවා ලබා දෙනවා. අපි ඒ අයට උදව් කර තිබෙනවා. අපි එහෙම උදව් නොකළා නම් දස ලක්ෂ හාරදහකට කිට්ටු වෙන්න විදේශ විනිමය ප්‍රමාණයක් උපයා ගැනීමට අපට කටයුතු කරන්න බැහැ. අපි ඒවා තවතවත් ඉක්මන් කරන්නටයි, වැඩ කටයුතු කර තිබෙන්නේ.

සමහර අවස්ථාවලදී අපට බනිනවා, පිටරටින් රෙදි ගෙන්වනවාය කියා. ගරු ඇමතිතුමා ප්‍රකාශ කළා වගේ අපි 1981–82 වර්ෂය සඳහා පිටරටින් ගෙන්වනනට ඉඩ දුන් රෙදි මීටර් දස ලක්ෂ දහය හැරෙන්නට අද වනතුරු එක රෙදි මීටරයක්වත් මේ රටට ගෙන්වන්නට ඉඩ දීලන් නැහැ ; ගෙනාවෙත් නැහැ. සඵසල පිටරටින් රෙදි ගෙන්වනවාය කිව්වා. නමුත් එදාට පසුව අද වනතුරු සඵසලවත් පිටරටින් මෙරටට රෙදි ගෙන්වා නැහැ. සඵසලත් දේශීය නිෂ්පාදන තමයි ගබඩා කරගෙන යන්නේ; බෙදාගෙන යන්නේ. නූල්හිරිය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කර්මාන්තශාලාවෙන්, වෙයත්ගොඩ කර්මාන්තශාලාවෙන් පූගොඩ කර්මාන්තශාලාවෙන් පමණක් නොවෙයි බලවේග පේෂකර්මාන්ත ශාලාවලිනුත් සළුසල රෙදි මිලදී ගෙන මේ රටේ සෑම තැනකටම බෙදා හරිනවා. ඒ අනුව සළුසලවත් රෙදි ආනයනය කර නැහැ. එහෙම නම් අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමාට මා කියන්නේ පිටරටින් රෙදි ගෙන්වනවා නම් ඒ ගෙන්වන අය කවුද කියලා අපට කියන ලෙසටයි. එවිට අපට පුළුවන් තත්ත්වයෙන් අපි එය නතර කරන්නම්. අපේ අමාත්‍යාංශය එයට සම්බන්ධ නැහැ. අපේ අමාත්‍යාංශයට එයට වගකියන්නෙත් නැහැ. නමුත් ඒවා නතර කිරීමට පුළුවන් මහන්සියක් ගන්නා බවට ප්‍රතිඥාවක් එතුමාට දෙන්න අපි සූදානම්.

ගරු සභාපතිතුමනි, අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා කිව්වා මිත්තේරිය කම්හල විවෘත කරන්නේ නැතිව මිත්තේරිය අතුරු මැතිවරණය තියන්න බැහැ කියා. ඒ වාගේම ඒ අතුරු මැතිවරණය කල්යාවි යයි කීවා. අතුරු මැතිවරණ තියන්න තීරණය කරන්නේ මම නොවෙයි; අපේ ඇමතිතුමා නොවෙයි. ඒ ගැන තීරණය ගන්නේ ජනාධිපතිතුමා. ඕනෑ දවසක එය කියන්න ජනාධිපතිතුමා තීරණය ගන්නාවේ. නමුත් අපට එකක් කියන්න පුළුවන්. ඉතාමත් ඉක්මනින් මිත්තේරිය කම්හල නැවත විවෘත කිරීමට අපේ ඇමතිතුමා විශාල උත්සාහයක් දරනවා. එය සාර්ථක වෙන බවට පෙරනිමිති තිබෙන බව මා මතක් කරනවා.

අපේ අමාත්‍යාංශය ගැන කළ විවේචනය ගැන අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමාටත් (ලක්ෂ්මන් ජයකොඩි මහතා), කලවානේ ගරු මන්ත්‍රීතුමාටත් (සරත් මුත්තෙට්ටුවෙගම මහතා) මම ස්තුතිවන්ත වෙනවා. අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා "දිවයින" පුවත්පතේ සඳහන්ව තිබුණු පුවතක් ගැන සඳහන් කරමින් රෙදි මිල වැඩි කළාය කුල් මිල වැඩි කළාය යනාදී වශයෙන් කිව්වා. මේවා රහස් නොවෙයි. ඒ අතරතුර දෙපාර්තමේන්තුවේ රෙදි වර්ගයක් හතකුත් ගණනකට විකුණුවාය කියලත් සඳහන් වෙනවා. ඒ මොනවාද කියලා දන් අපි බැලුවා. ඉතාමත් දුහුල් රෙද්දක්; බැන්ඩේජ් වගේ රෙදි වගයක්; හරස් නූල් දිග් නූල් අඩු කරලා වියන රෙද්දක්; අමු රෙද්දක්. ගිවිසුමක් යටතේ ඒ දෙපාර්තමේන්තුව ඒ රෙද්ද එක ආයතනකට සපයනවා, අඩු මිලකට, ඒක අමු රෙද්දක්. දන් ඒකෙත් මිල වැඩි කරලා නූල් මිල වැඩි වුණු නිසා. එතුමා කවුරුත් හරි එවනවානම් ඒ මිලටම දෙන්න පුළුවන්. හැබැයි, දුහුල් රෙද්දක් රුපියල් 16ට ගන්නට තිබෙන රෙද්ද කොවෙයි. හරස් නූල්, දිග් නූල් අඩුවෙන් බැන්ඩේජ් විධියට වියන දුහුල් රෙද්දක්. ඒ නිසා නමයි අඩු ගණනට දෙන්නේ. මම මෙය සඳහන් කළේ නැත්නම් මෙයත් වැරදි විධියට ප්‍රචාරය යන්නට පුළුවන්.

මට පසුව කථා කරන මන්ත්‍රීතුමන්ලාගේ අදහස්ද, වැදගත් යෝජනාද මෙම කර්මාන්තය නංවාලීමට උපයෝගී කර ගන්නට සූදානම් බව ප්‍රකාශ කරමින් අපේ සියලුම වැඩවලට උදව් උපකාර වුණු ලේකම් මහතා ඇතුළු අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ සියලුම සේවක මහත්වරුන්ට ස්තුති කරමින් මම නවතිනවා.

අමරසිරි දෙඩන්ගොඩ මහතා (බද්දේගම)
(திரு. அமரசிறி தொடங்கொட — பத்தேகம)
(Mr. Amarasiri Dodangoda-Baddegama)

ගරු සභාපතිතුමනි, ඉතාමත් වැදගත් කාර්ය භාරයක් මේ රටේ ජනතාව වෙනුවෙන් ඉටු කරන අමාත්‍යාංශයක වැය ශීර්ෂය පිළිබඳව අදහස් දැක්වීමට අවස්ථාව ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා. ඒ මන්ද, මේ රටේ ජනතාවගේ ආහාර නිෂ්පාදනය වගේම රෙදිපිළි නිෂ්පාදනය පිළිබඳව සැහෙන වගකීමක් පැවරෙන ඇමතිවරයෙකු හා නියෝජ්‍ය ඇමතිවරයෙකු වෙනුවෙන් වෙන් කරනු ලැබූ වැය ශීර්ෂයක සාකච්ඡාව මේ ගරු සභාවේ ඉතාම වැදගත් දෙයක්. එය විශේෂයෙන් වැදගත් වන්නේ රෙදි නිෂ්පාදනය රටක නිදහස් අරගල සමඟ බැඳුණු දෙයක් වන නිසයි. ඒ මන්ද, ආසියාවේ විජිත වශයෙන් විදේශීය රටවලට තැඹුරුවෙලා තිබුණු ඉන්දියානු සාගරය අවට රටවල් වාගේම ඒ සියලු ජාතීන් ඒ රටවල අරගලයන් කරද්දී සඳහන් කළ දෙයක් තමයි ආහාර නිෂ්පාදනය වාගේම ජනතාවගේ රෙදි නිෂ්පාදනය.

එංගලන්ත විශ්වවිද්‍යාලවල ඉගෙන ගෙන නිදහස් සටන් ව්‍යාපාරයේ යෙදුණු ආසියානු ජනතායකයන් ජනතාවගේ ආහාර වාගේම ජනතාවගේ ඇදුම් පැළඳුම්—වස්ත්‍ර—නිෂ්පාදන පිළිබඳව යම් ප්‍රතිපත්තියක් දැරුවා. මේ හේතුවෙන් ආසියාකරයේ නිදහස් පතා සටන් කළ ජනතාව, ඒ ජනතාව නියෝජනය කළ යුරෝපයේ අධ්‍යාපනය ලැබ සටන් පත්තරය ලැබූ විශාල පිරිසක් රෙදි නිෂ්පාදනය පිළිබඳවත් යම් යම් අදහස් ප්‍රකාශ කළා. ඒ හේතුවෙන් ඉන්දියාවේ ගාන්ධිතුමා විශේෂයෙන්ම ඉන්දියානු ජාතික සටනේ ඉන්දියාවට අවශ්‍ය රෙදි නිෂ්පාදනය පිළිබඳව ඉන්දියානු ජනතාව දැක්විය යුතු පිළිවෙත ගැන පැහැදිලි ප්‍රකාශයක් කළා. ලංකාවේ දිවංගත අගමැතිවරයකු වූත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායක වූත් බණ්ඩාරනායක මැතිතුමා 1934 වර්ෂයේදී "චරකය හා ගොයම් කෙත" නැමති ග්‍රන්ථයක් ප්‍රසිද්ධ කර ජනතාවගේ ඇදුම්-පැළඳුම් ජනතාව විසින්ම නිෂ්පාදනය කර ගැනීම පිළිබඳ මතයක් ප්‍රකාශ කළා. ජනතාවගේ ඇදුම්-පැළඳුම් ඒ රට තුළදීම ඒ ජනතාව විසින් නිෂ්පාදනය කර ගැනීම පිළිබඳව, ඉතිහාසයේ රත් අකුරෙන් තම ලියවා ගත් ඉන්දියාවේ ශ්‍රේෂ්ඨ ජනනායකයකු වන ගාන්ධිතුමාත් පැහැදිලිව අදහස් ප්‍රකාශ කර තිබෙනවා. ඒ අදහස පදනම් කොට ගත්, ජාතික අවශ්‍යතාවන් ජාතිය විසින්ම සපුරා ගැනීම මගින් ආර්ථික ස්වාධීනත්වය ලබා ගැනීම පදනම් කොට ගත් වැඩ පිළිබඳ මතයක් යුරෝපීය විජිතයන් වශයෙන් පැවතුණු රටවල් තුළ ගොඩනැඟුණා. තමන් පරිපාලනය කිරීම සඳහා තමන් විසින්ම ව්‍යවස්ථා සම්පාදනය කර ගැනීමට අමතරව, ජාතික ස්වාධීනත්වය පිළිබඳ මෙවැනි ඉතා වැදගත් අදහස් ජනතාව තුළ ක්‍රමයෙන් පැලපදියම් වන්න පටන් ගත්තා.

මේ රටට අවශ්‍ය ආහාර මේ රටේ ජනතාව විසින්ම නිපදවා ගත යුතුවා මෙන්ම අපේ ජනතාවට අවශ්‍ය ඇදුම්-පැළඳුම් අපේ ජනතාව විසින්ම නිපදවා ගත යුතුය කියන අදහස දිවංගත ගරු එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා 1934 දී 'චරකය සහ ගොයම් කෙත' යන පොත මගින් ප්‍රකාශයට පත් කළා. ඒ මතය, ඒ අදහස පදනම් කරගෙන තමයි, 1956 සිට මේ රටේ රෙදි නිෂ්පාදනය දේශීය ව්‍යවසායකයන්—රජය හෝ වේවා පෞද්ගලික අංශය හෝ වේවා—සතු විය යුතුය කියන මතය ඉදිරිපත් කෙරුණේ.

පසුගිය දශක කිපය තුළ ගෘහස්ථ කර්මාන්තයක්—අත් යන්ත්‍ර උපයෝගී කොටගෙන රෙදි නිෂ්පාදනය කිරීම—වශයෙන් නිෂ්පාදනය වුණු රෙදි ප්‍රමිතිය අතින් ඒ තරම් දියුණු මට්ටමක නොතිබුණත් ඒවා අපේ රටේ ජනතාව පාවිච්චි කළ යුතුය කියන මතය ගොඩනැඟී තිබුණේත් අර හේතුව නිසයි.

අපට නිදහස ලැබුණාට පස්සේ, දියුණු වන්න උත්සාහ කරන රටක් වශයෙන් ස්වයං ආර්ථිකයක් පිළිබඳ මතය අනුව මේ රටේ රෙදි නිෂ්පාදනය දේශීය ව්‍යවසායකයන් අතින්ම විය යුතුය යන අදහසක් පසුගිය දශක හතර තුළ ගොඩනැඟී තිබුණා, ඒ අනුවයි, රෙදි නිෂ්පාදනය සම්බන්ධයෙනුත් 1977 දක්වාම කටයුතු කෙරෙමින් තිබුණේ.

නමුත් 1977 දී ඒ පදනම වෙනස් වුණා. ග්‍රාමීය ආසන නියෝජනය කරන මන්ත්‍රීවරුන් හැටියට අපි දන්නවා, ග්‍රාමීය වශයෙන් රෙදි නිෂ්පාදනයට ඒ කාලයේ කොයි තරම් තැනක් තිබුණාද කියා. මගේ ආසනයට කිට්ටු ආසනයක් වන අම්බලන්ගොඩ ආසනයේ 6,400 කට කිට්ටු ප්‍රමාණයක අත්යන්ත්‍ර රෙදි නිෂ්පාදකයන් හිටියා. නමුත් මේ රජයේ ප්‍රතිපත්තිය යටතේ ඒ අයට අවශ්‍ය අමුද්‍රව්‍ය ලබා ගැනීමට තිබෙන අපහසුව නිසා, එහෙම නැත්නම් නිෂ්පාදනය කරන රෙදි අළෙවි කර ගැනීමට තිබෙන අමාරුව නිසා ඒ අය අත්යන්ත්‍ර රෙදි නිෂ්පාදනය අත්හැර දැම්මා. නිෂ්පාදනය පසෙකට දැම්ම නිසා දන් ඒ අයට රැකියා පිළිබඳ ප්‍රශ්නයකුත්, ජාතික අත්යන්ත්‍ර රෙදි නිෂ්පාදනයට හවුල් වීම පිළිබඳ ප්‍රශ්නයකුත් මතු වී තිබෙනවා.

මා දන්නා තරමින් පසුගිය රජය කාලයේදී රාජ්‍ය ව්‍යවසාය යොදා මේ රටේ පේෂකර්මාන්තශාලා කිපයක්ම ආරම්භ කර තිබුණා. ජාතික පේෂකර්ම සංස්ථාව යටතේ ක්‍රියාත්මක වුණු ඒ පේෂකර්මාන්තශාලා හැසිරවීම මේ රජයේ අනුග්‍රහය යටතේ විදේශීය කොම්පැනි කිපයකට පැවරී තිබෙනවා. ඒ හේතුව උඩ නිෂ්පාදන ක්ෂේත්‍රයේ ප්‍රගතියක් ඇති වුණත් දේශීය නිෂ්පාදනය පිළිබඳ ආකල්පයට ලොකු පහරක් වැදී තිබෙනවා. අද ඉන්දියාව පවා මේ රටේ රෙදි නිෂ්පාදනය කෙරෙහි ආධිපත්‍යය පතුරුවා තිබෙනවා. නමුත් ඉන්දියාව දේශීය අවශ්‍යතා වෙනුවෙන් දේශය තුළ ඒ රටේ ජනතාව විසින්ම රෙදි නිෂ්පාදනය කර ගැනීමේ සටන සාර්ථකව කරගෙන ගොස් විශිෂ්ට ප්‍රතිඵල ලැබූ බවත් අපි අමතක කරන්න හොඳ නැහැ. ඒ ප්‍රතිපත්තිය නුදුන් සිටි ඉන්දියාව දන් පේෂකර්මාන්ත අතින් අවට රටවල් කෙරෙහිත් අවධානය යොමු කරන වකවානුවක 1977 ත් පස්සේ අපි, එනෙක් ජාතික පේෂකර්ම සංස්ථාව විසින් ක්‍රියාත්මක කරගෙන ආ වැඩ පිළිවෙල අත්හිටුවා ඒ කර්මාන්තශාලා විදේශීය කොම්පැනි කිපයකට පවරා දී තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අමරසිරි දෙඩන්ගොඩ මහතා]
අ. හා. 2.45

මේ සිදුවීම් පිළිබඳව ජාතික මට්ටමෙන් බලන්න ඕනෑ. නිදහස් වෙලඳ ක්‍රමයේ තාවකාලික ප්‍රසාරනයක ප්‍රගතියක් රටට පෙන්නා, කඩවල් පිරවීමෙන්, වෙළඳ පොළවල් පිරවීමෙන් පාරේ ගමන් කරන වාහන නියා පාරවල් පිරවීමෙන් තාවකාලික ප්‍රගතියක් මේ රටේ දකින්නට තිබුණත්, ජාතික මට්ටමෙන් අපේ ආර්ථික ක්‍රමය පිළිබඳ සැලැස්ම ගැන කල්පනා කරන විට මේ කිසිම සැලැස්මක් දිගුකාලීන සැලැස්මක් හෝ මේ රටේ ස්වාධීන ස්වෛරී ආර්ථිකය තහවුරු කරන වැඩ පිළිවෙලක් පෙන්නුම් කරන සැලැස්මක් නොවන බවයි අපේ විශ්වාසය. ජනතාව හොඳ රෙදි ඉල්ලන විට, විදේශීය කොම්පැනි කාරයන් මේ රටට ගෙන්වා, මේ රටේ සංස්ථාවල කම්හල් ඔවුන්ට භාර දී, මේ රටේ ජනතාවගේ දරුවන් අත්යන්තුවලින් කරගෙන ආ කර්මාන්ත වෙනුවට විදේශීය කොම්පැනිවල කාර්මික ව්‍යාපාර මගින් ක්‍රමයෙන් ඉදිරිපත් කරනු ලැබූ රෙදිපිළි වෙළඳ පොළට ඉදිරිපත් කර ජනතාවට තාවකාලික තෘප්තියක් දෙනු ලැබුවත් මේ රටේ ජාතික සැලැස්ම පිළිබඳව දිගුකාලීනව සලකන විට එය අසාර්ථකයි කියන එකයි අපේ විශ්වාසය. ශ්‍රී ලංකාව තුන්වන ලෝකයේ රටක් හැටියට, මේ පසුගිය දශක කීපය තුළ යටත් විජිතයෙන් මිදුණු රටක් හැටියට සිටීමින් රටවාසීන්ගේ, මූලික අයිතිවාසිකම් සහ රටේ මූලික අවශ්‍යතාවයන් ගැන සලකන විට, විදේශීය කොම්පැනි මෙරටට කැඳවා මේ රටේ නිෂ්පාදන ඔවුන්ට භාර දීම—අපේ මූලික අවශ්‍යතාවයන් පිළිබඳ නිෂ්පාදනය ඔවුන්ට භාර දීම, වෙළඳ පොළ භාර දීම, ඒ අයට වෙළඳ පොළ හසුරුවන්නට ඉඩ දීම—පැරණි විජිත ක්‍රමය වෙනුවට නව විජිත ක්‍රමයකට පිවිසීමක් කියලයි අපි විශ්වාස කරන්නෙ. අපේ රටේ යම් නිෂ්පාදනයක් හැසිරවීම විදේශීය කොම්පැනියකට හෝ විදේශීය අධිකාරයකට හෝ භාර දීම මොන යම් ආකාරයකින්වත් මේ රටේ ජනතාවගේ ස්වාධීනත්වයට හිතකර වෙන්නේ නැතැයි කියන එකයි අපේ විශ්වාසය.

ජාතික සටන් පිළිබඳව සලකන විට වර්ෂ එක් දහස් නවසිය තිස් ගණන්වල යුරෝපාකරයේ අධ්‍යාපනය ලබා—අපේ රටේ හෝ ආසියාකරයේ වෙනත් රටවල හෝ සල්ලිකාරයින්ගේ දරුවන් වෙන්න පුළුවන්—ඔක්ස්ෆර්ඩ්, කේම්බ්‍රිජ් වැනි සරසවිවල අධ්‍යාපනය ලබා ආපසු සිය රටට පැමිණි අය තම රටවල තිබුණු විදේශීය සටන පිළිබඳව හරි තේරුමක් ලබා ගනිමින් ඇති කරන ලද දේශප්‍රේමී අරගල අද ප්‍රතික්ෂේප කරන ස්වරූපයකයි අපි ජීවත් වෙන්නෙ. මෙන්න මේ නියා මම විශේෂයෙන්ම ගරු ඇමතිතුමාගේත්, ගරු නියෝජ්‍ය ඇමතිතුමාගේත් අවධානය යොමු කරන්නේ ආහාර නිෂ්පාදනය වගේම රෙදිපිළි නිෂ්පාදනයත් මේ රටේ ඉතාම වැදගත් දෙයක්ය කියන කාරණය කෙරෙහියි.

රෙදිපිළි නිෂ්පාදනය පිළිබඳ අයිතිය ජාතිය සන්තකව තිබිය යුතුයි. රෙදිපිළි නිෂ්පාදනය හෝ ඒ පිළිබඳ අමු ද්‍රව්‍ය හැසිරවීම හෝ වෙළඳපොළ හැසිරවීම හෝ විදේශීය කොම්පැනියකට එහෙම නැත්නම් විදේශීය අධිකාරයකට පැවරීම, ඒ අයට බලපෑම් කරන්න ඉඩදීම, මේ රටේ ජනතාවගේ අයිතියට තර්ජනයක් බව කියන්න ඕනෑ. මම මේ විධියට කියන්නේ ඇයි? පසුගිය කාලසීමාව තුළ යම් කම්හලක—තුල්හිරිය වෙන්න පුළුවන්, වේයන්ගොඩ වෙන්න පුළුවන්, පූගොඩ වෙන්න පුළුවන්, වෙන යම්කිසි කම්හලක වෙන්න පුළුවන්—අධිකාරිය විදේශීය කොම්පැනිවලට භාර දීම නියා ඒවායේ නිෂ්පාදනය කරන රෙදිපිළිවල යම් මට්ටමක ප්‍රමිතිකරණයක් ඇති වුවත් වෙළඳ පොළේ අවශ්‍යතාවයට, ජනතාවගේ ඉල්ලුමට අනුව ඒවා නිෂ්පාදනය කරනු ලැබුවත් මේ රටේ අවශ්‍යතාවය වන්නේ එය නොව වර්ෂ කීපයක් ගත වීමෙන් පසුව හෝ ජාතික අයිතියක් තිබෙන ජාතියට හැසිරවිය හැකි, ජාතිය විසින් පරිපාලනය කිරීමේ සම්පූර්ණ ශක්තියක් ඇති නිෂ්පාදනයක් ඇති කිරීමය කියන එකයි ජනතාවගේ විශ්වාසය.

විශේෂයෙන්ම තුන්වන ලෝකයේ රටවල—යටත් විජිත වශයෙන් තිබී අමාරුවෙන් සාකච්ඡා මාර්ගයෙන් හෝ සටන් මගින් හෝ සිය නිදහස ලැබූ, දියුණු වෙන්න උත්සාහ කරන රටවල්—ජාතික අයිතියක් නමයි මූලික නිෂ්පාදන ඒ අය සතු කර ගැනීම. රෙදිපිළි නිෂ්පාදනය පිළිබඳව හෝ අමු ද්‍රව්‍ය නිපදවීම පිළිබඳව හෝ ඇඳුම් නිෂ්පාදනය කිරීම පිළිබඳව හෝ විදේශීය කොම්පැනි, විදේශීය අධිකාරී විසින් පසුගිය දශක කීපය තුළ යම් බලපෑමක් කරන්නට යෙදුණේ නම්, එය අපේ ජාතියේ ස්වෛරී භාවයට කළ තර්ජනයක් වෙනවා. මෙන්න මේ නියා ගරු ඇමතිතුමාගේත් ගරු නියෝජ්‍ය ඇමතිතුමාගේත් අවධානයට යොමු කළ යුතු කාරණයක් තිබෙනවා. ප්‍රමිතකරණය පිළිබඳව, පාරිභෝගික ඉල්ලුම් පිළිබඳව, ජාතික අවශ්‍යතාවයන් පිළිබඳව අපි දිගු කාලීන මට්ටමෙන් සලකා බලන්න ඕනෑ. ජාතියක් හැටියට කල්පනා කරන විට අපි තව දශකයකින් තිම වෙන මිනිසුන් කොටසක් නොවන බව සැලකිය යුතුයි. නවම අපි යටත් විජිත තත්ත්වයෙන් නිදහස් වී අවුරුදු පණහක් හැටක්වත් ගත වුණා නොවෙයි. යටත් විජිත යුගයක්, වැඩවසම් යුගයක්, ධනේශ්වර යුගයක්, සමාජවාදී යුගයක් යන මේ කොයි එකක්වත් කිසිම ජාතියක ජීවත්වෙන ජනතාවගේ—ඒ පුද්ගලයාගේ—එහෙම නැත්නම් ඒ අයගේ—ජීවිත කාලය තුළ තිම වෙන එකක් නොවෙයි. අවුරුදු දහස් ගණනක්, නැතිනම් පන්සිය ගණනක් ඒත් නැතිනම් දෙසිය ගණනක් එහෙමත් නැතිනම් එකසිය ගණනක් අවසන් වුණු යුග පරිවර්තනයයි අපට පෙනෙන්නේ. මෙන්න මේ නියා, අද මේ වාගේ මූලික නිෂ්පාදනයට අයිතිය තාවකාලිකව හෝ විජාතික අධිකාරයනට පත්වීම ගැන. එහෙම නැත්නම් විදේශීය කොම්පැනි කැඳවා ඒ අයට දේශීය පේෂකර්මාන්තය භාර දීම ගැන එහෙමත් නැතිනම් මේ රටේ සාමාන්‍ය ජනතාව තවමත් ලීවලින් තැනූ රෙදි වියන යන්ත්‍රවලින් කරනු ලැබූ නිෂ්පාදන අද අඩපණ වී තිබීම ගැන අපි අපේ විශේෂ අවධානය කොමු කළ යුතුයි.

අපේ මැතිවරණ කොට්ඨාශවල, අපේ දිස්ත්‍රික්කවල පේෂ කාර්මිකයන් සෑහෙන පිරිසක් තමන්ගේ එදනෙදා ජීවිතය රැක ගැනීම සිදු කර ගන්නා අතරම යම් මට්ටමක ප්‍රගතියක් ස්වකීය නිෂ්පාදන වෙළඳපොලට එවීමෙන් පෙන්නුම් කළා. එම නිෂ්පාදන විදේශීය නිෂ්පාදන සමග තරඟ කිරීමෙදී නොයෙකුත් අඩුපාඩුකම් සහිත තත්ත්වයක් තිබෙන්නට පුළුවනි. නමුත් විජාතික කොම්පැනි, නිදහස් වෙළඳ කලාපයේ හෝ මේ රටේ පේෂකර්මාන්ත ශාලාවල හෝ රෙදි නිෂ්පාදනය කිරීමෙදී, තියෝජ්‍ය ඇමතිතුමා සඳහන් කළ විධියට, හොඳ නිෂ්පාදන දකින්නට පුළුවනි. නමුත් ප්‍රශ්නය ඒක නොවෙයි. ගරු සභාපතිතුමනි, අපේ පේෂකර්මාන්තය නවමත් පවතින්නේ ළදරු අවස්ථාවකයි. එවැනි කර්මාන්තයක් තුළින් වෙගෙය වී කරන නිෂ්පාදන, රටට, ජාතියට ඉදිරිපත් කිරීමෙදී විජාතික කොම්පැනි මගින් නිෂ්පාදිත හෝ ආයාත කරනු ලැබූ හෝ රෙදිපිළි යම් මට්ටමකින් හෝ වෙළඳපොළේ තරඟකාරී තත්ත්වයක පැවතීම, ජාතික නිෂ්පාදනවලට තරමක තර්ජන යක්. ඒ නියා මේ රටේ ජාතික වශයෙන් වැදගත්කමක් උසුලන රෙදි නිෂ්පාදනවලට විවෘත වෙළඳපොලත් තර්ජනයක්, විවෘත වෙළඳ ප්‍රතිපත්තිය මත විදේශීය ආයෝජකයන්ට ආරාධනා කිරීම ළදරු අවස්ථාවක ඇති අපේ දේශීය නිෂ්පාදනවලට හානියක්.

විවෘත වෙළඳපොළෙහි හොඳ නිෂ්පාදන දකින්නට තිබීම, තාවකාලිකව ජනතාව සතුටු කරවනු ලබන්නක් වුණත්, ජාතික මට්ටමෙන් දිගු කාලීන පේෂකර්ම ප්‍රතිපත්තියක් අනුව, මේ රටේ ජනතාවට අවශ්‍ය රෙදිපිළි මෙ රටේම නිපදවීම පිළිබඳව කල්පනා කර බලන විට, එය අසාර්ථක පිළිවෙතක් බව අපේ විශ්වාසයයි. මේ නියා රෙදිපිළි නිෂ්පාදනයත්, ආහාර නිෂ්පාදනය වාගේම රටේ වැදගත්කමක් උසුලන බව ගරු ඇමතිතුමාට මතක් කර දෙන්න කැමතියි.

ගරු සභාපතිතුමනි, ඉන්දියානු රජය, ඒ අයගේ දේශීය පේෂකර්ම වැඩ පිළිවෙළ යටතේ, විදේශීය රටවලට බලපාන්න පුළුවන් මට්ටමේ රෙදිපිළි නිෂ්පාදකයින් බවට අද පත්ව සිටිනවා. ඒකට හේතු වුණේ මොකක්ද? ඒ අයට පුලුවන් වුණා, විදේශීය රෙදිපිළි ආයාත නවත්වන්නට. ඒ වාගේම රෙදිපිළි නිපදවීම සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ඒ රටේම නිපදවා ගන්නටත් පුළුවන් වුණා. එහෙත් අපේ රටට රෙදිපිළි නිපදවීමට අවශ්‍ය අමුද්‍රව්‍ය සමහර ප්‍රදේශවලින් නිපදවා ගැනීමට හැකියාව තිබුණත්, ශක්තිය තිබුණත්, ඒ ගැන සැලකිලිමත් වුණේ නැහැ. මේ රටේ මෙතෙක් තිබුණු ආණ්ඩුවලින් තරමක උත්සාහයක් තිබුණත්, පූර්ණ උත්සාහයයක් යොදා නැහැ. මෙන්න මේ නියා, පේෂකර්ම අමාත්‍යාංශයක් වශයෙන් සලකන විට, රෙදිපිළි නිෂ්පාදනයත් අපේ රටේ ආර්ථික ස්වාධීනත්වය පිළිබඳව වැදගත් නිෂ්පාදනයක් බව එතුමන්ලාට මතක් කර දෙන්න කැමතියි.

ගරු සභාපතිතුමනි, ඉන්දියාව, පකිස්ථානය, ඉන්දුනීසියානු සෙසු රටවල්, බ්‍රිතාන්‍ය ආධිපත්‍යයෙන් මිදීමට අරගල කළ අවස්ථාවලදී, ජාතික නිෂ්පාදන, විශේෂයෙන්ම ආහාර හා රෙදිපිළි සෑහෙන බලපෑමක් ඇති වුණා. දිවංගත බණ්ඩාරනායක අගමැතිතුමා ලංකාවට ඇවිත් "වරකය සහ ගොයම්කෙත" නැමැති පොත ලිවීමෙන් වාගේම අදත් ඉන්දියානු නායකයන්, තමන්ගේ රටට පිවිසෙන විට, ජාතික හැඟීම් ඇති වන විධියට, ඒ රට තුළ ඒ අයගේ ජාතික අරගලය ශක්තිමත් කරන විධියට, ජාතික රෙදිපිළි නිෂ්පාදනම පාවිච්චි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කිරීමෙත් ජනතාවට ආදර්ශයක් දී තිබෙනවා. ඒ අත්දමට තියම ජාතික නායකයන් වශයෙන් ඒ අය ක්‍රියා කළ නිසා, රෙදිපිළි නිෂ්පාදනය අතින් ඉතාම සාර්ථක තත්ත්වයක් දකින්නට තිබෙනවා. ආර්ථික අරගලයෙන් මිදීමටත්, රටේ ස්වාධිනත්වය ලබා ගැනීමටත් ලෝකයේ පස් වන බලවතා හැටියට ඉන්දියාව ගොඩනගා ගැනීමටත් ආහාර සහ රෙදිපිළි නිෂ්පාදන හේතු වී තිබෙනවා. මෙන්න මේ තත්ත්වයන් අප තේරුම් අරගෙන අපේ රටෙන්, විජාතික කොම්පැනිවල අධිකාරයන්ගෙන් හෝ විදේශීය රෙදිපිළි ආයතනයන්ගෙන් හෝ විදේශීය රෙදිපිළි ආයාතයන්ගෙන් හෝ නිදහස් වෙළඳ කලාපය තුළින් හෝ මේ රටේ ඇති රෙදි කර්මාන්තශාලා විදේශීය කොම්පැනිවලට භාර දීමෙන් හෝ වැළකී, අත්යන්ත්‍රවලින් කරනු ලබන නිෂ්පාදන දේශීය වෙළඳපොලට ගෙනැවිත් රජයේ ආයතන—ආරෝග්‍යශාලා සහ බන්ධනාගාර වාගේ රජයේ සියළුම ආයතන— එම රෙදි පාවිච්චි කරනවා වාගේම ජනතාවටත්, අපේම රටේ නිෂ්පාදිත රෙදිපිළි පාවිච්චි කිරීම පිළිබඳව අධිකාරයක් පැවැත්වීමට රජයේ සහ මේ රටේ ජාතික රෙදිපිළි නිෂ්පාදකයන්ට බලය දී, විජාතික නිෂ්පාදන වැඩ පිළිවෙල ඉවත් කරන්නටය, එම වැඩ පිළිවෙළින් ඉවත් වෙන්නටය කියා ඉල්ලමින් මගේ අදහස්වලට සවන් දීම ගැන ස්තුති කරමින් මා නිහඬ වෙනවා.

වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා (හම්බන්තොට දිසා ඇමතිතුමා)
(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்—அம்பாந்தோட்டை மாவட்ட அமைச்சர்)
(Dr. P. M. B. Cyril–District Minister for Hambantota)

ගරු සභාපතිතුමනි, පේෂකර්මාන්ත අමාත්‍යාංශයේ වැය ශීර්ෂ ගැන සාකච්ඡා කරන මේ අවස්ථාවේදී මා බලාපොරොත්තු වෙන්නේ හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් තිස්සමහාරාම මැතිවරණ කොට්ඨාශයෙන් අත් යන්ත්‍ර පේෂ කර්මාන්තයෙනුත් බලවේග පේෂ කර්මාන්තයෙනුත් ජීවත් වූ උදවියගේ තත්ත්වය ගැන ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කර එමගින් ඒ උදවියට සහනයක් ලබා දෙන්නටයි. විශේෂයෙන්ම රෙදිපිළිවලින් ස්වයංපෝෂිත තත්ත්වයක් උදා කර දීම ගැන සකලවාසි ලාංකික ජනතාවම ගරු ඇමතිතුමාට ස්තුති කරන්නට ඕනෑ. ආහාරයෙන් රට ස්වයංපෝෂිත වෙන්න ඉස්සෙල්ල එතුමා රෙදිපිළිවලින් රට ස්වයංපෝෂිත කර තිබෙනවා. රජයක් වශයෙන් පාලකයන් පාලිතයන්ට දියයුතු සිවුපසයක් තිබෙනවා. කෑම බීම, ඉඳුම් හිටුම්, ඇඳුම් පැළඳුම් සහ බෙහෙත් හේත් යනු ඒ සිවුපසයයි. අපේ ගරු ඇමතිතුමා තුන් වන අවශ්‍යතාවය—ඇඳුම් පැළඳුම්—අකුරටම ඉෂ්ට කිරීම ගැන මුළු මහත් ජනතාවගේම ස්තුතිය එතුමාට හිමි විය යුතුයි. ඒ තුළින් හොඳ රෙදිපිළි ජනතාවට ලැබුණත් කාලාන්තරයක් තිස්සේ අත් යන්ත්‍ර පේෂ කර්මාන්තයෙන් ජීවත් වූ අපේ ප්‍රදේශවල අත් යන්ත්‍ර කාර්මිකයන්ට රක්ෂාව නැති වූ බවයි මට පෙත්වා දෙන්නට වුවමනා කරන්නේ.

අ. භා. 3

මේ අත්යන්ත්‍ර පේෂ කර්මාන්තය නවීකරණය කරන ලෙස මා ඉල්ලීමක් කරනවා. නවීනතම යන්ත්‍ර සූත්‍රවලින් නිෂ්පාදනය කරන රෙදිපිළි සමඟ තරග කරන්නට බැහැ, අත් යන්ත්‍රවලින් වියන රෙදි පිළිවලට. මුදල් දී ගන්නවා නම් හොඳ රෙදිම ලබා ගැනීමටයි, ජනතාව බලාපොරොත්තු වෙන්නේ. අත් යන්ත්‍ර පේෂ කර්මාන්තය නවීකරණය කර වඩා හොඳ තත්ත්වයකින් රෙදිපිළි නිෂ්පාදනය කරන්නට පියවර ගන්නොත් ඒ කර්මාන්තයෙන් ජීවත් වූ විශාල සංඛ්‍යාවකට නැවතත් රක්ෂාව සපයන්නට පුළුවන්කම තිබෙන බවයි මා කියන්නේ. බද්දේගම ගරු මන්ත්‍රීතුමාත් (අමරසිරි දොඩන්ගොඩ මහතා) ප්‍රකාශ කළ විධියට අපේ ප්‍රදේශවල තිබුණු අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත මධ්‍යස්ථාන දැන් අවුරුදු පහක් හයක් තිස්සේ වසා දමා තිබෙනවා. මගේ කොට්ඨාශයේ තිබුණ එවැනි මධ්‍යස්ථාන 38 ක් අද වසා දමා තිබෙනවා. එම නිසා ඒවායේ රක්ෂාවේ යෙදුණු විශාල සංඛ්‍යාවකට රක්ෂාව නැතිව ගොස් තිබෙනවා. නමුත් බලවේග පේෂ කර්මාන්තයට ගරු ඇමතිතුමා පොඩි නව පණක් දුන් නිසා ඒ තුළින් කීප දෙනෙකු ඒ ආයතනවලට බදවා ගන්නට පුළුවන් වුණා. නමුත් ඔක්කෝටම රක්ෂා සපයන්නට පුළුවන් වුණේ නැහැ. උසස් තත්ත්වයේ රෙදිපිළි සමඟ තරග කරන්නට නොවෙයි, අඩු වශයෙන් ගම්බද ප්‍රදේශවල ජනතාවගේ අවශ්‍යතාවයන්ට සරිලන ප්‍රමාණයට හෝ ඒත් නැත්නම් රෝහල්වලට සහ බන්ධනාගාරවලට වුවමනා කරන රෙදිපිළි සහ අනෙකුත් ද්‍රව්‍ය නිෂ්පාදනය කළ හැකි තත්ත්වයට අත් යන්ත්‍ර පේෂ කර්මාන්තය නවීකරණය කළහොත් අපට යළිත් මේ රටේ අත් යන්ත්‍ර පේෂ කර්මාන්තය නගා සිටුවිය හැකිය කියා මා කල්පනා කරනවා.

අද මේ රටේ ආරෝග්‍යශාලාවලට අවශ්‍ය තුවාල වෙළුම් පටි, ගෝස් යනාදිය පිටරටින් ගෙන්වනවා. මම හිතන හැටියට, අපේ රෝහල්වලට වුවමනා කරන ගෝස්වලින් අඩක් පමණ මේ රටේ නිෂ්පාදනය කරනවා. මේ රටේ අත් යන්ත්‍ර පේෂකර්මාන්තය එවැනි ද්‍රව්‍ය නිෂ්පාදනය කරන තත්ත්වයකට පරිවර්තනය කළොත් අත් යන්ත්‍ර පේෂකර්මාන්තයෙන් යැපුණු දහස් ගණනකට එය විශාල සහනයක් වෙනවා. ලංකාවේ තිබෙන හැම අත් යන්ත්‍ර පේෂකර්මාන්ත මධ්‍යස්ථානයක්ම එවැනි ද්‍රව්‍ය නිෂ්පාදනයට යොමු කළොත් මා සිතන්නේ නැහැ වෙළුම් පටි, ගෝස් යනාදිය අඟලක්වත් පිටරටින් ගෙන්වන්නට වුවමනා වේවිය කියා. ඒ තුළින්ම මේ ප්‍රශ්නය විසඳන්නට පුළුවනි.

විජයපාල මෙන්ඩිස් මහතා
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)

ඒවා අඟලක්වත් අද පිටරටින් ගෙන්වන්නේ නැහැ. ලංකාවේම තමයි ඒවා නිෂ්පාදනය කරන්නේ.

වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා
(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)
(Dr. P. M. B. Cyril)

හොඳ තවිකරණය කළ යන්ත්‍රවලින්—

විජයපාල මෙන්ඩිස් මහතා
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)

නැහැ. ඒවා නිෂ්පාදනය කරන්නේ අත් යන්ත්‍රවලින්.

වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා
(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)
(Dr. P. M. B. Cyril)

බොහොම හොඳයි. අපි ඒවායින් ස්වයංපෝෂිත වී තිබෙනවා නම් අතිරික්තයක් තිබෙනවා නම් අපට ඒවා අපනයනය කරන්නටත් පුළුවන්කම තිබෙනවා. ඒ අනුව අපට හැකියාව තිබෙනවා, ඒ තුළින් අත් යන්ත්‍ර පේෂ කර්මාන්තයේ යෙදෙන උදවියගේ රක්ෂාව සුරක්ෂිත කරන්නට. හම්බන්තොට දිස්ත්‍රික්කයේ අත් යන්ත්‍ර පේෂ කර්මාන්තයෙහි යෙදී සිටි විශාල ජනතාවක් අද රැකියා නැතිව ඉන්නවා. ඒ නිසයි මම මේ ගැන කියන්නෙ. රෝහල්වලට අවශ්‍ය වෙළුම්පටි යනාදිය ලංකාවට ඇතිවෙන්න තිබෙනවා නම් වැඩිපුර නිෂ්පාදන කරන ඒවා අපි බලමු, පිටරටවලට යවන්න.

දකුණු පළාතේ තිබෙන විශාලම නූල් කැටිමේ කර්මාන්තශාලාව පිහිටා තිබෙන්නේ තිස්සමහාරාමයේ මගේ කොට්ඨාශයේයි. මෙහි දනට වැඩ කෙරෙන්නේ ඉතාමත් අඩු ප්‍රමාණයකින්. පැය 24 ටම වැඩ මුර 4 ක් තිබෙනවා.

විජයපාල මෙන්ඩිස් මහතා
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)

කපු වවන්න එපායැ.

වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා
(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)
(Dr. P. M. B. Cyril)

ගරු ඇමතිතුමනි, මීට කලින් කපු වැවිවෙ නැති කාලවලදීත් පිටරටින් ගෙනැවිත් හෝ කපු කැටීම් කළා. එලෙස හෝ කටයුතු කර අපි ඒක ආරක්ෂා කරගත්ත ඕනෑ. එහෙම නැත්නම් ඒක නිදහස් වෙළඳ කලාපයේ කර්මාන්තශාලාවකට හෝ පරිවර්තනය කර එහි රැකියාවේ යෙදී සිටි උදවියගේ රැකියා ආරක්ෂා කර දෙන ලෙසයි මා ඉල්ලා සිටින්නෙ.

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)

ඒ පළාතේ කපු වැවීමේ ව්‍යාපෘතියක් තිබුණා!

වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා
(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)
(Dr. P. M. B. Cyril)

තිබුණා, තිබුණා. අපි ආඩම්බරයෙන් ප්‍රකාශ කරන්න ඕනෑ, 1977, 1978 වර්ෂවල මුළු මහත් ලංකාවෙම වැඩිපුර කපු නිෂ්පාදනය කෙළේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ බව. අද එය අඩපණ වී තිබෙනවා. හොඳ රෙදි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා]

වෙනත් විධියකට ලැබෙන තිසා අර කලින් මෙන් මහන්සි වී නිෂ්පාදනය කිරීම තතර වී තිබෙනවා. එය එසේ අඩපණ නොවෙන්නට තම කපු නිෂ්පාදනය සඳහා මීට වඩා මිලක් ලබා දෙන්න ඕනෑ. මම දන්නවා තමුන්නාන්සේලා අවම මිල වැඩිකර දුන් බව.

විජයපාල මෙන්ඩිස් මහතා
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)

පිටරටින් ගෙන්වන යුද්ධ කළ කපු මිලම මෙහෙ යුද්ධ නොකළ කපුවලට දැනටත් ගෙවනවා.

වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා
(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)
(Dr. P. M. B. Cyril)

මොන විධියෙන් හෝ ඇමතිතුමනි, අවධානයක් යොමු වෙනවා නම් හොඳයි. මේ වාගේ විශාල කර්මාන්තශාලාවක් අද ක්‍රියා විරහිත වී තිබීම ජාතියේ පාපයක්. එය ඒ තත්ත්වයෙන් මුදගෙන එහි රැකියා කළ උදවියගේ රැකියා ආරක්ෂා කර දීම මහා පුණ්‍ය කර්මයක් බව මා විශේෂයෙන් මතක් කරනවා.

ඒ අතරම මම ආයාචනයක් කරනවා හැකියාවක් තිබෙනවා නම් අඩු ගණනේ මේවායින් එක කර්මාන්තශාලාවක්වත් නිදහස් වෙළඳ කලාපයේ කර්මාන්තශාලාවක් බවට පරිවර්තනය කරන්නය කියා. එසේ පරිවර්තනය කර රැකියා ලබා ගැනීමේ අවස්ථාව ඇති කර දෙන්නය කියා මතක් කරමින් මගේ වචන ස්වල්පය හමාර කරනවා.

විජයපාල මෙන්ඩිස් මහතා (ජේෂ්ඨ කර්මාන්ත අමාත්‍යතුමා)
(திரு. விஜயபால மெண்டிஸ் — புனைவைத் தொழில் அமைச்சர்)
(Mr. Wijayapala Mendis–Minister of Textile Industry)

ගරු සභාපතිතුමනි, අද උදේ 11.15 සිට ජේෂ්ඨ කර්මාන්ත අමාත්‍යාංශයේ වැය ශීර්ෂ පිළිබඳ සාකච්ඡාව පැවැත්වෙනවා. ආරම්භයේදී කථා කළ කලවාන ගරු මන්ත්‍රීතුමා (සරත් මුත්තෙට්ටුවෙගම මහතා) නැගූ ප්‍රශ්න කීපයකට මගේ නියෝජ්‍ය ඇමතිතුමා සෑහෙන වශයෙන් පිළිතුරු දුන්නා

එක්සත් ජාතික පක්ෂයට සම්බන්ධ වී තිබෙන වෘත්තීය සමිතිය වන ජාතික සේවක සංගමය ගැන එතුමා ප්‍රශ්නයක් නැඟුවා. එතුමා සඳහන් කළා ජේෂ්ඨ කර්මාන්ත ශාලාවල පාලනය ගෙන යන්නේ ජාතික සේවක සංගමයයි, ඒ අනුව තුල්හිරිය වැනි පොහොකම්හල්වල විශාල පිරිසක් සේවකයන් අස්කර තිබෙනවා. ඒ අයගේ ප්‍රශ්නය තවමත් විසඳී නැත කියා. ඒ අයගේ ප්‍රශ්න තවම විසඳී නැහැ. උසාවියට ගිහින් තිබෙනවා. උසාවියේ තඩු තවම අවසාන වී නැහැ. ඇපැල් උසාවිය ආදී උසාවිවල තඩු තවම තීරණය වී නැහැ. ජාතික සේවක සංගමයේ ඇහිලි ගැහිල්ලක් නැති බව මම පළමුවෙන්ම කියන්න කැමතියි. වෘත්තීය සමිතියක් වශයෙන් අප ඒ අයගෙන් බලාපොරොත්තු වන්නේ ඒ කර්මාන්ත ශාලාවේ වැඩ කටයුතු හරියාකාර ගෙන යෑමයි. ඒ නිසා මම පුරුද්දක් වශයෙන් සෑම මාසයකම සෑම කර්මාන්ත ශාලාවකම වෘත්තීය සමිති එක්ක සාකච්ඡා කරනවා. නිෂ්පාදනය සම්බන්ධයෙන් මොන-මොන ප්‍රශ්න තිබෙනවාද, ඒ ඒ මාසය තුළ කොතරම් ප්‍රමාණයක් නිෂ්පාදනය කර තිබෙනවාද, නිෂ්පාදනය වැඩි කිරීමට දියුණු කිරීමට තව මොන මොන ආකාරයේ ක්‍රියා මාර්ග ගත යුතුද, සේවක පිරිසට තිබෙන්නවාවූ අයුපාඩුකම් මොනවාද ආදී කරුණු ගැන දිරිඝ සාකච්ඡාවක් මම හැම මාසයේදීම හැම කර්මාන්ත ශාලාවකම සේවක පිරිස් සමග පවත්වනවා. ඒ නිසා අද ඒ කර්මාන්ත ශාලාවල සමහර අය බලාපොරොත්තු වන අන්දමේ අරගල මොකවත් නැහැ. ඒ බව කියන්න සන්තෝෂයි.

ඉස්සර ජවායේ හරියට අරගල තිබුණා. ඉස්සර තුල්හිරියේ නිෂ්පාදනය කළේ අරගල මියක් රෙදි නොවෙයි. ධාරිතාවෙන් සියයට දහයක්. පහළොවත් පමණයි නිෂ්පාදනය කළේ. අරගලමයි නිෂ්පාදනය කළේ. සමාජවාදය ගැනයි කතා කළේ. ජවා නිෂ්පාදනය කළා මිස මාසයකට දවස් දහයක්, පහළොවක්වත් වැඩ කළායයි මම හිතන්නේ නැහැ. ඒ අනුව දිගටම යන අතර අපි බාර ගත්තාට පස්සේ මම වෘත්තීය සමිතිවල සහාය විශේෂයෙන් ලබා ගත්තා, එම තත්ත්වය වෙනස් කිරීම සඳහා. එද සිටයි, මුලින් සඳහන් කළ අන්දමට මම මේ අමාත්‍යාංශය බාර ගන්ද සිට සෑම මාසයකම, සෑම කර්මාන්ත ශාලාවකම සේවක පිරිස් සමග සාකච්ඡා පැවැත්වීම ආරම්භ කළේ. ඒ සාකච්ඡා මාර්ගයෙන් තමයි, මම ඒ ස්ථානවලින් බලාපොරොත්තු වන නිෂ්පාදන ශක්තිය වැඩි කර ගන්නේත්, කාමයක් ඇතිව, විනයක් ඇතිව එම ස්ථානවල නියම පරිසරයක් ඇතිකර ගන්නේත්.

මින්නේරියේ කම්හල තතර කිරීම සම්බන්ධයෙන්, වයා දැමීම සම්බන්ධයෙන් කලවානේ ගරු මන්ත්‍රීතුමා (සරත් මුත්තෙට්ටුවෙගම මහතා) කතා කළා. මීට ඉස්සරත් අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) මේ ගැන ප්‍රශ්න කළ අවස්ථාවේදී මම උත්තර දී තිබෙනවා. අප මින්නේරියේ කම්හල වයා තිබෙන්නේ තාවකාලිකව, මාස දෙක තුනකට පමණක් බව මම දැනුම් දුන්නා. හේතුව වෙන මොකවත් නොවෙයි. අපි දැනට මේ රටේ වැඩි හරියක් නිෂ්පාදනය කරන්නේ කපු නූල්. කපු නිෂ්පාදනය දැන් අපට වැඩි වී තිබෙනවා. අද ජනතාව හුගක් පුරුදු වී තිබෙන්නේ කෘතිම රෙදි අඳින්නයි. නමුත් කෘතිම නූල් නිෂ්පාදනය වෙනවා අඩුයි. ඒකයි අපි කල්පනා කර තිබෙනවා මින්නේරියේ කර්මාන්ත ශාලාවේ කෘතිම නූල් නිෂ්පාදනය කිරීමේ යන්ත්‍රෝපකරන හරිගස්සා ඒ කම්හල ඒ තත්ත්වයට පරිවර්තනය කරන්න. අපි ඒ සඳහා ව්‍යාපෘතියක්, වැඩ පිළිවෙලක්. සැලැස්මක් ලැස්ති කර තිබෙනවා. ඒ අනුව ඉතා ඉක්මනට එහි වැඩ ආරම්භ කරනවා.

දැන් තමුන්නාන්සේලාට පෙනෙනවා ඇති, මා අතේ තිබෙන මේ රෙද්ද පූගොඩ නිෂ්පාදනය කළ එකක් බව. මෙය නිෂ්පාදනය කර තිබෙන්නේ සියයට සියයක්ම කපු නූල්වලින් නොවෙයි. මෙහි සියයට හැට පහක් කෘතිම නූල්. කපු නූල් තිබෙන්නේ සියයට තිස් පහක් පමණයි. ජනතාව කැමති මේවාටයි. ජනතාව ඉල්ලන දේයි, අපි දෙන්න ලැස්ති වන්නේ. මොකක් හරි එකක් හදා ඒකම අඳින්න කියා අපි ජනතාවට බල කරන්නේ නැහැ. ජනතාව අපේක්ෂා කරන්නේ මොනවාද කියන එක ගැන අපි ඉතාම සෝදිසියෙනුයි ඉන්නේ. ඒවා නිෂ්පාදනය කිරීමටයි, අපේ බලාපොරොත්තුව. 1977 වන තුරුම අපේ රටේ තිබුණු කර්මාන්තශාලාවල නිෂ්පාදනය කළේ අපේ රටේ ජනතාවට වුවමනා කරන විධියේ දේවල් නොවෙයි. ඒවායේ හදන දේවල් විකුණා ගන්නට බැරුව තිබුණා. එදා රෙදි සහ නූල් ගෙන්වීම් ආණ්ඩුව විසින් ඒකාධිකාරයක් හැටියට පවත්වාගෙන ගියත් ඒ කර්මාන්තශාලාවල හදන දේවල් විකුණා ගන්නට බැරි තත්ත්වයක් තිබුණා. ඒවා ජනතාව ප්‍රතික්ෂේප කළා. ඒවා පාවිච්චි කරන්නට පුළුවන් තත්ත්වයක තිබුණේ නැහැ. ඒ ඇදුම් ඇදගෙන පාරක බැහැලා යන්නට පුළුවන් තත්ත්වයක තිබුණේ නැහැ.

අහාවප්‍රාප්ත හිටපු ආහාර හා සමුපකාර ඇමති එස්. බී. හේරත් මැතිතුමා විරුද්ධ පාර්ශ්වයේ ඉඳගෙන, ජවාගේම වේදිකා මත නැගී එදා රජය ජනතාවට රෙදි සැපයුවේ කොයි ආකාරයටද කියන එක ප්‍රසිද්ධියේ විවේචනය කළා. එදා තිපදවූ රෙද්ද නොයෙක් නොයෙක් ආකාරයට විග්‍රහ කළා. ජවා මවුදු වගේ රෙදි. ජවා දැන් මේ අයට අමතක වෙලා. ජවා දැන් අපට අවුරුද්දෙන් අවුරුද්ද මතක් කර දෙන්නට සිදු වෙලා තිබෙනවා. ජවා ලාම්පු තෙල් ගදයි, එලෝ මෙලෝ දෙලොවම පෙනෙනවාය කිව්වා. අලුතෙන් පැමිණි බද්දේගම ගරු මන්ත්‍රීතුමාත් (අමරසිරි දොඩංගොඩ මහතා) ජවා අඳින්නට දෙන්නයි කියනවා. ඉන්දියාවේ නායකයෝත් ඇන්දාලු. අපේ සංස්කෘතිය සභ්‍යත්වය පාවා දෙන්නට අපි ලැස්ති නැහැ. අවුරුදු දෙදහස් පන්සියයක් තිස්සේ හිරි ඔතප් ආරක්ෂා කරගෙන හොඳට හැඳ පැළඳ ජීවත් වෙන්නට කැමති ජනතාවකුයි මේ රටේ ජීවත් වෙන්නේ. මේ රටේ ජනතාව මොන තරම් උස්සනට ඉන්න කැමතිද ? ඉතින් අරවාගේ ලජ්ජා නැති විධියේ ඇදුම් අඳින්නට කැමතිවෙයිද ?

ආණ්ඩුව මාර්ගයෙන්ම අමු ද්‍රව්‍ය ගෙන්වා, ආණ්ඩුව මඟින්ම පාලනය කර, ආණ්ඩුව මඟින්ම රෙදි තිපදවා මේවා ඇඳපල්ලා කියා ජනතාවට කිව්වා. ඒක ගන්නටත් හුලඳත්තක් අරගෙන පාන්දර පෝලිමේ ඉන්නට යන්න ඕනෑ. ඒ යුගය තමුන්නාන්සේලාට මතක ඇති. අද අපි විදේශිකයන්ට පාලනය භාර දී තිබෙනවාය කියනවා. ස්වදේශගත කළ යුතුයි කියනවා. ජාතික කැක්කුමක් ඇති විය යුතුයි කියනවා. මේවා ඔක්කොම කියල තමයි එදා ශ්‍රී ලංකා නිදහස් පක්ෂ රජය විසින් රෙදි නිෂ්පාදන නීතිගත සංස්ථාවක් ඇති කර තිබුණේ. එදා නූල් ගෙන්නුවේත්, සායම් ගෙන්නුවේත්. රෙදි නිෂ්පාදනය සඳහා වුවමනා කරන අනිකුත් ද්‍රව්‍යත් ගෙන්නුවේත් එකෙන් තමයි. එකෙන්ම හම්බ කළ කොටසකුත් මේ රටේ සිටියා. අවශ්‍ය තරම් ප්‍රමාණයක් එකෙනුත් ගෙන්නුවේ නැහැ. ඔය අත් යන්ත්‍රවලට එදා මොනවාද සිදුවුණේ. අත් යන්ත්‍රවලටය කියා නූල් ගෙන්නුවාට අත් යන්ත්‍ර තිබෙන අයට නොවෙයි එදා ජවා බෙදා දුන්නේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කවුරු හරි දේශපාලන පන්දමකාරයෙක් හිටියා නම් අන්න එයාටයි ඒක දුන්නේ. ඒ උදවිය ඒවා අරගෙන ගිහින් වැඩි ගණනකට විකුණාගෙන ඒකෙන් ජීවිකාව කර ගන්නා. අවශ්‍ය ප්‍රමාණයට අඩුවෙන් ගෙන් වූ නිසා බොහොම ලෙහෙසියෙන් ඒක කරන්නට පුළුවන් වුණා.

අපේ ගරු ජනාධිපතිතුමා මේවා සියල්ලක්ම වේලාසනින් දැනගෙන රෙදි නිෂ්පාදනය සම්බන්ධයෙන් කළ යුත්තේ මොකක්ද කියන එක තීරණය කරගෙන, වැඩ පිළිවෙල සකස් කරගෙනයි සිටියේ. එහෙම තීරණය කරගෙන රෙදි ගෙන්වීමට තිබුණු එකම ආයතනය අහකට දමා ඕනෑ කෙනෙකුට මැෂින් ගෙන්වන්නට ඉඩ දුන්නා. ඕනෑ කෙනෙකුට නූල් ගෙන්වන්නට ඉඩ දුන්නා. මේ සියල්ලක්ම විවෘත කළා. ඒ නිසා මේක ඇතුලේ තරගකාරී තත්ත්වයක් ඇති වුණා. ඊට පසුව, අවුරුදු ගහක් තිස්සේ මේ රටේ අඳින්නට රෙදි කැල්ලක් නැතිව හිටපු අපේ අර දුප්පත් අහිංසක ජනතාවට, කිර්වස්තුයෙන් වගේ හිටපු ජනතාවට බොහොම සන්තෝෂයෙන් රෙදි කැල්ලක් දකින්නට අඳින්නට ලැබුණා. අද ඒ ජනතාව පාරක තොටක බැහැලා ගියත්, රාජ්‍යමකට ගියත් මොන තරම් ලස්සනට හැඳ පැළඳගෙන සිටිනවාද ? එහෙම වෙලා තිබෙත්තේ අපි මේ ප්‍රතිපත්ති වෙනස් කළ නිසයි.

අ. භා. 3.15

පරණ තාලයටම ගහන්නට තොවෙයි ජනතාව අපව පත් කළේ. ඒ ගැන පොඩ්ඩක් කල්පනා කර බලන්න. පරණ විධියටම ඒකාධිකාරය තබාගෙන ඒකෙන්ම නූල් ගෙන්වා, ඒකෙන්ම රෙදි නිෂ්පාදනය කර වුවමනා කරන අමු ද්‍රව්‍ය සියල්ලමත් ඒකෙන්ම ගෙන්වා රෙදි නිෂ්පාදනය කර ජනතාවට දෙන්නට නම් තමුන්නාන්සේලාව පරාජය කර ජනතාව අපට බලය ලබා දෙන්නේ නැහැ. ඒක වෙනස් කරන්නටයි, අපට බාර දුන්නේ. ඉතින් අපි ඒක කළා. අද අපි ස්වයංපෝෂිත වන ප්‍රමාණයට ඇවිත් තිබෙනවා. [බාධා කිරීමක්]

අපි විදේශීය රෙදි ගෙන්වනවා යයි මිට පොඩ්ඩකට කලින් අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) කිව්වා. විකුණා ගන්නට බැරි තරම් විදේශීය රෙදි ප්‍රමාණයක් අද සර්එසලේ තිබෙනවා. නමුත් ඒ කටදා ගෙනා ඒවාද ? 1981 ගෙන්වූ රෙදි. ඒ අයට පිටරටින් ගෙන්වන්න අවසර ලැබුණේ රෙදි යාර දශ ලක්ෂ 10 යි. අපේ අමාත්‍යාංශය සමග සාකච්ඡා කර අපේ අවසරය ලැබුණාට පසුව පමණයි, සර්එසලට රෙදි ගෙන්වන්නට පුළුවන්. 1981 දී සර්එසල ගෙන්නුවේ රෙදි යාර දශ ලක්ෂ 10 යි. ඒ රෙදිවයි තවම විකුණා ගන්නට බැරිව තිබෙන්නේ. ජනතාවට වුවමනා රෙදි අද අපි මෙහිම නිෂ්පාදනය කරනවා. තුල්හිරිය, පූගොඩ, වෙයන්ගොඩ ආදී කම්හල්වලින් ජනතාවට අවශ්‍ය රෙදි අද අපි නිපදවනවා. විවෘත ආර්ථිකයක් ඇති කර අපි නිකම් හිටියේ නැහැ. අපේ කර්මාන්තශාලාවල තිබෙන දැවැන්ත මෝල්වල නිෂ්පාදනය උපරිම ධාරිතාව දක්වා වැඩි කළා. එමෙන්ම රෙදිවල නිෂ්පාදන තත්ත්වයත් උසස් කළා. නූල්වල තත්වයත් උසස් කළා.

කවදාවත් නූල් මේ රටින් පිටරට යැව්වා කියා අහලාවත් තිබෙනවාද ? ඉතිහාසයේවත් තිබෙනවාද ? මෙහි හදන නූල් ගැන මම තමුන්නාන්සේලාට කියන්නම්. 1977 අපි භාර ගන්නා විට තුල්හිරියෙන් හැම වර්ෂයකම රුපියල් දශ ලක්ෂ නිහක හතලිහක පාඩුවක් වින්දා. ඒ තුල්හිරියෙන් පමණක්. එහෙත් 1981 සිට තත්ත්වය බලන්න. මේ රටේ පරිභෝජනයට පමණක් නොවෙයි, පිටරට යැවීමටත් රෙදි නිෂ්පාදනය කළා.රෙදි පමණක් නොවෙයි නූලුත් පිටරට යැව්වා. [බාධා කිරීමක්] තමුන්නාන්සේලා හැමදාම සමාජවාදය කරේ ගහගෙන වෙනම කණ්ණාඩියක් දමා ගෙන ඒකෙන් බලනවා. ඕකෙන් බලබලා හිටි මහරගම ගරු මන්ත්‍රීතුමාගේ (දිනේෂ් ගුණවර්ධන මහතා) පියාත් ඒ පරණ හණමිටිය පැත්තකින් තබා අපිත් සමග එක් වී වැඩ කළානේ.

දිනේෂ ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)
එහෙම එකතු වුණත් සංස්ථා විදේශිකයිනුට දුන්නේ නැහැ.

විජයපාල මෙන්ඩිස් මහතා
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)
අපි මෙහි කපු වැවුලුට කියන්න පුළුවන්, සියයට සියයක් කපුවලින් ස්වයම්පෝෂිත වුණා කියා. අපි කපු පිටරටින් ගෙන්වා නූල් හැදුවේ මෙහේ. එසේ හද, අපි විදේශ විනිමය උපයාගෙන තිබෙනවා. 1980 නූල් කිලෝග්‍රෑම් 1,15,875 ක් යවා තිබෙනවා. එහි වටිනාකම ඩොලර් 5,83,284 යි. රුපියල් වලින් නම් 1,19,57,322 යි. 1982 කිලෝග්‍රෑම් හැත්තෑදහස් ගණනක් යවා තිබෙනවා, වටිනාකම රුපියල්වලින් 77,19,096 යි. 1983 දී කිලෝග්‍රෑම් 64,000 ක් යවා තිබෙනවා, වටිනාකම රුපියල්වලින් 78,11,302 යි. මේ නූල් පමණක් යවා ලැබූ ආදායමයි.

ඒ වගේම තමයි රෙදිත්. අපේ විරුද්ධ පාර්ශ්වයේ හැම කෙනෙක්ම කථා කළේ මේ මෝල්වල පාලනය පිටරැටියන්ට පැවරීම ගැනයි. මේකෙ කොහොමද අපි වෙනසක් කරන්නෙ? තමුන්නාන්සේලාගේ කාලයේ අපේ ලංකිකයො ඉස්සරවෙලාම මේවා පාලනය කළා. අපේ කාලයෙත් සංස්ථාව මාර්ගයෙන්මත් තවත් මේ රටේ තිබුණු පොදුගලික සමාගම්වලිනුත් පාලනය කළා. නමුත් අපට බලාපොරොත්තු වූ ප්‍රතිඵල ලබාගන්නට බැරිවුණා. අපට පෙනුණා මෙතැන මොනවා හරි අඩුපාඩුවක් තිබෙන බව. එක්කෝ අපේ උදවිය තියම ශක්තිය යොදු වැඩ කරන්නෙ නැහැ. එහෙම නැත්නම් නියම විධිය පෙන්වා දීමට අවබෝධයක් ඇති පිරිස් නැහැ. මොකක් හෝ අඩුපාඩුවක් තිබෙනවා. ඒ නිසා අපට වුවමනා වුණා කෙසේ හෝ ජනතාවට වුවමනා කරන දේ සපයා දීමට. අපේම මේ දැවැන්ත මෝල් වලින් ඒවා නිෂ්පාදනය කර දීමට ක්‍රමයක් අපි සෙව්වා.

අපේ සංස්ථාවට බැරිවුණා නම්, අපේ පොදුගලික අංශයට බැරි වුණා නම්, ඊළඟට ගන්න තිබුණු පියවර තමයි විදේශ සමාගම් කැඳවා ඒ උදවියට භාර දීම.

එස්. ඩී. බණ්ඩාරනායක මහතා
(திரு. எஸ். டி. பண்டாரநாயக்க)
(Mr. S. D. Bandaranayake)
තාක්ෂණික දැනීම පමණක් නම් ඒ විදේශ රටවලින ලබාගන්නෙ, ඒක වැදගත් වෙනවා.

විජයපාල මෙන්ඩිස් මහතා
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)
ඒක තමයි මම මේ කියන්න ආවෙ.

මේවා සැම අතකින්ම අත්තිම ප්‍රපාතයට වැටී තිබුණු, කාලයක් තමුන්නාන්සේලාගේ කාලය. ඒ කාලයේ මේ මෝල් වලින් රෙදි වෙනුවට වෙනත් දේවල් නිෂ්පාදනය කළේ. අපි කල්පනා කළා, ඒ මෝල්වලින් උපරිම ප්‍රයෝජනය ලබාගන්නට. තුල්හිරිය, වෙයන්ගොඩ, පූගොඩ, මේවා විශාල මෝල්. මේවාට අපේ ධනස්කන්ධයක් යටකර තිබෙනවා. ඒ නිසා ඒවායින් ප්‍රයෝජන ගත යුතුයි. විදේශ සමාගම්වලට අපි මේවා භාර දුන්නේ ඒවා පාලනය කිරීමටයි. නිෂ්පාදනය කිරීමත්, ඒවා අලෙවි කිරීමත් මේ පාලනයට අයත් වෙනවා. ඒ සමගම අපේ අයට තාක්ෂණික පුහුණුව ලබා දීමත් අපි එයට ඇතුළු කළා. ඒ පුහුණුව මේ රටේ මෝල් වලදී ලබාදීම පමණක් නොවෙයි, පිටරට ඇති ඒ අයගේ කර්මාන්ත ශාලාවලදීත් ඒ පුහුණුව ලබා දිය යුතුය යන්න අපේ එක කොන්දේසියක් වුණා. ඒ අනුව අපේ අය අදත් එංගලන්තයට ගිහින් තිබෙනවා, මැන්චෙස්ටරයට ගිහින් තිබෙනවා, බොම්බේ ගිහින් තිබෙනවා, කොයිත්බටූර් ගිහින් තිබෙනවා. ඉන්දියාවේ වෙනත් නොයෙකුත් ප්‍රදේශවලට ගිහින් තිබෙනවා කවදාවත් පිටරට නොගිය අපේ මේ සේවකයින් පිටරට ගිහින් තාක්ෂණික පුහුණුව ලබාගෙන තිබෙනවා.

මේ සියල්ලක්ම හැමදම තිබෙන කොන්ත්‍රාත්තු නොවෙයි. මේවා සීමා වෙලා තිබෙනවා අවුරුදු හතකට. ඊට පසුව අපේ උදවිය භාර ගන්නට ඕනෑ මේ කර්මාන්ත ශාලා. නිෂ්පාදනය කිරීමට. සැලැස්මක් අනුව එතැන් සිට ඉදිරියට ගෙන යන්නට ඕනෑ, නිසි ලෙස පාලනය කරගෙන යන්නට ඕනෑ. කර්මාන්තය සම්බන්ධව ඒ මැෂින් සම්බන්ධව දැනුම ඇති කරගන්න ඕනෑ. මේ ඔක්කොම සැණ ශක්තිය අද ලබා දීගෙන යනවා. ඒ අතරම අපි යන්තෝෂයි කියන්න, අද අපි විශාල දියුණුවක් ලබා තිබෙන බව.

අපේ සමහර ගරු මන්ත්‍රීතුමන්ලා විශ්වාස ගන්නෙත් නැහැ අද අපි නූල් පිටරට යවනවා කිව්වාම. අපේ මහරගම ගරු මන්ත්‍රීතුමාටත් ටිකක් අමාරුයි ඒක පිළිගන්න. ඇයි හැමදාම අපි පිටරටින් නූල් ගෙන්නුවානේ. නමුත් අපි අද නූල් පිට රට යවනවා. ඒක මේ මන්ත්‍රීතුමන්ලා දන්නවාදැයි මම දන්නේ නැහැ. අද මේ ඔක්කොම මෙහේ හදනවා. එදා පිටරටින් ගෙන්නුවා. අද පිට රට යවනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අමරසිරි දෙඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)
විශාල කොම්පැණි ඇවිල්ලා මෙහේ හදලා එහෙ යවනවා.

විජයපාල මෙන්ඩිස් මහතා
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)
නැහැ, නැහැ, අපේ කර්මාන්තශාලාවල පමණක් නොවෙයි, පෞද්ගලික අංශයේ ඒවායිනුත් යවනවා. මෙන්න, පෞද්ගලික අංශයෙන් ඇමෙරිකානු ඩොලර් 24,418 ක් වටිනා නූල් නොගයක් ඔක්තෝබර් මාසවල පිටරට යවා තිබෙනවා, ඒ වාගේම බටහිර වෙළඳපොළ වලට, ස්විට්සර්ලන්තයට යවා තිබෙනවා, බටහිර ජර්මනියට යවා තිබෙනවා. බලන්තකො මේ විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීතුමන්ලා දන්නේ නැහැනේ. ඔය නූල් සුත්තර ඇද ඇද හිටිය මියක්. අනෙක් පැත්තෙත් මේවාත් දැනගත්ත ඕනෑ.

අමරසිරි දෙඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)
"යුනයිටඩ් ස්පිනිං ඇන්ඩ් විවිං මිල්ස්" කියන්නේ පිටරට එකක්ද ?

විජයපාල මෙන්ඩිස් මහතා
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)
"යුනයිටඩ් ස්පිනිං ඇන්ඩ් විවිං මිල්ස්" කියා ලංකාවේ තිබෙනවා පෞද්ගලික අංශයට අයිති සමාගමක්. ඒගොල්ලොත් නූල් පිටරට යවනවා. අපේ අමාත්‍යාංශය යටතේ තිබෙන කර්මාන්තශාලාවලිනුත් යවනවා. බලන්තකො මේ රටේ වෙන දේවල් දන්නෙ නැහැනෙ මේගොල්ලො. [බාධා කිරීමක්] දැන ගෙන අර මොකක්ද හංගන් නවත් එකකින්නෙ කතා කරන්නෙ, බඩේ බිජු තියාගෙන.

අ. භා. 3.30

1983 වර්ෂයේදී බටහිර වෙළඳපොලවලට අපනයනය කර ඇති මුළු නූල් ප්‍රමාණය කිලෝ ග්‍රෑම් 24,331 යි. එහි වටිනාකම ඇමරිකන් ඩොලර් 70,840 යි. එතම් රුපියල් 17,10,339.45 යි. යුරෝපීය රටවල් කිහිපයකටම මෙම නූල් යැවීම සඳහා තවත් කොන්ත්‍රාත් ඇති කර ගෙන තිබෙනවා. මේවා හැම රටකින්ම වාගේ ඉල්ලනවා. මේ අනුව මෙහි දියුණුවක් ඇති වී තිබෙනවා. 1984 දී අදුනින් කිලෝ ග්‍රෑම් 1,50,000 ක් යවන්න තිබෙනව. එහි වටිනාකම රුපියල් දස ලක්ෂ 11.9 යි. ඒ කියන්නේ රුපියල් ලක්ෂ 119 ක්.

අපේ මුදල් ඇමතිතුමාගේ අයවැය වාර්තාවේ විශේෂ අංගයක් හැටියට විදේශ විනිමය සොයා ගැනීම ගැන සඳහන් වී තිබුණා. අපේ නිෂ්පාදනය වැඩි කර විදේශ විනිමය සොයා ගන්නවා නම් එය අපේ රටට විශාල සහනයක් වෙනවාය කියා එහි තිබෙනවා. බලන්න, අපේ ක්ෂේත්‍රයෙන් කොපමණ විදේශ විනිමය ප්‍රමාණයක් ලබාගෙන තිබෙනවාද කියා. කලවාන ගරු මන්ත්‍රීතුමා (සරත් මුත්තෙට්ටුවෙගම මහතා) මෙතන සිටියේ නැහැ. අපි, රෙදි, නූල්, ඇඟලුම්වලින් සැහෙන විනිමය ප්‍රමාණයක් උපයාගෙන තිබෙනවා. ඇඟලුම් පිටරට යවා 1977 වන විට රුපියල් දස ලක්ෂ 131 ක් ලබා ගෙන තිබෙනවා. 1982 වන විට රුපියල් දස ලක්ෂ 3,912 ක් ලබා ගන්නා. 1984, 85 වන විට එය රුපියල් දස ලක්ෂ 4,000 ඉක්මවනවා. මෙහි මොන තරම් දියුණුවක් වී තිබෙනවාද? අපේ නිෂ්පාදනයක් වන ගෝස් ගැන—ඒ කියන්නේ දුහුල් රෙදි. ඉස්පිරිතාලවල තුවාල සඳහා පාවිච්චි කරන බැන්ඩේජ් පටි ආදී දේවල්—සාකච්ඡා වුණා. 1982 වර්ෂයේ සිට ඒවා පිටරටින් ගෙන්වීම සම්පූර්ණයෙන්ම නතර කර තිබෙනව. ඒවා නිෂ්පාදනය කිරීම අන්‍යන්ත්‍ර ජේෂ්ඨ කාර්මිකයන්ට භාර දී තිබෙනවා. දැන් සියයට සියයකම ඒවා නිෂ්පාදනය කරන්නේ අපේ රටේ. එම නිසා අපේ නිස්සහාරාම ගරු මන්ත්‍රීතුමා (වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා) දැන ගත යුතුයි ඒ අංශයෙනුත් අපි දැන් ස්වයංපෝෂිත වී තිබෙන බව.

වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා
(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)
(Dr. P. M. B. Cyril)
ගරු ඇමතිතුමනි, ඒ පැත්තටත් ඒ කර්මාන්තශාලාවක් දෙනවානම් හොඳයි.

විජයපාල මෙන්ඩිස් මහතා
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)
මේ කර්මාන්තශාලා වැඩි කරන්න අමාරුයි. ඉල්ලුම් අනුව පමණයි ඒවා වැඩි කරන්න පුළුවන් වෙන්නේ. දැන් අපි නිෂ්පාදනය කරන ප්‍රමාණයට වඩා නිෂ්පාදනය කළොත් නිෂ්පාදකයා අමාරුවේ වැටෙන්න පුළුවන්. අලුතින් මෙම කර්මාන්තශාලා ඇති කිරීම සඳහා ඉල්ලුම් පත්‍ර ලැබී තිබෙනවා. නමුත් අලුත් කර්මාන්තශාලා ඇති කිරීම තාවකාලිකව නතර කර තිබෙනවා, මේවා සඳහා ඉල්ලුම වැඩිවනතුරු.

අපේ දිවුලපිටියේ ගරු මන්ත්‍රීතුමා—දිවුලපිටියේ නොවෙයි—අත්තනගල්ලේ මන්ත්‍රීතුමා මෙහි පැමිණ සිටිනවා. එතුමා ඉස්සර දිවුලපිටියේ මන්ත්‍රීතුමා. ඉස්සර මගේ ආසනයට අල්ලපු ආසනයේ ඉඳල අර ආසනයට එතුමා ගියා. මා දන්නේ නැහැ, ඊළඟට කොහාට යයිද කියා [බාධා කිරීම්] නූල් සම්බන්ධයෙන් මන්ත්‍රීතුමා කියූ දෙයට උත්තර දුන්නා. තමුන්නාන්සේලාගේ කාලයේදී නූල් ගෙත්වා තිබුණේ විස්සෙන් දෙකේ මානයේ නූල් රාත්තලක් රුපියල් 13.70 වයි. එවිට කිලෝ ග්‍රෑම් එකක් රුපියල් 28 ක් 29 ක් වෙනවා. තිහේ මානයේ රාත්තලක් රුපියල් 15.85 යි, හතළිහේ මානයේ රාත්තලක් රුපියල් 17.15 යි, පනහේ මානයේ රාත්තලක් රුපියල් 24.00 යි, තිහෙන් දෙකේ මානයේ රාත්තලක් රුපියල් 16.70 යි. එවිට කිලෝ එකක් රුපියල් 35 ක් වෙනවා. ඒ තමුන්නාන්සේලාගේ කාලයේදී තිබුණු මිල ගණන්.

This is the price of yarn that you imported. It was Rs. 16.70 per pound. So, a kilo whould be about Rs. 35.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)
How much is it now ?

විජයපාල මෙන්ඩිස් මහතා
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)
Now it is about Rs. 70. You said Rs. 70.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)
That is what is in the papers. What about the 6 per cent BTT ?

විජයපාල මෙන්ඩිස් මහතා
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)
That is not my business. That is a proposal by the Minister of Finance. What can I do ? We have to respect that.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)
The BTT was 1 per cent then. Then it rose to 4 per cent, and now in 1981 it is 6 per cent.

ආර්. එම්. ධර්මදස බණ්ඩා මහතා
(திரு. ஆர். எம். தர்மதாச பண்டா)
(Mr. R. M. Dharmadasa Banda)
Not in every case.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

The popular yarn is that. That is a big yarn !

ඒක ගෙවන්න වෙන්නෙ පාරිභෝගිකයාටයි.

විජයපාල මෙන්ඩිස් මහතා
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)

මම මේ කරුණු සඳහන් කළේ අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමාගේ දැනගැනීම පිණිසයි. කලවාතේ ගරු මන්ත්‍රීතුමා (සරත් මුත්තෙට්ටුවෙගම මහතා) කිව්වා, බලවේග කර්මාන්තශාලා විදේශීය සමාගම්වලට දී තිබෙනවාය—විකුණා තිබෙනවාය—කියලා. බලවේග කර්මාන්තශාලා එකක්වත් විදේශීය සමාගම්වලට විකුණලා නැති බව කියන්නට ඕනෑ. තවම දෙපාර්තමේන්තුවෙන් ස්ථාන දෙකක් පාලනය වෙනවා. අනෙක් දහය විකුණලා තිබෙන්නේ ටෙක්ස්ටර් කැදවා ලංකාවේ උදවියට පමණයි. පොද්ගලික කොම්පැණියක් සමග හවුල්වෙලා සඵසල එකක් අරගෙන තිබෙනවා. තුවරඑළියේ තව එකක් පුද්ගලයෙකු විසින් අරගෙන වෙනත් විදේශ සමාගමක් සමග කොන්ත්‍රාත් ක්‍රමයකින් පවත්වාගෙන යමින් එහි නිෂ්පාදනය වන සැම දෙයක්ම පිටරට යවනවා. [බාධා කිරීම්] කොන්දේසියක් ගැන තොවෙයි කියන්නේ. තුවරඑළියේ තිබෙන පවර් ලූම් එක ගැනයි කියන්නේ. පවර් ලූම්වලට කොන්දේසි තැහැ. ඒවා අපි විකුණලා ඉවරයි. ඒක අපට අයිති තැහැ.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

No, but those conditions. We want those conditions.

විජයපාල මෙන්ඩිස් මහතා
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)

පවර් ලූම්වලට මොනවාද කොන්දේසි? ඒවා පොද්ගලික අංශයට විකුණලා තිබෙන්නේ.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

There is a very clear, definite document No. 3/4/489 Department of Textiles. Conditions of Tender for the Sale of the Powerloom Project at Polgolla of the Department of Textile Industries. Then you go on to Polgolla, Kundasale, Ampitiya, Gampola, Gampola New, Nugawela, Matale, Ranwela etc. There are conditions. Very serious conditions are here, which have been violated.

විජයපාල මෙන්ඩිස් මහතා
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)

Those are the conditions as to how they should pay back.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

Exactly. It is sligned by Mr. P. A. T. Gunasinghe. Not only that even the workers are tied down with conditions. That is what I am telling you. I will quote you 2/3/10/1 of 80/5 එතැනත් තිබෙනවා පොල්ගොල්ලේ සාමාන්‍යාධිකාරීට ලියන ලද ලියුමක්. "මෙන්න මේ කොන්දේසි උඩයි කම්කරුවෝ ටික ගන්න ඕනෑ" කියලා.

This is what I am telling you. Then about payment they have violated–

විජයපාල මෙන්ඩිස් මහතා
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)

There is no question of our violating anything. One of the conditions was that they should have taken all the workers at that time and that the workers should get all the benefits they were enjoying.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

They did not take all the workers.

විජයපාල මෙන්ඩිස් මහතා
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)

They took. At the time we handed over they took all the workers.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

But then subsequently they sent them away ! Those conditions were there. Even railway warrants were to be given.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

They did not take all the workers. There are disputes pending even now.

විජයපාල මෙන්ඩිස් මහතා
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)

Where ? There is the Labour Department, which is most competent to–go into there.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

May I mention, Wellwoven Limited, Uyanwatte, Polgolla. There is a dispute there because they have violated Clause 4. Even about payment of their instalments to the Bank.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

From Yatiyantota they did not take anybody.

විජයපාල මෙන්ඩිස් මහතා
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)

What have we got to do with the Bank payments ?

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

That is exactly the condition of sale. You do not know what you have done !

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විජයපාල මෙන්ඩිස් මහතා
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)

I know exactly what it is. There the conditions were that they should take all the workers and that they must be allowed to have the benefits they were enjoying.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

If the conditions have been violated what will you do ?

විජයපාල මෙන්ඩිස් මහතා
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)

If it is a labour dispute, of course, they must go to the Labour Department.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

Not Labour. If the conditions of sale have been violated what is the use of talking about Labour ?

විජයපාල මෙන්ඩිස් මහතා
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)

It is, of course, a labour dispute and it must go to the Commissioner of Labour.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

Then why did you have such a condition ?

විජයපාල මෙන්ඩිස් මහතා
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)

At the time of take over they must take all the workers. The agreement would support the workers if they go to court. The agreement is there.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

Everything has been violated. All the conditions have been violated. The financial, labour and purchase conditions have been violated. The Director of Textile Industries has pointed this out many times to the Ministry as well as to the owners, but they have not taken heed of it. A very serious matter, Sir, I am sorry, but anyway I had to mention this although I did not want to come out with all this.

විජයපාල මෙන්ඩිස් මහතා
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)

අපට විශේෂයෙන් පාලනය වෙනස් කරන්නට සිදුව තුණේ ඒකයි. විරුද්ධ පාර්ශ්වයේ අර්ථ මන්ත්‍රීතුමාගේත්, කලවානේ ගරු මන්ත්‍රීතුමාගේ සහ අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමාගෙත් අදහස් හා විවේචන අනුව විදේශීය සමාගම් වලට මේ පාලනය දීම ගැන තමුන්නාන්සේලා විරුද්ධයි. අපි ඒක දන්නවා. අපි ඒක පිළිගන්නවා. තමුන්නාන්සේලාට එයට එක් වන්නට අමාරුයි. තමුන් එහෙම නොදී තමුන්නාන්සේලා පාලනය කළ කාලයේ ජනතාව සිටියේ කිරිවස්ත්‍රයෙන්. අත්න ඒක අපි වලක්වන්නට ඕනෑ. අපි තාවකාලිකවයි මේවා විදේශීය සමාගමවලට දී තිබෙන්නේ. තාක්ෂණික දියුණුව ගැන අපේ උදවිය දැනගත්තා තුරු පමණයි, දී තිබෙන්නේ. අපේ උදවියට අවශ්‍ය පුහුණුව මෙහිදීත් පිටරටදීත් ලබා දෙන්නට ඕනෑ නිසයි, දී තිබෙන්නේ.

මහජනයාට හරියට අදින්න නොදී තිබුණු කාලයේ තමුන්නාන්සේලා එයින් ආශ්වාදයක් ලැබුවාදැයි මම දන්නේ නැහැ. අපට වුවමනා කරන්නේ ජනතාවට හොඳට අඳින්න දෙන්නයි. අපි, අපේ පාලන කාලයේදී ජනතාවට අවශ්‍ය ඇඳුම් කෙසේ හෝ ලබා දෙනවා. ජනතාවට පළමුකොටම කෑම අවශ්‍යයි. ඊළඟට ඇඳුම අවශ්‍යයි. ඒ අවශ්‍යතා හරියට ඉටු කරන්නට ඕනෑ. අත්න ඒ නිසයි ඒ විධියට වෙනස් කළේ. මේ තත්ත්වය යටතේ අපේ උදවියට අවශ්‍ය දැනුම ලබාගෙන ඊට පසු—මේ කොන්ත්‍රාත්තු අවසාන වුණාට පසු—අපේ උදවියට පුළුවන් පාලනය භාරගන්න. අපි ඒ විදේශීය කොම්පැනිවලින් ඉහළ දැනුමක්, හොඳ අධ්‍යාපනයක්, වැදගත් අභ්‍යාසයක් ලබා ගන්නවා. ඒ අයට මේ කර්මාන්තශාලාවල පරිපාලනය පැවරීම මගින් අපි බලාපොරොත්තු වන්නේ එයයි. මම කලින් කිව්වා, එක්තරා මෝලක රෙදි නිෂ්පාදනය කොයි තරම් දුරට අද දියුණු වී තිබෙනවාද කියා. ඒ වාගේම වෙයන්ගොඩ මෝලත් දියුණු වී තිබෙනවා.

මම මේ ගරු සභාවට පෙන්වා දුන්නා, අපට කෘත්‍රිම රෙදි අවශ්‍ය බව. ඒ වාගෙම් අපට කෘත්‍රිම තුලුත් අවශ්‍යයි. කෘත්‍රිම තුල් පිළිබඳව අඩුපාඩුකම් තිබෙනවා. තවමත් පිටරටින් කෘත්‍රිම තූල් එක්තරා ප්‍රමාණයක් ගෙන්වන්න සිදු වී තිබෙනවා. අපි බලාපොරොත්තු වෙනවා, මිත්තේරිය මෝලේ කෘත්‍රිම තූල් සකස් කරන්න. ඒ සඳහායි, දැන් වැඩ පිළිවෙල හරි ගස්සාගෙන යන්නේ. වැඩි කල යන්න ඉස්සෙල්ලා අපි නැවතත් මිත්තේරි මෝලේ වැඩ පටන්ගන්නවා. [බාධා කිරීම්] මම කලින් කිව්වානේ, මාස දෙකකටය කියල ? අපි ඒ සේවකයන්ට පඩි ගෙවනවා.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)
කොත්දේසි මොනවාද ?

විජයපාල මෙන්ඩිස් මහතා
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)
එක-එක කොත්දේසි තිබෙනවා.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)
ඒ කොත්දේසි මොනවාද කිව්වොත් හොඳයි. තුල්හිරිය කර්මාන්ත ශාලාවේ කටයුතු කරන බ්‍රෝසියර් උත්තැහේ රුපියල් ලක්ෂ 4 1/2 ක් ඩියුටි ගෙවල කාර් එකක් ගෙනැවිත් තිබෙනවා. ඒ ඩියුටි එක ගෙවල තිබෙන්නේ තුල්හිරිය කර්මාන්ත ශාලාවයි. මේක මහ පුදුම වැඩක් නේ ? එයා පොඩි කාර් එකක් ගෙනාවා නම් ඩියුටි එක අඩුයි. නමුත් මහ විශාල දැවන්න " ජගුවාර් " එකක් ගෙනාව නිසා අර විධියේ ලොකු ඩියුටි එකක් ගෙවන්න සිදු වී තිබෙනවා. ඒකටත් යොදවන්නේ අපේ රටේ සල්ලි. අපේ විරුද්ධත්වය තිබෙන්නේ ඒකටයි.

විජයපාල මෙන්ඩිස් මහතා
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)
තමුන්නාන්සේලාගේ කාලයේදී ඒ වාගේ කාර් ගෙන්නුවේත් නැහැ ; මෙහි රෙදි නිෂ්පාදනය කළේත් නැහැ. ඒ කර්මාන්ත ශාලා දිවේ පාඩුවටයි.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)
වෙන්න පුළුවන්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

විජයපාල මෙන්ඩිස් මහතා
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)

ඒක තේන්නම් අපිත් කියන්නේ. අද අපි ඒ මෝල්වල උසස් අන්දමින් රෙදි නිෂ්පාදනය කරනවා. දැන් ඒවායේ පාඩුව අත්තිමටම අඩු කර ලාබත් පෙන්වා ගෙන යනවා. වෙන මොනවාද, තමුන්නාන්සේලාට වුවමනා කරන්නේ ? අපි ජනතාව තිර්වස්ත්‍රව තබන්නේ නැහැ; ජනතාවට අවශ්‍ය රෙදි සපයනවා. දැන් අපි රෙදි පිටරටත් අරිනවා. තුලුත් පිටරට අරිනවා. ඒ මඟින් සැගෙන විදේශ විනිමය ප්‍රමාණයක් අපි ලබා ගන්නවා. මේ ආකාරයට ලොකු දියුණුවක් දැන් ලබාගෙන තිබෙනවා. තමුත් තමුන්නාන්සේලා අර පරණ හණ මිටි කරේ තියාගෙන ඇවිදිනවා. ජනතාව අපට බලය දුන්නේ මේ වැඩයත් හරියට කරන්නයි; ජනතාව තිර්වස්ත්‍රව නොතබන්නයි. අපි ඒ වැඩය කරගෙන යනවා.

අර ගෙවූ ඩියුටි එකත් ඒ වාහනය විකුණන වෙලාවට ආපහු ලබා ගන්න පුළුවන්.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)
ආපහු ලබා ගන්නේ කාගෙන්ද ?

විජයපාල මෙන්ඩිස් මහතා
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)
කාර එක ගැන කියපු නිසයි, මම ඒ ගැන සඳහන් කළේ.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

ඩියුටි ප්‍රශ්නය ගැන මුදල් ඇමතිතුමාත් එක්ක බලාගත්ත ඕනෑ. නමුත් ඒ ඩියුටි එක පවා ගෙවා තිබෙන්නේ තුල්හිරියයි. ඇත්ත වශයෙන්ම මේක ගෙවන්න ඕනෑ නැහැ. අපට පුළුවන්, ඒ වාහනය ආපහු ගෙන යන්නය කියන්න. එහෙම නැත්නම් ඒ වාහනය "ගවන්මන්ට් ස්ටෝර්ස්" එකට ගන්නය කියන්න පුළුවනි. නමුත් රුපියල් ලක්ෂ 4 1/2 ක් ඩියුටි ගෙවා තුල්හිරිය කර්මාන්ත ශාලාවයි, ඒ වාහනය අරගෙන තිබෙන්නේ. අයිතිකාරයා ඒ ඩියුටි එක ගෙවිවා නම් කමක් නැහැ.

විජයපාල මෙන්ඩිස් මහතා
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)

තුල්හිරිය නොවෙයි, වේයන්ගොඩ මෝල්ලේ "ටූටෝල්" සමාගමටයි, ඒක අරගෙන තිබෙන්නේ. ඒ මෝල පාලනය කරන්නේ ඒ උදවියයි. එම නිසා වාහන ගෙනෙන්න ඕනෑ, ඒ උදවිය. ඒ නිසයි, ඒ ඩියුටි එක ඒ මෝලෙන් ගෙවා තිබෙන්නේ. ඒක ආපහු ගෙන යන කොට, එහෙම නැත්නම් විකුණන කොට ඒ ඩියුටි එක ආපහු ගෙවන්න ඕනෑ.

අපි ඇහලුම් නිෂ්පාදන සම්බන්ධයෙන් සැගෙන දියුණුවක් ඇති කර තිබෙන බව මම කලින් පෙන්වා දුන්නා. ඇත්ත වශයෙන්ම කියනවා නම් තේ ළඟට වැඩිම විදේශ විනිමය ප්‍රමාණය අපට ලැබෙන්නේ ඒ ඇහලුම් කර්මාන්තයේ නිෂ්පාදන මඟිනුයි. විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීතුමන්ලා සමච්චලයෙන් "ටෙලර් ෂාප්පු" හැටියට හැඳින්වූ ඒ කර්මාන්ත ශාලාවලින් තමයි, අපට ඒ තරම් විදේශ විනිමයක් ලැබෙන්නේ. විරුද්ධ පාර්ශ්වයේ තව නායකතුමා ඒ කර්මාන්තශාලා "ටෙලර් ෂාප්පු" හැටියට සමච්චලයෙන් හඳුන්වා තිබෙන හැටි **හැන්සාඩ්** වාර්තාවෙන් මම දැක්කා. ගිය අවුරුද්දේ රුපියල් දසලක්ෂ තුන්දස් තමසිය ගණනක විදේශ විනිමයක් ඒ ඇහලුම් කර්මාන්තයෙන් අපට ලැබී තිබෙනවා.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக්ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

සමච්චලයක් හැටියට නොවෙයි, ඇත්ත නත්ත්වයයි කියා තිබෙන්නේ. අපේ ගොවියා උදැල්ලෙන් ගොවිතැන් කර ලබා ගන්නා නිෂ්පාදනය පිටරට යවා විදේශ විනිමය ලබා ගත්තාම එය හඳුන්වන්නේ උදැල්ලෙන් ලබා ගත් විදේශ විනිමය හැටියට නොවෙයි, ගොවියා ලබා ගත් විදේශ විනිමය හැටියටයි.

විජයපාල මෙන්ඩිස් මහතා
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)

අත්යන්ත්‍ර රෙදි ගැනත් තමුන්නාන්සේලා කථා කරනවා. එතුමන්ලාට ඒකේ ඉතිහාසයත් අමතක වී තිබෙනවා, එදා දහතායක මහතා ස්වදේශ ඇමති වශයෙන් ඉන්න කාලයේදී මේ රටේ හැම තැනම අත්යන්ත්‍ර මධ්‍යස්ථාන විවෘත කළා. හැම ආසනයකම මධ්‍යස්ථාන හත ගණනේ විවෘත කළා. ඒ විධියට ඒ වැඩ කරගෙන ආවා. එදා ඔය හැම දෙයක්ම කළේ සමුපකාර සමිති මඟිනුයි. ඊට පසුව සමුපකාර සමිතිවලින් ණය ලබා ගත්තා. එසේ ණය මුදල් ලබා ගත්තේ නූල්, වුවමනා කරන අමු ද්‍රව්‍ය, සායම් ආදිය ලබා ගත්තයි.

ඒ විධියට ඒවා ලබාගෙන රෙදි නිෂ්පාදනය කළා, පාරිභෝගිකයා ඒ රෙදි මිලදී ගත්තත් නොගත්තත්, ඒ රෙදි අලෙවි කරන්න පුළුවන් වුණත්, බැරි වුණත් ඒ ගැන සැලකිල්ලක් නොකර රෙදි නිෂ්පාදනය දිගටම කරගෙන ගියා. අත්තිමට රෙදි ඔක්කොම ගොඩ ගැහුනා. රෙදි යාර කෝටි ගණනක් ගොඩගැහුනා. මේ විධියට ගොඩගැහුනු රෙදිවලට මොනවාද කරන්නේ කියා 1977 දී අපට ප්‍රශ්නයක් වුණා. ගබඩාවල් හැම තැනම පිරිලා. මොනවාද මේවාට කරන්නෙ කියල සමුපකාර සමිතිවලින් හැම තිස්සේම අපෙත් අහන්න පටන් ගත්තා. සමුපකාර අමාත්‍යාංශයත් සමඟ යාකච්ඡා කර ඒවා අඩු මිලට හෝ විකුණන්නය කියා අපි විශේෂ අවසරයක් දුන්නා. තමුත් විකුණා ගන්න බැරි වුණා. මේ මැතක් වන තෙක්ම අපි ඒවා අඩු මිලට වික්කා. රෙදි දිරාපත් වෙන තත්ත්වයට පත් වුණා. ඇයි ? එදා සමුපකාර සමිතිවලින් ණය ගත්තා. රෙදි හැදුවා. මේ හදන රෙදි ආපසු හාර ගැනීමට සමාගමක් තිබුණා, "විවිං සප්ලයිස් කෝර්පරේෂන්"—**Weaving Supplies Corporation**—කියල. තවත් මොකක්දෝ සමාගමක්, මම හිතන්නෙ බිඩි සමාගමත් එක්ක හවුල් වෙලයි තිබුණේ. තමුන්නාන්සේලාට මතක ඇති. තමුත් ඒ රෙදි වික්කෙ නැහැ. විකුණන්න බැරි වුණා. සමුපකාර සමිතිවලින් අරගත් ණය ගෙවන්නත් බැරි වුණා. රෙදි ටික ගොඩගැහුනා. අර සමිති ඔක්කොම වැහීගෙන ගියා. ඔන්න ඔකයි සිදු වුණේ.

අ. භා. 3.45

දැන් අපි සම්පූර්ණයෙන්ම අලුත් ව්‍යාපාරයක් ආරම්භ කර තිබෙනවා. අද අපේ මෝල්වල රෙදි නිෂ්පාදනය දියුණු විගෙන එන විට, උසස් වර්ගයෙන් රෙදි නිෂ්පාදනය කෙරෙන විට අත්යන්ත්‍ර රෙදි අදින්නය කියා ජනතාවට බල කරන්න අපට පුළුවන්කමක් නැහැ. තමුත් අත් යන්ත්‍ර රෙද්දෙන් හදන එක් එක් වර්ග තිබෙනවා. හෝටල්වලට, ආරෝග්‍යශාලාවලට එහෙම නැත්නම් විදේශ විනිමය ලබා ගැනීම සඳහා මේවා නිෂ්පාදනය කරන්න පුළුවන්. ඒ නියම පාට, නියම සැලැස්ම, නියම මාදිලිය සොයා බලා ඒ අනුවයි අපි ඒ රෙදි හදන්න ඕනෑ. දැන් අපි කටයුතු කරගෙන යන්නේ අන්න ඒ අනුවයි. දැන් අපි හැම කොට්ඨාශයකම මන්ත්‍රීවරුන්ට ලියුම් යවා තිබෙනවා. මොන මොන මධ්‍යස්ථාන එකතු කර එක් මධ්‍යස්ථානයක් විවෘත කළ යුතුද කියා සොයා බලන ලෙස අපි මන්ත්‍රීවරුන්ට දන්වා යවා තිබෙනවා. අපි ඒ මධ්‍යස්ථානය විවෘත කරන්නේ දෙපාර්තමේන්තුව මඟිනුයි. සමුපකාරය මඟින් නොවෙයි. දෙපාර්තමේන්තුව විසින් ඒ කටයුත්ත හාර ගන්නවා. අත්යන්ත්‍ර මධ්‍යස්ථාන තුනක් හෝ හතරක් හෝ එකතු කර එක් මධ්‍යස්ථානයක් ඇති කර, එහි මෙත්ත මේ රෙද්ද නිෂ්පාදනය කළ යුතුය කියා දෙපාර්තමේන්තුවෙන් හාර දෙනවා. එතකොට පාවිච්චි කළ යුතු නූල තියම කරන්නේත් දෙපාර්තමේන්තුවෙන්. අමු ද්‍රව්‍ය දෙන්නෙත් දෙපාර්තමේන්තුවෙන්. විදේශීය රටවලට යවන්නට තිබෙන ඇණවුම් අනුවයි, ඒ මධ්‍යස්ථානවලට ඒ කටයුතු අපි හාර දෙන්නෙ. ඒ අනුව කටයුතු කිරීමෙන් පසුගිය අවුරුදු දෙක තුළ දස ලක්ෂ විසි පහක නිෂ්පාදන පිටරටවලට යවන්නට අපට පුළුවන්කම ලැබී තිබෙනවා.

ඒ වාගේම තව අපේ පෞද්ගලික සමාගමක් තිබෙනවා, කෝතල් සමාගම කියා. එම සමාගම විසින් 'විස්ක්ලෝත්' පිටරට යවනවා. ඒ සමාගම මඟින් ජපානයට ඇඟලුම් නිෂ්පාදන යවන්න ලක්ෂ විසි පහක ඇණවුමක් හාර අරගෙන තිබෙනවා. අත් යන්ත්‍රවලින් නිෂ්පාදනය කළ යුත්තේ විදේශීය රටවලට යවන්න පුළුවන්, විදේශීය රටවල් ප්‍රිය කරන රෙදි වර්ග පමණක් බව මේ අනුව අපට පෙනී යනවා. ඒ අනුව අපි දෙපාර්තමේන්තුව මඟිනුත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විජයපාල මෙන්ඩිස් මහතා]

ඇණවුම් හාර ගත්තවා. තවත් සමාගම් දෙකක් අපි ඇති කර තිබෙනවා. එකක් තමයි ලංකා පෙබරික් සමාගම. අනික් එක, ලංකා හැන්ඩ්ලූම් සමාගම කියා දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ යටතේ තිබෙන සමාගමක්. එම සමාගම් මඟිනුත් ඇණවුම් ලබාගෙන ඒ ඒ මධ්‍යස්ථානවලට හාර දෙනවා. මේ මේ දේවල් හදන්නය කියා. එතකොට කරදරයක් ඇති වෙන්නෙ නැහැ. ඒ නිසා, අත් යන්ත්‍ර තිෂ්පාදන අපි නැවත වරක් ඒ ආකාරයට දියුණු කරගෙන යනවා. අර ඉස්සර වගේ විකුණන්න බැරි රෙදි තිෂ්පාදනය කරන්නේ නැතිව, විකුණන්න පුළුවන් රෙදි පමණක් තිෂ්පාදනය කරන්නට අපි කටයුතු සලසා තිබෙනවා. දෙපාර්තමේන්තුව විසින් ඒ කටයුතු ඒ ඒ මධ්‍යස්ථානවලට හාර දෙන්නේ යම් වගකීමක් ඇතිවයි.

සංස්කෘතික අමාත්‍යාංශයක් වුණාම සමස්ත වශයෙන් රටේ සංස්කෘතික ජීවයට බලපාන සියල්ලක් ගැනම හොයා බලන, යම්කිසි මග පෙන්වීමක් කරන අමාත්‍යාංශයක් විය යුතුයි. එහෙම නැතිව පුරා විදු දෙපාර්තමේන්තුව ගරු ඇමතිතුමාගේ භාරයේ තිබෙන තිසා, කොතුකාගාරය ගරු ඇමතිතුමාගේ භාරයේ තිබෙන තිසා මෙම අමාත්‍යාංශයේ මුළු මහත් වගකීම ඒ කටයුතුවලට පමණක් සීමා කළොත් සංස්කෘතික අමාත්‍යාංශයකින් ඉටු වියයුතු යුතුකම් ඉටු වෙන්නේ නැහැයි කියන එක මගේ පෞද්ගලික හැඟීම බව මම මේ අවස්ථාවේදී මතක් කරන්නට කැමතියි.

අද මේ රටේ ඉතාම බලසම්පන්න ප්‍රචාරක මාධ්‍යයන් දෙකක් තිබෙන බව තමුන්නාන්සේ දන්නවා. ඒ රූපවාහිනිය සහ ගුවන් විදුලියයි. ඒ මාධ්‍යයන් දෙකින්ම සංස්කෘතික අමාත්‍යාංශයට අදාළව සංස්කෘතික දියුණුවක් ඇති කරන්නට පුළුවන් බව, වඩාත් උසස් මට්ටමේ නිෂ්පාදනයන් කරන්නට පුළුවන් බව තමුන්නාන්සේ දන්නවා. නමුත් සංස්කෘතිනක අමාත්‍යාංශය කිසිම විධියකින් ඒ වැඩකටයුතුවලට සම්බන්ධ වන බවක් පෙනෙන්නට නැහැ. සම්බන්ධ වුණත් එහෙම සම්බන්ධ වෙන බවක් අපට පෙනේනට නැහැ. සම්බන්ධ වුණත්, ඒක තමුන්නාන්සේගේ වගකීමක් නො වෙයි කියන එක පැහැදිලියි.

චිත්‍රපට සම්බන්ධයෙන් වේවා, නාට්‍ය සම්බන්ධයෙන් වේවා Public Performances Board කියන එක පත් කරන්නේ කවුද? සංස්කෘතික අමාත්‍යාංශය විය යුතු. තමුන් ඒකට සංස්කෘතික අමාත්‍යාංශයේ කිසිම සම්බන්ධකමක් නැහැ. මොනවා කරනවාද, මොනව සිදු වෙනවාද කියන කිසි දෙයක් ගරු ඇමතිතුමාට බලන්නට බැහැ. තුමා ඒ සම්බන්ධව කිසිම දෙයක් දන්නෙත් නැහැ. මේ අමාත්‍යාංශයට සංස්කෘතික අමාත්‍යාංශය කියා නම තබන එක වැරදියි. මේකට කියන්නට ඕනෑ පුරා විද්‍යා අමාත්‍යාංශය කියලයි. එහෙම නැත්නම් කොතුකාගාර අමාත්‍යාංශය කියලයි. මොකද, මේක සංස්කෘතික අමාත්‍යාංශයක් නම් ඒ වැඩ ටික ගරු ඇමතිතුමාගේ අමාත්‍යාංශයෙන් සිදුවිය යුතුයි.. වෙන රටකට ගිහින් සංස්කෘතික ඇමතිතුමාය කිව්වොත් ඒ රටවල උදවිය හිතන්නේ මුළු මහත් ශ්‍රී ලංකාවේම සංස්කෘතික දියුණුවට අනගිත දෙන, සංස්කෘතික වර්ධනයට මග පෙන්වන අමාත්‍යාංශයේ ඇමතිතුමා තමුන්නාන්සේය කියලයි. තමුන් එහෙම එකක් නැති බව අපි දන්නවා. අපට දැන් මේ ගරු සභාවේ මෙම අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සම්බන්ධයෙන් කතා කරන්නට තිබෙන්නේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ගැනයි, කොතුකාගාරය ගැනයි, රාජ්‍ය ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව ගැනයි පමණයි. ඒ නිසා මේකට සංස්කෘතික අමාත්‍යාංශය කියා නම තබන එක වැරදියි.

මම එදා අයවැය දෙවනවර කියවීමේ විවාදය පැවැත්වෙන අවස්ථාවේදී සිංහල සංස්කෘතියට සිදු වී තිබෙන දේ ගැන කිව්වා. තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ විවෘත ආර්ථික ප්‍රතිපත්තිය නිසා අද කැසට් සංස්කෘතියක් ඇති වී තිබෙනවා. කැසට් පටිවලින් ගයන එක සින්දුවක් එදා මම කිව්වා. තවත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සරත් මුත්තෙට්ටුවෙගම මහතා]

සිත්දුවක් මට මේ ඒයේ පෙරේදා අහන්නට ලැබුණා. ඒ සිත්දුවේ තිබෙන්නේ "මේක ගුතෙ අයියගෙ බජ්ව් දන කාමරේ" කියලයි. එදු ගරු මුදල් ඇමතිතුමා අයවැය කතාව පවත්වන වෙලාවේ, විදුලියත් ඇණහිටි වෙලාවෙ ඒ සිත්දුව ලියපු එක්කෙනා මෙහි සිටියා නම් "මේක. . . . . කාමරේ" කියල ඒ සිත්දුව වෙනස් කරන්නට ඉඩ තිබුණා. මේවා තමයි දන් සින්දු හැටියට තිබෙන්නේ. තමුත්තාන්සේගේ අමාත්‍යාංශයෙන් ඒවා ගැන හොයන්නටවත් බැහැ. තමුත්තාන්සේට ඒ සඳහා බලතලත් නැහැ. සංස්කෘතික අමාත්‍යාංශයක් නම් ඒවා ගැන සෙවිය යුතුව තිබෙනවා.

සභාපතිතුමා
(தலைவர்)
(The Chairman)

I do not think that reference is very good, hon. Member. You are referring to the Hon. Minister of Finance.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

That is only the music of India, Sir.

සභාපතිතුමා
(தலைவர்)
(The Chairman)

This is Parliament. I do not think that reference is good at'all. I will have it deleted from HANSARD.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

මම කියන්නට උත්සාහ කළේ මේ අමාත්‍යාංශයට සංස්කෘතික අමාත්‍යාංශය කියා නම් කරන එක වෙනස් කරන්නට ඕනෑ බවයි. එහෙම නැත්නම් මෙය තියම සංස්කෘතික අමාත්‍යාංශයක් කරන්නට ඕනෑ බවයි. එහෙම නැත්නම් මෙය තියම සංස්කෘතික අමාත්‍යාංශයක් කරන්නට ඕනෑ. දැන් තිබෙන්නේ සංස්කෘතික අමාත්‍යාංශයක් නොවෙයි, වෙන වෙන දෙපාර්තමේන්තු කිපයක් එක්කාසු වෙලා පවතින අමාත්‍යාංශයක්.

මම හිතන හැටියට මේ රජය අනුගමනය කරන විවෘත ආර්ථිකය වැනි ප්‍රතිපත්ති නිසා ඕනෑම කෙනකුට ඕනෑම දෙයක් නිෂ්පාදනය කිරීමට නිදහසක් තිබෙනවා. එය සීමා කරන්න මම කියන්නේ නැහැ. නමුත් තියම සංස්කෘතික මට්ටමක තිබෙන දේවලට, ඇත්ත වශයෙන්ම ඉහළ මට්ටමකට ගේන්න පුළුවන් නිෂ්පාදනවලට අත දෙන්නට රජයට යුතුකමක් තිබෙනවා.

එවැනි නිෂ්පාදන කරන සමහර උදවියට වෙළඳ පොළක් නැහැ. කැසට් නිෂ්පාදනය කළත්, තැටි නිෂ්පාදනය කළත්, නාට්‍ය නිෂ්පාදනය කළත් එක්තරා විධියක දේවලට පමණක් වෙළඳ පොළක් තිබෙන බව තමුන්නාන්සේ දන්නවා. ඒවාට ප්‍රේක්ෂකයන් වැඩි ගණනක් සිටිනවා. නමුත් ඉහළ මට්ටමේ සංස්කෘතික නිෂ්පාදනවලටත් යම්කිසි උදවු-උපකාරයක් කරන්නට ආණ්ඩුවට යුතුකමක් තිබෙනවා. ප්‍රේක්ෂකයන් වැඩි පිරිසක් දැනට නැති වුවත් එවැනි තත්ත්වයක් ඇති කළ හැකි විධියට ආධාර දීම යුතුකමක්.

ප්‍රේක්ෂකයන් ඇති වන්නේ වෙළඳ පොළේ තිබෙන්නා වූ හාණ්ඩවල හැටියටයි. ජනතාව ඒට පුරුදු වෙනවා. අද හැදෙන දරුවෝ සහ තරුණ පරම්පරාව සින්දුවක් අහනවා නම් අහන්නේ අර විධියේ සින්දු. එය දන් හැන්සාඩ් වාර්තාවෙන් කපා දැම්මට තියම කර තිබෙන නිසා මම ඒ සින්දුව ආයෙත් සැරයක් කියන්නේ නැහැ. නමුත් මිනිසුන්ට පුරුදු වී තිබෙන්නේ ඒ වාගේ සින්දු තමයි. ළමයින්ට පුරුදු වන්නේ ඒවායි. ඒ නිසා මම තමුන්නාන්සේගෙන් විශේෂයෙන් ඉල්ලා සිටින්නේ තමුන්නාන්සේගේ සංස්කෘතික අමාත්‍යාංශයෙන් කළ යුතු කොටස කරන ලෙසයි. එසේ කිරීමට යුතුසුළු වන ලෙස තමුන්නාන්සේගෙන් ඉල්ලමින් මගේ වචන ස්වල්පය මෙයින් නවත්වනවා.

චන්ද්‍රකුමාර විජය ගුණවර්ධන මහතා (කඹුරුපිටිය)
(திரு. சந்திரகுமார விஜய குணவர்த்தன — கம்புறுப்பிட்டிய)
(Mr. Chandrakumara Wijeya Gunawardane–Kamburupitiya)

ගරු සභාපතිතුමනි, සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සාකච්ඡා කරන මේ අවස්ථාවේදී වචන ස්වල්පයක් කතා කිරීමට මට අවස්ථාව සැලසීම ගැන ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම කලවානේ ගරු මන්ත්‍රීතුමා සංස්කෘතිය පිළිබඳව තම අදහස් ප්‍රකාශ කිරීමෙන් පසු කතා කරන්නට මට අවස්ථාව ලැබීම ගැන මම එක් අතකින් සන්තෝෂ වෙනවා.

කලවානේ ගරු මන්ත්‍රීතුමා කැසට් සංස්කෘතිය පිළිබඳව මීට කලින් කතා කරනවා මම අසා සිටියා. ඒ වේලාවේදී නුවරඑළිය දිසා ඇමතිතුමියගෙත් ඒ මන්ත්‍රීතුමාට ප්‍රමාණවත් පිළිතුරු ලැබුණා. කලවානේ ගරු මන්ත්‍රීතුමා මේ කැසට් පටි ඕතවලින් ශ්‍රවණය කර තිබෙන්නේ එතුමා කියන බයිලා විතරයි. අමරදේව සංගීතඥයාගේ ඉතාම ලස්සන සින්දු සහිත කැසට් පටි තිකුත් වී තිබෙනවා. සිංහබාහු නාට්‍යය සම්පූර්ණයෙන්ම පටිගත වී තිකුත් වී තිබෙනවා. තන්ද මාලිනී ආදී තවත් සංගීත විශාරදයන්ගේ ඉතාම උසස් ගණයේ ගී පටිගතකර කැසට් තිකුත් කර තිබෙනවා. මේ ළඟදී ඉතාම ලස්සන නෘත්‍ය ගී ඇතුළත් කැසට් පටියක් තිකුත් වුණා. ඒ නිසා, බයිලා විතරක් අහන්නෙ නැතිව මේවාත් අහන ලෙස මම කලවානේ ගරු මන්ත්‍රීතුමාගෙන් ඉල්ලා සිටිනවා.

කලවානේ ගරු මන්ත්‍රීතුමන්ලාගේ මහ රැළි පවත්වන හැම තැන්වලම අපට අහන්න ලැබෙන්නේ ඔය බයිලා විතරයි. උසස් ගණයේ සංගීතයක් ඒ රැස්වීම්, රැළි පවත්වන තැන්වල කොයි වෙලාවකවත් අහන්නට ලැබෙන්නේ නැහැ. අපේ සංස්කෘතිය ආරක්ෂා කිරීමට කටයුතු කිරීම තමුන්නාන්සේලාගේත් යුතුකමක්. දරුවෝ බයිලා කැසට් අහනවා යයි එතුමා ප්‍රකාශ කළා. ඒවායේ නම්වත් මම භාවිතා කරන්නේ නැහැ. මේ පාර්ලිමේන්තුවෙහි ඒ වාගේ වචන පාවිච්චි කිරීම සුදුසු නැති නිසා. තම දරුවන්ට කියවීමට අවශ්‍ය පොත පත, ඇසිය යුතු සින්දු කැසට් පට ලබා දීමට කටයුතු කිරීම දෙමාපියන්ගේත් යුතුකමක්. මේවා පාලනය කරන්නට සංස්කෘතික ඇමතිතුමාට පුළුවන්කමක් ඇත්තේ නැහැ.

1977 න් පසු මේ රටේ ඇති කරන ලද සංස්කෘතික දියුණුව ගැන මම මේ වේලාවේදී සංස්කෘතික ඇමතිතුමාට ස්තුතියක් කරනවා. විශේෂයෙන්ම දහම් පාසල් දියුණු කිරීමට ගරු ඇමතිතුමා ගත් ක්‍රියාපටිපාටිය ගැන අපේ ස්තුතිය මේ අවස්ථාවේදී විශේෂයෙන් එතුමාට ප්‍රකාශ කරන්නට කැමතියි. අපේ බාල පරපුර යහමඟ යැවීමට ඉතාම අවශ්‍ය වන්නේ දහම් පාසල් අධ්‍යාපනය නිසා ඒ ගැන මේ අවස්ථාවේදී විශේෂයෙන් කරුණු සඳහන් කරන්න ඕනෑ. අපගේ එදිනෙදා ජීවිතයට අවශ්‍ය හැම විෂයයක් ගැනම දිනපතා පාසල්වලදී දරුවන්ට උගන්වන්නට අවස්ථාව ලැබුණත් ධර්මය පිළිබඳව වැදගත් විධියට උගන්වන්නට එහිදී අවස්ථාවක් සැලසෙන්නේ නැහැ.

සතියකට වරක් ඉරුදින දහම් පාසල්වලට යාමට අපේ දරුවන් පුරුදු වී සිටිනවා. හැම ගමකම පන්සල්වල දහම් පාසල් පවත්වාගෙන යනවා. මේවා පවත්වාගෙන යන්නෙ බොහොම අමාරුවෙන්. නමුත් අපේ බෞද්ධ භික්ෂූන් වහන්සේලා තිස්සරණධ්‍යාෂයෙන් මේ දරුවන් යහමඟ යැවීම සඳහා ධර්මය ඉගැන්වීමට මහත් වැයමක් දරනවා. මේ දහම් පාසල් පවත්වාගෙන යාමට අද ප්‍රධාන බාධකයක් වී තිබෙනවා, පෞද්ගලික උපකාර පන්ති. විශේෂයෙන්ම, ඉරුදිනවල නොයෙක් පෞද්ගලික පංති පැවැත්වෙනවා. 8 වන ශ්‍රේණිය, 9 වන ශ්‍රේණිය, 10 වන ශ්‍රේණිය වැනි පංතිවල ඉගෙන ගන්නා ළමයින් ඒ උපකාර පංතිවලට යන නිසා, මේ දහම් පාසල්වලට එන්නට ඔවුන්ට අවස්ථාව ලැබෙන්නෙ නැහැ. ඔවුන් දහම් පාසල්වලට එන්නට කැමති වුණත් ඒවාට අවස්ථාවක් ලැබෙන්නෙ නැහැ.

ඒයේ මම සභාගිවුණා කඹුරුපිටිය මැනිවරණ කොට්ඨාශයේ ගඟබඩ පත්තුව දකුණ ප්‍රාදේශීය ශාසනාරක්ෂක සමිතියේ දහම් පාසල් නැගී බෙදා දීමේ උත්සවයකට. එහිදී එහි සභාපති ස්වාමීන් වහන්සේ මට ප්‍රකාශ කළා, මේ පෞද්ගලික පංති නිසා මාතර දිස්ත්‍රික්කයේ දහම් පාසල් පවත්වාගෙන යාම ඉතා බරපතල ප්‍රශ්නයකට මුහුණ පා තිබෙනවා කියා. ඒ නිසා අපි මේ සම්බන්ධව යම්කිසි පිළියමක් යොදන්නට ඕනෑ. අඩුම වශයෙන් ඉරුදින උදය වරුවවත් ආගමික වරුවක් වශයෙන් ප්‍රකාශයට පත් කර ඒ වෙලාවේ මේ පෞද්ගලික පංති පැවැත්වීම තහනම් කළ යුතුයි. එසේ නොකළොත් මේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දරුවන්ට ආගමික අධ්‍යාපනය ලබාගන්නට බැරි වෙනවා. ඒ නිසා මේ කාරණය කෙරෙහි ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්නට මම කැමතියි.

දහම් පාසල්වල උගන්වන ආචාර්යවරුන් ඒ සඳහා කැප කරන්නේ තමන්ට ඉරුදින විවේකීව ගත කරන්නට තිබෙන කාලයයි. ඒ අය ලොකු කැපවීමකින් මේ කටයුත්ත කරනවා. ඒ නිසා මම ගරු ඇමතිතුමාට යෝජනා කරනවා, මේ දහම් පාසල්වල උගන්වන ආචාර්ය මණ්ඩලයට යම්කිසි දිරි දීමනාවක් ගෙවන්නට කටයුතු කරන්නය කියා. අපේ මාතර දිසා ඇමතිතුමා දැන් ඒ සඳහා අරමුදලක් සූදානම් කරගෙන යනවා, දහම් පාසල්වලට යම් යම් උපකාර කරන්නට. දහම් පාසල්වලටත් කොමිලයේ පොත් ලබා දීම ගැන මම ස්තුතිවන්ත වෙනවා. අපේ දරුවන්ට එය විශාල සහනයක් වෙලා තිබෙනවා. ඒ වාගේම දහම් පාසල්වලින් බෞද්ධාචාර්ය විභාගය පවත්වා සහතිකයක් නිකුත් කරනවා. ඒ ලබාගන්නා සහතිකය සාක්කුවේ දමාගෙන සිටීම පමණයි, දැනට කරන්නේ. එම නිසා මම විශේෂයෙන්ම ඇමතිතුමාගේ අවධානයට යොමු කරවනවා, ඒ සහතිකය පිළිගෙන අපේ පාසල්වලට ආගම ඉගැන්වීමට ගුරුවරුන් පත් කිරීමේදී ඒ සහතිකලත් අය පත් කරන්නටය කියා. දහම් පාසල් ගැන මම මීට වඩා කථා කරන්න බලාපොරොත්තු වෙන්නෙ නැහැ.

මේ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන සංස්කෘතික ත්‍රිකෝණය මගින් අද ජේතවනාරාමය, අභයගිරිය, ආදී තටඹුන්ව තිබුණු සිද්ධස්ථාන ප්‍රතිසංස්කරණය කරමින් බෞද්ධ ජනතාවට විශාල සේවයක් කරගෙන යනවා. සංස්කෘතික ත්‍රිකෝණය කිව්වාම මම විශ්වාස කරන්නෙ නැහැ ඒ මගින් බෞද්ධ වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කිරීම පමණක් ප්‍රමාණවත්ය කියා. සංස්කෘතිය තිසි විධියට ආරක්ෂා කරන්න නම්, අපේ සාම්ප්‍රදායික සංස්කෘතික ලක්ෂණ ගැන කල්පනා කර බලා ඒවාත් දියුණු කිරීමට අපි කටයුතු කළ යුතුයි. කලාශිල්ප, සාහිත්‍ය ආදිය මෙන්ම දහම් පාසල් වුවත් එයට ඇතුළු වෙන්න ඕනෑ. ඒ හැම දෙයක්ම මේ සංස්කෘතික ත්‍රිකෝණය යටතේ දියුණු කරන්නට කටයුතු කරනවා නම් ඒක වැඩදායක වෙනවා. නමුත් මේ වැඩ පිළිවෙළ යටතට පත් වෙන්නේ එක්තරා ප්‍රදේශයක් පමණයි. මහනුවර, පොළොන්නරුව, අනුරාධපුරය වැනි ප්‍රධාන ස්ථාන කිහිපයකින් වට වන ප්‍රදේශයක් පමණයි ඊට ඇතුළත් වන්නෙ.

කොළඹට තම සංස්කෘතික සංකීර්ණයක් තිබෙනවා. නමුත් අපි රුහුණ ගැන කල්පනා කළාම, රුහුණට කිසිවක් නැහැ. ඒ නිසා මම යෝජනා කරනවා "රුහුණු කවය" කියා සංස්කෘතික මධ්‍යස්ථානයක් ඇති කරන්න කියා. සංස්කෘතික ලක්ෂණ තිබෙන ගොඩනැගිලි රුහුණේ තිබෙනවා. සාහිත්‍යධරයන් සිටියා, ඉන්නවා. ඒ වාගේම දැනට වුවත් නොයෙක් කවියන්, ලේඛකයන් ඉන්නවා. ඒ අයගේ කෘතීන් මහජනතාවට කියවන්නට සැලැස්වීමට යම්කිසි වැඩපිළිවෙලක් සකස් කරන්නට ඕනෑ.

පසුගිය දිනවල මාතර තාරකා කොටුව බලන්නට තමුන්නාන්සේ ගියා. අද ඒ තාරකා කොටුව සෙනෙහ විධියට ජරාවාස වෙමින් පවතිනවා. එය ලන්දේසි යුගයේදී පැවති ඉතාමත් වැදගත් බලකොටුවක්. මුළු ලෝකයේම, ලන්දේසීන්ගේ ඉදිකිරීම් ගැන කල්පනා කර බලන විට මේ තරම් වටිනාකමක් ඇති බලකොටුවක් තවත් ඇත්තේ නැහැ. ඒ නිසා එය ආරක්ෂා කළ යුතුයි. මා මාතර නගරාධිපති වශයෙන් සිටි කාලයේදී ඒ සඳහා වෙනම මුදලක් වැය කර, සංස්කෘතික දෙපාර්තමේන්තුවෙන් ආධාරත් ලබාගෙන එය නවීකරණය කිරීමට වැඩපිළිවෙලක් සකස් කළා. නමුත් එය මේ දක්වා ක්‍රියාත්මක වී නැහැ. පසුගිය වර්ෂයේදී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් එහි ගොස් යම් යම් කැණීම් කටයුතු කළා. ඒ කැණීම් කටයුතු මා තමුන්නාන්සේට පෙන්නුවා. නමුත් එයින් කිසිම ප්‍රතිඵලයක් මේ දක්වා සිදුවී නැහැ.

මාතර නුපෙ වෙළඳපොලත් ඒ වාගේමයි. එය ඉතාමත් වටිනා ගෘහ නිර්මාණ ශිල්පීය අංග සහිතව සකස් කර ඇති වෙළඳපොලක්. මාතර නගරයට ඇතුළුවන තැනම තිබෙන්නේ ඒ වෙළඳපොලයි.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)
ගජමත් නෝනා.

චන්ද්‍රකුමාර විජය ගුණවර්ධන මහතා
(திரு. சந்திரகுமார விஜய குணவர்த்தன)
(Mr. Chandrakumara Wijeya Gunawardane)

අත්තනගල්ල ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) මතක් කරනවා, ගජමත් නෝනා ගැන. එතුමා පසුගිය කාලයේදී දකුණු පළාතේ, මාතර ප්‍රදේශයට ගිහින් ගජමත් නෝනා ගැන සෙනෙහ පරීක්ෂණ පැවැත්වූවා. ගජමන් නෝනා කරලියටත් ගෙනවා. එතුමා ගජමන් නෝනා ගැන සෙනෙහ පරීක්ෂණ පැවැත්වූවා. එතුමා ගජමත් නෝනා ගැන සෙනෙහ ආදරයක් ඇති කෙනෙක්. නමුත් දැන් එතුමාගේ කථාවේදී සංස්කෘතික අමාත්‍යාංශය ගැන සෙනෙහ විවේචනයක් කළා. එතුමාගේ රජය කාලයේදී කරන්නට අවස්ථාවක් තිබිලත් නොකළ වැඩ ගැන කල්පනා කරන්නේ නැතිව, 1977 න් පසුව අපි මේ දක්වා සංස්කෘතිය දියුණු කිරීමට බොදට සංස්කෘතිය දියුණු කිරීමට ගත්තාවූ පියවර ගැන කිසිවක් ප්‍රකාශ නොකරයි එතුමා කථා කළේ.

මේ රජය නාට්‍ය ශිල්පය දියුණු කළා. එද හිහමනේ ගිය නාට්‍ය ශිල්පීන්ට අද මේ රජය මගින් අතහිත දී තිබෙනවා. ටවර් හෝල් පදනම තිසා අද නාට්‍ය ශිල්පීන්ට යම්කිසි තැනක් ලැබී තිබෙනවා. එද හිහමනේ ගිය පැරණි ගායකයින්, පැරණි නාට්‍ය ශිල්පීන් අද මේ පදනම යටතේ යම්කිසි වේතනයක් ලබනවා. ඔවුන්ගේ හැකියාවත් රූපවාහිනියෙන් දැක බලා ගන්න පුළුවන්, ගුවන් විදුලියෙන් අහන්න පුළුවන්. ලංකාවේ පමණක් නොවෙයි, මුළු ලෝකයේම ඔවුන්ගේ හඬ රැව් පිළිරැව් දෙනවා. ඒ තත්ත්වය ඇති වුයේ 1977 න් පසුවයි. එම නිසා මේ රුහුණේ පැරණි සිද්ධස්ථාන, පැරණි ගොඩනැගිලි සම්බන්ධව කරන මේ වැඩපිළිවෙල තව තවත් දියුණු කිරීම සඳහා මා තමුන්නාන්සේට ආරාධනා කරනවා.

මා මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ, අවුරුදු ගණකට ඉහතදී ගරු පලාත් පාලන ඇමතිතුමාගේ-ගරු ඇමතිතුමාගේ-අමාත්‍යාංශය යටතේ ඒ කාලයේදී මාතර සියලුම පැරණි ගොඩනැගිලි පිළිබඳව කළ පරීක්ෂණයක් ගැන. ආචාර්ය එච්. ඒ. පී. අභයවර්ධන මැතිතුමා—සංස්කෘතික අමාත්‍යාංශයේ අතිරේක ලේකම්තුමා—මාතර විශේෂ කොමසාරිස් වශයෙන් ඒ කාලයේදී කටයුතු කළා. ඉන් පසුව එතුමා පලාත් පාලන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් වශයෙන් කටයුතු කරන කාලයේදී එතුමාගේ ප්‍රධානත්වයෙන් ගරු අගමැතිතුමා විසින් කම්ටුවක් පත් කරනු ලැබුවා. ඒ කම්ටුව මගින් මාතර නගරයේ තිබෙන සියලුම පැරණි ගොඩනැගිලි, විශාල වලව් ගැන පරීක්ෂණයක් කළා. දැනට රාහුල විද්‍යාලය පවත්වාගෙන යන සරම් සිරිවර්ධන මුදලිතුමාගේ වලව්ව ප්‍රධානකොටගෙන ඇති සියලුම වලව් පිළිබඳව විශාල පොතක් දැනට සකස් කර තිබෙනවා.

ආරක්ෂා කළ යුතු පැරණි සිද්ධස්ථාන, පැරණි ගොඩනැගිලි ආරක්ෂා කිරීම සඳහා රුහුණු කවයක් ඇති කළොත් මාතර නගරයේ පමණක් නොවයි, මුළු රුහුණේම තිබෙන ඒ පැරණි සිද්ධස්ථාන යථා තත්ත්වයට ගෙන එන්නටත්, පැරණි ගොඩනැගිලි ආරක්ෂා කරන්නටත්, පැරණි සම්ප්‍රදායානුකූල නැටුම්, ගැයුම්, වැයුම් ආදී සියලු දේ ආරක්ෂා කරන්නටත්, ඒවා සඳහා දිරිදීමටත් කටයුතු කරන්න පුළුවන්කම ලැබෙනවා. මා කලින් කීවා වාගේ තාරකා කොටුව ප්‍රතිසංස්කරණය කර එය මාතර රුහුණු සංස්කෘතික මධ්‍යස්ථානය බවට පරිවර්තනය කරන්නට අපි බලාපොරොත්තු වෙනවා. ඒ නිසා මා මේ අවස්ථාවේදී ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ මේ කටයුතු ඉක්මණින් කිරීම සඳහා එතුමාගේ අවධානය යොමු කරන්නට කියායි.

අපේ ගරු ඇමතිතුමා සංස්කෘතික ත්‍රිකෝණය මගින් අනුරාධපුරයේන්, පොළොන්නරුවේත් කලාශිල්ප දියුණු කරන්නට, ආරක්ෂා කරන්නට කටයුතු කරනවා වාගේ රුහුණේ සිටින කලාශිල්පීන් ආරක්ෂා කරන්නටත් කටයුතු කරන මෙන් මම ඉල්ලා සිටිනවා. ඒ කාලයේදී කැටයම් ශිල්ප, මූර්ති ශිල්ප පිළිබඳ දක්ෂ මූර්ති ශිල්පීන්, කලාකරුවන් සිටියා වාගේ, ඉතාමත් දක්ෂ ලෙස මූර්ති කලාව කරන්න පුළුවන් තරුණ තරුණියන් අදත් රුහුණේ සිටින බව මා දන්නවා. මහමෙවුනා උයනේ පිහිටා තිබෙන සමාධි ප්‍රතිමාවේ ලොවිතුරා සුවය දැකෙනවාසේ කළුගල්වලින් ඒ වගේ නිමයුම් කරන්න පුළුවන් දක්ෂ තරුණ තරුණියන් අදත් ඉන්නවා.

කළුගලින් එවැනි නිමැයුම් කරන්නට පුළුවන්. මගේ ජන්ද කොට්ඨාශයේ ජන්ම ලාභය ලැබූ ගල්බොඩ ඥානිස්සර හාමුදුරුවෝ අකුරැස්සේ තිබෙන ඌරුමුත්ත වත්ත නැමැති ස්ථානය තාක්ෂණික ශිල්පය හදරන ස්ථානයක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[චන්ද්‍රකුමාර විජය ගුණවර්ධන මහතා]

බවට පරිවර්තනය කරගෙන යනවා. එහි තරුණ තරුණියන් විශාල සංඛ්‍යාවක් කලා අංශයෙන් ඉතාම ලක්ෂණ බුදු පිළිම, බෝධිසත්ව පිළිම, සඳකඩ පහත් වැනි දේවල් හදාගෙන යනවා. මෙවැනි ශිල්පයන්හි දක්ෂතා ඇති අයට අත හිත දීමට සංස්කෘතික දෙපාර්තමේන්තුව කටයුතු කරනවා නම් රැකීරක්ෂා ප්‍රශ්නයත් එක්තරා ප්‍රමාණයකට ක්‍රමානුකූලව අඩු කරන්නට පුළුවන්කම ලැබෙනවා. ඒ ගැනත් තමුන්නාන්සේගේ අවධානය යොමු කරන්නට කැමතියි.

ගරු සභාපතිතුමනි, මට තවත් සංවේගය ඇතිවන කරුණක් තමයි, මහා සංඝ රත්නය තඩු හබවලට සම්බන්ධ වීම නිසා උසාවිවලට ගිහිල්ලා නොයෙක් අවහිරතාවලට අතවරවලට මුහුණපානවා දකීම. සමහර අවස්ථාවලදී ස්වාමීන් වහන්සේලා උසාවියට ආවාම මම වාඩිවෙලා ඉන්න පුටුව උන්වහන්සේලාට වාඩිවෙන්න දෙන්න මට සිදු වෙනවා. පන්සල් තඩු වලටත් විහාර දේවාලගම් පනත යටතේ තඩුවලටත් මහජනතාව රැස් කකා සිටින තැනකට ආවාම උන්වහන්සේලාගේ ගෞරවය ආරක්ෂා වන විධියෙත් ඒ ස්ථානයේ වැඩ ඉන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. සමහර වෙලාවට නීතිඥයෝ හරස් ප්‍රශ්න අහනකොට සංඝ ගෞරවය නැති වන විධියටත් යම් යම් ප්‍රශ්න උන්වහන්සේලාගෙන් අහනවා. මේ තත්ත්වය නැති කරන්නට සංඝාධිකරණය පිහිටුවීමේ කටයුතු කරගෙන යන නමුත් එහි ප්‍රතිඵල අපි තවම දැක නැහැ. එම නිසා ඉතා ඉක්මණින් සංඝාධිකරණයක් ඇති කර ගරුතර ස්වාමිපාදයන්වහන්සේලාගේ ගෞරවය ආරක්ෂා වන විධියට ඒ අයගේ යම් පැටළිලි තිබෙනවා නම් ඒවා හරි ගස්සන්නට කටයුතු කරන ලෙස මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

මීට වඩා කථා කිරීමට මම බලාපොරොත්තු වන්නේ නැහැ. ඉදිරි අනාගතයේදී තව තවත් උනන්දු වී සංස්කෘතිය ආරක්ෂා කර ගැනීමටත්, විශේෂයෙන් බාල පරම්පරාව තුළ ආගමික හැඟීම් ඇතිවන පරිදි සංස්කෘතික සංවර්ධනයක් ඇති කිරීමටත් ගරු ඇමතිතුමාට ශක්තිය හා ධෛර්ය ලැබෙවායයි ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

අ. හා. 5.30

පී. බී. කවිරත්න මහතා (නියෝජ්‍ය පුද්ගලික බස් ප්‍රවාහනය පිළිබඳ ඇමතිතුමා)

(திரு. பீ. பி. கவிரத்ன — தனியார் பஸ் போக்குவரத்துப் பிரதி அமைச்சர்)

(Mr. P. B. Kaviratne Deputy Minister for Private Omnibus Transport)

සංස්කෘතික අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ වවන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලබා දීම ගැන මම ස්තුතිවන්ත වනවා. යම්කිසි පුද්ගලයෙකුට ඇමතිකමක් දෙන්නට ඕනෑ නිසා, කවද හෝ සංස්කෘතික අමාත්‍යාංශය පිහිටුවන්නට ඇත කියන ඉඟියකින් ගරු කලවානේ මන්ත්‍රීතුමා (සරත් මුත්තෙට්ටුවෙගම මහතා) කථා කළා. කරුණාකර අතීතය අමතක කරන්නට එපාය කියා මම එතුමාට පළමුවෙන්ම කියන්නට කැමතියි. රටේ අතීතය වුවමනාවෙන් අමතක කරන්නට එපා. සංස්කෘතික අමාත්‍යාංශය මේ රටේ පිහිටවුයේ 1956 වර්ෂයේදී මේ රටේ පැවැති මහජන එක්සත් පෙරමුණු ආණ්ඩුවයි. ආචාර්ය ඩබ්ලිව්. දහනායක මැතිතුමා, දිවංගත ගරු එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මැතිතුමා යහ පිලිප් ගුණවර්ධන මැතිතුමා වැනි මේ රටේ ශ්‍රේෂ්ඨ ජනනායකයන්, මේ රටේ කලා වේදීන්, ගරුතර මහා සංඝ රත්නය, සමාජ සේවකයින් ආදී වශයෙන් හැම ක්ෂේත්‍රයකම උතුම් පුද්ගලයන් එක කරගෙන යම්කිසි දේශපාලන හා සමාජ විපල්ලවයක්—වෙනස්කමක්—1956 වර්ෂයේදී මේ රටේ ඇති කළා. ඒ ආණ්ඩුව තුළින් ජයවීර කුරුප්පු මැතිතුමා—එවකට රත්නපුර මහජන මන්ත්‍රීතුමා—පළමුවන වරට සංස්කෘතික ඇමතිවරයා වශයෙන් පත් කළා. එද, මෙද, තුර අද දක්වා මේ සංස්කෘතික අමාත්‍යාංශය පුරා විදුවටයි, කටුගෙටයි, ජාතික ලේඛණාරක්ෂක දෙපාර්තමේන්තුවටයි පමණක් සීමා වුණාය කියලා එතුමා කල්පනා කරනවා නම් එය වැරදියි. මේ රටේ සිංහල සාහිත්‍යය පිළිබඳව, නාට්‍යය පිළිබඳව, සංගීතය පිළිබඳව යම් අවදිකමක් ඇති කරන්නට රජය අතීත දිමේ වැඩපිළිවෙලක් යෙදුවා නම් ඒ වැඩපිළිවෙල යෙදුවේත්, මේ අමාත්‍යාංශය තුළිත්. එය 1956 සිට මේ දක්වා අපේ සංස්කෘතියේ අංග දියුණු කළා මිස පිරිහුණේ නැහැ, කියන එක මම එතුමාට මතක් කරන්නට කැමතියි.

සංස්කෘතික අමාත්‍යාංශයට අයත් විෂය ක්ෂේත්‍රයේ පටු හෝ පුළුල්කම් ඇති. මම එකඟ වන්නම්, ඒ ගැන එතුමාත් සමඟ. නමුත් සංස්කෘතික අමාත්‍යාංශය පිහිටෙව්වේ පුද්ගලයෙකුට ඇමතිකමක් දෙන්නය කියන පටු චේතනාව ඉදිරිපත් කිරීම ගැන මගේ කණගාටුව එතුමාට මතක් කරන්නට කැමතියි.

එතුමා ප්‍රකාශ කළා, දැන් තිබෙන්නේ බජට් සිත්දුය කියා. මොන පිස්සු කථාවක්ද ? සංගීතය ගැන, සංගීතයේ ප්‍රවර්ධනය ගැන තිසි අධ්‍යයනයක් කර තිබෙනවා නම් එතුමාට කල්පනා වෙයි, ඒ ප්‍රකාශය වැරදිය කියා. සංස්කෘතිය ගැන කල්පනා කරන විට, ඉතිහාසයේ කොයි කාලයේත් දියුණු සාංස්කෘතික අංග වගේම තොදියුණු සංස්කෘතික අංගත් සංකලනය වී තිබුණු බව අපට පෙනෙනවා. අනුරාධපුර යුගය ගත්තත්, පොළොන්නරු යුගය ගත්තත්, මහනුවර යුගය ගත්තත්, කොයි යුගය ගත්තත්, අපට පෙනෙනවා, දියුණු සාහිත්‍ය කෘති නිෂ්පාදනය වන විට ඊට වඩා අඩුමනත් සාහිත්‍ය කෘතිත් නිෂ්පාදනය වී තිබෙන බව.

මේ කාලයේත් එහෙමයි. හොඳ නාට්‍ය—අඩු තරමින් දියුණුවක් දකිත්ත පුළුවන් නාට්‍ය-නිෂ්පාදනය වන විට ප්‍රමාණවත් පරිදි, පරිපූර්ණ විධියට මනුෂ්‍යත්වය පිළිබඳ යම්කිසි ශ්‍රේෂ්ඨ දර්ශනයකට සම්බන්ධ දෘෂ්ටි කෝණයක් නැති පරිතත අවබෝධයක් නැති කලාකරුවන් තුළින් ළාමක කලා කෘතින් බිහිවීම පුදුමයක් නොවෙයි. එය කවදත් සිද්ධ වන දෙයක්. එම නිසා, කිසිම ප්‍රබුද්ධතාවක් නැති කලාකරුවකු තුළින්—කලවානේ ගරු මන්ත්‍රීතුමා පාවිච්චි කළ වචනය මේ ගරු සභාව තුළ පාවිච්චි කරන්න මා අකමැති වුණත්, එතුමා කියන විධියට—බජට් සංගීතයක් බිහිවීමත් පුදුමයක් නොවෙයි.

ඒ එක්කම මා අහන්න කැමතියි, තන්ද මාලනී ගායිකාවගේ 'යාත්‍රා' කැසට් පටය නිෂ්පාදනය වුණේ 1952 ද, 1956 ද, නැත්නම් අද-ඊයේද කියා. කරුණාකර ඒ ගැනත් කල්පනා කර බලන්න හැටියට මා ඉල්ලා සිටිනවා. ඒ කැසට් පටයේ එන 'පිළිම තෙළා නැති විරුවන් පිරිසක්-සැමරුම් දින නැති විරුවන් පිරිසක්' තමැති අති ශ්‍රේෂ්ඨ ගීතයට අපේ රජයේ කිසි කෙනෙක් විරුද්ධත්වය පළ කළේ නැති බව, අපේ රජයෙත් ඒ ගීතය තහනම් වුණේ නැති බව එතුමා කල්පනා කරන්න ඕනෑ. ඒ ගීය දේශපාලන වශයත් අපට විරුද්ධ වන්න පුළුවනි ; අපේ ඇගැයුම්වලට විරුද්ධ වන්න පුළුවනි. නමුත් අප හැම තැනම තිදගස් අදගස් ප්‍රකාශ කරන්න තිබෙන අයිතිය සුරක්ෂිත කළා මිස ඒ අයිතිය නැති නොකළ බවත් එතුමාට පෙන්නා දෙන්න කැමතියි. එම නිසා එතුමා දේශපාලන වශයෙන් කථාවක් පැවැත්වුවා මිස අඩු තරමින් සංස්කෘතික අමාත්‍යාංශය සඳහා 1984 ඇස්තමේන්තුවේ වෙන් වී ඇති එක පිටුවක්වත් පෙරළා බලා ඒ ප්‍රකාශය නොකළ බවයි, මගේ හැඟීම. නියෝජ්‍ය පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා ඇමතිතුමා කියනවා එතුමාගේ ප්‍රකාශය විහිළු ප්‍රකාශයක්ය කියා. නමුත් උගත් මන්ත්‍රීවරයකු වන කලවානේ ගරු මන්ත්‍රීතුමා සම්බන්ධයෙන් එහෙම කථා කරන්න මා කැමති නැහැ.

අපේ සංස්කෘතික අමාත්‍යාංශයෙන් කොයි තරම් සේවයක් සිදු වී තිබෙනවාද ? පුරාවිදු කටයුතු බලන්න. සංස්කෘතික ත්‍රිකෝණය ගැන බලන්න. එපමණක්ද නොවෙයි, මේ සංස්කෘතික අමාත්‍යාංශය තුළින්, අමාත්‍යාංශය යටතේ තවත් මොන-මොන අංග දියුණු වී තිබෙනවාද ? අඩපණ වී, මැරිලා, පණ ගිහින්, වලලන්න ඔන්න-මෙන්න කියා තිබුණු සිංහල ශබ්ද කෝෂයට ප්‍රාණ ජීවය දී එහි 8 වැනි කාණ්ඩයත් ඉතාමත් සාර්ථක ලෙස මේ රටේ පාඨකයා අතට, සිංහල සමාජය අතට පත් කරන්න පුළුවන්කම ලැබුණේත් මේ ඇමතිතුමාගේ කාල සීමාව තුළදී නේද ? ඒ බව මේ අවස්ථාවේදී අප ගෞරවයෙන් මතක් කරන්න ඕනෑ.

ත්‍රිපිටක ග්‍රන්ථ මුද්‍රණය කිරීම සඳහා තම අමාත්‍යාංශයේ මුදල් නැති වන විට මේ ඇමතිතුමා අතිගරු ජනාධිපතිතුමාගේ අරමුදලෙන් පවා මුදල් ලබා ගෙන එය මුද්‍රණය කිරීමට කටයුතු කිරීමම කොයි තරම් ශ්‍රේෂ්ඨ ක්‍රියාවක්ද ?

සිංහල කලා මණ්ඩලය දැන් ක්‍රියාත්මක ස්වරූපයෙන් දනට අඩු බවට කලවානේ ගරු මන්ත්‍රීතුමා කළ ප්‍රකාශයට තම් මාත් එකඟ වෙනවා. එම නිසා ඒ සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්න කැමතියි. මේ වර්ෂයේ පැවැත්වුණු සාහිත්‍ය උත්සවය පිළිබඳව පුවත් පත්වල විවිධ විවේචන පළ වුණා. 'දිවයින' පත්‍රයේ මුල් පිටුවේ, එද, සාහිත්‍ය උත්සවයේදී දේශීය වෛද්‍ය ඇමතිතුමා කථාව පැවැත්වූ පින්තූරයක් පළ කර තිබුණා. මුළු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ශ්‍රාවක සංඛ්‍යාව—අහගෙන හිටිසංඛ්‍යාව—78 ක් බවත් එහි සඳහන් කර තිබුණා. ඒ කාරණය පිළිබඳව අපේ විශේෂ අවධානය යොමු කළ යුතුතුව තිබෙනවා. විශේෂයෙන්ම සාහිත්‍ය හා නාට්‍ය පිළිබඳ අංශ දෙකින් ලියැවෙන, සකස් වන කලා කෘතීන් පරිශීලනය කිරීමට, අධ්‍යයනය කිරීමට, සොයා බලා තෑගි දීමට සුදුසු උසස් ගණයේ කෘතීන් විවේචනය කිරීමට, ඒ කෘතීන් කලා මණ්ඩලයට ඉදිරිපත් කිරීමට, සංස්කෘතික අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීමට උගත්කම විතරක් ප්‍රමාණවත් නැහැ, ගරු ඇමතිතුමනි. බොහෝ දෙනෙක් සාහිත්‍යය පිළිබඳව හාෂා ශාස්ත්‍ර පිළිබඳව උගත්කමින් පරිපූර්ණ වෙන්න පුළුවන්. එපමණක් මදි. නාට්‍ය පිළිබඳ, නාට්‍ය පිළිබඳ තව තැම්ම, තව රටාව, තව ආකල්ප, තව සංකල්ප තේරුම් ගන්නට පුළුවන්, එදිනෙදා සාහිත්‍ය, නාට්‍ය, නාට්‍ය පිළිබඳ ඇති වෙන වෙනස් කම් අවබෝධ කර ගන්නට පුළුවන්, පරිණත කලා කුසලතාවන්ගෙන් හෙබි උගතුන් මේ කලා මණ්ඩලයට පත් කරන්නට තමුන්නාන්සේ කල්පනා කළ යුතුයි. මේක අවශ්‍යයි. ඒ මොකද ? සාහිත්‍යකරුවකුගේ ජීවිතය ගැන කල්පනා කර බැලුවොත් ඒක බොහොම ශ්‍රේෂ්ඨ එකක්. කලවාත ගරු මන්ත්‍රීතුමා (සරත් මුත්තෙට්ටුවෙගම මහතා) යාක්ෂි දරනවා ඇති, තිකොලායි ගොගොල් කියන ශ්‍රේෂ්ඨ රුසියානු ලේඛකයා ඔහුගේ "මළ මිනිස්සු"—"Dead Souls"—කියන පොතේ කොපියෙන් කොපිය, පිටපතෙන් පිටපත, පරිවිඡේදයෙන් පරිවිඡේදය විකුණ විකුණයි අලුත් පරිවිඡේද ලිවිවේ. කලාකරුවෙකුට මුදල් හිමි පුද්ගලයෙක් වෙන්න අමාරුයි. ඒක කලාවට හිමි ජීවිතයක්. ඒකකලාවට උරුමකමක්. ඇත්තත් වෙකොප්ගේ කෘති, තිකොලායි ගොගොල්ගේ කෘති ඩෙස්ටොයෙව්ස්කිගේ කෘති මම හොඳට පරිශීලනය කර තිබෙනවා. සාර් රාජ්‍ය කාලයේදී ගොගොල්ස් වගේ ශ්‍රේෂ්ඨ ලේඛකයින් මොන තරම් දරිද්‍රතාවයෙන් දිලිඳුකමින් පෙළී සිටියාද කියනවා නම් ඔහු තමන්ගේ කෘතිය අංගසම්පූර්ණ ලෙස ලියා පළ කරන්නට මත්තෙන්, අවිවුකත්තෝරුකාරයාට එහි පිටපතෙන් හාගයෙන් හාගය විකුණලයි ජීවත් වුණේ.

පොත් ලිවීම සම්බන්ධයෙන් අද තිබෙන තත්ත්වයත් ඒ තරම්ම අමාරුයි කියා මම කල්පනා කරනවා. පොත් පත් සකස් කරන්නට අද සැහෙන අමාරුවක් තිබෙනවා. හොඳ කෘතියක් නිෂ්පාදනය කළත් සැහෙන වියදමක් දරන්නට සිදු වෙනවා, මුද්‍රණ ශාස්තු සඳහා. අද පිටු සියයක පමණ පොතක් ඩිමයි කොලයේ අවිවූ ගැහැවිවත් රුපියල් විසි පහකට, තිහකට අඩුවෙන් දෙන්නට බැහැ. මම එය පිළිගන්නවා. එමනිසා විශේෂයෙන් කලා මණ්ඩලයට පත් කරන සාමාජිකයන් පිළිබඳ නැවත වරක් කල්පනා කර බලන ලෙස මම ගරු ඇමතිතුමාගෙන් විශේෂයෙන් ඉල්ලා සිටිනවා. ඒ උදවියගේ කුසලතාවන් ගැන කල්පනා කරන්නට එතුමාට සිදු වෙයි. එහෙම නැතිව ඒ පැරණි උගතුන්ම ඒකට පත් කරනවා නම් හොඳ කෘතීන් අගයකරන තුලනය කරන ආකාරයෙන් ඒ උදවියගෙන් අපට බලාපොරොත්තු වන්න පුළුවන්කමක් නැහැ.

ඒ වාගේම පොත් අවිවූ ගැසීම සම්බන්ධයෙන් යම්කිසි පහසුකමක් ඇති කිරීමට තමුන්නාන්සේ කල්පනා කළ යුතුයි. සාහිත්‍ය ක්ෂේත්‍රය තුළ යම්කිසි පරිහානියක් ක්‍රමයෙන් ඇති වේගත යන බව මත් පිළිගන්නවා. මේ රටේ අනාගත ඉතිහාසඥයෝ, ඉතිහාසය ලියනවිට බලන්නේ සාහිත්‍ය කෘතීන් තුළිනුයි. රටේ ඉතිහාසය කොහොමද සිදු වුණේ කියන එක. ගරු සථාපතිතුමනි, "කවිසිඑම්මණ" නමැති ශ්‍රේෂ්ඨ කෘතිය දඹදෙණි සාහිත්‍ය යුගයේ පණ්ඩිත පැරකුම්බා රජතුමා විසින් ලියන ලද කෘතියක්. අද සිංහල ශබ්ද කෝෂය හාරව ක්‍රියා කරන, ඒ සඳහා ගරු ඇමතිතුමා විසින්ම පත් කරන ලද ආචාර්ය පුංචි බණ්ඩාර යත්නස්ගල මැතිතුමා විසින් ඒ කෘතිය පිළිබඳව විවේචනයක් ලිවිවා. පුංචි බණ්ඩාර යත්නස්ගල මැතිතුමා "කවිසිඑම්මණ සාහිත්‍යය" කියා මූලික කවිසිඑම්මණ කාව්‍යය විවේචනාත්මක හදාරන්න කෘතියක් ලිවිවා. ඒ ඒ සමාජ තුළ තිබුණු සමාජ ව්‍යුහය පිළිබඳව, සමාජ රටාව පිළිබඳව, ආර්ථික ශක්තිය පිළිබඳව, ජනසමාජයේ තිබුණු ප්‍රබුද්ධ හාවය පිළිබඳව මිණුම් දණ්ඩ සකස් කරන්නට පුළුවන් වෙන්නේ ඒ ඒ වකවානුවල ලියැවුණු කලා කෘතීන් තුළින් පමණයි කියන එක ඒ කෘතියේදී එතුමා පැහැදිලිව සඳහන් කර තිබෙනවා. එතුමා පමණක් නොවෙයි, සැම විචාරකයෙක්ම පැහැදිලි කර තිබෙන්නේ ඒකම තමයි. එම නිසා සාහිත්‍ය පොත පත අවිවූ ගැසීමේදී යම්කිසි අමාරුකමක් නිසා සාහිත්‍ය කලාවේ යම්කිසි පිරිහීමක් ඇති වුණොත් එය අපේ සමාජ රටාව පිළිබඳව අනාගතයේදී වැරදි නිගමනයක් ඇති කර ගන්නට එය ප්‍රයෝජනයට ගන්නට එය උදවිවට ගන්නට ඉඩ ඇති බව මම මේ අවස්ථාවේදී පෙන්නා දෙන්නට කැමතියි. අපි මහවැලිය හදනවා. අපි ආර්ථික රටාව දියුණු කරනවා. ඒ එක්කම අපි බුද්ධිය දියුණු කිරීමට සාහිත්‍ය, කලාව, නාට්‍යය, චිත්‍රය, කාව්‍යය, මූර්ථිය, වැනි අංග දියුණු කිරීමට කටයුතු යෙදිය යුතුයි. ටවර්හෝල් පදනම යටතේ ගරු අගමැතිතුමා දැන් දී තිබෙන සහයෝගය අපි අගය කරනවා. එය කිසියේත්ම ලුහුඬින් සලකන්න පුළුවන්කමක් නැහැ. එය උතුම් උවටක්, අත්වැලක්.

සංස්කෘතික අමාත්‍යාංශයේ ක්ෂේත්‍රය මීට වඩා පුළුල් කළ යුතුය කියා කලවාත ගරු මන්ත්‍රීතුමා (සරත් මුත්තෙට්ටුවෙගම මහතා) කිව්ව අදහසට මමත් එකඟ වෙනවා. එය ඇත්ත. ගුවන් විදුලියෙන්, රූපවාහිනියෙන් ඉදිරිපත් කරන කලාකෘතීන් පිළිබඳව සංස්කෘතික අමාත්‍යාංශයට යම්කිසි වගකීමක් තිබෙන්න ඕනෑ. එහෙම නැත්නම් එක පැත්තකින් ආර්ක්ෂා කරගෙන යන සංස්කෘතිය යම් මාධ්‍යයකින් විනාශ වී යාමට ඉඩකඩ තිබෙනවා. කලවාත ගරු මන්ත්‍රීතුමා සමග මම එකඟ වෙනවා, සංස්කෘතික අමාත්‍යාංශයේ විෂය පථය පුළුල් කළ යුතුයි කියන එක ගැන.

මීට වඩා කරුණු කියන්නට මම විර්ය කරන්නේ නැහැ. විශේෂයෙන්ම කලා මණ්ඩලයට පත් කිරීම පිළිබඳව මීට වඩා පුළුල් අවධානයක් යොදවන ලෙස ඉල්ලා සිටින අතර, පොත් මුද්‍රණය කිරීමේදී අද ලේඛකයින්ට මුහුණ පාන්නට සිදු වී තිබෙන අවහිරකම්වලට සැහෙන පිළියමක් යෙදීමට තමුන්නාන්සේගේ අමාත්‍යාංශය තුළින් ශක්තියක් ලැබෙවායි කියා ප්‍රාර්ථනය කරන අතර, ත්‍රිපිටක මුද්‍රණය, සිංහල ශබ්ද කෝෂ කරණය සංස්කෘතික ත්‍රිකෝණය. ඊටත් වඩා කලාකරුවන්ට තොයෙක් තොයෙක් ආකාරයේ ආධාර දීම වැනි ක්‍රියා මාර්ග තුළින් ඔබතුමාගේ සංස්කෘතික අමාත්‍යාංශය මඟින් මේ කාලය තුළ ඇති කරන ලද දියුණුව තවත් උච්චතම ස්වරූපයකින් ඇති කිරීමට ශක්තිය ලැබෙවායි කියා ප්‍රාර්ථනය කරමින් මා නිහඬ වෙනවා.

ඩබ්ලිව්. පී. බී. දිසානායක මහතා (මහනුවර දිසා ඇමතිතුමා)
(திரு. டபிள்யு. பீ. பி. திஸாநாயக்க — கண்டி மாவட்ட அமைச்சர்)
(Mr. W. P. B. Dissanayake–District Minister, Kandy)

ගරු සභාපතිතුමනි, මේ අමාත්‍යාංශය ගැන වවන ස්වල්පයක් කතා කිරීම වැදගත් යුතුකමක් හැටියටයි මා සලකන්නෙ. විශේෂයෙන්ම මහනුවර දිස්ත්‍රික්කයේ ඉතාම ක්‍රියාත්මකව කටයුතු කෙරෙන අමාත්‍යාංශයක් තමයි සංස්කෘතික අමාත්‍යාංශය. තමුන්ත කනගාටුවෙන් හරි කලවාත ගරු මන්ත්‍රීතුමා (සරත් මුත්තෙට්ටුවෙගම මහතා) සඳහන් කළ අදහස් මටත් අනුමත කරන්නට පිළිගන්නට සිදුවෙනවා. මේ අමාත්‍යාංශයේ විෂයපථයට සම්බන්ධ නොවන කාරණයක් මේ රටේ තිබෙනවාද කියන එක අපි කල්පනා කර බැලිය යුතුව තිබෙනවා. සැම දෙයක්ම සංස්කෘතියට අදාළ නිසා අපේ පැරණි සංස්කෘතිය ආර්ක්ෂා කරන්න ඕනෑ. වර්තමානයේ ඇතිවෙන හැම දෙයක්ම, අපටම ආවේණිකව තිබෙන, අපිම ආඩම්බරයෙන් හැම විටම කතා කරන සංස්කෘතියක් බලපෑ යුත්තේ, අපේ පැරණි සංස්කෘතිය විනාශ වන අන්දමට නොව, එයින් අපට යම් දියුණුවක් ලැබෙන හැටියටයි.

අපේ සංස්කෘතියේ ආර්ක්ෂා පිණිස දැනට සැහෙන විධියේ වැඩ රාශියක් මෙම අමාත්‍යාංශයෙන් කරගෙන යාම ගැන මම ස්තුතිවන්ත වෙනවා, විශේෂයෙන් ගරු අගමැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සංස්කෘතික ත්‍රිකෝණය පිහිටුවා දැන් ක්‍රියාත්මක කිරීමේ හේතුවක් වශයෙන් වර්ෂ සිය දහස් ගණනක් තොයෙකුත් හේතූන් මත පරිහානියට විනාශ මුඛයට පත්වී තිබුණ අපේ සිද්ධස්ථාන, පූජනීය ස්ථාන, අපේ සංස්කෘතික වටිනාකමක් ඇති අපේ ඒ සංස්කෘතික දායාදයන් නැවත සංරක්ෂණය කිරීමට ඒ අරමුදලට පුළුවන් වී තිබෙනවා. ඒ ගැන අපි ආඩම්බර වන අතර, දැනට වැළඳ ගෙන තිබෙන කොටස පමණක් නොව, මේ තුන් සිංහලයම අද සංස්කෘතික ආකරයක් නිසා, ඒ තුන් සිංහලයේම තිබෙන අපේ ඒ වැලලී ගිය සංස්කෘතික දායාදයන් සංරක්ෂණය කිරීමට සංස්කෘතික ත්‍රිකෝණයට ක්‍රියාත්මක වන්නට වාසනාව ලැබෙවායි අපි ආශංසනය කරනවා.

අ. හා. 5.45

ගරු සභාපතිතුමනි, මා වැඩි වේලාවක් කතා කරන්න බලාපොරොත්තු වෙන්නෙ නැහැ. බෞද්ධ කටයුතු පිළිබඳව කොමසාරිස්වරයකු සහ දෙපාර්තමේන්තුවක් ඇති කිරීමට මේ රජයට පුළුවන්වීම ගැන මම ආඩම්බර වෙනවා. මෙතුවක් කල් ඒ කොමසාරිස් දෙපාර්තමේන්තු පිහිටුවන තුරු, මහාගාරකාරතුමාටයි ඒ කටයුතු හාරවී තිබුණෙ. මහාහාරකාරතුමාගේ රාජකාරී බෞද්ධ කටයුතුවලට පමණක් සීමා වුණේ නැහැ. විවිධ ක්ෂේත්‍රයන්හී සේවාවක් එතුමාට හාරව තිබුණා. නමුත් අද බෞද්ධ කටයුතු පිළිබඳව වෙනමම කොමසාරිස්තුමෙකු සහ දෙපාර්තමේන්තුවක් පිහිටුවා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩබ්ලිව්. ජී. බී. දියතායක මහතා]

තිබෙනවා. ඒ පත් කර තිබෙන කොමසාරිස්තුමා ගැන අපි ආඩම්බර වෙනවා. එතුමා මේ රටේ විශ්වාසය දිනාගත් ඉතාම ශ්‍රේෂ්ඨ ගණයේ තීතිඥයෙක්. ඒ වගේම විනිශ්චයකාරවරයෙක්. හැබැයි එතුමාගේ කාර්ය භාරය ගෙන යාමට අවශ්‍ය බලතල එතුමාට තිබෙනවාද කියා අප සෝදිසි කර බලන්නට ඕනෑ.

බෞද්ධ විහාරගම් පනත අනුව බෞද්ධ කටයුතු පිළිබඳ කොමසාරිස්තුමා මේ විහාර දේවාලගම් පාලනය කර ගෙන යනවා. ඒ අනුව බෞද්ධ භික්ෂූන් වහන්සේලා ලියාපදිංචි කිරීමේ කටයුතු කරනවා. ඒ වාගේ සීමාසහිත කටයුතුයි එතුමා කරන්නේ. එම නිසා මෙහිදී ඇමතිතුමාගෙන් එක් ඉල්ලීමක් කරන්න කැමතියි. ඒ කියන්නේ, සංඝයා වහන්සේලාගේ ගෞරවය ආරක්ෂා කිරීම පිණිස කැබිනට් මණ්ඩලයට කරුණු ඉදිරිපත් කර මේ පනතට සංශෝධන කීපයක් ඇති කරන්නට කටයුතු කරන ලෙස එතුමාගෙන් ඉල්ලා සිටින්නට කැමතියි.

ගරු සභාපතිතුමනි, මාතර හිටපු නගරාධිපතිතුමා, වර්තමාන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්. උසාවියේ දී අපේ භික්ෂූන් වහන්සේලා මුහුණපාන තත්ත්වය දැක එතුමාට ඇති වුණු කනගාටුව නිසා එතුමා යෝජනාවක් කළා. ඇත්තවශයෙන්ම එතුමා කියන කාරණය සම්පූර්ණයෙන්ම ඇත්ත. සංඝාධිකරණයකින් මේ ප්‍රශ්නය විසඳා ගන්නට බැහැ. සංඝාධිකරණයකින් විසඳා ගන්නට පුළුවන් වෙන්නේ සංඝයා වහන්සේලා අතර ඇති ප්‍රශ්න පමණයි.

අද උසාවියට භික්ෂූන් වහන්සේලා යන්නේ සංඝයාවහන්සේලා අතර ඇති ප්‍රශ්න මතම නොවෙයි. බොහෝ විට දේපල පිළිබඳ ප්‍රශ්න සම්බන්ධවයි. ඒ ගැන ස්වාමීන් වහන්සේලාට දොස් නගන්නට අපට බැහැ. සිංහල රජදරුවන්ගේ කාලයේ සිට නිත්දගම් හැටියට ශාසනයේ පැවැත්ම සඳහා, සංඝරත්නයෙහි පැවැත්ම සඳහා රජ දරුවන් විසින් යන්තස් පිට පූජා කරන ලද එම විහාර දේවාලගම් ආරක්ෂා කිරීම පිණිස එම ස්වාමීන් වහන්සේලාට අධිකරණය හමුවීමට යන්නට සිදු වන අවස්ථා තිබෙනවා. නමුත් අද, අද ගොවියෙකුට හෝ කුඹුරු හිමියකුට හෝ කුඹුරු පනත අනුව කොමසාරිස්තුමා හෝ විශේෂයෙන් ඒ කටයුතු සඳහා පත් කර සිටින නිලධාරීන් හමුවට හෝ ගිහින් කරුණු ඉදිරිපත් කර ඒ අයට කිසියම් සහනයක් ලබා ගන්නට පුළුවනි, කිසියම් ප්‍රශ්නයක් සම්බන්ධයෙන් කිසියම් තීරණයකට එළඹෙන්නට පුළුවනි. අන්න ඒ අන්දමටම භික්ෂූන් වහන්සේලා සම්බන්ධවන මෙබඳු ප්‍රශ්න විසඳන්නට වෙනම ම මණ්ඩලයක් පිහිටුවන්නට බැරිද කියන ප්‍රශ්නය මතු කරන්න කැමතියි. එහෙම නැත්නම් වර්තමාන කොමසාරිස්තුමා දක්ෂ තීතිඥයෙකු, හිටපු විනිශ්චයකාරවරයකු නිසා, විහාර දේවාලගම් සම්බන්ධයෙන් ඇතිවන ආරාවුල් පිළිබඳව පරීක්ෂණ පැවැත්වීම සඳහා ඒ කොමසාරිස්තුමාට තීතියෙන් බලය පැවරීමට කටයුතු කරන ලෙස ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, මහනුවර හතර දේවාලය තිබෙන්නේත්, දළදා මාළිගාව තිබෙන්නේත් තමුන්නාන්සේගේ ආසනයේයි. සිංහල රජ කාලයේ සිට මේ සිද්ධස්ථාන වලට ලැබී ඇති දේපොළ පාලනය කිරීම සඳහා ඒවායේ භාර කරුවන්ට විශාල මුදල් ප්‍රමාණයක් වියදම් කරමින් උසාවි යන්නට සිදු වී තිබෙනවා. නමුත් මෙතරම් මුදලක් වියදම් කරන්න එම සිද්ධස්ථානවලින් ආදායම් ලැබෙන්නේ නැහැ, ආදායම් මාර්ග ඔක්කොම ඇහිරී ගිහින්. කලින් මෙම සිද්ධස්ථානවලට අයිතිව තිබුණු ගම්වර දැන් එක් එක් පුද්ගලයන් අල්ලා ගෙන තිබෙනවා. අඩු වශයෙන් ඒ වෙනුවෙන් රාජකාරියවත් ඉෂ්ට කරන්නේ නැහැ. එම නිසා මේ ප්‍රශ්න විසඳීම සඳහා නීති අලුතෙන් සම්පාදනය කිරීමට ක්‍රියා කරන ලෙස ඇමතිතුමාගෙන් මම ඉල්ලා සිටිනවා. එහෙම නැතිනම්, අර කුඹුරු පනත යටතේ පරීක්ෂණ පවත්වන්නට කොමසාරිස්වරුන්ට බලය දී තිබෙනවා වාගේ, විශේෂ විනිශ්චය සභා පත් කර තිබෙන්නා වාගේ අවුරුදු කීපයකට සීමා කරමින්වත් දැන් පවතින මේ තත්ත්වයෙන් ගොඩගැනීම සඳහා වෙනම ම විනිශ්චය සභාවක් – දැන් තිබෙන නීති සංශෝධනය කිරීමෙන් හෝ–පිහිටුවන්නට කටයුතු කරන ලෙස ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි, ඇත්තවශයෙන්ම අද පවතින තත්ත්වය මොකක්ද ? අපේ රටේ ඇති විශාලම සංස්කෘතික ප්‍රදර්ශනය මහනුවර පෙරහැරයි. එය අපේ රටේ ආගමික උත්සවයක් පමණක් නොවෙයි, මුළු මහත් ආසියාවේම පැවැත්වෙන ප්‍රධානතම සංස්කෘතික ප්‍රදර්ශනය හැටියටත් අපට සලකන්නට පුළුවනි. මෙම සිද්ධස්ථානයට ලැබිය යුතු ආදායම් නොලැබෙන නිසා අද ඒ ප්‍රදර්ශනය කොයි තරම් අමාරුකම් මධ්‍යයේ පවත්වා ගෙන යනවාද කියනවා නම් අපේ අතිගරු ජනාධිපතිතුමාට පවා සිද්ධ වුණා, මේ උත්සවය පවත්වන්නට එතුමාගේ අරමුදලෙන් ආධාර කරන්නට. මේ තත්ත්වය තවදුරටත් පිරිහුණොත් එම කටයුතු කර ගෙන යන්නට පුරා විද්‍යා දෙපාර්තමේන්තුවට භාර දෙන්නට අපට සිදු වෙයි. එම නිසා මේ ඉල්ලීම කරන්නේ අපේ රටේ ජීවත්වන සෑම බෞද්ධයකු වෙනුවෙන්මයි.

ගරු සභාපතිතුමනි, මෙම අමාත්‍යාංශයට අදාළව, දේශීය නැටුම් අංශය ගැනත් මෙහිදී වචනයක් කියන්න ඕනෑ. අපේ මේ ඇමතිතුමා අපේ රටේ සංස්කෘතියට විශාල ලෙස උරුමකම් ඇති කෙනෙක්. එතුමා කත්දැඩරට සිටි පැරණිම පුහු පවුලකින් පැවත ගෙන එන කෙනෙක්. මේ ඇමතිකම එතුමාට ලොලැබී තිබුණත්, කලාව ආරක්ෂා කිරීමට එතුමා බැඳී සිටින කෙනෙක්. අපේ දේශීය නැටුම් දෙස බලමු. මා විරුද්ධ නැහැ නැටුම් සංකලනය කිරීම ගැන. ඒවාට අපි තව තිෂ්පාදනයයි කියමු. නමුත් අපේ පැරණි නැටුමය කියා අඳුන් නැටුම් වර්ගයක් දැන් පෙන්වනවා වේදිකාවල. කණගාටුවෙන් වුණත් මතක් කරන්නට ඕනෑ, රූපවාහිනියෙන් පවා ඒවා පෙන්වන බව. ඒවා කිසියෙන්ම අපේ නැටුම් සම්ප්‍රදායට අයිති නැහැ. මුදල් ඉපැයීමේ පරමාර්ථයෙන් අද අපේ නැටුම් කලාව කෙළෙසීමට සැහෙන පිරිසක් කටයුතු කරගෙන යන බව මා කණගාටුවෙන් මතක් කරන්නට ඕනෑ.

උඩරට වෙස් නැටුම මේ රටේ තිබෙන ඉතාම වටිනා කලා කෘතියක්. නවමත් අනරිත් පතර පුරාණයේ සිට ඒ කලාව ආරක්ෂා කරගෙන ආපු කීප දෙනෙකු අතෙයි එය රැඳී තිබෙන්නේ. රජයේ වියදමින් ආණ්ඩුවේ මැදහත්වීමෙන් නොයෙකුත් ස්ථානවල පවත්වන නැටුම් සංදර්ශන අපි දක තිබෙනවා. ඒ සන්දර්ශනවලදී නැටුම් පෙන්වන විට නමින් උඩරට වෙස් නැටුම යයි කිව්වාට ඒ තටත්තේ වෙස් නැටුම නොවෙයි, වෙන එකක්. ඒවා බලන කොට අප තුළ බලවත් වේදනාවක් බලවත් හිතේ අමාරුවක් ඇති වෙනවා. ඇයි මේ අපරාධය කරන්නේ ? උඩරට වෙස් නැටුමය කියා වේදිකාවේ නැටුමක් පෙන්වනවා. බෙරයත් ගහනවා, වයලීනයත් ගහනවා තබලාවත් ගහනවා. තවත් තිබෙන සංගීත භාණ්ඩත් ගහනවා. වලිගත් වනනවා. අතුන් වනනවා. ඔළුවත් වනනවා. බාගෙට හෙළුවෙනුත් තටනවා. හනුමා වාගේ ඇඳලත් තටනවා. ඒකටත් කියනවා උඩරට වෙස් නැටුමය කියල. ලඟදී බෝවු කරණම් ටිකකුත් ගහනවා. පිණුම් ගහනවා. ඒකටත් කියනවා වෙස් නැටුමය කියලා. මේවාට ඉඩ දෙන්නට එපා. කාට හරි වුවමනා නම් නැටුම් සංදර්ශනයක් පවත්වන්නට ඔගේ පවත්වා ගත්තාවේ. සංස්කෘතික අමාත්‍යාංශයේ මුදල් ඒ තියම නැටුම ආරක්ෂා කරන්නට යොදවමු.

අපේ සංස්කෘතික කණ්ඩායම් පිටරටවලට යවනවා. ඒ අය පිටරටවල්වලට ගිහින් ඉදිරිපත් කරන නැටුම් අපි විත්‍රපට්ටලින් දකල තිබෙනවා. ඒ අය නටන්නේ හාරත කලාවට සම්බන්ධ නැටුම්. ඉන්දියානු සම්ප්‍රදායට අයිති දකුණු ඉන්දියානු නැටුම්. ඒ නටන්නේ අපේ නැටුම් නොවෙයි. බෙරයත් අදුන් කරයිද කියා මා තුළ සැහෙන බියක් තිබෙනවා. ලී කෙළිය කියන එක අද දකින්නවත් නැහැ. දැන් ඒක කවුරුවත් කරන්නේ නැහැ වේදිකාවට අල්ලන්නෙ නැති නිසා. සවරං නැහැ. දැන් හුහක් දේවල් ප්ලාස්ටික් වෙලා. ලී කෙළියත් ප්ලාස්ටික් වී තිබෙනවා නම් ඒක පුදුමයට කාරණයක් නොවෙයි. නවීකරණයට මා විරුද්ධ නැහැ. අපි ඒවාට තව තිෂ්පාදන යයි කියමු. අපේ පැරණි නැටුම් ආරක්ෂා කර ගනිමු. ගරු ඇමතිතුමාට මා ඉතා ඕනෑකමින් කියන්නේ තමුන්නාන්සේ මේවා ගැන වගබලා ගනයුතු බවයි.

ගරු සභාපතිතුමනි, කා සමගවත් අමනාපයෙන් නොවෙයි මා කථා කරන්නේ. රූපවාහිනියෙන් ප්‍රචාරය කරන සමහර නැටුම් සංදර්ශන මා දක තිබෙනවා. සමහර විට ඒ වැඩ සටහන් නොබලා රූපවාහිනිය තිබ්බා දමන බව මා කියන්නේ කණගාටුවෙන්.

රූපවාහිනිය සහ ගුවන් විදුලිය කෙලින්ම අපේ සංස්කෘතියට සම්බන්ධ අපේ සංස්කෘතියට බලපාන ආයතන දෙකක්. ජන සංනිවේදන මාධ්‍ය කොහේ තිබුණත් එය කවුරුන් විසින් කළත් එය මේ රටේ සංස්කෘතියට තදින්ම බලපාන දෙයක්. ඒ සම්බන්ධව තමුන්නාන්සේ විශේෂ වගකීමක් භාර ගන්නට ඕනෑ. ඒ සඳහා තමුන්නාන්සේට විශේෂ බලතල අවශ්‍ය නැහැ. කැබිනට් මණ්ඩලයේදී ඒ සම්බන්ධව තීරණ ගන්නට පුළුවනි. අපේ ගුවන් විදුලියෙන් සහ රූපවාහිනියෙන් ප්‍රචාරය කරන සමහර වැඩ සටහන් ගැන තමුන්නාන්සේගේ අවධානය යොමු කරන්න රූපවාහිනියේ අර විහිළු තහළු කෝලමක් පෙන්නුවා. දැන් ඒක අවසානය කියා නොබෝද කිව්වා. මේවාද අපි පෙන්වන්නේ ? මේවාද අපි බලන්නේ ? මේවාද අපි අහන්නේ ? අපි පමණක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නොවෙයි වෙනත් රටවල වැසියනුත් මේවා බලනවා. මේවා අහනවා. ඉංග්‍රීසිකාරයෝ ගස් උඩ හිටපු කාලෙ රෝම අධිරාජයාගේ රාජ සභාවේ අපේ දූතයෝ හිටියාය කියා අපි කියනවා. ඒ තරම් පැරණි සංස්කෘතියකට උරුමකම් කියන ඒ තරම් ආඩම්බර ඉතිහාසයක් තිබෙන අපි වර්තමානයේ මේ වාගේ පිරිහීමකට ඉඩ දුන්නොත් ඒ මිනිස්සු කියයි, "උඹලාගේ ඉතිහාසය ඔක්කොම බොරු, එහෙම එකක් උඹලාට තිබිලා නැහැ" කියල.

ඒ වාගේම, දූනට තෂ්ඨාවශේෂ බවට පත් වී ලංකාවේ කොහේ තිබුණත් පුරාවිද්‍යාත්මක වටිනාකමක් තිබෙන හැම ගල් කැල්ලක්ම අපේ ජාතිය තරමටම වටිනා බව මම කියන්නට ඕනෑ. මේ රටේ අපේ යම් වටිනාකමක් තිබෙනවා නම් එය තිබෙන්නේ මේ සිමෙන්ති සංස්කෘතියේ නොවෙයි. එය තිබෙන්නේ අපේ ගල්වල තිබෙන සංස්කෘතියේ බව මම තමුන්නාන්සේට අවධාරණයෙන් මතක් කරනට ඕනෑ. සිමෙන්ති සංස්කෘතියෙන් අපේ ඉතිහාසයක් පෙන්වන්නට දන් සැහෙන පිරිසක් උත්සාහ කරනවා. අපේ ඉතිහාසය තිබෙන්නේ ඒ සිමෙන්ති සංස්කෘතියේ නොවෙයි. අපේ ඉතිහාසය තිබෙන්නේ ගල් කැටයම්වල, ලී කැටයම්වල, අපේ පුරාවිද්‍යාත්මක වටිනාකමක් ඇති සිද්ධස්ථාන සහ සෙසු ස්ථානවලත් බව මම තමුන්නාන්සේට මතක් කරන්නට ඕනෑ. අපි එවා ආරක්ෂා කරන්නට ඕනෑ. සංස්කෘතික ත්‍රිකෝණයේ වැඩ මුළු තුන් සිංහලයම වැලඳ ගන්නා වැඩ පිළිවෙලක් බවට පත් කළ යුතුයයි මම කිව්වේ ඒ නිසයි.

ගරු මන්ත්‍රීතුමන්ලා කීපදෙනෙක්ම දහම් පාසල් වැඩේ ගැන කරුණු සඳහන් කළා. මේ ඊයේ පෙරේදිදත් අපට එක් ශාසනාරක්ෂක මණ්ඩලයකට රුපියල් අට දහ බැගින් මුදල් වගයක් එවා තිබුණා. මම තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙනවා මුදල ප්‍රමාණවත් නොවුණත්, අවුරුද්ද අන්තිමේදී අපට ලැබුණු ඒ මුදල අපට දූනට තිබෙන අඩුපාඩුකම් මගහරවා ගැනීමට විශාල වශයෙන් ආධාරයක් වෙනවා. අප බලාපොරොත්තු වන්නේ මුදල් ආධාරම නොවෙයි, ගරු ඇමතිතුමනි. අපට දහම් පාසල් පොත් ලබා දී තිබෙනවා. අපි එය ඉතාම අගය කොට සලකනවා. ඒවා පින් සිදුවන වැඩ.

බෞද්ධාචාර්ය විභාගය සමත් වන හැම ළමයෙක්ම බෞද්ධ ළමයින් යන පාසල්වල බෞද්ධාගම උගැන්වීම සඳහා අතිවාර්යයෙන්ම පත් කරන්න ඕනෑයයි රජයට කරුණු ඉදිරිපත් කරන්නට තමුන්නාන්සේට බැරිද? කවුරුවත් මාත් එක්ක අමනාප වෙන්න එපා. මුස්ලිම් ළමයින් යන පාසල්වල මුස්ලිම් ආගම උගැන්වීම සඳහා මුස්ලිම් ආගම හැදෑරූ ළමයින් "මවුලවි" තමන් පත් කර තිබෙන බව අපි දන්නවා. ඒක හොඳයි. කොයි ආගම වුණත් අපි උගන්වන්නට ඕනෑ. නමුත් මේ රටේ විශාල පිරිසක් අදහන බෞද්ධාගම උගැන්වීම සඳහා සාමාන්‍ය ගුරුවරුයි පත් කරනු ලබන්නේ. බෞද්ධාචාර්ය විභාගය සමත් වන ළමයින් බෞද්ධාගම උගන්වන ගුරුවරුන් වශයෙන් පත්වීමට සුදුසු වෙනවා නම්, ආර්ථික වශයෙනුත් එය ප්‍රයෝජනවත් වන නිසා, ළමයින් ඒ විභාගය සඳහා ඉගෙනීමට මීට වඩා උනන්දුවන් දක්වයි. හැම ළමයෙක්ම ඒ විධියට ආගම ඉගෙනගන්නා විට දූනට මේ රටේ තිබෙන කලබලත් නැති වෙන්න පුළුවනි.

දන් අ.පො.ස. සාමාන්‍ය පෙළ සඳහා අතිවාර්ය කර තිබෙන්නේ ගණිතය සහ සිංහල විෂයයන්. ආගම අතිවාර්ය නැහැ. මම මේ යම්බන්ධයෙන් ඉදිරිපත් කරන අදහසට විපක්ෂයේන් සියලුදෙනාම මාත් එක්ක එකඟ වෙයි. මුළු රටම එකඟ වෙයි. අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයට ආගම ධර්මය අතිවාර්ය විෂයයක් කරන්නට ඕනෑයයි වහාම තීරණයක් ගනිමු. එක්-එක්කෙනා අදහන ආගම, ක්‍රිස්තියානි ආගම, කතෝලික ආගම, මුස්ලිම් ආගම, බෞද්ධාගම, හින්දු ආගම යන මොන ආගම වුණත් කමක් නැහැ, ආගම අතිවාර්ය විය යුතුයි.

ඊළඟට මම තවත් කරුණක් මතක් කරන්න ඕනෑ. ගරු ඇමතිතුමා කොතෙක් දුරට මේ ගැන දන්නවාදැයි මම දන්නේ නැහැ. එක්-එක් පින්තූර ගසා, වචන ලියා පත්තර වර්ගයක් එවනවා. ඒවාට කියන්නේ මොන පත්තරද? මම තම් කියන්නේ කැලෑ පත්තර කියලා. කවුරු හෝ අපේ සංස්කෘතිය විනාශ කරන්නට කරන කුමන්ත්‍රණයක් මේක. අවුරුදු දෙදහස් පන්සියයකට වැඩි කාලයක් ආරක්ෂා කරගෙන ආ අපේ වැදගත් ශිෂ්ටාචාරය, සංස්කෘතිය විනාශ කරන්නට කවුරු හෝ කරන විශාල කුමන්ත්‍රණයක්. මේ අය මහා කැන පත්තර වගයක් ගහනවා.

අ. හා. 6

අඩ නිරුවතින් සිටින කාන්තාවන්ගේ පින්තූර, ඉස්කෝලේ යන ළමයින් ඉස්කෝලයේදී ආලය කරන විධිය දක්වෙන පින්තූර, ගැහැනු ළමයි, පිරිමි ළමයි ගස් අස්සේ ගොහින් සිප වැළඳගෙන කතාබහ කරන විධිය දක්වෙන පින්තූරවලින් ළමයින් මත් කරන්නට හදනවා. මේ පත්තර අපේ සංස්කෘතියට විශාල බාධාවක් නිසා ගරු ඇමතිතුමා ඒ ගැන මැදිහත් වී මේවා තහනම් කිරීමට හෝ මේවා මීට වඩා ක්‍රමානුකූලව යකඩ් කොට, අප රටේ සංස්කෘතියට සහ්‍යත්වයට අපේ දරුවන්ගේ අනාගතයට බල කොපාන විධියට, දූනුම වඩන විධියට පමණක් සීමා කිරීමට හෝ කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

අවසාන වශයෙන් මම මතක් කරන්නේ මේ කාරණයයි. මහනුවර දිස්ත්‍රික්කයේ, ගම්පල ආසනයේ ඉතාම පැරණි ස්ථාන කීපයක් තිබෙනවා. නුවර රාජධානියේ සිටි රජවරුන් විදේශීය ආක්‍රමණවලදී පැනගොස් හැංගී සිටි තැන්. අද ඒ තැන් ආරක්ෂා කිරීමට කෙනෙක් නැතිව විනාශ වෙමින් පවතිනවා. තිල්ලඹ නම් ස්ථානයේ තිබෙනවා ඉර හද කෙටූ ගල තමන් ගලක්. එතැනට කිසිම කෙනෙකුගේ හවිහරණයක් නැහැ. මම මේ ළඟදී එතැනින් යන විට එතැන එහා පැත්තේ ගල් කඩනවා. ඒ මනුෂ්‍යයාට මම අත් දෙක ඔසවා වැදලා කිව්වා, "අනේ සහෝදරයා, මේ ගල එහෙම කඩන්න එපා" කියා. තිල්ලඹකැලේ තමයි රජ්ජුරුවෝ හැංගිලා හිටියේ. අද නම් කැලයක් නැහැ. ඒ පලාතට කියන නම පමණයි "කැලේ". දූන ඒකට කියන්නේ බලහත්කාර ව්‍යාපාරය කියලයි. අද පවුල් හාර පන් සියයක් එහි පදිංචි වී සිටිනවා. දූන් එහි කැළයක් නැහැ.

ගම්පොල නගරයේ සිංහයාපිටියේ පුද්ගලයෙකුට අයිතිව තිබුණු ඉඩමක් දූනට අවුරුදු 35 කට පමණ ඉස්සර කැණීම් කරන්න යයි අන්පත් කර ගත්තා. ගරු කථානායකතුමාත් ඒ ගැන දන්නවා. එහෙත් අද වන තුරු ඒ ඉඩමේ කිසිවක් කර නැහැ. එය අනික් අයට සැහෙන ප්‍රශ්නයක්. ඒ ඉඩමේ කැණීම් කටයුතු කර එහි වටිනාකමක් ඇති දෙයක් නැත්නම් අත්හරින්න. නැත්නම් අයිතිකාරයාට ආපසු දෙන්න. [බාධා කිරීමක්] ඒක සංස්කෘතික දෙපාර්තමේන්තුවේ කාරණයක්. මගේ කාලයේ නොවෙයි. ඒක බොහොම කලින් සිදු වූ දෙයක්. මම ඉස්කෝලේ යන කාලයේ සිටම එය තිල්ලඹකැලේ. එහෙත් දන් එයට ලියුම් එන්නේ බලහත්කාර ව්‍යාපාරය කියලයි. දූන් මට එය තවත්වන්න බැහැ. ගල්ටිකවත් ප්‍රවේශම් කර ගත්තොත් ඇති.

මට ලැබුණු කාලය අවසාන නිසා මම වැඩිපුර කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. අඩුපාඩු තිබෙන්නට පුළුවන්. කෙසේ වුවත් අපේ ගෞරවය සහ ස්තුතිය මේ ඇමතිතුමාටත් නියෝජ්‍ය ඇමතිතුමාටත් ප්‍රකාශ කළ යුතුයි. නියෝජ්‍ය ඇමතිතුමාගේ මෙහෙයවීම හා මේ අමාත්‍යාංශයේ අධික්ෂණය යටතේ වැලිවිට සිරි සරණංකර සංඝරාජ හිමිපාණන් වෙනුවෙන් සිහිවටනයක් මේ මැතක දී ගරු අගමැතිතුමා විසින් ගලගෙදර විහාර කළා. එහි හික්ෂු අභ්‍යාස මධ්‍යස්ථානයක් පිහිටු වීමට ලබන අවුරුද්දේ මුදලක් වෙන් කරන්නට තීරණය කර තිබීම ගැන මා සන්තෝෂ වෙනවා. සංස්කෘතික අමාත්‍යාංශයෙන් කෙරෙන වැඩ ඉතාමත්ම සාර්ථක අන්දමින් කෙරෙන බව අපි දන්නවා.

මේ අමාත්‍යාංශයේ බොහොම හොඳ ලේකම් මහත්මයෙක් හිටියා, කලින් රත්නායක කියා. එතුමා අද ජීවතුන් අතර නැහැ. ඒ ගැන අපි කණගාටු වෙනවා. මේ අමාත්‍යාංශයට එතුමාගෙන් විශේෂ සේවයක් සිදු වුණා. එමෙන්ම රෝලන්ඩ් සිල්වා මහතාත් මේ අමාත්‍යාංශයේ වැඩ කටයුතු ගැන උනන්දුවකින් හා ඕනෑකමකින් කටයුතු කරනවා. අපේ ටෙලිෆෝන් පණිවුඩයකට සමහර විට එතුමා මහනුවරට එනවා, අපිත් සමග සාකච්ඡා කරන්නට. මේ අමාත්‍යාංශයට සම්බන්ධ ඒ සියලු දෙනාටම අපේ ස්තුතිය හිමි කරන අතර, මේ කර ගෙන යන වැඩ කටයුතු තව තවත් ධෛර්යමත්ව කර ගෙන යෑමට ගරු ඇමතිතුමාට ශක්තිය ලැබෙවායි මා ප්‍රාර්ථනා කරනවා.

එඩ්මන්ඩ් සමරවික්‍රම මහතා (නැගෙනහිර කොළඹ — නියෝජ්‍ය කාරක සභාපතිතුමා)

(திரு. எட்மன்ட் சமரவிக்ரம —கொழும்பு கிழக்கு — உப குழுத் தலைவர்)

(Mr. Edmund Samarawickrema–Colombo East–Deputy Chairman of Committees)

ගරු සභාපතිතුමනි, සංස්කෘතික ඇමති ඊ. එල්. බී. හුරුල්ලේ මැතිතුමා මගේ කල්‍යාණ මිතුයෙක්. ගරු ජනාධිපතිතුමාගේ උපත් දිනය නිමිත්තෙන් තාඩලත්ත ආණ්ඩුවෙන් බුදු පිළිම 7 ක් තැගි ලැබුණා. ජනාධිපතිතුමා එයින්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එඩිමන් සමරවික්‍රම මහතා

එක පිළිමයක් මට හාර දුන්නා. මගේ කොට්ඨාශයේ ජයවර්ධනාරාමය ආදී ප්‍රසිද්ධ පන්සල් බොහොමයක් තිබෙනවා. නමුත් මම කල්පනා කර බැලුවා මේ පිළිමය දුප්පත් පළාතකට ගෙන යන්න ඕනෑය කියා. එතම්, පල්ලම කියන පළාතට. මම එහේ මිනිසුන් අදුනනවා. මගේ මාමාවූ හිටපු පොලිස් අධිකාරී සී. වී. ගුණරත්න මහතා විශ්‍රාම ගත්තාට පසුව ඒ පල්ලම පළාතේ ඉඩමක් අරගෙන වැව්වා. ඒ කාලේ නිතරම මාවත් එහේ එක්කරගෙන යනවා. මට ඒ පළාත පුරුදුයි. ඉතින් මම කල්පනා කළා ඒ දුප්පත් මිනිස්සු ඉන්න පළාතකට මේ බුදු පිළිමය ගෙන යන්න ඕනෑය කියා. එතම්, ඒ පල්ලම පළාතේ තන්දිමිත්‍ර පන්සලට; තක්දිමිත්‍ර යෝදයා සිටි පන්සලට. ඒ කටයුත්තට සහභාගි වන්නට මම තමුන්නාන්සේටත් ආරාධනය කළා. අවුරුදු පහක් එහේ වැහි නැතිවයි, තිබුණේ. තමුන්නාන්සේටත් මතක ඇති. තමුන්නාන්සේත්, නියෝජ්‍ය කථානායකතුමාත් මගේ ආරාධනය පිළිගෙන ඒ අවස්ථාවට සහභාගි වුණා. ඔබතුමන්ලාගේ පැමිණීම ගැන මම අවංකව මෙහිදීත් ස්තුතිය පුද කරනවා. තමුන්නාන්සේට මතක ඇති එදා මහ විශාල වර්ෂාවක් ඇති වුණු බව. දැන් එහේ වැව් පිරිලා ගිහිත් තිබෙනවා. අද කවුරුත් බොහොම සන්තෝෂෙන් ඉන්නවා. බුදු ගෙයත් දැන් යාද අවසානයි. එදා පැමිණීම ගැන මම තමුන්නාන්සේට නැවතත් ස්තුතිය පුද කරනවා.

සංස්කෘතික ත්‍රිකෝණය තුළ මහනුවර අනුරාධපුරයේ ජේතවනාරාමය, මිරිසවැටිය, දඹුල්ල ආදී නුගාක් සිද්ධස්ථානවල වැඩ මේ ආණ්ඩුවෙන් කර තිබෙනවා. ආණ්ඩු ගණනාවක් තිබුණා. මහජන එක්සත් පෙරමුණේ ආණ්ඩුවකුත් තිබුණා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුත් තිබුණා. එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුත් තිබුණා. මමත් හිටියා; අපේ සංස්කෘතික ඇමතිතුමාත් හිටියා. ඉතින් අපේ ආණ්ඩුවලින් නුගාක් විහාර ස්ථාන වැඩි දියුණු කර තිබෙනවා. ජනාධිපතිතුමා දැන් ලොවාමහාපාය ප්‍රතිසංස්කරණය කරගෙන යනවා. එදා මේවා සියල්ලම ආපයවල් තත්ත්වයට වැටිලයි, තිබුණේ. අපේ ආණ්ඩු තිබෙන විට මේවා සියල්ලම කිරීම ගැන අපි සන්තෝෂයි.

එපමණක් නොවෙයි මේ අවස්ථාවේදී විශේෂයෙන් මතක් කරන්න ඕනෑ දෙයක් තියෙනවා. අපේ අගමැතිතුමාත් පැළෑණේ ශ්‍රී වජිරඥාණ ස්වාමීන් වහන්සේ ගැන මතක් කරනවා. [බාධාකිරීමක්] නෑදෑයෙක් නියා තමයි ඒ කියන්නෙ. එතුමා හොඳ පණ්ඩිත හිමි නමක්. අපේ දේශීය වෛද්‍ය ඇමතිතුමාත් නිතරම මතක් කරනවා. දැන් අවුරුදු 28 ක් වෙනවා උන්වහන්සේ අපවත් වෙලා. මේ ආණ්ඩුවෙන් තමයි උන්වහන්සේ වෙනුවෙන් මුද්දරයක් නිකුත් කිරීමෙන් අනුස්මරණය කෙළේ. මේ ගැන මම ඇමතිතුමාටත් නියෝජ්‍ය ඇමතිතුමාටත් කියා තිබුණා. ඒ මුද්දරය නිකුත් කිරීම ගැන ඥතියෙකු හැටියට මගේ යුතුකමක් තිබෙනවා ආණ්ඩුවට ස්තුති කරන්න.

ගරු සභාපතිතුමනි, කල්පනා කර බලන්න, අපේ ජනාධිපති උතුමාණන් කවදාවත් ගුරුවරුන් අමතක කරන්නේ නැහැ. ජනාධිපති උතුමාණන්ට පැළෑණේ වජිරඥාණ ස්වාමීන් වහන්සේයි බුද්ධාගම ඉගැන්නුවේ. ජනාධිපති වරණය අවස්ථාවේදී එතුමාට ප්‍රකාශ කළා එතුමන් බුද්ධාගම ඉගැන්නුවාය කියා. අගමැතිතුමාට ඉගැන්නුවා. වෙළඳ ඇමතිතුමාට ඉගැන්නුවා. බර්නාඩ් සොයිසා මහත්මයාට බුද්ධාගම ඉගැන්නුවා. ඩඩ්ලි සේනානායක මහතාටත් ඉගැන්නුවා. විරුද්ධ පක්ෂයේ නායක අනුර බණ්ඩාරනායක මහතාත් බුද්ධාගම ඉගෙන ගත්තේ ඒ පන්සලෙන්. ඔය විධියට මේ දේශපාලනයේ සිටින සියලු දෙනාටම බුද්ධාගම උගන්වා තිබෙනවා.

මම රාජ්‍ය ඇමතිතුමාට ස්තුති කරන්න ඕනෑ පාර්ලිමේන්තුව මේ ස්ථානයේ සැදීමට කල්පනා කිරීම ගැන. තමුන්නාන්සේ දන්නවා නොටගමුවේ ගුරුකුලය, විදාගම ගුරුකුලය, අහයගිරි ගුරුකුලය කියා ගුරුකුල තිබුණ බව. අන්තිම ගුරුලය තිබුණේ පැළෑණේ. පැළෑණේ ගුරු කුලයෙන් ඉගෙන ගත් ටික දෙනෙකුගේ නම් මේ ගරු සභාවේ සඳහන් කරන එක මගේ යුතුකමක්. ලංකා ඉතිහාසයේ සඳහන් වන අවසාන ගුරුකුලය හැටියට සැලකිය හැකි පැළෑණේ ගුරුකුලය ඇසුරු කොට ඉගෙන ගත් නුගාක් පණ්ඩිත හාමුදුරුවරු ඉන්නවා. තුඩාවේ පණ්ඩිත ගුණවර්ධන මුහන්දිරම් මහතාගේ ගුරුකුලයෙන් එළිය ලැබූ පැවිදි පඬිවරයන් අතර මාතර සිරිධම්මාවරිසඳ්ඛීන්ද්‍රාසහ රාමඤ්ඤ නිකායේ මාහිමියන් වහන්සේ, බද්දේගම සිරි ධම්මරතන නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ, මැද උයන්ගොඩ සිරි සුමංගල ස්වාමීන්ද්‍රයන් වහන්සේ හා මැනක් වන තුරුම රාමඤ්ඤ නිකායේ මහනායක පදවිය හොබවමින් සිට අභාවප්‍රාප්ත වූ කරතොට ඉන්දසාරාභි ධාන මහනායක ස්වාමීන් වහන්සේ ආදී පඬිවරුන්ගේ නම් සඳහන් කරන්න පුළුවනි.

ඒ වාගේම ගිහි ශිෂ්‍යයන් අතර එවකට සුප්‍රකට නීතිඥයෙකුව සිටි ජේම්ස් ද ඇල්විස්, ආණ්ඩුවේ නීතිපති පදවිය දැරූ චාර්ල්ස් ලෙයාරෝ, දිසාපති වැක්රිඩ්, බී. ගුණසේකර මුදලිදු, ඩබ්ලිව්. ඇf්ස්. ගුණවර්ධන වාසල මුදලිදු හා ජෝන් කවිතිලක පඬිතුමා යන අයගේ නම් සඳහන් කරන්න පුළුවනි.

මේ අවස්ථාවේ තවත් ගරු මන්ත්‍රීවරුන් කථා කරන්නට සිටින නිසා මම වැඩිය කථා කරන්නෙ නැහැ. මේ පැළෑණේ අන්තිම ගුරු කුලය ගැන විකක් කල්පනා කර බලන්න කියා මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. ගරු ඇමතිතුමාත් පැළෑණට ගිහිත් තිබෙනවා කුඩා කාලයේදී. උන්තැන්ගේ මගේ කල්‍යාණ මිත්‍රයෙක්. උන්තැන්ගේ සෙන්ට් පැට්‍රික් විද්‍යාලයේ ඉගෙන ගත්තෙ. මගේ සහෝදරයන්, මාමාගේ පුත්තුන් එහෙ ඉගෙන ගත්තෙ. අපි ඒ ඉගෙන ගන්නා විට පැළෑණේ නුමට එනවා යාපනේ දුවිඩ ළමයි. අපි ඒ අයත් සමග බොහොම එකමුතුවෙන් සිටියා. අපේ මාමා කෙනෙක් සිටියා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ කෙනෙක්—එම්. එස්. සමරසිංහ මහතා. එයා fපාදර් ලොංග්ස් සමග බොහොම මිත්‍රකමින් සිටියා. ඒ වාගේම සී. ඩී. සමරසිංහ, ඒ. ජී. සමරසිංහ හා මගේ සහෝදරයාත් සිටියා. ඔවුන් සෙන්ට් පැට්‍රික් විද්‍යාලයේ ක්‍රිකට් කණ්ඩායමෙන් ක්‍රීඩා කළා. දෙමළ අය පමණක් නොවෙයි ඒ කාලයේ පැළෑණට ආවේ. කිරුබා කියා නීග්‍රෝ ජාතිකයෙකුත් ආවා. අපි කවුරුත් බොහොම එකමුතුවෙන් සිටියා. ඒ නිසා අදත් අපි ඒ එකමුතුවෙන් ඉන්න ඕනෑ. ඒ නිසා මේ ගුරු කුලය ගැන ගරු ඇමතිතුමා උනන්දුවෙන් කටයුතු කර, එහි පුස්තකාලයක් ඇති කරන්න කියා ඉල්ලා සිටිමින් මගේ කථාව මෙයින් අවසන් කරනවා.

සභාපතිතුමා
(தலைவர்)
(The Chairman)

Order please ! Hon. Deputy Chairman of Committees will now take the Chair.

අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත්වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [එඩිමන්ඩ් සමරවික්‍රම මහතා] මූලාසනාරූඪ විය.

அதன் பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, குழுப் பிரதித் தலைவர் அவர்கள் [திரு. எட்மண் சமரவிக்கிரம] நடுவை வகித்தார்கள்.

Whereupon MR. SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES (MR. EDMUND SAMARAWICKREMA) *took the Chair.*

දිනේෂ් ගුණවර්ධන මහතා (මහරගම)
(திரு. தினேஷ் குணவர்த்தன — மஹரகம)
(Mr. Dinesh Gunawardene–Maharagama)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය ගැන අදහස් රාශියක් ඉදිරිපත් වුණා. එතියා ඒවා ගැන තැවත කථා කරන්නට මම බලාපොරොත්තු වෙන්නෙ නැහැ. කෙසේ වෙතත් අපේ කලවාතේ ගරු මන්ත්‍රීතුමාත් (සරත් මුත්තෙට්ටුවේගම මහතා), ඒ වාගේම නියෝජ්‍ය පුද්ගලික බස් ප්‍රවාහණය පිළිබඳ ඇමතිතුමාත් ප්‍රකාශ කළ මූලික අදහස් ගැන ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කිරීමට මම බලාපොරොත්තු වෙනවා.

පුරාවස්තු යහ දෑනට එකතු කර ගත හැකි දේ පිළිබඳව සංස්කෘතික අමාත්‍යාංශය දක්වන උනන්දුව පමණක් සංස්කෘතියේ ආරක්ෂාවට ප්‍රමාණවත්ද කියන ප්‍රශ්නය වෙනදාට වඩා වැඩි වුවමනාවකින් අපත්තට අද සිදු වී තිබෙනවා. අපේ රටේ ජනතාවගේ දියුණු සංස්කෘතිය ගැන මුළු ලෝකයම අවධානය යොමු කරනවා. එසේ වන්නේ ජාතියක් හැටියට මේ රටේ සංස්කෘතිය අභිමානවත් කාල පරිච්ඡේදයන් ගණනාවකට උරුමකම් කියන නිසයි. නමුත් වර්තමානයේ අපේ සංස්කෘතිය බාල්දු වෙලා තිබෙනවාය කියන ටික කියන්නට සිදු වී තිබෙනවා. ඒ ගැන සංස්කෘතික ඇමතිතුමා හැටියට ඔබතුමා දැඩි අවධානය යොමුකර වැඩ පිළිවෙලක් සකස් කළේ නැතිනම් අපට ඉතුරු වෙන්නෙ ඉතිහාසයේ ඉතුරු වී තිබෙන දේ පමණයි. වර්තමාන හා අනාගත පරම්පරා සංස්කෘතියෙන් පිරිහුණු ජවා බවට පත්වෙනවාට කිසිම අනුමානයක් නැහැ, මේ දැන් තිබෙන තත්ත්වය අනුව. එය අපි කණගාටුවෙන් වුවත් කිව යුතුව තිබෙනවා. මේ රටේ සංචරය සහ විලිබිය නැති පරම්පරාවකට මග පාදන මේ රටාව නිසා සිදු වෙගන යන මේ ජාතික පරිහානිය ඉතාමත්ම භයානක තත්ත්වයකට පත්ව තිබෙනවා. ඇස් ඉදිරිපිටම මුහුදු වෙරළේ දිගටම සිදු වන සංස්කෘතික විනාශය අභිමානවත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ජාතියේ සංස්කෘතිය පිරිහී යන හැටි පෙන්වනවා. අගිමාතවත් සංස්කෘතියක විනාශය ඇස් දෙක ඉදිරිපිට දැන් සිදු වෙනවා. ඩොලර්වලට, විදෙශ විනිමයට තියෙන කැදරකම නිසා ජාතියේ සංස්කෘතිය ආරක්ෂා කරන්නට බැරි තත්ත්වයකට අපි පරිවර්තනය වී තිබෙනවා. මේ රටේ ඉපැරණි නගරවල වැව් අමුණු දාගැබ් වටා සිදු වෙන්නෙත් ඔය විකම බවට පරිවර්තනය වෙමින් තිබෙනවා.

මා මේ වික ඔබතුමාට කීවේ ඔබතුමාගේ විෂය පථය මීට වඩා පළල් කළ යුතු යුගයකට පැමිණ තිබෙන බව පෙන්නුම් කරන්නටයි. ඒ වික සිදු නොකළොත්, අපි ජාත්‍යන්තරව ලබා ගත්තා මුදල්වලින් සංස්කෘතික ත්‍රිකෝණයෙන් ආරක්ෂා කරන අපේ රටේ ඉපැරණි සංස්කෘතියේ සංකේත හෝ නිර්මාණ හෝ කෘතීන් නරඹන්නට පමණයි අන්තිමට අපට ඉතුරු වෙන්නේ. අපේ රටේ සංස්කෘතියේ ජීවය ඉදිරියට ගෙන යන්නට ඒවා නැරඹීම පමණක් උදව් වෙයිද කියන ප්‍රශ්නය ගැන අපි අපේ අවධානය යොමු කරන්නට ඕනෑ.

මහනුවර ගරු දිසා ඇමතිතුමා කිව්වා වගේ මේ දහම් පාසල් ක්‍රමය ගැන මීට වැඩි අවධානයක් යොමු කරන්නට කාලපරිච්ඡේදය දැන් පැමිණ තිබෙනවා. ඒවාට දෙන ආධාර පිළිබඳව මීට වඩා දැඩි අවධානයක් යොමු කළ යුතුව තිබෙනවා. අපේ නිර්මාණ කරුවන්ට සමාජයේ මීට වඩා උසස් තත්ත්වයක්, පිළිගැනීමක්, ආරක්ෂාවක් සපයා දෙන්නට කාලපරිච්ඡේදය දැන් පැමිණ තිබෙනවා. ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ ඒ වැඩ කර නැත කියා හෝ කෙරෙත්තේ නැත කියා හෝ නොවෙයි මා කියා සිටින්නේ. ඊට වඩා වැඩි අවධානයක් යොමු කළ යුතු කාල පරිච්ඡේදයක් දැන් පැමිණ තිබෙන බවයි මම කියන්නේ.

ගරු රාජ්‍ය ඇමතිතුමා සාහිත්‍ය උත්සවයේදී ප්‍රසිද්ධියේම ප්‍රකාශ කර තිබෙනවා, ආසියාවේ පොත් මිල වැඩිම රට ශ්‍රී ලංකාවයි කියා. ඒ පිළිබඳව අදහස් ගණනාවක් ඉදිරිපත් වුණා. අද ලේඛකයකුට, නිර්මාතකරුවකුට තමන්ගේ කෘතියක් පළකර ගැනීමට තිබෙන අමාරු තත්ත්වය මහ හැරවීමට අපි ඉක්මන් පියවරක් ගත යුතුමයි. මෙයට හොඳම උදාහරණයක් වශයෙන් ජී. බී. සේනානායක ශූරීන් සාහිත්‍ය උත්සවයේදී එද කළ ප්‍රකාශය කෙරෙහි මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. 1983.12.19 වන දින 'දිවයින' පුවත්පතේ එම ප්‍රකාශය මෙහෙම සඳහන් වෙනවා:

"ජනාධිපති සහ සාහිත්‍ය සම්මානවලට ප්‍රතිපත්ති දෙකක් ඇයි?—ජී. බී. සේනානායක"

සුප්‍රසිද්ධ ග්‍රන්ථ කර්තෘවරයකු වන ජී. බී. සේනානායක මැතිතුමාට ඒ සාහිත්‍ය උත්සවය ද රු. 50,000 ක් ප්‍රදානය කර තිබෙනවා. තමුන් අන්තිමට එතුමා එය හාර ගැනීමේ අර්ථයක් නැති බව ප්‍රකාශ කර තිබෙනවා. ඇයි? එම ප්‍රදානය සඳහා බදු ගෙවන්න සිදු වෙනවා. ජනාධිපති සම්මානවලට බදු ගෙවන්නේ නැහැ. තමුන් සාහිත්‍ය සම්මානවලට බදු ගෙවන්න සිදු වෙනවා. එක අර්ථයක් පමණයි එයින් කියවෙන්නේ. සාහිත්‍යකරුවන්ට ලැබෙන යම්කිසි ප්‍රදනයක ගෞරවය ඒ ආකාරයෙන් ආරක්ෂා වන පරිදිම ඒවා ප්‍රදනය කරනවාද කියන ප්‍රශ්නය එයින් මතු වෙනවා. ජී. බී. සේනානායක ශූරීන්ගේ එම ප්‍රකාශයේ මෙම ප්‍රශ්නය විශාල වශයෙන් අන්තර්ගත වී තිබෙනවා. මේ සාහිත්‍ය උළෙලේදී ලොකුම ප්‍රදනය ලැබුණේ එතුමාටයි. මුළු මහත් ලේඛක පරපුර වෙනුවෙන් සහ වෙනත් නිර්මාතකරුවන් වෙනුවෙන් එතුමා එද ඔය විධියට අදහස් පළ කර තිබෙනවා. ඒ අයගේ කෘතීන් පළ කරන්නටත්, කෘතීන් පිළිබඳව දක්වන සැළකිල්ලක් සේ ජනාධිපති සම්මානය වැනි සම්මානයක් ප්‍රදනය වන අවස්ථාවලදී ඒවාට තියමින ගෞරවය හිමි කරන්නටත්, ඒවායේ ප්‍රයෝජනයක් හැටියට එය පරිවර්තනය කර ගන්නටත් අවස්ථාවක් සලසා දෙන්නට ඕනෑ. පාර්ලිමේන්තු අනුමතියක් නොමැතිව එම ප්‍රදනය ආදයම් බද්දෙන් නිදහස් කරන්නට බැරි නිසා එතුමාට දෙන මේ ප්‍රදනය ආදයම් බද්දට අන්තර්ගත වෙනවාය—යටත් වෙනවාය—කියා තිබෙනවා. එම නිසා එතුමා එය හාර ගැනීමට මැලිකමක් දක්වනවා කියන එකයි ඒ පත්තරයේ සඳහන් වී තිබෙන්නේ.

මේවා ගැන සමහර විට නිලධාරීන්ගේ පැත්තෙන් අවධානයක් යොමු වෙන්නේ නැහැ. ප්‍රදනය ගැන තිබෙන උනන්දුව සහ එයින් ලැබෙන ප්‍රචාරය ගැන තමයි, වැඩිහරියක් අපේ අවධානය යොමු වෙන්නේ. මේ වාගේ විවේචන පැත්තෙන් තිබෙන දේවල් ගැනත් ඔබතුමා සැළකිල්ලක් දක්විය යුතුය කියන වික මා කියනවා.

6—ඒ 074275 (83/12)

සිතමා කර්මාන්තයේ යෙදී සිටින තළු නිළියන් එකතු වී ඇති කර තිබෙන සංවිධානයේදී තමුන්නාන්සේලාගේ ආණ්ඩුව බලයට පත් කරන්නට කටයුතු කළ ජෝ අබේවික්‍රම එම සංවිධානයේ ප්‍රධානියා වශයෙන් මොකක්ද කියා තිබෙන්නේ? 1983 දෙසැම්බර් මස 18 වන දින "රිවිරැස" පත්තරය අනුව ඒ මහතා මෙහෙම කියා තිබෙනවා:

"කසල ශෝධකයන්ටත් අද ඒ අයගේ අයිතිවාසිකම් දිනාගැනීම සඳහා සංවිධානයක් තිබෙනවා. නැත්නේ අපට විකරයි. ඒ අඩුව පුරවමින් අද අපි මේ පිහිටුවාගත් තළු නිළි හවුල තුළින් චිත්‍රපට කර්මාන්තය දැකට වැටී ඇති අගාධයෙන් ගොඩගන්නට අපට පුළුවන්. මොකම හේතුවක් නිසාවත් අපි මෙයට දේශපාලනය වැද්ද නොගත යුතුයි. මොක දේශපාලන පක්ෂයකටවත් පන්දම් දල්ලන්න තළු නිළියන් හේන්තු කරන්න තරකයි."

මෙම ප්‍රකාශය දීර්ඝ වශයෙන් තිබෙනවා. සිංහල සිතමා කලාව, දේශීය සිතමා කර්මාන්තය මුහුණපාන විශාල අර්බුදය ගැන සිතමා තළු නිළියන් විශාල බියකින් සහ වේදනාවකිනුයි පසුවන්නේ. අපේ සංස්කෘතියේ චිවිධ අංශ ගැන, නාට්‍ය කලාව සහ මූර්ති කලාව ගැන ඒ ක්ෂේත්‍රයේ නියැළී සිටින අයගේ අවධානය සහ යෝජනා එක්තැන් වන ආකාරයට මීට වඩා ප්‍රළුල් වැඩපිළිවෙලක් තිබෙන්නට ඕනෑය කියන විකයි මම ඔබතුමාට කියා සිටින්නේ. මේ රටේ චිත්‍රපට කරමාන්තය සමහර විට වැසී යන්නට පුළුවන්. ඊයේ-පෙරේදු සිට මේ රටට ඉන්දියාවෙන් ගෙන්වන්නට පටන්ගෙන තිබෙන චිත්‍රපට නිසා මේ රටේ චිත්‍රපට කර්මාන්තයේ අනාගතය කුමක්ද කියන ප්‍රශ්නය ඇසිය යුතුව තිබෙනවා. එපමණක් නොවෙයි, එයින් මේ රටේ සංස්කෘතියට තිබෙන අභියෝගය ගැන අපි සලකා බැලිය යුතුයි. ඉන්දියාවෙන් වෙනත් ආකාරයෙන් එන චිත්‍රපට මේ රටේ සංස්කාතිය ආක්‍රමණය කරයිද කියන සැකයක් ඇති වෙනවා. ඒ පැත්තත් මේ පැත්තත් දෙපැත්තම බලන්න ඕනෑය කියන් වික කෙරෙහි, දැඩි අවධානය යොමු කර කටයුතු කරන මෙන් මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

මේ රටේ කලකරුවන්ගේ ආරක්ෂාව ඇති කරන්නට විධිමත් වැඩපිළිවෙලක් අද වෙනදාටත් වඩා අවශ්‍ය වෙලා තිබෙනවා. රජය දැනටමත් ඒ අයට උදව් කරන එක ඇත්ත. උදව් කරන්නට පුළුවන්. නොයෙක් ආධාර ක්‍රම මාර්ගයෙන්.

ඩබ්ලිව්. එම්. ජී. ටී. බණ්ඩා මහතා (තියෝජ්‍ය සංස්කෘතික කටයුතු ඇමතිතුමා)

(திரு. டபிள்யு. எம். ஜீ. ரீ. பண்டா — கலாசார அலுவல்கள் பிரதி அமைச்சர்)

(Mr. W. M. G. T. Banda–Deputy Minister of Cultural Affairs)

චිත්‍රපට ආංශය අපේ අමාත්‍යාංශය යටතේ තිබෙන ආංශයක් නොවෙයි.

දිනේෂ් ගුණවර්ධන මහතා

(திரு. தினேஷ் குணவர்த்தன)

(Mr Dinesh Gunawardene)

මම දන්නවා. මම කථා කරන එකක්වත් ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ නොවෙයි තිබෙන්නේ. මත් ද්‍රව්‍යවලින් ජාතියේ සංස්කෘතිය විනාශ කිරීමත්, ඔබතුමාගේ අමාත්‍යාංශට යටත් දෙයක් නොවෙයි. තමුන් එය ජාතික සංස්කෘතියේ විනාශය ඇති කරන්නක් නිසයි, මම ඔබතුමාගේ අමාත්‍යාංශයට ජාතික සංස්කෘතිය තියෝජනය කිරීම සඳහා පියවර ගන්නා ලෙස ඉල්ලා සටින්නේ. අපි සංස්කාතියේ එක් කැල්ලක් පමණක් නැත්තම් ඉතිහාසය පිළිබඳව පමණක් මෙතන කථා කරලා, ඊට අවශ්‍ය මුදල් වැය ශීර්ෂයක් අනුමත කර යාමට පමණක් සීමා වෙන්නේ නැහැ කියන වික මම මුලදී කිව්වා. ඒ ගැන මීට වඩා අපි අවධානය යොමු කරන්නට ඕනෑ. ඒවා අපි ඉතිරි කර, ඉදිරි පරම්පරාවලට මගක් පෙන්වන්නටයි තැවත සංරක්ෂණය කරන්නේ. ඒ වෙනුවට ඉදිරි පරම්පරාව වෙනත් මගකට යොමු කරන තත්ත්වයකට පරිවර්තනය වෙනවා නම් ඒවායින් ඇති වන ප්‍රයෝජන මොනවාද කියන එක ගැන අන්තිමේදී අපිම ප්‍රශ්න කරගන්නට වෙනවා, මෙන්න මේ ගැන අපි හිත යොමු කරන්නට ඕනෑ.

"සංස්කෘතික පරිහානිය" නමින් පොතක් ලියූ, මහාචාර්ය සරත්චන්ද්‍ර මැතිතුමාට සිදු වුණු දේ පිළිබඳව අපේ අවධානය අපි යොමුකරන්නට ඕනෑ. අපේ සංස්කෘතියේ කලාකාමීන්ට තමන්ගේ නිදහස් අදහස් අගිතව පළ කරන්නට තිබෙන වාතාවරණය ගැන අපි අපේ අවධානය යොමු කරන්නට ඕනෑ. ඊයේ-පෙරේදු අමරදේව ශූරීන්ට ගෞරවය දක්වීමේ උත්සවයේදී මහාචාර්ය සරත්චන්ද්‍ර මැතිතුමාගේ ප්‍රකාශයක් ගැන පුවත්පත් සිරස්තලයක් තිබෙනවා, මෙන්න මේ විධියට: "සංස්කෘතික පරිහානියේ තරම නියත්තගිහිත් යළි ගුටි කන්න වේද". (ගරු කඹුරුපිටියේ මන්ත්‍රීතුමා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[දිනේෂ ගුණවර්ධන මහතා]

චන්ද්‍රකුමාර විජයගුණවර්ධන මහතා කිව්වා, සරත්චන්ද්‍ර ශූරීන්ගේ කෘතියක් ගැන කැසට් එක ගැන කියද්දිය කිව්වේ. මේ රටේ සංස්කෘතියේ, කලාවේ, නිර්මාණ කලාවේ, විශාල සේවාවක් ඉෂ්ට කළ මේ වැනි අයගේ අදහස් පළ කරන්නට, ඒවා සංවාදයට ලක් වීමට ආරක්ෂාව දීම සංස්කෘතික අමාත්‍යාංශයේ එක් කටයුත්තක් ලෙස අපි සලකන්නට ඕනෑ. ඒ තුළින් තමයි, තව තවත් කලාව දියුණු තත්තවයට පරිවර්තනය වන්නේ. මේ වික ඔබතුමාට කිවයුතුව තිබෙනවා. බොහෝ කෘතීන් පළ කිරීමට මුදල් අර්බුදය තමයි බල පා තිබෙන්නේ. තමුත් මීට වඩා ඒ ගැන අවධානය යොමු කරන්නට පුළුවන් ආකාරයේ වැඩපිළිවෙලක් සොයන්නට ඕනෑ.

ඒ වාගේම හිත්දි-සිංහල ශබ්ද කෝෂයක්—පිටු දෙදහකින් පමණ ලියැවුණු ශබ්ද කෝෂයක්—කාලයක් තිස්සේ තිබෙනවා. එය ගෞරවනීය ස්වාමීන් වහන්සේ තමන් විසින් සකස් කරලද ශබ්ද කෝෂයක්. මේක පමණයි තවම එවැනි මට්ටමකින් සකස් කර තිබෙන්නේ. එවැනි කෘතීන් ගණනාවක් තිබෙනවා. ඒවා ගැන අවධානය යොමු කර ඒවා පළ කරන්නට පුළුවන් වැඩපිළිවෙලක් ඇති කරන්නටය කියන වික මම ඔබතුමාගෙන් ඉල්ලනවා. ඒ වගේම මම තව එක කාරණයක් කියන්නට බලාපොරොත්තු වෙනවා.

මේ ලෝකයේ හැම ජාතියකටම ජාතික ගීයක්ම තිබෙනවා. අපේ රටෙත් ජාතික ගීයක් තිබෙනවා. රාජ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂය මේ ගරු සභාවේ යාකච්ජා වන අවස්ථාවේදී මා තොසිටි නිසාත්, මෙය ජාතියේ සංස්කෘතිය පිළිබඳ ප්‍රශ්නයක් වන නිසාත් මේ ගැන මේ අවස්ථාවේදී කරුණු ඉදිරිපත් කරන්න මා බලාපොරොත්තු වෙනවා. උදේට සිංහල සේවයෙන් ජාතික ගීය වාදනය වෙනවා; ඉංග්‍රීසි සේවයෙනුත් ජාතික ගීය වාදනය වෙනවා, නමුත් සොයා බලන්න, දෙමළ සේවයෙන් වාදනය වන්නේ කුමක්ද කියා. අපේ ජාතික සංස්කෘතියට සිදුව වන්න යන්නේ මොකක්ද කියන දේ ගැන මේ අමාත්‍යාංශය දැනට වඩා උනන්දුවක් දක්වා කටයුතු කළ යුතු කාල පරිච්ඡේදයකට ඇවිත් තිබෙනවා.

කිසිම රටක ජාතික ගීයක් විවිධ භාෂාවලට පරිවර්තනය වන්නේ නැහැ. භාරත ජාතික ගීය මුළු භාරතය—ඉන්දියාව—පුරා ප්‍රචාරය වන්නේ එකම භාෂාවකිනුයි. ලෝකයේ හැම තැනම තත්ත්වය ඒකයි. අපේ රටෙත් එහෙම විය යුතුයි. තමුත් එසේ නොවෙනවා නම් ඒ කියන තත්ත්වය ඇති කරන්නත් කාල පරිච්ඡේදය දැන් ඇවිත් තිබෙනවා. මම කිසිම තිලධාරියකුට චෝදනා කරනවා නොවෙයි. සමහර තිලධාරීන් තොදැනුවත්ව මේවා සිදුව වන්න පුළුවන්. කරුණාකර හෙට උදේම ගුවන් විදුලියට සවන් දී මේ ගැන අවධානය යොමු කොට අවශ්‍ය කටයුතු කරන හැටියට අපේ ජාතික සංස්කෘතිය වෙනුවෙන් ගරු ඇමතිතුමාගෙන් මම ඉල්ලා සිටිනවා.

අනෙක් ප්‍රදේශවල ජනතා නියෝජිතයනුත් ඉල්ලා සිටි දෙයක්, මාත් මේ අවස්ථාවේදී ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්න කැමතියි. මැන කාල පරිච්ඡේදයේදී බටහිර ජාතීන් පරාජයට පත් කළ මේ රටේ අමරණීය ඉතිහාසය තිබෙන්නේ සීතාවකටයි. ඒ අමරණීය ඉතිහාසය පිළිබඳව සොයා බැලීමට, ඊට එකතු කරගන්න පුළුවන් දේවල් එකතු කරගැනීමට, ඒ පිළිබඳව කොතුකාගාරයක් ඇති කිරීමට උත්සාහ දරන්නයයි මේ අවස්ථාවේදි මම ඉල්ලා සිටිනවා. විශේෂයෙන් ගේවාගම් කෝරළයේත්, සියනෑ කෝරළයේත්, තුන් කෝරළයේත් ප්‍රදේශවල ගම්මු විශාල වශයෙන් මේ පිළිබඳ සොයාගැනීම් කරගෙන තිබෙනවා. අපේ රටේ ඉදිරි පරම්පරාවලට මේ සොයාගැනීම් ඉතා වැදගත් වෙනවායයි මම හිතනවා. අපේ ජාතික සංස්කෘතිය සහ ජාතික ස්වාධීනත්වය පාගා දමන්න ආ අවස්ථාවේදී පළමු වරට ඊට විරුද්ධව ශතවර්ෂ භාගයකට වඩා කාලයක් යුද්ධ කොට ජාතික නිදහස රැකගත් ඉතිහාසය අපේ රටේ ජනතාව වෙත නිර්මාණාත්මකව ඉදිරිපත් කරන්න අප කටයුතු කළ යුතුව තිබෙනවා. එම නිසයි, සීතාවක ඒ පිළිබඳ කොතුකාගාරයක් ඇති කරන හැටියට මම ඉල්ලා සිටින්නේ, ඒ වගේම ඒ පිළිබඳ පර්යේෂණ පැවැත්වූ කථිකාචාර්යවරු කිප දෙනෙක් කෘතීන් පළ කර තිබෙනවා. ඒ අයට උදවු දෙනවා නම් තවත් දේවල් හොයාගන්න අපට පුළුවන් කම් ලැබෙනවා. එය අපේ රටට ඉතාමත් වැදගත් වෙනවා.

වර්තමානයේ කෝටිවේ අවට තිබෙන ගුගෝලීය ලක්ෂණයන් පිළිබඳව තොරතුරු සොයා ගත්තත් ශාස්ත්‍රීය පර්යේෂණ මගින් ආධාර ලැබෙනවා. යම්-යම් ඇළවල්, යම්-යම් කළපු, යම්-යම් විල් ඇති වුණේ මොකද, කුමක් සඳහාද කියන සංස්කෘතික පසුබිම පවා මේ වගේ පර්යේෂණ තුළින් සොයා ගත්ත පුළුවන් වෙයි.

ඊළඟට මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ අපේ රටේ දැඟබ, පත්සල් හා වෙනත් සංස්කෘතික දායාදයන් විදේශ විනිමය සොයා ගැනීම සඳහා උපයෝගී කර ගැනීමට දරන උත්සාහය නවත්වන්න කියායි. ඒ වගේම, අපේ රටේ සංස්කෘතික විනාශය ඇති කරන්න උත්සාහ දරන ඒ සංස්කෘතික අහියෝගයට මුහුණ දීම සඳහා මේ අමාත්‍යාංශය අනෙකුත් අමාත්‍යාංශත් සම්බන්ධ කරගෙන ඉක්මනින් වැඩ පිළිවෙළක් ආරම්භ කළ යුතු කාල පරිච්ඡේදය ඇවිත් තිබෙනවායකියන වික කියමින් මම නවතිනවා.

අ. හා. 6.30

විරවන්නි සමරවීර මහතා (නියෝජ්‍ය අධ්‍යාපන ඇමතිතුමා)
(திரு. வீரவன்னி சமரவீர — கல்வித் பிரதி அமைச்சர்)
(Mr. Weerawanni Samaraweera Deputy Minister of Education)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පසුගිය කාල සීමාව තුළදී සංස්කෘතික අමාත්‍යාංශය තුළින් විශාල වැඩ කොටසක් ඉඩ කිරීමට හැකියාව ලබා ගැනීම පිළබඳව පළමු කොටම ගරු ඇමතිතුමාට මා ස්තුතිවන්ත වෙනවා. ඒ අතරතුරම එතුමාගේ අවධානය යොමු විය යුතු කරුණු කිපයක් ඉදිරිපත් කරන්න කැමැතියි.

ගරු මන්ත්‍රීතුමන්ලා කිප දෙනෙකුගෙන්ම අදහස් ප්‍රකාශ වුණා. අද මේ රටේ තරුණ පරම්පරාවට මුහුණ පාන්න සිදු වී තිබෙන කිසියම් ගැටළුවක් පිළිබඳව. විශේෂයෙන් අද මේ රටේ පළ වගෙන යන චිත්‍ර කතා පොත් පිළිබඳව මම තමුන්නාන්සේට සඳහන් කරන්නට ඕනෑ. මහතුවර ගරු දිසා ඇමතිතුමාත් ඒ පිළිබඳව කතා කළා. රාජ්‍ය අමාත්‍යාංශයේ වැය ශීර්ෂය අවස්ථාවේදී මට කතා කරන්නට අවස්ථාවක් නොලැබුණු නිසාත්, මෙය ජාතික සංස්කෘතියට අදාළ කරුණක් නිසාත්, මෙය සංස්කෘතික අමාත්‍යාංශයේ තමුන්නාන්සේගේ විෂය පථයට අඩංගු නොවුවත් මේ අවස්ථාවේදී ඒ පිළිබඳව අදහස් ඉදිරිපත් කිරීම සුදුසුයි කියා මම හිතනවා.

චිත්‍ර කතා පොත් නිසා අද ඉතාමත් භයානක තත්ත්වයකටයි මුහුණ පාන්නට සිදු වී තිබෙන්නේ. මේ රටේ ළමා සාහිත්‍යයක් ගොඩ නැගීමට, ළමා සාහිත්‍ය නිර්මාණය කිරීමට පොත් පත් ආදිය මුද්‍රණය කිරීමේ අපහසුතාවත් තිබෙනවා නම් එයින් ප්‍රයෝජන අරගෙන එය වාසියක් කරගෙන මුදල් සොයා ගැනීම පරමාර්ථය කරගත් පිරියක් අපේ කුඩා දරුවන් වෙළඳ පොළක් කරගෙන තිබෙනවා. පාසල් යන අපේ දූ දරුවන්ගෙන් සියයට අසූවක් අනුවන් පමණ මේ චිත්‍රකතා පොත් කියවන්නට අද බලෙන්ම වගේ පෙළඹී සිටිනවා. ඔවුන්ගේ වයස කියවීමේ රුචිය දනවන තත්ත්වයකයි පවතින්නේ. ළමා කාලයේ කියවීමට ආශාවක් දක්වනවා. කියවීමට සුදුසු දේවල් සොයා ගැනීම අපහසු නිසා චිත්‍ර කතාවලට ඉතාමත් වාසිදායක තත්ත්වයක් ඇතිවී තිබෙනවා. එය මොනම චිත්‍ර කතාවක් වත්, මොනම චිත්‍රයක්වත් මොනම වචනයක්වත් සංයමයක් ඇති වන විධියට, දරුවන්ගේ මනසට ගැලපෙන ආකාරයට, ජීවතයේ ගැඹුරට වුවමනා වන විධියට, ශීලාචාර ගති පැවතුම් දක්වන විධියට ඉදිරිපත් කර නැති බව කණගාටුවෙන් මතක් කරන්නට ඕනෑ. මේවා අද දරුවන්ට නුරු වෙලා

ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේටත්, අපි කාටත් පසුගිය දවස්වල බම්බලපිටියේ සිදු වුණ මංකොල්ලය ගැන පුවත්පත් මගින් දැකින්නට ලැබුණා. අමු මහ දවාලේ කිසිම දවසක ඇති නොවුණ විධියේ මංකොල්ලයක් තරුණයන් කිප දෙනෙක් එකතු වෙලා කර තිබෙන්නේ. තවමත් ඒ මංකොල්ලය ගැන හරිහැටි සොයා ගෙන තිබෙවාය කියා මම හිතන්නේ නැහැ. අපේ තරුණ පරපුර යන ගමන් මාර්ගය ඒකයි. මත් පෙත්තෙන් බෝවුණ සංස්කෘතියකටයි අද ඇදිගෙන යන්නේ තරුණයන් සඳහා පළ වන පත්‍රයක මුල් පිටුවේ කෙළවරක ඔබේ නිදන කාමරයට සුදුසු පින්තූරයක් ඇතුල් පිටුවේ තිබෙනවාය කියා ගහලා තිබෙනවා. පත්තරයේ පිටුව පෙරළුලා බැලුවාම මොනවාද පෙනෙන්නේ. අමු හෙළුවැලි රූපයක්. අද මේ සමහර පුවත්පත් කලාවේදීන් ස්ත්‍රීන්ගේ හෙළුවැල්ල පෙන්වන්නේ නැතිව පත්තර විකුණා ගන්නට බැරි පහත් තත්ත්වයකට වැටී තිබෙනවා. අපේ තරුණයන් මේවා බිත්තිවල අලවාගෙන උදේ හවා බල බලා ඉන්නවා. තුන්සිය හැට පස් දවසෙම බණ කිව්වත් මේ විධියේ විනාශකාරී පරිසරයක් තුළ අපේ සංස්කෘතිය ආරක්ෂා වෙයි කියා අපට හිතන්නට අමාරුයි. අපේ දරු දැරියන් පාසල්වල ජීවත් වන්නේ පැය පහක් පමණයි. එතැනින් පස්සේ සමාජයට එන්නට ඕනෑ. සමාජයේ වැඩිහිටියන් තුළ තිබෙන අඩුවරකාරී තත්ත්වය නිසා අද බාල පරපුර ශීලාචාර හාවයන් ජාතාගම අයාරුවෙන් තත්ත්වයන් පිළිබඳව විශාල ගැටලුවකට මැදි වී සිටිනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඒ වාගේම සංගීතය ගැන කියවුණා. මේ රටේ ඉතාමත්ම ප්‍රබුද්ධ ගායකයෙක් අපේ අමාත්‍යාංශය යටතේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගුරුවරයෙක් හැටියට වැඩ කරනවා. ඒ ජනාධිපති සම්මාන පවා දිනාගත් ටී. එම්. ජයරත්න සංගීතඥයායි. එතුමාගේ පාසලේ, අවුරුද්දක් අරමිභයේදී සංගීතය සඳහා අදුනෙත් ළමයින් තෝරා ගන්න වෙලාවේ ඒ දරුවන් ටික ළඟට අරගෙන ගායනය ඉගෙන ගන්නට කැමති ළමයින් එක පැත්තකටත්, වාදනය ඉගෙන ගන්නට කැමති ළමයින් අනික් පැත්තටත් යන්න කියා එතුමා කිව්වාලු. ගායනය ඉගෙන ගන්නට කැමති ළමයින්ට කතා කර "මම සංගීතය උගන්වන්නට ඉස්සරවෙලා මේ පස්වැනි පන්තියේ දරුවන්ගෙන් කවුරුහරි පුතෙක් තමන් දන්නා සින්දුවක් කියන්න, ඊට පස්සේ මම සින්දු උගන්වන්නම්" කියා එතුමා කිව්වාලු. එක ළමයෙක් අත ඔසවාගෙන දුවගෙන ආවාලු. "සර්, මම සින්දුවක් කියන්නම්" කියා පස්වැනි පන්තියේ ඒ දරුවා කියා තිබෙන සින්දුව මොකක්ද ? "ඇරපන් කරාමේ මේක අපේ පයිප්පේ." මෙන්න අපේ දරුවන්ට අහන්නට ලැබෙන දේවල්. මෙන්න අද තිබෙන කැසට් සංගීතය. මෙන්න, මේ තරුණයෝ කියන තවත් සින්දුවකින්: "මද සුලඟේ ඔහෙ සැලෙනා තනි වුණ කුසුමෙකි මා" මේ ජාතික අර්බුදකාරී අවස්ථාවේ, ජාතිය වෙනුවෙන් අනාගත පරපුරට අඩගහන වෙලාවේ මද සුලඟේ ඔහෙ සැලි සැලී ඉන්න තරුණයෝයි, අද අපට දකින්නට ලැබෙන්නේ. තරුණ පරපුරට අපි අභියෝග එල්ල කරන්නෙ ඇයි ? වැඩිහිටියන් තුළින් කෙරෙන වැරදි කටයුතු නිසා ඔවුන් වැරදි මාර්ගයෙයි ගමන් කරන්නෙ. ගනි පැවතුම්, ඇදුම් පැලඳුම්, කතාබස්, සංගීතය හැම දෙයක් ගැනම අපි ප්‍රශ්නාර්ථය ලකුණු කරන්න ඕනෑ, අපෙන් පසුව එන අනාගත පරපුරට වැඩිහිටියන් වශයෙන් ගත කරන ජීවිතවලින් අර්ථයක් වෙයිද කියා. වැඩි කතාවක් ඕනෑ නැහැ. දවල්ට කෑම කන්න ගියාම, දවල් 12 ට පමණ මේ පාර්ලිමේන්තුව එහා පැත්තේ හෝජනාගාරයේ ඉඳගෙන, අපේ තරුණ පෙළ යන ගමන් මාර්ගය දෙස—මේ දියවන්නා ඔයේ වැව් කණ්ඩිය දෙස—බලාගෙන සිටියොත් සංස්කෘතියට මොතවාද වෙන්නෙ කියා හොඳට බලාගන්න පුළුවන්. ඒ තරම් තත්ත්වයක් තිබෙත්තෙ.

රූපවාහිනියෙන් හොඳ දේවල් පෙන්වනවාය කියා සමහර කට්ටිය උදම් අනවා. ඇත්ත. මිනී මරණ හැටි, මංකොල්ල කන හැටි, සිපවැළඳ ගන්නා හැටි, අද රූපවාහිනිය මුළුමනින්ම වාගේ අරක්ගෙන තිබෙනවා. "240 රොබට්" හොඳයි කියනවා. "Hawaii Five—0" කියල තවත් එකක් තිබෙනවා.සම්පූර්ණයෙන්ම මිනී මරන දේවල්. හොරකම් කරන දේවල්. දරුවන්ගේ සිතුම් පැතුම් ගොරෝසු පැත්තට නැඹුරු කරන දේවල්. රූපවාහිනියෙන් පෙන්වන්න දේවල් නැත්තම්, පෙන්වන්න තිබෙන්නෙ පැයකට දෙකකට සීමාවෙන්න දේවල් පමණක් නම්, දරුවන්ගේ තාමයෙන් එය වහල දමන එක හොඳයි. ගරු සභාපතිතුමනි, ඒයේ පුරා පෝය දවසේ ගිහියෙක් විසින් විනාඩි 15ක බෞද්ධ කථාවක් කරගෙන ගියා. එය කලේ සංකර භාෂාවෙන්. බෞද්ධ දර්ශනය පිළිබඳව, බුදුපියාණන් වහන්සේ දේශනා කළ ධර්මය පිළිබඳව සංකර භාෂාවෙන් කතා කළා. එහි වචන එකක් දෙකක් මම කියන්නම්. 'ප්ලැනක්'. මේ බෞද්ධ කථාවේදී කිව්ව වචනයක්. 'ශෝභනය' තවත් වචනයක්. පුරා පෝය දවසේ බෞද්ධයින්ට අහගෙන ඉන්න රටේ හොඳ බෞද්ධ ගිහියෙකු විසින් රූපවාහිනියෙන් කළ කතාවක් තමයි ඒ. ඇයි, මහා සංඝයා වහන්සේලා මේ රටේ ඒ තරම්ම හිඟද ? මායයකට වරක් එන පෝය දවසේදී විනාඩි 15ක් තුළ කතා කරන්නට, බෞද්ධයන් සඳහා තෝරා බේරාගත් වචන ටිකක් නුරු කරගන්න බැරි ගිහියෙක් යොදනවා. කුණුහරුප භාෂාවෙන් ආගම ගැන කතා කරන්න කෙනෙක් යොදවන්න තරම් රූපවාහිනිය සොච්චමට ගිහිත්ද කියා සංස්කෘතික අමාත්‍යාංශය යටතේ කතා කරද්දී මම අහන්න ඕනෑ. ලෝකයේ රටවල් අපට සමව්වල් කරන එක අහන්න දෙයක් නොවෙයි. පාලි භාෂාව දන්නේ නැත කියා බෞද්ධ භික්ෂූන් වහන්සේලාට ඇඟිල්ල දික් කර අභියෝග කරන්නට තරම් අපේ රටේ ඇතැම් උගතුන් අද තිර්හීත වී තිබෙනවා. අවුරුදු 2500ක් තිස්සේ මේ රටේ ශාසන ඉතිහාසය ආරක්ෂා වුණේ කවුරු නිසාද ? ගිහියන් නිසාද ? නැත්තම් අමාරුවෙන් හරි ගල්ගුහාවල හැංගී සිටි අපේ සංඝරත්නය නිසාද කියා අපි අහන්න බලන්න ටවිනවා.

දහම් පාසැල් ගැන මේ සභාවේදී සඳහන් වුණා. දහම් පාසැල්වලට පොත්පත් ලබා දීම, දහම් පාසල්වලට අධ්‍යාපන ලබා දීම සම්බන්ධයෙන් ගත් පියවර ගරු ඇමතිතුමා ගත් ඉනාමත් කාලෝචිත පියවරක් වශයෙන් සලකන්න පුළුවන්. දහම් පාසල් තුළින් දරුවාගේ චරිත වර්ධනයක් අපි බලාපොරොත්තු වෙනවා. නමුත් ගරු ඇමතිතුමනි, දහම් පාසැල් උත්සව රාශියකට මම සහභාගී වී තිබෙනවා. දහම් පාසල්වල පරමාර්ථය සම්පූර්ණයෙන් අමතක කර ඇති බවයි පෙනෙන්නේ. දහම් පාසල් උත්සව වලත් මවාගන්න ආටෝපයක් තිබෙන බවයි පෙනෙන්නෙ. ඒ මඟිනුත් අද තරඟකාරී තත්ත්වයක් දරුවන් තුළ ඇති කර තිබෙනවා. උත්සවවලට ගියාම මොනවාද පේන්න තිබෙන්නෙ? දහම් පාසැල් දරුවන් කිවාස හතරකට කොටස් කර තිබෙනවා. ඒ කොටස් අතරේ තරඟ තිබෙනවා. මුදිතා කිවාසය, උපේක්ෂා කිවාසය, කරුණා කිවාසය, මෛත්‍රී කිවාසය කියා දරුවන් කිවාස හතරකට බෙදා, කුඩු තරඟ, ජාතක කථා තරඟ, නාට්‍ය තරඟ ආදිය පවත්වනවා. ඔය තරඟවලදී කොලු පැටව් ටික ගහගෙන හාමුදුරුවන් ළඟට දුවගෙන එනවා. දිනපු එක් කෙනාට සද්ධර්මාලංකාරයක් නැගි වශයෙන් දෙනවා. එහෙම තමි කෝ අපේ පරමාර්ථය? ජීවිතයේ ගැඹුරට එබී බැලීමක් කෝ? වයස අවුරුදු 14, 15, 16, 18 සම්පූර්ණ වුණ අපේ දියණියන්, පාසල් ශිෂ්‍යාවන් අද ධර්මශාලාවල නාට්‍ය නටනවා. අපි මීට වඩා ගැඹුරට බහින්න ඕනෑ. වියදම් කරන මුදලේ වටිනාකම නොවෙයි අපි බලන්න ඕනෑ, ජීවිතයේ යථාර්ථය පිළිබඳ අවබෝධයක් කොයි තරම් දුරට ලැබෙනවාද කියා ගැඹුරට කල්පනා කර බලන්න ඕනෑ. ඒ එක් කාරණයක්.

ඊළඟට අපේ පැරණි, පොරාණික පෙරහැරවල් තිබෙනවා. අවුරුදු පතා අපි ආරක්ෂා කරගෙන එන පෙරහැරවල. හේවිසි කණ්ඩායම්වල අපේ ගැහැණු දරුවො නටනවා. අපේ ගැහැණු දරුවො, ඒ පෙරහැරවල රාත්‍රී කාලයෙ බැන්ඩ් ගහමින්, හේවිසි ගහමින් යනවා. මේ පෙරහැරවලින් අපේ පෞරාණික සිරිත්විරිත්, ගතිගුණ ඇත් වී යනවා. දැන් තිබෙන්නෙ බජව් සංගීතය. ඊයෙ රාත්‍රියෙත්, රූපවාහිනියෙන් මම පෙරහැරක් දැක්කා. බලා ගෙන යන විට මට සම්පූර්ණයෙන්ම වාගේ දකින්න ලැබුණේ බජව් සංගීතයක්. අපේ හේවිසි කණ්ඩායම්වල ඒ පැරණි ශාස්ත්‍රීය වාදන නොවෙයි, වාදනය කළේ. එම නිසා මේවා ගැනත් ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

අපේ දරුවන් සඳහා දැනට පිටවන ළමා චිත්‍ර පොත්, ඒවාගේම පත්‍ර මඟින් කෙරෙන හෙළුවැලි රූප ප්‍රදර්ශනය පාලනය කිරීමට ගරු රාජ්‍ය ඇමතිතුමාගේ අමාත්‍යාංශයත් මෙම අමාත්‍යාංශයත් එකතු වී කිසියම් උපදේශක සභාවක් පත් කිරීමට අවධානය යොමු කලොත් තරකද කියා ප්‍රශ්න කරන්න කැමතියි. හෙළුවැලි රූප ප්‍රදර්ශනය කිරීම මේ තරම්ම වැදගත් යයි ඒ අය සිතනවා නම්, ගැහැණුන්ගේ හෙළුවැලි රූප සහිපහා පත්‍රවල පළ කර ඒවා විකුණා ගන්නට උත්සාහ දරන උදවියට මම එක යෝජනාවක් කරන්න කැමතියි. මෙවැනි චිත්‍ර පළ කරන පත්‍රයක කර්තෘතුමා, එතුමාගේ බිරිය, දරුවන් ඇතුළු සියළු දෙනාම අමු තිරුවතින් පෙනී සිටින වර්ණ ඡායාරූපයක් මුද්‍රණය කර 1984 ට කැලැන්ඩරයක් හැටියට සකස් කර බෙදා හරින ලෙස මම යෝජනා කරන්න කැමතියි. එහෙම කර මේ කුණුහරුප පින්තූර දරුවන් අතර බෙදා හරින්නට පටන් ගත්තොත් අපිට ඒකෙ සාධාරණයක් පෙනෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ මානසික විනාශයේ තේරුම මොකක්ද? අපේ දරුවන් මේ විධියට සමව්වලයකට පත් කරන්නේ, මුදලට විකුණා ගන්නට කල්පනා කරන්නේ මන්ද? මේ ක්‍රියාවලින් අපේ දරුවන් කොයිතරම් අනාථ වෙනවාද? ප්‍රශ්නයකදී, ගැටළුවකදී එය විසඳා ගන්නට බැරි මානසික මට්ටමක් ඇතුව, දරුවන් කොයි තරම් සංඛ්‍යාවක් සිය දිවි නසා ගන්නවාද, ජීවිතයෙන් පලා යනවාද? මේ තරම් සැලෙන පසුබිමක් ඔස්සේ උසස් ජාතියක් හැටියට ජාතිය ගොඩනගා ගන්නේ කොහොමද? එම නිසා, වාතිජ මට්ටමෙන් ඇත් වූ බෞද්ධ පරිසරයක් ඇති කර ගන්නට අපේ ගරු ඇමතිතුමාට ශක්තිය ලැබෙවායි ප්‍රාර්ථනා කරනවා.

අවසාන වශයෙන් අපේ තරුණ බෞද්ධ මහා සම්මේලනය ගැනත් වචනයක් කියන්න කැමතියි. තරුණ බෞද්ධ සම්මේලනයක් තිබෙනවාය කියා ලොකු ප්‍රචාරයක් තිබෙනවා. නමුත් ඒකෙ තිලතල දරන්නේ අවුරුදු හැට -හැත්තෑව පිරුණු 'තරුණයෝ'. නමින් තරුණ බෞද්ධ සම්මේලනය. මේ සම්මේලනයෙ තනතුරු අපේ තරුණයන්ට දෙන්නට ලෝභ වෙන්නේ ඇයි? තිලතලවලින් වැඳඹෙන්නට ඇයි මේ තරම් කැදරකම? තරුණ බෞද්ධ සම්මේලනය නම්, තරුණ බෞද්ධ සමිතිය නම්, ඒකෙ තිලතල දෙන්නට ඕනෑ තරුණයන්ට. නමුත් මැරෙකකල්ම ඉන්න හදනවා. වයස අවුරුදු පනහ පැනපු අවුරුදු හැටේ හැත්තෑවේ අයයි, ඒ තිලතල දරන්නේ. නොයෙකුත් ලාභ ප්‍රයෝජන ලබා ගන්නට, ජාත්‍යන්තර වශයෙන් කිසියම් ධානාන්තර ලබා ගන්නට, පිටරට සවාරි ගහන්නට එම තිලතල දරා සිටිනවා මිස, අදුනෙන් ඇතිවන පරම්පරාවට එහි වගකීම භාර දෙන්නට බොහොම අකමැතියි. එම නිසා ඒ ගැනත් අවධානය යොමු කරමින් දැනට ගෙන යන වැඩ—ව්‍යාපාර තවදුරටත් සාර්ථක අන්දමින් ගෙන යාමට මේ ඇමතිතුමාටත්, නියෝජ්‍ය ඇමතිතුමාටත් ශක්තිය ලැබෙවායි ප්‍රාර්ථනා කරමින් මම නියෝජ්‍ය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආ. හා. 6.45

අමරසිරි දෙඩන්ගොඩ මහතා (බද්දේගම)
(திரு. அமரசிறி தொடங்கொட — பத்தேகம)
(Mr. Amarasiri Dodangoda Baddegama)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට අවස්ථාව ලබාදීම ගැන මම පළමුවෙන්ම තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙනවා. ගරු මූදල් ඇමතිතුමා අයවැය ලේඛනය පිළිබඳ මූලික ඉදිරිපත් කිරීම් වලදී, ආර්ථික සංවර්ධනයත් සමග සමාජ සංවර්ධනය පිළිබඳව අදහසක් ඉදිරිපත් කර තිබෙනවා. එම නිසා මුළු මහත් ආර්ථික ක්ෂේත්‍රයටත්, සෑම අමාත්‍යාංශයකම ක්‍රියා මාර්ගවලටත් අදලව එබඳු වැඩ පිළිවෙළක් යකස් කිරීමේ වගකීම මේ අමාත්‍යාංශයට පැවරී අති බව කියන්න ඕනෑ. ඒ අනුව හැම ගරු ඇමතිවරයකුගෙන්ම, මන්ත්‍රීවරයකුගෙන්ම ප්‍රකාශිත දේවල් කිරීක්ෂණය කොට මේ රටේ සංස්කෘතිය රැක ගැනීම සඳහා විවිධ ක්ෂේත්‍රයන්හි ක්‍රියාත්මක වන වැඩ පිළිවෙළ හැසිරවීම සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ වගකීම් භාරය පැවරී තිබෙන්නේ මේ ඇමතිතුමාටත්, නියෝජ්‍ය ඇමතිතුමාටත් බව කියන්න කැමතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, 1956 දී මෙම සංස්කෘතික අමාත්‍යාංශය පිහිටුවීමේ ලා පදනම් වුණු අදහස පිළිබඳව ඇමතිතුමාගේ අවධානය යොමු කරවන්න ඕනෑ. විශේෂයෙන්ම 1956 ආණ්ඩුවට පිහිටුවීමෙන් පසුව, සංස්කෘතික අමාත්‍යාංශයක් පිහිටුවීමේ අදහස ඉස්මතු වුණෙත්, ඒ අදහස ක්‍රියාත්මක වුණෙත්, කාලාන්තරයක් තිස්සේ අපේ රටේ තිබුණු විජාතික ආණ්ඩු ඒ අයගේ පාලන කාලය තුළ අපේ රටේ සංස්කෘතියට තිබුණු තැන එහෙම තැතිතම් අපේ සංස්කෘතික උරුමයත්, සංස්කෘතික දයාදයත් රැක ගන්න අපේ රටේ සංස්කෘතික වැඩ පිළිවෙළ යටපත් කර තිබුණු නිසයි.

එසේ ඒ අමාත්‍යාංශය පිහිටුවා බුද්ධ ජයන්ති උත්සවයත් පවත්වා සිංහල භාෂාව පිළිබඳ යෝජනාවත් ගෙනැවිත් ත්‍රිපිටකය රචනය පිළිබඳ අහසක් ගෙනැවිත් බෞද්ධ ආයතන දෙකක් විශ්ව විද්‍යාල බවටත් පත් කළා. වසර සිය ගණනක් තිස්සේ මේ රටේ ජනතාවට අහිමිව තිබුණු ජාතික උරුමයන් නැවත ලබා දීම සඳහායි එද, ඒ අමාත්‍යාංශය පිහිටෙව්වේ. වර්තමාන අමාත්‍යාංශයත් ඒ අදහස් ගැන තේරුමක් ඇතිව කටයුතු කරගෙන යෑම ගැන අපි සතුටුයි. සංස්කෘතික අමාත්‍යාංශය පිහිටුවීමේ පරමාර්ථය ගැන මා සඳහන් කළේ අද මේ සාකච්ඡාවේදී කථා කළ ගරු මන්ත්‍රීවරු සහ ගරු ඇමතිවරු වර්තමාන ක්‍රියා මාර්ග වලින් සහ අනෙකුත් අමාත්‍යාංශ වලින් සහ අනෙකුත් ප්‍රතිපත්ති වලින් සංස්කෘතික අමාත්‍යාංශයේ වැඩ පිළිවලට සෑහෙන හානියක් සිදු වී තිබෙනවාය කියා ප්‍රකාශ කළ නිසයි. රූපවාහිනිය හෝ ගුවන් විදුලිය හෝ ග්‍රන්ථ කරණය හෝ මුද්‍රණය හෝ වෙනත් යම් යම් නවීන වැඩ පිළිවෙළවල් හේතුකොට ගෙන සංස්කෘතික අමාත්‍යාංශය විසින් වෙර වැයම් දරා ගනු ලබන ප්‍රයත්නයන් සහ වැඩ පිළිවෙළවල් සහ ප්‍රතිපත්ති අඩපණ වෙනවාය කියන එකයි ගරු මන්ත්‍රීවරුන්ගේ සහ ඇමතිවරුන්ගේ කථාවලින් පෙනුණේ.

ඒකට මූලික හේතුව වශයෙන් පෙනෙන්නේ කුමක්ද ? ජනතාවකගේ ආර්ථික සහ භෞතික සම්පත් වර්ධනය වාගේම සංස්කෘතික සහ අධ්‍යාත්මික ගුණ වගාවත් අමාත්‍යාංශයක් විසින් පනවනු ලබන රෙගුලාසි වලින් හැසිරවීමේ අමාරු කමක් තිබෙනවා. ඒ සම්බන්ධව දැඩි ක්‍රියා මාර්ගයක් ගැනීම වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන ප්‍රජාතන්ත්‍රවාදී ස්වරූපය නිසා අපහසු වෙන්නට පුළුවනි. ළමයින් විඩියෝ කැසට් නරඹන විට ළමයින් විඩියෝ ගේම්ස්වල යෙදෙන විට ඒවා වැලැක්වීමට දැඩි නීති රීති පැනවිය යුතුව තිබෙනවා.

අධ්‍යාපන නියෝජ්‍ය ඇමතිතුමා ප්‍රකාශ කළ විධියට විවිධ ප්‍රකාශන ප්‍රවෘත්ති පත්‍ර, චිත්‍ර කථා ඔය ආදී දේවල් තහනම් කිරීම හැරෙන්නට ඒවාට වෙන පිළියමක් යොදන්නට පුළුවන් කමක් නැහැ. සිරිතක් වශයෙන් ඒවා බැලීම තනර කරන්නට ජනතාව පෙළඹෙන්නේ නැත්නම් නීතියෙන්වත් එය තනර කරන්නට පියවර ගන්නට වෙනවා. නමුත් අද තිබෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූල ධර්ම අනුව ඒකට අපහසු කමක් තිබෙනවා. අපේ ජාතික සංස්කෘතික උරුමයන් රැක ගැනීම සඳහා නීති මගින් හෝ කටයුතු කිරීම ගැන අවධානය යොමු කරවන මෙත් මා ගරු ඇමතිතුමාගෙනුත් නියෝජ්‍ය ඇමතිතුමාගෙනුත් ඉල්ලීමක් කරනවා. ඇත්ත වශයෙන්ම මේ තත්ත්වය ගැන මා අදහස් දක්වන්නේ මේ රටේ තිබුණු විදේශීය ආණ්ඩු විසින් උදුරා ගනු ලැබූ අපේ ජාතික උරුමයන් පසුගිය අවුරුදු පහළොවක් තිස්සේ යළිත් ගොඩ නඟන්නට නවමත් බැරි වී තිබෙන නිසයි. ඉතිහාසය හදාරා පුරා විද්‍යාත්මක සොයා ගැනීම් වලින් සහ පුරාණ කෘතීන් වලින් කරුණු හදාරා අපේ ඒ පැරණි සංස්කෘතිය ඉස්මතු කර ජාතික සංස්කෘතික උරුමයන් සහ දයාදයන් නැවත ගොඩ නැංවීමෙහිලා යම් යම් පියවරවල් ගන්න කොට වර්තමාන ක්‍රියා මාර්ගවලින් රජයේ ප්‍රතිපත්තිවලින් ඒකට හානියක් සිදු වෙනවා නම් ඒ පිළිබඳව සියලුම අමාත්‍යාංශ සමග සාකච්ඡාවක් කරන්නට පුළුවනි සංස්කෘතික ඇමතිතුමාට. රූපවාහිනිය සහ ගුවන් විදුලිය රාජ්‍ය අමාත්‍යාංශයට අයත් වෙන්නට පුළුවනි. විඩියෝ කැසට් ආනයනය විවෘත වෙළඳ ප්‍රතිපත්තිය නිසා වෙනවා වෙන්නට පුළුවනි. නමුත් ඒ සියලුම අමාත්‍යාංශ සමග සාකච්ඡා කිරීමෙන් සංස්කෘතික උරුමයන් සුරැකෙන පරිදි පියවර ගන්නට ඇමතිතුමාගේ අවධානය යොමු විය යුතුයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා දන්නා විධියට ඒ ඒ අමාත්‍යාංශවලට අවශ්‍ය නීති සම්පාදනය කරන්නට කලින් ඒක රටේ නීතියට අනුකූලද කියා නීතිපතිතුමාගෙන් විමසීමක් කරනවා. ඒ පනත් නීතිගත කිරීමට කලින්, ව්‍යවස්ථාදායකයට ඉදිරිපත් කිරීමට කලින් ඒකෙ නීත්‍යානුකූල බව විමසනවා. නමුත් එය සංස්කෘතියට අනුකූලද කියා කිසිම වෙලාවක විමසන්නේ නැහැ. එමනිසා කැබිනට් මණ්ඩල රැස්වීම් වලදී සියලුම අමාත්‍යාංශවල වැඩ පිළිවෙළවල් සාකච්ඡා කිරීමේදී රූපවාහිණිය ගනු ලබන ක්‍රියා මාර්ගය හා එහි ප්‍රතිපත්තිය, පුවත්පත් සම්බන්ධ ක්‍රියා මාර්ගය හා එහි ප්‍රතිපත්තිය, ග්‍රන්ථකරණය සහ එහි ප්‍රතිපත්තිය ආදී දේ කොයි තරම් දුරට රටේ සංස්කෘතියට අනුකූලද කියා සොයා බැලීමට සමස්ත සාකච්ඡාවක් ඒ සියලු අමාත්‍යාංශවල නියෝජනය ඇතිව සිද්ධ විය යුතුය කියන එකයි මගේ විශ්වාසය.

ඒ වාගේම ගරු ඇමතිතුමාගේත් නියෝජ්‍ය ඇමතිතුමාගේත් අවධානය යොමු කරන්න කැමතියි—මීට කලිනුත් මම මේ කාරණය ඉදිරිපත් කළා—ජාතික සංස්කෘතික වැදගත්කම පිළිබඳව. ඒ කියන්නේ 13 වෙනි සියවසේ—පසු කාලයක අප අවනත කරගත් ඉංග්‍රීසි ජාතියේ—1 වෙනි ජෝන් රජ්ජුරුවෝ එදා පාර්ලිමේන්තුවට දුන් අයිතිවාසිකම් ප්‍රකාශනයට, "මැග්නා කාර්ටා" එකට, අත්සන් තබන්න අකුරු දන්නෙ නැතිව මුද්‍රාව තැබූ වෙලාවේ ක්‍රි. ව. 1215 කාලයේ ලංකාවේ රජු හැටියට සිටි දෙවෙනි පරාක්‍රමබාහු රජ්ජුරුවෝ "කව් සිඵමිණ" කියා ලිව්ව පොත අදත් අපට තේරුම් ගන්න බැරිව තිබෙනවා.

ඒ වාගේ ශ්‍රේෂ්ඨ සංස්කෘතියක් ඉතිහාසයක් තිබුණ, උගත් ඉතාමත් දියුණු ශාස්ත්‍රීය මට්ටමේ දැනුමක් ඇති පාලකයො හිටපු රටක් පසු කාලයක අර ජාතීන් විසින් යටත් කර ගනු ලැබුවා. අපේ ශ්‍රේෂ්ඨ සංස්කෘතිය ගොඩනැඟීමෙහිලා පුරා විද්‍යා කැණීම් කර ඒවාගේම සංස්කෘතික වැදගත්කම පෙන්වන කලා ශිල්ප හා සාහිත්‍යය පිළිබඳ සොයාගැනීම් කර ඒ වාගේම අපේ ඉතිහාසය පිළිබඳ හැදෑරීම් කර ඒවා තවදුරටත් සාකච්ඡාවට ලක් කළ යුතුය කියා මම විශේෂයෙන් මතක් කරන්න කැමතියි.

මම හිතනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමාත් සෑහෙන අදහස් කීපයක් දැක්වුවා. ඉතාමත් වැදගත් සංස්කෘතික පරපුරකට කෑකෝ දක්වන ඒ නියෝජ්‍ය සභාපතිතුමා දැක්වූ අදහසවලට විශේෂයෙන් අනුකූලව මම මීට කලිනුත් ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කළ කරුණක් ගැන මතක් කරන්න කැමතියි. එනම් රාජ්‍ය ලේඛනාගාරය පිළිබඳවයි. ඇත්ත වශයෙන්ම තවමත් රාජ්‍ය ලේඛනාගාරයේ අපේ වටිනා රාජ්‍ය ලියවිලි සුරක්ෂිතව තැබීම ගැන ගනු ලබන ක්‍රියා මාර්ග ගැන අපට සැහීමට පත් වෙන්න බැහැ. ඒ මොකද අපේ රාජ්‍ය ලේඛනාගාරයේ තමයි පැරණි ලියවිලි සියල්ලම රැස් කර තිබෙන්නේ. ඒ ලියවිලි සියල්ලම එසේ එක තැනක රැස් කර තබා හදිසියේ යම් පහරදීම් අවස්ථාවක් ඇති වුණොත් හෝ කලබල අවස්ථාවක් ඇති වුණොත් හෝ එහෙම නැත්නම් වෙනත් කලබලයක් හේතුකොටගෙන හෝ යම් විධියක හානියකට පත් වුණොත් අපේ ලියවිලි සියල්ල අපට නැහැ. එතිසා මේවා පිටපත් කරන්න ඕනෑ. නවීන ක්‍රමානුකූලව පිටපත් කිරීමේ කාර්‍යය සඳහා පසුගිය අවස්ථාවක පරිපූරක ඇස්තමේන්තුවකුත් සම්මත කළා. එම නිසා පුළුවන් තරම් ඉක්මණින් ඒ රාජ්‍ය ලේඛනාගාරයේ තිබෙන ලියවිලි පිටපත් කර තවත් ස්ථානයක ඒවා ආරක්ෂාව සඳහා තැන්පත් කරන්නය කියා මම ඉල්ලනවා.

ඊළඟට මම තමුන්නාන්සේගේ අවධානය යොමු කරන්න කැමතියි ත්‍යාග ප්‍රදාන ගැන. ත්‍යාග ප්‍රදානය කිරීමේදී ඉහළ මට්ටමේ කලාකරුවන් පමණක් කොළඹ ප්‍රධාන තැනකට කැඳවා ත්‍යාග ප්‍රදාන නොකර, දිසා මට්ටමේ, ප්‍රාදේශීය මට්ටමේ, ගම් මට්ටමේ සාහිත්‍ය, කලා ශිල්ප, නාට්‍ය තරග තබා ඒ කුශලතාවන් තිබෙන දක්ෂතාවන් තිබෙන පිරිසට ත්‍යාග පිරිනැමීමේ ක්‍රමයක් ඇති කරන්නය කියා මා ඉල්ලනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අවධාන වශයෙන් දකුණු පළාතේ ආයතනයක් තියෝජනය කරන මන්ත්‍රීවරයෙක් හැටියට තව එක කරුණක් කෙරෙහි තමුන්නාන්සේගේ අවධානය යොමු කරනවා. මෙය මට තීතර පෙනෙන දෙයක්. මේ කාරණය අදාළ වන්නේ රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති සංචාරක ව්‍යාපාරයට වෙන්න පුළුවන්. නමුත් මේ වර්ෂයේ ටිකක් සංචාරකයන් එළඹීම පිළිබඳ තත්ත්වයේ වෙනසක් වූ නිසා මම පෙන්වා දෙන කාරණය දැනට සිදු වෙනවා අඩුයි. නමුත් සංචාරක ව්‍යාපාරය නැවතත් වැඩි දියුණු වන විට මේ තර්ජනය වැඩි වෙන්න පුළුවන්. අද ශීඝ්‍ර විධියට මේ රටේ සංස්කෘතික උරුමයන් පිළිබඳව සඳහන් වන යම් යම් දෙවල් මෙහි පැමිණෙන සංචාරකයන් විසින් බැහැර ගෙන යනවා. ඒ පිළිබඳව දැඩි තීති පනවා තිබෙනවා. නමුත් මම දන්නා හැටියට, පුස්කොළ පොත්, පැරණි ඇඳුම්-ආයිත්තම්, විවිධ අවස්ථාවලදී භාවිතා කරන ලද පැරණි සංස්කෘතික අගයක් තිබෙන දේවල්, රජවරුන්ගේ ඇඳුම්, උඩරට තිබෙන ඉතාම පැරණි ආයිත්තම් හා ආභරණ වැනි දේවල් විශාල ප්‍රමාණයක් අද කොළඹ නගරයේන් සංචාරක ව්‍යාපාරය ව්‍යාප්ත නගරවලත් කඩ සාප්පුවල තිබෙනවා. ඒවා තිබෙන්නේ සංචාරකයන්ට ගෙන යෑම සඳහායි. "පන්සිය පනස් ජාතක" පුස්කොළ පොත පවා විදේශවලට ගෙන යනු ලබනවා. වී. ඕ. සී. වැනි දේවලට අමතරව—ඒවා ලන්දේසි යුගයේ දේවල්— ඊට වඩා පැරණි, මේ රටේ ජාතික උරුමය රැකෙන විශාල වස්තූන් රැසක් දැනටමත් මේ රටින් ගිහින් හමාරයි. තවදුරටත් ඒවා එසේ යෑම වැළැක්වීම සඳහා ඒවා රජය විසින් මිලට ගෙන, කොතුගාරයට ලබාගෙන, ඒ ඒ ප්‍රදේශවල උප දිසාපතිවරුන් මාර්ගයෙන් ඒ වස්තූන් ගැන පරීක්ෂණයක් කරලා, ඒවායේ තත්ත්වයන් පිළිබඳව සොයා බලා, මේ ජාතික සංස්කෘතික දායාද විදේශගත වීම වැළැක්වීම සඳහා කටයුතු කරන ලෙස ඉල්ලා සිටීමින්, තමුන්නාන්සේ ලාගේ ඉදිරි වැඩ කටයුතු සාර්ථක වේවායි ප්‍රාර්ථනා කරමින් මම නවතිනවා.

වී. ජ. මු. ලොකුබණ්ඩාර මහතා (ඇමතිතුමා)
(திரு. டபிள்யு. ஜே. எம். லொக்குபண்டார — அமைச்சர்)
(Mr. W. J. M. Lokubandara–Minister)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සංස්කෘතික අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සම්බන්ධයෙන් විපක්ෂයේන් ආණ්ඩු පක්ෂයේත් මන්ත්‍රීවරුන් සභාවේ කළ කතා අහන විට අපේ හිතට නැගෙන්නේ සංස්කෘතික අමාත්‍යාංශයට ප්‍රතිපත්ති මාලාවක ඇති අවශ්‍යතාවන් ගැන කරුණු ප්‍රකාශ වුණු බවයි. ගරු ඇමතිතුමාත් තියෝජ්‍ය ඇමතිතුමාත් මේ පිළිබඳව යාකච්ජා කර අපේ පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවේදී ගත් තීරණයක් ගැන මම මේ අවස්ථාවේදී කරුණු කියන්නට ඕනෑ. දැන් පත් වී ඉන්නේත් හොඳම හොඳ ලේකම් කෙනෙක්. ඉස්සර හොඳ දාතපතියෙක්, පින්වත්තයෙක් සිටියා. අද කිසිම සැකයක් නැතිව, සුදුසුම වෙලාවට අවශ්‍යම ලේකම්වරයෙක් පත් වී ඉන්නවා. එතුමා හිටපු මහාධිකරණ විනිශ්චයකාරවරයෙක්. ඒ නිසා එතුමා යම් ප්‍රශ්නයක් දෙස නීත්‍යානුකූලව බලන ගතියක් තිබෙනවා. ඒ නිසාම එතුමා සංස්කෘතික ප්‍රඥප්තියක අවශ්‍යතාව පිළිබඳ ප්‍රශ්නය මතු කළා. අද මේ සභා ගැබ තුළින් රැව් දුන්නේත් ඒ සංස්කෘතික ප්‍රඥප්තිය පිළිබඳ අවශ්‍යතාවයි.

නැම එක්කෙනාගේම පවි සොදාගෙන සංස්කෘතිය පිටින් යනවාදෝයි මට වෙලාවකට දුක හිතෙනවා. එහෙත්, රජරට, විශේෂයෙන්ම මහා බෝධිය ආරක්ෂා කළ පරපුරට අයත් අපේ සංස්කෘතික ඇමතිතුමාට එය කිසිසේත් බරක් වන්නේ නැහැ. එතුමා ඒ සියල්ලටම උර දෙන්නට, කර දෙන්නට සැදී-පැහැදීමට පුළුවන් තරම් පුළුල් උරයක් හා සවියක් ඇති කෙනෙක්.

මම බොහෝම සන්තෝෂ වෙනවා පසුගිය කාලය තුළ එතුමාගෙන් වී තිබෙන කටයුතු ගැන. දිවක් තිබෙනවා නම්, ඇත්ත පවසනවා නම් කිසිම කෙනෙකුට ඒවා නොකියා ඉන්නට බැහැ. මේ රටේ කොයි පළාතට ගොස් බැලුවත්, කවුරුත් නොසලකා හැර තිබුණු මේ අත්දමේ අමාත්‍යාංශයකට මෙතුමා මේ විධියට පණ දුන්නා නේද යන කාරණය උඩ මෙතුමා කෙරෙහි ඕනෑම කෙනෙකු තුළ ගෞරවයක් ඇති වෙනවා. රාජකාරියක් වශයෙන් නොව අපේ සංස්කෘතිය පිළිබඳ හැඟීමක් ඇතිව කටයුතු කරන්නට ඕනෑය යන අදහසින් මෙතුමා කටයුතු කරන ආකාරය ගැන බැලුවාමත් අපට ඇති වන්නේ ඉමහත් සන්තෝෂයක්.

සංස්කෘතික අමාත්‍යාංශය පිහිටුවීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ගෞරවයක් ගන්නවා නම් අද කලවාතේ ගරු මන්ත්‍රීතුමාගේ කතාවෙන් මගේ හිතේ ලොකු විමතියක් ඇති වුණා. මේක මේ කාටවත් ඇමතිකමක් දෙන්න කළ මොකක්ද එකක්යයි එතුමා කීවා. කොහොම පහළ වුණත්, මේ සංස්කෘතික අමාත්‍යාංශයට සැබවින්ම අත දුන්නේ හුරුල්ලේ මැතිතුමාගේ යුගයේදීයයි කිසිවෙක් කියනවා නම් කාටවත් එය නැතැයි කියන්නට බැහැ.

අති ගරු ජනාධිපති උතුමාණන් විශේෂයෙන් දැහැමි සමාජයක් ඇති කිරීමේ පිළිණ දී මේ රට පාලනය කරන්නට පටන්ගත් පසු මේ යුගයේදී ගන්නා ලද නොයෙකුත් ක්‍රියා කලාප ගැන කල්පනා කරන විට මේ කාරණය අපට පැහැදිලි වෙනවා. සංස්කෘතික අමාත්‍යාංශයේ ප්‍රකාශන අංශය ගැන බලන්න. ත්‍රිපිටකය ගැන හෝ වේවා, ශබ්ද කෝෂය ගැන හෝ වේවා, විශ්ව කෝෂය ගැන හෝ වේවා අතෙක් ප්‍රකාශන ගැන හෝ වේවා කල්පනා කර බැලුවොත්, මේ යුගය පරයන යුගයක් නැවත ඒයයි කාගටවත් කියන්නට බැරි බව පැහැදිලි වෙනවා.

ගරු ජනාධිපතිතුමාගේ ආශීර්වාදය ඇතිව සංස්කෘතික අමාත්‍යාංශයේ කටයුතු පසුගිය හය වසරේ කළාට වඩා දෙගුණ තෙගුණව කරන බවට ගරු ඇමතිතුමා උදුවප් පුර පසළොස්වක් පොහෝ දා, විශේෂයෙන්ම මහා බෝධිය මෙරටට වැඩමවූ දා පිළිණ දී තිබෙන බව අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමාට පිළිතුරු දෙමින් ගරු ඇමතිතුමා මුලින්ම කිව්වා. ඒ ප්‍රතිඥාව ඉෂ්ට කිරීමට එතුමාට දීර්ඝායුෂ හා ශක්තිය ලැබෙවායි මම ප්‍රාර්ථනා කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සංස්කෘතිය සම්බන්ධයෙන් සලකා බලන විට මේ අමාත්‍යාංශය අර්ථාන්විත කිරීමට එතුමා ගත් හොඳම පියවරක් ගැන අපි ස්තුතිවන්ත වන්නට ඕනෑ. ඒ තමයි, බෞද්ධ කටයුතු පිළිබඳව කොමසාරිස් කෙනෙකු පත් කොට වෙනම දෙපාර්තමේන්තුවක් ඇති කිරීම. මීට කලිනුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා යකාදියේ තිබුණා බෞද්ධාගමට මුල් තැන දෙන්නට ඕනෑය බෞද්ධාගමට ප්‍රමුඛස්ථානය දෙන්නට ඕනෑය කියන වගන්ති. නමුත් ඒවා අර්ථ ශූන්‍ය වගන්ති බවට පත් වී තිබුණා. සැබවින්ම අරුත්බර වූයේ නැහැ. හේතුව ඒවා ක්‍රියාත්මක කරන්නට ආයතනයක් නොතිබීමයි. අපේ ගරු ඇමතිතුමා මේ ගැන කල්පනා කර ගත් පියවර නිසා අද කිසිම සැකයක් පැකිළීමක් නැතිව ඉදුරාම ඕනෑම බෞද්ධයෙකුට ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්නට ආයතනයක් නැත්තම් දෙපාර්තමේන්තුවක් තිබෙනවා. හොඳ බෞද්ධයෙක්, හොඳ ශ්‍රද්ධා සම්පන්න බෞද්ධ පරපුරක කෙනෙක්, එම දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා කොට තිබෙනවා. එතුමා ශ්‍රේෂ්ඨ විනිශ්චයකාරවරයෙක්. හොඳ තීන්දුවක් ගන්නට පුළුවන් බෞද්ධ විනය ධර්ම ගැන දන්නා කෙනෙක්. ඒ එක පැත්තක්.

ඊළඟට අනික් පැත්තෙන් බලමු. අපේ ගරු මන්ත්‍රීතුමෙක් වන ගුන්ථකරණයේ ඉතා දක්ෂතා ඇති, විශේෂයෙන්ම විචාරකයකු වශයෙන් කුශලතා දක්වා ඇති, කවිරත්න තියෝජ්‍ය ඇමතිතුමා කිව්වා, පොත් ප්‍රකාශනය සම්බන්ධයෙන් ඇති දුෂ්කරතා ගැන. ඒ ගැනත් වටහයක් මමත් තොකියා හොඳ නැහැ. මෙහි කෙළින්ම වගකීම තම මේ අමාත්‍යාංශයට තොවෙයි, භාර වන්නේ. ගරු තියෝජ්‍ය ඇමතිතුමා අපේ පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවේත් සිටිනවා. මේ අවස්ථාවේ කිය යුතු වැදගත් දෙයක් තිබෙනවා. කලින් තිබුණු ආණ්ඩුව කාලයේ මන්ත්‍රීවරයෙකුගෙන් හෝ මන්ත්‍රීවරයෙකුගේ කැවර් කෙනෙකුගෙන් ලියමනක් අරගෙන යන්නට ඕනෑ, කඩදාසි ටික ගන්නට. ඒ කාලයේ කඩදාසි සංයුක්ත මණ්ඩලය කියා එකක් තිබුණා. කවුරු හෝ බලගතු කෙනෙකුගෙන් දුරකථන පණිවුඩයක්වත් නැත්නම් කඩදාසි ටික ගන්නට බැහැ. එහෙත් අද යම්කිසි පොතක් පළ කරන්නට ඕනෑ නම් ඒ නවතිත්දාවට යටත් වෙන්න ඕනෑකමක් නැහැ. ඒක හොඳටම ඇති. ඒ කාලයේ කෝටා එක ගන්නට ඕනෑ නිසා පොත් දෙතුන් සියයක් ලියා පොත් දහ දාහකට හෝ පහළොස් දාහකටය කියා කෝටා එක අරගෙන කඩදාසි ටික කළුකඩයට විකුණනවා. මේවා කවුරුත් දන්නා රහස්. අද එවැනි තත්ත්වයක් නැහැ. ඒක පැහැදිළිව පිළිගන්න ඕනෑ.

ඊළඟට පොත් විකිණීමේ ප්‍රශ්නය එනවා. ඒ ගැන ඉතා වැදගත් දෙයක් කියන්න ඕනෑ. ඒ දවස්වල පාසල් පුස්තකාල කියක් තිබුණාද, අද කියක් තිබෙනවාද බලන්න. ඉස්සර අධ්‍යාපන අමාත්‍යාංශය පාසල් කියවීම් පොත්වලින් මිල දී ගන්නේ පිටපත් 200 යි. අද එයින් පිටපත් 1,500 ක් හෝ 2,000 ක් හෝ ගන්නවා, අද පාස්ල පුස්තකාල 3,000 ක පමණ තිබෙනවා. මේ ගැනත් කල්පනා කර බලන්න ඕනෑ. පාසල් පුස්තකාලවලට පොත් 3,000 ක් ගන්නවා කියන්නේ පොත් විකිණෙන ක්‍රමයක් ඇති කර තිබෙනවාය කියන එකයි. නිකම් කසිකබල් ජරා පොත් ගන්නේ නැහැ. පුස්තකාලවලට ගන්නා මටටමක පොත් ලිව්වොත් ඒ පොත් අලෙවි කර ගන්නට පුළුවන්. මේ ඇස්තමේන්තු කියවා බලන්න. පළාත් පාලන අමාත්‍යාංශය පොත් ගන්නට රුපියල් ලක්ෂ 40 ක පමණ වෙන් කර තිබෙනවා. ඒ ඒ පළාත් පාලන ආයතන ප්‍රධානීන් වර්ෂය අවසානයේ තමන්ගේ හිතුමනාපයට මෙනවා හෝ කසිකබල් පොත් ටිකක් ගන්නේ නැතිව හොඳ පොත් ගන්නට පොළඹවන ක්‍රමයක් තිබෙන්නට ඕනෑ. එහෙම නම් මේ ප්‍රශ්නය ඒ තරම් තදබල වන්නේ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වී. ජ. මු. ලොකුබණ්ඩාර මහතා]

තවත් දෙයක් තිබෙනවා. රටේ ජාතික පුස්තකාල ගොඩනගාගෙන යන ක්‍රමයක් දැන් තිබෙනවා. ඒ මඟින් ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයත් ලේඛකයින්ගේ පොත් මිල දී ගැනීමෙන් ආධාර කරනවා. මේ අතරමයි සංස්කෘතික දෙපාර්තමේන්තුවෙනුත් පොත් ලියන ලේඛකයින්ට ආධාර කරන්නේ. එපමණක් නොවෙයි, ජාතික පුස්තකාල සේවා මණ්ඩලය ලබන වර්ෂයේ සිට, පළ කරනු ලබන හැම හොඳ පොතකිත්ම පිටපත් 1,000 ක් ගන්නට දැන් කටයුතු යොද තිබෙනවා. මෙවර ඇස්තමේන්තුවලින් පමණක් එසේ පොත් ගන්නට රුපියල් ලක්ෂ 25 ක් වෙන් කර තිබෙනවා. එහෙම නම් හොඳ පොතක් මුද්‍රණය කර ගත්තොත් එය විකුණා ගැනීමේ අමාරුවක් ඉස්සර වගේ දැන් නැති බව අපට පෙනෙනවා. ඒ අතින් සහනයක් තිබෙනවා යයි කියන්න පුළුවන්.

ගරු ඇමතිතුමාගෙන් සිදු විය යුත්තේ මෙයයි. අර සංස්කෘතික ප්‍රඥප්තිය මඟින් බලය ලැබුණාට පසුව ගරු ඇමතිතුමාට කළ හැක්කේ අධ්‍යාපන අමාත්‍යාංශයෙන් වේවා රාජ්‍ය අමාත්‍යාංශයෙන් වේවා වෙළඳ අමාත්‍යාංශයෙන් වේවා ගත්තා යම් තීරණයක් අපේ සංස්කෘතියට ගැලපෙන්නේ කවර ආකාරයකින්දැයි බලා එය සමාජයේ යහපතට හේතුගත වන අයුරින් කටයුතු ඉටු කර ගැනීමට අවශ්‍ය පියවර ගැනීමයි. අපි බොහොම සන්තෝෂ වන්නට ඕනෑ. වෙනත් ආණ්ඩු යුගවලදී වාගේ නොවෙයි, මේ යුගයේදී ලොකු සේවයක් වෙලා තිබෙනවා. පළමුවැනිම දේ තමයි අමාත්‍ය මණ්ඩලයේ නොයෙකුත් ඇමතිවරු සංස්කෘතික දියුණුවට අත හිත දීම. සංස්කෘතිය ගැන කථා කරද්දී අපට අමතක කරන්න බැහැ, අපේ කර්මාන්ත හා විද්‍යා කටයුතු පිළිබඳ ඇමතිතුමා. අනෙක් අතින් ඒ ඒ දිස්ත්‍රික් ඇමතිවරුත් ශ්‍රී ලංකාවේ —

නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(துணைப் பிரதிக் தலைவர் அவர்கள்)
(Mr. Deputy Chairman of Comittee)

තව මිනිත්තු පහයි වෙලාව දෙන්න පුළුවන් ඇමතිතුමාට කථා කරන්න.

වී. ජ. මු. ලොකුබණ්ඩාර මහතා
(திரு. டபிள்யு. ஜே. எம். லொக்குபண்டார)
(Mr. W. J. M. Lokubandara)

හොඳයි අපේ නියෝජ්‍ය කාරක සභාපතිතුමාත් පුත්තලම පැත්තෙ ගිහින් නන්දිමිත්‍ර යෝධයා කළ ඒ වැඩ ගැන සොයා බලා, ඒවාට පුතර්ජීවයක් දීගෙන යනවා. මේ විධියට නොයෙක් කටයුතු සිද්ධ වෙනවා. අපේ ගරු අග්‍රාමාත්‍යතුමා විශේෂයෙන්ම, සිංහල භාෂාවේ, සාහිත්‍යයේ දියුණුවට, කලාවේ දියුණුවට අත හිත දෙන හැටි අපි කවුරුත් දන්නවා. වේදිකා නාට්‍ය විනෝද බද්දෙන් නිදහස් කරවා ගැනීම සඳහා ඒ කලාකරුවන් ලොකු හඬක් නගමින් සිටියා. ඒ පිළිබඳව ඇහුම්කන් දුන් ගරු අග්‍රාමාත්‍යතුමා එතුමාගේ විශේෂ අනුග්‍රහය මත නිත්දුවක් දී තිබෙනවා.

ප්‍රකාශන දෙස බැලුවාම, 1974, 1975, 1976, යන අවුරුදුවල පළ වූ ප්‍රකාශන හා 1980, 1981, 1982 වර්ෂවල පළවූ ප්‍රකාශන සයදා බැලුවාම, 1974 දී පොත් 108 ක් පළ වී තිබෙනවා. 1980 දී පොත් 136ක් පළ වී තිබෙනවා. මේ විධියට බැලුවාම පෙනෙනවා එතරම් හානියක් වෙලා නැති බව.

මේ ගුවන් විදුලි සංස්ථාව හා රූපවාහිනිය ගැන කල්පනා කළාම එක දෙයක් අපි අමතක කරන්න හොඳ නැහැ. ගරු සංස්කෘතික ඇමතිතුමා හැම විටම මේ ගැන සිහි තබාගෙන කටයුතු කරයි කියා මම සිතනවා. රූපවාහිනිය හැදූ මනුෂ්‍යයාට අපි ස්තුති කරන්නට ඕනෑ. ගුවන් විදුලිය වාගේ නැතිව, වහන්නත් පුළුවන් විධියට එය හදා තිබීම ගැන. නැත්නම් මේක මළ ලෙඩක්. අඩු ගණනේ එපා වෙන කොට වහන්නවත් පුළුවන්කම තිබෙනවා. එහෙම වුණත් මේ වැඩ සටහන් හදන අයගේ යුතුකමක් තිබෙනවා මේ වැඩ සටහන් හාමුදුරුවරුන් බලන්න පුළුවන් කියා හිතන්න. අඩු ගණනේ පෝය දිනවලවත්. මේක හාමුදුරුවන්ට තහනම්ය කියන්න බැහැ. අද තත්ත්වය අනුව. එම නිසා ගරුතර සංඝරත්නයට පරම අයිතියක් තිබෙනවා මේවාට සම්බන්ධ වෙන්න. අනික් අතින් බැලුවාම අපි දෙහොත් මුදුන් දී මහා සංඝරත්නයට වැද වැටෙනවා. විවරයට අපි සලකන තරම්, කසාවතට අපි සලකන තරම්, කිසි ආකාරයකින් අඩුවක් නැතිව සලකන තරම සමාන කරන්න පුළුවන් වෙනත් දෙයක් නැහැ. අපට දෙන්නට පුළුවන් ලොකුම ගුරුත්වය තමයි වඳින එක : විශේෂයෙන්ම විවරයට සලකන එක. මේක තමයි මාක්ස්වාදීන්ට තිබෙන ලොකුම රුදව. අපි මහා සංඝරත්නයට දක්වන සැලකිල්ලට ඔවුන් විරුද්ධයි.

මම දන්නවා, මේ වන විට ගරු සංස්කෘතික ඇමතිතුමා සංඝාධිකරණ පනත ගැන සැහෙන්න කටයුතු කර තිබෙනවා. කෙටුම්පත හදා ඉවරයි. දැන් එය තිබෙන්නේ අවසාන අවස්ථාවේ. මම ඉල්ලා සිටිනවා හොරට සිවුරු අදින අයට, හික්ෂු ප්‍රතිරූපකයන්ට, ශ්‍රමණ වේශධාරීන්ට විරුද්ධව දැඩි නීති පනවන්නය කියා. එක වරක් සිවුරක් හොරට ඇදලා අසූ වුණොත් දෙන දඩුවම දෙගුණයක් කරන්න ඕනෑ, නැවත වතාවක් එහෙම අහුවුණොත්. බද්දේගම ගරු මන්ත්‍රීතුමා (අමරසිරි දෙඩන්ගොඩ මහතා) නීතිඥයකු වශයෙන් දන්නවා නැවත නැවත ඒ වැරැද්දම කළොත් දඩුවම වැඩි කරන බව ; හිරේ දමන බව. අපි මේ සිවුරේ ගරුත්වය ආරක්ෂා කිරීමට ක්‍රම ඇති කරන්න ඕනෑ. බොහෝ අය මෙය වඩාගෙන සිටින හැටි බැලුවාම ඒක අපේ නායක හාමුදුරුවන්ට තිගරුවක්. සමහරුන් සිවුර දගෙන නිකම්ම පිංගුත්තරයෝ වාගේ සිටින හැටි බැලුවාම කනගාටුදායකයි. ඒ අතින් කල්පනා කර බලා මම ඉල්ලා සිටිනවා ගරු සංස්කෘතික ඇමතිතුමාගෙන්, මහා සංඝරත්නයට ආයාචනයක් කරන්නය කියා, මල්වත්ත, අස්ගිරිය වැනි අපේ මහා නායක හිමිපාණන් වහන්සේලාට ආයාචනයක් කරන්නය කියා. අඩු ගණනේ සංඝික දානයකට යන විටවත් මේ සමහර ඇත්තන් නිසා වන අපහාසවලින් වැළකීමට කටයුතු කරන්නය කියා. " දශධම්ම සූත්‍රය " ගන්නාම අපට පෙනෙනවා, " වෙ වණණියම් ගතං හි හිකඛවෙ, පඛඛ ජුතෙන අභිණහං පවවෙක්ඛි තඛඛං " කියලා තිබෙන බව. නිතරම ගිහියයි පැවිද්දයි අතර වෙනසක් තිබෙනවා. ඒ වෙනස තමයි තිබෙන වටිනාකම. ඒ වෙනස වටිනාකම ලෙස නොසලකන තරමට පිරිහෙනවා නම් මහා සංඝරත්නය ආඥාවක් තිකුත් කළ යුතුයි.

ඒ නිසා මම මේ අවස්ථාවේදී විශේෂයෙන්ම කියා සිටිනවා,මේ තිළ ඇදුම මේ හික්ෂු යුනිෆෝම් එක පැලැණේ වජිරඤාන හාමුදුරුවන් වැනි උත්තමයන් ඇන්ද එකක් බව අමතක කරන්නට හොඳ නැහැ. එයට තිගරු කරමින්, සමහර විට මාක්ස්වාදීන්, වෙනත් නොයෙක් උපක්‍රමකාරයන්, තුස්තවාදීන් ආදී නොයෙක් නොයෙක් අය එය අඳිනවා. කොණ්ඩ වවා ගෙන එය අඳින අය ඉන්නවා. මහා සංඝරත්නයට නිග්‍රහ කරන්න සමහර අය එහෙම කරනවා. හිතාමතාම සංවිධානාත්මකව එය කරනවා. එම නිසා මේ ගැන විශේෂයෙන් සැලකිල්ල යොමු කරන්නටය කියා මා ඉල්ලා සිටිනවා. සමහර අය සිවුර දගෙන මැයි දින පෙළපාලියේ යනවා. ඒ අය මහා සංඝරත්නය වෙන්න බැහැ. එය මහා විහාර සම්ප්‍රදය වෙන්න බැහැ. කිසිම සැකයක් නැහැ, එහෙම කරන්නේ අපේ සංඝරත්නයට නිග්‍රහ කරන්නටයි. සමහර දේවල් ගැන කල්පනා කළ විට, හිතක් පපුවක් ඇති බෞද්ධකම සළකන, විශේෂයෙන් මහා බෝධි පරපුරට අයිති ඇමතිතුමාටත්, වැලිවිට ශ්‍රී සරණංකර නාහිම්පාණන්ගේ තම සිහි වෙත විට අපේ සිහියට නැගෙන ගලගෙදර ගරු නියෝජ්‍ය ඇමතිතුමාටත්, කවදාවත් මෙබදු නැනකදී නිහඬව සිටින්න බැහැ. මේ කරුණු ගැන සලකා ගරු ඇමතිතුමා ගත්තා තීරණ තුළින් ඉදිරියේදී මේ රටේ සංස්කෘතියේ පුතර්ජීවනයක් ඇති වෙනවාට සැකයක් නැහැ. ඔබතුමාගේ තම ඉතිහාසයේ ලියවෙන්නට මේ කළ වැඩ ටික හොඳටම ඇති. ඔබතුමාගේ අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ සිට අතිරේක ලේකම්වරුන්ටත්, ඒ වාගේම ශබ්දකෝෂ කාර්ය මණ්ඩල ප්‍රධාන සංස්කාරකතුමා ඇතුළු හොරණ වජිරඤාන මාහිම්පාණන් වහන්සේ ඇතුළු වියත් පිරියටත් මා ස්තුතිවන්ත වෙනවා.

එක අතකින් බැලූ විට හවුහරණයක් නැතිව සිටි අයට ඔබතුමාගේ අමාත්‍යාංශයෙන් දී ඇති අනුග්‍රහයන් යනාදිය ගැන බැලූ විට අපට බොහොම සංතෝෂ වෙන්න පුළුවන්. එබදු තත්ත්වයක් උද, කළ ඔබතුමාගේ අමාත්‍යාංශයට මුදල් අඩුයි කියන කථාව අපි පිළිගන්නවා.

මා ගරු ඇමතිතුමාට එක ආයාචනයක් කරනවා. දූනට දඹදිව සිද්ධස්ථාන ගැන කල්පනා කරන විට, කුසිනාරාව, සාරානාථය, ලුම්බිණිය වැනි තැන් ගැන කල්පනා කරන විට, අපේ බුදු නාමුදුරුවන්ගේ උප්පත්ති ස්ථානය, ඒ වාගේම සම්බෝධියට පැමිණියා වූ බුද්ධගයාව, දම්සක් පැවතුම් සූත්‍රය දේශනා කළ ස්ථානය, නිර්වාණාවබෝධය සිදු වූ තැන හා තේපාලය වැනි තැන් ගැන කල්පනා කළ විට මේ රටේ හැදුණු වැඩුණු හික්ෂුවරු එම ස්ථානවල අදත් ඉන්නවා. ඒ අයගෙන් පසුව ඒ තැන් ගන්නට අය නැහැ. එම නිසා මා ගරු ඇමතිතුමාගෙන් විශේෂ ඉල්ලීමක් කරනවා, ඉදිරියටත් ඒ ස්ථාන මේ රටේ සිංහල බෞද්ධ හික්ෂුවරු විසින් නඩත්තු කිරීමට අවස්ථාවක් ඇති කිරීම සඳහා මහා බෝධි සමාගම වැනි ආයතනවල අනුග්‍රහය ඇතිව යම් වැඩපිළිවෙළක් යොදන්නය කියා. ඊට අවශ්‍ය මුදල් මේ පාර්ලිමේන්තුව තුළින් වෙන් කරවා ගැනීමට හැකියාව ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින්, මේ වැය ශීර්ෂය ගැන කථා කිරීමට ඉඩ සලසා දුන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඩබ්ලිව්. එම්. ජී. ටී. බණ්ඩා මහතා (සංස්කෘතික කටයුතු නියෝජ්‍ය ඇමතිතුමා)

(திரு. டபிள்யு. எம். ஜீ. ரீ. பண்டா — கலாசார அலுவல்கள் பிரதி அமைச்சர்)

(Mr. W. M. G. T. Banda–Deputy Minister of Cultural Affairs)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සංස්කෘතික අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සාකච්ඡා කරන කාලය තුළ සියදු දෙනාටම පෙනෙන්නට තිබුණු ලක්ෂණයක් නම් මේ රජයේ විවිධ අමාත්‍යාංශ තුළින් කෙරුණු කටයුතු සියල්ලකගේම දොෂාරෝපණය සංස්කෘතික අමාත්‍යාංශය තුළට පත් කිරීමයි. ඇත්ත වශයෙන්ම, චෝදනා ලෙස යම් යම් කථා තුළින් ඉදිරිපත් වූ විවිධ කරුණු මේ රටේ සිදු වුණේ නැහැයි අපට කියන්නට බැහැ. එසේ වුණත්, සංස්කෘතික අමාත්‍යාංශය තුළින් මේ කාල සීමාව තුළ මේ රටට සේවයක් සිදු වුණාද නැද්ද කියා අපි කල්පනා කරන්න ඕනෑ. මා හිතන්නේ විවේචන වශයෙන් ඉදිරිපත් වුණේ කරුණු දෙකක් තුනක් පමණයි. අනික් සියලුම ඒවා ප්‍රතිසංවිධානය කිරීම ගැන, සංස්කෘතියේ අනාගත අභිවෘද්ධිය ගැන ඉදිරිපත් වූ කරුණුයි. අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) ප්‍රකාශ කළා, ප්‍රකාශන මුද්‍රණය බොහොම හීන වී තිබෙනවාය කියා. අපේ හපුතලේ ගරු මන්ත්‍රීතුමා — දේශීය වෛද්‍ය ඇමතිතුමා — එයට පිළිතුරු දුන්නා. එම නිසා මා එයට පිළිතුරු දෙන්න කල්පනා කරන්නේ නැහැ. නමුත් ප්‍රකාශන අංශය වෙතුවෙන් අපේ අමාත්‍යාංශයට ලැබෙන්නේ රුපියල් ලක්ෂ පහමාරයි. මේ රුපියල් ලක්ෂ පහමාරෙන් අවුරුද්දකට සිංහල ශබ්ද කෝෂයේ කාණ්ඩ දෙකක් තිකුත් කරනවා. ඒ දෙකට පමණක් රුපියල් ලක්ෂ පහමාරක් යනවා. මුද්දල්වල තිබෙන හිඟකම, අඩුපාඩු, ඌණතාවය ප්‍රකාශන අංශයේ තන්නවය මෙසේ වීමට හේතුවයි.

ඊළඟට, අපේ අමාත්‍යාංශයෙන් මෙනෙක්—මේ කාලසීමාව තුළ—සිදු වුණු වැඩ ගැන මම මතක් කරන්නට ඕනෑ. සිංහල ශබ්ද කෝෂය ගැන ගරු අත්තනගල්ල මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) ප්‍රකාශ කළා. සංස්කෘතික අමාත්‍යාංශය නමින් වෙනම අමාත්‍යාංශයක් ඇති කළේ 1956 වර්ෂයේදීයි. අපි එය පිළිගන්නවා. 1956 වර්ෂයේ සිට 1977 වර්ෂය වන තෙක් ගත වූ 21 අවුරුද්ද තුළ මේ රටේ සංස්කෘතියට කළ සේවාවන් වෙනුවෙන් ඉතිහාසයට එක් වන්නට දෙයක් තිබෙනවාදැයි පෙන්වන ලෙස ගරු අත්තනගල්ලේ මන්ත්‍රීතුමාට අභියෝග කරන්නට සිදු වෙනවා. මම එහෙම කියන්නේ මේ නිසයි: 1927 සිට 1977 වන විට සිංහල ශබ්ද කෝෂය ලියන්නට පටන් ගෙන අවුරුදු 50 යි. මේ පණස් අවුරුද්ද තුළ කාණ්ඩ දෙකයි ලියලා තිබෙන්නේ. මේ කාණ්ඩ දෙකක් ලියා නිම කිරීමට අවුරුදු පණහක් ගත වුණා. මේ සුළු කාලසීමාව තුළ, ඒ සිංහල ශබ්ද කෝෂය කාණ්ඩ 6 ක් ලියා මුද්‍රණය කර ජනතාව අතට පත් කරන්නට අපිට පුළුවන් වුණා. කාණ්ඩ 8 ක් දැන් මුද්‍රණය වී තිබෙනවා. තවත් කාණ්ඩ 8 ක් සම්පූර්ණ කරන්නට අවශ්‍ය වී තිබෙනවා. මේ කාණ්ඩ 16 ම අපිට මුද්‍රණය කරන්නට පුළුවන්කම තිබෙනවා. අපේ සිංහල ශබ්ද කෝෂ කාර්ය මණ්ඩලය ඉතා උනන්දුවෙන් වැඩ කරගෙන යනවා. නමුත් අවසාන කාණ්ඩය එනම්, 8 වන කාණ්ඩය මුද්‍රණය කළේ අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අරමුදලින්; එතුමා විසින් පරිත්‍යාග කරන ලද මුදලකින්. අපේ උපදේශක කමිටුව ගිය සතියේත් මේ ගැන සාකච්ඡා කළා. ජාත්‍යන්තර වශයෙන් ලෝකය පිළිගත් ශබ්ද කෝෂය අතරින්, ග්‍රන්ථ අතරින් විශාලම ශබ්ද කෝෂය—පද රාශියක් තිබෙන ශබ්ද කෝෂය—වන්නේ සිංහල ශබ්ද කෝෂයයි. සිංහල ශබ්ද කෝෂයක් නැතිව ශ්‍රී ලංකාව වෙතුවෙත්, ජාතිය වෙතුවෙත් ශ්‍රී ලංකාවේ අතීතය වෙතුවෙත්, සංස්කෘතිය වෙතුවෙත් යම්කිසි කෙනෙක් කථා කරන්නට කල්පනා කරනවා නම් ඒක විහිළුවක්. මේ අවුරුදු 50 ක් තුළ නොකල වැඩය ශබ්ද කෝෂය ඉදිරි අවුරුදු තුන ඇතුළත අවසන් කරන්නට අපට පුළුවන් වෙනවා. ආණ්ඩු පාර්ශ්වයේ ගරු මන්ත්‍රීතුමන්ලාත්, විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීතුමන්ලාත් අපේ ඉතිහාසය ලියා, අපේ රාජකාරිය මේ කාලසීමාව තුළදී අවසන් කරන්නට ඕනෑය කියන හැඟීම හදවත් තුළට ගෙන ශබ්ද කෝෂය අවසාන කරන්නට අවශ්‍ය මුදල් ප්‍රතිපාදන එක් එක් මන්ත්‍රීතුමාගේ ජන්ද කොට්ඨාශ මට්ටමෙන් හෝ ඒ ජන්ද කොට්ඨාශවල පරිත්‍යාගශීලී මහත්වරුන් ගෙන් හෝ ලබා දෙනවා නම් 1986 වර්ෂය නිම වන්නට පෙර මේ කාර්යය අවසාන කරන්නට අපි සූදානම් බව තමුන්නාන්සේලාට මතක් කරන්නට ඕනෑ.

ඊළඟට, ප්‍රායෝගික ශබ්ද කෝෂයක් අවශ්‍යයි කියා උපදේශක මණ්ඩලය තීරණය කළා. ඒ තීරණය කර මාස තුනෙන් අපි ප්‍රායෝගික ශබ්ද කෝෂයේ වැඩ පටන් ගත්තා. මේ ප්‍රායෝගික ශබ්ද කෝෂයේ පළමුවන කොටස සිංහල ශබ්ද කෝෂයේ එදිනෙදා වැඩකටයුතු සඳහා ප්‍රයෝජන ගන්නට අපහසු නිසා මේ ගැන කල්පනා කර ශබ්ද කෝෂය සිංහල භාෂාවෙන් පිළියෙල කිරීමේ අරමුණ ඉටු කර ගැනීමට උපදේශක සභාවේ උපදෙස් පරිදි ශබ්ද කෝෂයේ පිටු එකදහස් අටකින් සමන්විත පළමුවන කාණ්ඩය 1982 වර්ෂයේදී අපි නිකුත් කළා. එහි දෙවැනි කාණ්ඩය දැනට මුද්‍රණය වෙමින් පවතිනවා. එය තව මාස තුනකින් පමණ නිකුත් කිරීමට පුළුවන් වෙයි. එය නිකුත් කිරීමත් සමඟම රජයේ කාර්යාල—විශේෂයෙන් උසාවි, විශ්ව විද්‍යාල, පාසල් වැනි—හා ව්‍යාපාරික ආයතනවලට එයින් ප්‍රයෝජන ලබාගන්න පුළුවන් වෙයි. විශේෂයෙන් ඒ කටයුතු ඉක්මනින් කර දීමට කටයුතු කළ අධිනීතිඥ හරිශ්චන්ද්‍ර විජේතුංග මහතාට අප ස්තුතිවන්ත වෙන්න ඕනෑ. එතුමා කාර්යය භාරගෙන තියමිත කාලයටත් පෙර එය අවසන් කළා.

සිංහල-ඉංග්‍රීසි ශබ්දකෝෂය, ප්‍රායෝගික ශබ්ද කෝෂය, සිංහල විශ්වකෝෂය, බෞද්ධ විශ්වකෝෂය ආදි කටයුතු සියල්ලක්ම පැවරී තිබෙන්නේ අපේ අමාත්‍යාංශයටයි. ඒ කාර්යයන් සම්බන්ධයෙන් අවුරුදු 50 ක් තුළ කෙරී ඇති වැඩ කොටසත්, පසුගිය හය අවුරුද්ද තුළ අපේ ගරු ඇමතිතුමාගේ මෙහෙයවීමෙන් කෙරුණු වැඩ කොටසත් ගැන කල්පනා කර බලන විට අපට කියන්න පුළුවනි, අර 50 අවුරුද්ද තුළ කෙරුණා වගේ විසි ගුණයකටත් වැඩි වැඩ කොටසක් පසුගිය අවුරුදු හය තුළ කෙරී තිබෙනවාය කියා.

ඒ වගේම, බෞද්ධ විශ්වකෝෂයේ 4 වැනි කාණ්ඩයේ 1 වැනි භාගය ප්‍රකාශයට පත් කර තිබෙනවා. එහි 2 වැනි භාගය දැනට මුද්‍රණය වෙමින් පවතිනවා. නමුත් මේ විධියට කටයුතු කෙරීගෙන ගියොත් නම් බෞද්ධ විශ්වකෝෂයේ වැඩ සම්පූර්ණයෙන් අවසන් වෙන්න තව අවුරුදු 25 ක් පමණ යනවා. එම විශ්වකෝෂයේ වැඩ ඉක්මණින් අවසන් නොකළොත් අප බලාපොරොත්තු වන බෞද්ධ දර්ශනය, ථේරවාදී බුද්ධාගම මුළු ලෝකය පුරා පතුරුවන්න අපට පුළුවන් කමක් ලැබෙන්නේ නැහැ. එම කටයුත්තේ මූලාරම්භය වන්නේ මේ බෞද්ධ විශ්වකෝෂයයි. එම නිසා එහි වැඩ කටයුතු ඉතා ඉක්මනින් ඉවර කරන්න බෞද්ධයන් වශයෙන් අපේ යුතුකමක් තිබෙනවා. එබැවින් අප ඒ සඳහා දැඩි අධිෂ්ඨානයක් ඇති කරගන්න ඕනෑ. එම නිසා මේ අවස්ථාවේදී ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් එක්තරා ඉල්ලීමක්, ආයාචනයක් කරන්න කැමතියි. ථේරවාදී බුද්ධාගම මුළු ලෝකය පුරා ප්‍රචාර කරන්න, දියුණු කරන්න අප කල්පනා කරනවා නම් මේ බෞද්ධ විශ්වකෝෂයේ වැඩ අපේ පාලන කාලය තුළම අවසන් කරන්න අපේ යුතුකමක් තිබෙනවා. ඒ සඳහා ගරු මන්ත්‍රීතුමන්ලාගේ සහයෝගය අපට අවශ්‍ය වෙනවා. අපේ අමාත්‍යාංශයේ පාර්ලිමේන්තු උපදේශක කාරක සභාව තුළින් යම්-යම් යෝජනා ඉදිරිපත් කොට භාණ්ඩාගාරයට කරුණු දක්වන්න අප කල්පනා කර තිබෙනවා. එම විශ්වකෝෂයේ වැඩ ඉක්මණින් අවසන් කිරීම සඳහා වැඩි-වැඩියෙන් මුදල් ලබාගත යුතුව තිබෙනවා. එහෙම නැතිව දැන් ලැබෙන මුදල් ප්‍රමාණය අනුව කටයුතු කෙරෙන ආකාරයට නම් බෞද්ධ විශ්වකෝෂයේ වැඩ අවසන් කරන්න අවුරුදු 25 ක් බලා ඉන්න අපට සිදු වන නියා ඒ කාලය වන විට අප මේ පාර්ලිමේන්තුවේ නමා මේ ලෝකයේවත් ඉන්න එකක් නැහැ. එහෙම වුණොත් බෞද්ධ විශ්වකෝෂය දකින්න අපට පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. බෞද්ධ විශ්වකෝෂය ගැන තමුන්නාන්සේලාට වගේම මටත්, මගේ ඇමතිතුමාටත්, අපේ කාර්ය මණ්ඩලයටත් විශාල වේදනාවක්, ඕනෑකමක්, අවශ්‍යතාවක් ඇති වී තිබෙනවා. නමුත් නොයෙකුත් අඩුපාඩුකම් නිසයි, ඒ බෞද්ධ විශ්වකෝෂයේ වැඩ මේ විධියට හෙමින් කෙරෙන්නේ.

ත්‍රිපිටක ග්‍රන්ථය මුද්‍රණය කිරීම පටන් ගත්තේ එක්දාස් නමසිය පණස්පගේ බුද්ධ ජයන්ති කාලයේදීයි. දැන් මේ යන්නේ 1983 අවුරුද්දයි. ඒ කටයුත්ත පටන්ගෙන දැනට විසිඅට අවුරුද්දක් ගත වී තිබෙනවා. මේ ආණ්ඩුව බලයට පත් වන විට ත්‍රිපිටක ග්‍රන්ථයේ කාණ්ඩ 4 ක් පමණයි, නිකුත් වී තිබුණේ. දැන් කාණ්ඩ 46 ක් අවසන් කර තිබෙනවා. තවත් ඉතිරිව තිබෙන්නේ කාණ්ඩ 9 ක් පමණයි. ඒ කාණ්ඩ 9 ත් ලබන අවුරුද්දේදී අවසන් කරන්න අපට පුළුවන් වෙයි. ඒ කාණ්ඩ 9 ත් අවසන් කළාට පස්සේ මට මේ නියෝජ්‍ය ඇමතිකම වුණත් කමක් නැහැ කියන අධිෂ්ඨානය ඇතිවයි, මා කටයුතු කළේ. ගරු ඇමතිතුමා කටයුතු කළේත් ඒ අධිෂ්ඨානයෙන් යුතුවය. අපේ කාර්ය මණ්ඩලය තුළත් එවැනි අධිෂ්ඨානයක් තිබෙනවා. ඒ කටයුත්ත සාර්ථක ලෙස අවසන් කිරීම පරම්පරාවෙන් අපට ලැබුණු දායාදයක්, උරුමයක් හැටියට සලකාගෙනයි, අප කටයුතු කරන්නේ.

මේ තත්ත්වය නිසා තමයි, ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේට උරුමකම් කියන පරපුරක කෙනෙක් සංස්කෘතික ඇමතිවරයා වශයෙන් ගරු ජනාධිපතිතුමත් විසින් පත් කරනු ලැබුවේ. සංඝ රාජ මාහිමිපාණන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඩබ්ලිව්. එම්. ජී. වී. බණ්ඩා මහතා]

වහන්සේගේ උරුමය ගැටුණ කෙනෙක් තියෝජ්‍ය සංස්කෘතික ඇමතිවරයා වශයෙන් පත් කොට මේ කටයුතුවල ආධිපත්‍යය පිළිබඳ උරුමයක් කියන්නට ජනාධිපතිතුමාණන් කටයුතු කර තිබෙන්නේත් ඒ නිසයි. ඒ උරුමය රැක දෙන්නට, ඒ ගැන උනන්දුවක් දක්වන, ඒ වාගේම කාලය ගැන කල්පනා නොකර අවංකව කටයුතු කරන උගත් පඬිවරුන් රාශියක් අපේ අමාත්‍යාංශයේ කටයුතු කරනවා. මේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ගැන සාකච්ඡා කරන වෙලාවේ කාටවත් වෝදනාවක් නඟන්නට බැරි වුණේ ඒ සියලු දෙනාගේම සහයෝගය ඇතිව අපේ අමාත්‍යාංශයේ කටයුතු එදා තිබුණාට වඩා විසිපත් ගුණයකින් පමණ අද වැඩි දියුණු කර තිබෙන නිසයි.

අද ලංකාවේ සංස්කෘතික අමාත්‍යාංශයක් තිබෙනවාය කියන හැඟීම ජනතාවගේ හදවත් තුළට ඇවිදින් තිබෙනවා. ඒ හැඟීම ඇවිදින් තිබෙන්නේ මේ රජය බලයට පත් වුණාට පසුව බව මම තමුන්නාන්සේලාට මතක් කරන්නට කැමතියි. සමහර ගරු මන්ත්‍රීවරු සඳහන් කළා වගේ සංස්කෘතික අමාත්‍යාංශය සතු වගකීම එකම අංශයකට පමණක් සීමා නොවන බව අපිත් පිළිගන්නවා. නමුත් දේශපාලන වශයෙන් මොන පැත්තක සිටියත්, මොන අදහස් දරුවත් සංස්කෘතිය ගැන යම් පසුබිමක් මේ හැම කෙනෙකුටම තිබෙනවා නම් ඒ පසුබිම මුල් කරගෙන විවිධ අමාත්‍යාංශ තුළින් පාලනය වන විවිධ ක්ෂේත්‍රයන් තුළින් ඇති වන විවිධ කටයුතු ගැන යම්කිසි තීරණයක් ගැනීමට අපි කල්පනා කරන බව තමුන්නාන්සේලාට මතක් කරමින් මේ අමාත්‍යාංශයේ කටයුතු ගැන ගරු ඇමතිතුමාත්, කාර්ය මණ්ඩලයත් දක්වන උනන්දුව සම්බන්ධයෙන් තියෝජ්‍ය ඇමතිතුමා වශයෙන් මගේ අවංක ආදර ස්තුතිය හා ගෞරවය ඒ හැම දෙනා වෙත ම පිරිනමමින් මගේ කතාව අවසන් කරනවා.

වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා (හම්බන්තොට දිසා ඇමතිතුමා)
(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்—ஹம்பாந்தோட்டை மாவட்ட அமைச்சர்)
(Dr. P. M. B. Cyril–(District Minister for Hambantota)

නැගී සිටියේය
எழுந்தார்,
Rose

තියෝජ්‍ය කාරක සභාපතිතුමා
(துணைப் பிரதித் தலைவர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

You can speak only if the Hon. Minister has no objection.

වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා
(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)
(Dr. P. M. B. Cyril)

I will take only two minutes, Sir.

ඒ. එල්. බී. හුරුල්ලේ මහතා
(திரு. ஈ. எல். பி. ஹுருள்ளே)
(Mr. E. L. B. Hurulle)

I have no objection.

වෛද්‍යාචාර්ය පී. එම්. බී. සිරිල් මහතා
(வைத்திய கலாநிதி பீ. எம். பி. சிறில்)
(Dr. P. M. B. Cyril)

ගරු තියෝජ්‍ය සභාපතිතුමනි, සංස්කෘතික අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සාකච්ඡා කරන මේ විවාදයේදී සංස්කෘතික අමාත්‍යාංශයෙන් ප්‍රතිසංස්කරණ කටයුතු කෙරෙන, තිස්සමහාරාම ආසනයේ තිබෙන යටාල විහාරය ගැන ගරු මන්ත්‍රීතුමෙක් සඳහන් කළා. ඒ නිසා ඒ ගැන පොඩි පැහැදිලි කිරීමක් කිරීම මගේ යුතුකමක් කියා මා හිතනවා. දැනට තිබෙන තත්ත්වය අනුව මේ යටාල විහාරයේ ප්‍රතිසංස්කරණ කටයුතු කොන්ත්‍රාත්කරුවකුට භාර දී නැහැ. සංස්කෘතික අමාත්‍යාංශයෙන් එහෙම නැත්නම් පුරා විද්‍යා දෙපාර්තමේන්තුවෙනුයි ඒ කටයුතු කරගෙන යන්නේ.

1984 වර්ෂය සඳහා සඳගිරිසෑය, තෙලුල්ල, යටාල විහාරය ආදියේ ප්‍රතිසංස්කරණ කටයුතු වෙනුවෙන් විශාල මුදලක් වෙන් කර තිබෙන නිසා පළාතේ මන්ත්‍රීවරයා වශයෙන් මට සතුටු වෙන්නට පුළුවන්කම තිබෙනවා. දැන් අවුරුදු හතරක්, පහක් පමණ කාලයක් තිස්සේ මේ සඳගිරිසෑය, යටාල, තෙලුල්ල ආදී විහාරවල ප්‍රතිසංස්කරණ කටයුතු කරගෙන ආවත් ඒවා ගැන එතරම් සතුටු වෙන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. තවම ඒවා හමාර වී නැහැ. සඳගිරි සෑය විහාරයේ කර තිබෙන ප්‍රතිසංස්කරණ කටයුතු පසුගිය වර්ෂයේ ඇදහැළුණු ධාරාතිපාත වර්ෂාව නිසා සෝදාගෙන ගොස් කඩාවැටී තිබෙනවා. 1984 වර්ෂය සඳහා විශාල මුදලක් වෙන් කර තිබෙන බැවින් තිස්සමහාරාම මැතිවරණ කොට්ඨාශයේ පුරා විද්‍යා දෙපාර්තමේන්තුවෙන් කෙරෙන පැරණි විහාරස්ථානවල තටබුන් ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩ කටයුතු හමාර කර දෙන ලෙස මම ගරු ඇමතිතුමාගෙනුත්, අමාත්‍යාංශයේ නිලධාරීන්ගෙනුත්, දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගෙනුත් ඉල්ලා සිටිනවා.

මම ගරු ඇමතිතුමාගෙන් තවත් ඉල්ලීමක් කරන්නට කැමතියි. සංස්කෘතික ත්‍රිකෝණයේ වැඩ කටයුතු ව්‍යාප්ත කරන ලෙස විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීතුමෙක් ඉල්ලා සිටියා. ඒ ඉල්ලීම මමත් අනුමත කරනවා. තිස්සමහාරාමය, කැළණිය, මිහියංගනය ආදී වශයෙන් බුදුරජාණන් වහන්සේගේ පාද ස්පර්ශය ලැබූ ස්ථාන කීපයක් මේ රටේ තිබෙනවා. තිස්සමහාරාමය මේ සංස්කෘතික ත්‍රිකෝණයේ වැඩ කටයුතුවලට ඇතුළත් වී නැහැ. ඒ ගැන අපේ ප්‍රදේශයේ ජනතාව බොහොම ලොකු හිතේ අමාරුවකිනුයි ඉන්නේ. එය ලොකු අසාධාරණයක් විධියට අපට පෙනෙනවා. එම නිසා හම්බන්තොට දිස්ත්‍රික්කයත් සංස්කෘතික ත්‍රිකෝණයට ඇතුළත් කර තිස්සමහාරාමයේ වැඩ කටයුතු කිරීමේ හැකියාව ගැනත් කල්පනා කර බලන ලෙස මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

කැළණිය, නාගදීපය, තිස්සමහාරාමය වැනි ස්ථානත් සංස්කෘතික ත්‍රිකෝණයේ විධියට ක්‍රියාත්මක කිරීමේ අදහසක් ගරු ජනාධිපතිතුමාට තිබෙනවා. එහෙම කරනවා නම් ඒ තටබුන් ප්‍රදේශ නැවත වරක් පුනරුත්ථාපනය කර විශාල ප්‍රගතියක් ඇති කරන්නට අපට හැකියාවක් ලැබෙනවා. ගරු ඇමතිතුමාගෙන් ඒ ඉල්ලීම කරමින්, සඳගිරි සෑය, යටාල විහාරය, දදිගම්විල, තෙලුල්ල යන විහාර කෙරෙහි ගරු ඇමතිතුමාගේ විශේෂ අවධානය යොමු වේවායි ප්‍රාර්ථනා කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

අ. හා. 7.30

ඒ. එල් බී. හුරුල්ලේ මහතා (සංස්කෘතික කටයුතු ඇමතිතුමා)
(திரு. ஈ. எல். பி. ஹுருள்ளே — கலாசார அலுவல்கள் அமைச்சர்)
(Mr. E. L. B. Hurulle–Minister of Cultural Affairs)

ගරු තියෝජ්‍ය සභාපතිතුමනි, අත්තනගල්ල ගරු මන්ත්‍රීතුමා (ලක්ෂ්මන් ජයකොඩි මහතා) ඉංග්‍රීසි භාෂාවෙන් කථා කළ නිසා එතුමාට ඉංග්‍රීසි භාෂාවෙන් පිළිතුරු දෙන්න මම බලාපොරොත්තු වෙනවා.

Mr. Deputy Chairman, the hon. Member for Attanagalla spoke in English, and that is why I am replying to him in English. He referred to the Cultural Triangle work. He said that auditing has to be done very carefully and he was wondering whether any audit was being done. I wish to put the record straight and saw that the 1981 audit–that is, the year we started–is over and that the report should be out in early January, that is, next month.

Then he referred to the architectural consultants and asked what experience the architects have in archaeology. I must quite frankly tell him that architects are not in charge of archaeological work. They only do their achitectural part and they are being advised by the Director-General, who is both an archaeologist and an architect. Besides the Director-General there are also the lecturers of the various universities who are in charge of the projects. They are experts in archaeology and they are also there to help the architects. Therefore the hon. Member need not be worried that we have got consultants who are only architects.

He also referred to the foreign consultants. I remember that when we started the Cultural Traingle and we were about to start a charity company in the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

UK. even the hon. Member for Attanagalla looked at it with a suspicious mind. He thought that the foreigners were going to take away all our money and also misappropriate all the money that they collect for this charity company that was going to help in our Cultural Triangle work. I am very happy to inform him that that society has been formed and experts have been sent here at their own expense. They have come and given us very valuable advice and they have also gifted some computers and I think we will get more without any expense to the Cultural Fund. Foreign consultants are got down here only if we do not have our own experts. There are certain fields where our people are not experts. In such a case we have to look to foreign consultants and foreign experts.

He also wanted to know how we were going to find the finances to carry on the Cultural Triangle work because the Treasury was releasing only Rs. 8 million this year. I must tell that we have started something that they never even dreamt of—not even their Finance Ministers. I was able to inaugurate a scheme of collections from tourists who come to these Cultural Traingle sites from 1st November 1979. We expect to get about Rs. 24 million next year. We expected it this year too, but due to the unfortunate incidents of July this year the tourist traffic has got reduced and therefore our income has also got reduced in August and thereafter. In August of the previous year our collections from tourists alone came to about Rs. 1.75 million, but this August after the July troubles the collections were only Rs. 4 lakhs. Now it is picking up again and we hope to be able to carry on the work without any hitch.

Then with regard to the comments made by various Members on both sides of the House about television, broadcasting, magazines and cartoons that appear, I must say that, although it is part and parcel of my Ministry unfortunately the power to control those is at the moment with another Minister. Cases of publication of indecent cartoons have come to my attention, and I have brought this to the notice of the Hon. Minister of State, who has taken prompt action to see that they are not repeated in future. I would like to inform everybody in this House that I have written to the Hon. Minister of State and asked him to amend the law so that a representative of the Ministry of Cultural Affairs also sits on the various boards that come under his Ministry.

The hon. Member for Attanagalla (Mr. Lakshman Jayakody) wanted all publications about the Cultural Triangle to be published in Sinhala and Tamil as well. At the moment these are published only in English because we want to give the widest possible publicity to the Cultural Triangle in foreign countries, particularly among the member countries of the UNESCO, which number about 150, and thereby collect funds for the Cultural Triangle. We will be taking action soon to translate them into Sinhala and Tamil, and they will be on sale and can be purchased by anyone who desires to purchase them.

ගරු තියෝජ්‍ය සභාපතිතුමනි, දෙපැත්තේම සියළුම ගරු මන්ත්‍රීවරුන්ට මම ස්තුතිවන්ත වෙනවා, මගේ අමාත්‍යාංශය ගැන විවේචනයක් නොකිරීම ගැන. නමුත් වැදගත් අදහස් රාශියක් ඉදිරිපත් කළා. ඒ සියලු දෙනාම ඉදිරිපත් කළ කාරණා පිළිබඳව අවධානය යොමු කර හැකි තරම් දුරට ඒවා ක්‍රියාත්මක කරන්නට සුදනම් බවත් මා දන්වා සිටිනවා.

බද්දේගම ගරු මන්ත්‍රීතුමා (අමරසිරි දෙඩන්ගොඩ මහතා) මීට පෙරත් ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව ගැන යම් මතයක් ඉදිරිපත් කළා. එනම් එහි තිබෙන වටිනා පොත්, ලේඛන යනාදිය විනාශ වෙමින් පවතින බවයි. නමුත් එවැනි දෙයක් සිදුවෙන්නට ඉඩ තබන්නේ නැති බව මම එතුමාට කියන්න කැමතියි. ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව සඳහා දැනට අලුත් ගොඩනැගිල්ලක් ඉදි වෙමින් පවතිනවා. ලබන අවුරුද්දේදී එහි වැඩ අවසන් කර විවෘත කරන්නට අපි බලාපොරොත්තු වෙනවා. සෑම දෙයක්ම සුරක්ෂිතව තබා ගැනීමට අවශ්‍ය අංගෝපාංගවලින් ඒ අලුත් ගොඩනැගිල්ල පරිපූර්ණ වෙනවා.

ඒ වගේම සූක්ෂ්ම ඡායාරූප ගැනීම දැන් අපි ආරම්භ කර අවසාන බව මතක් කරන්න කැමතියි. දැනටමත් වර්ෂ 1878 සිට "ඔබසවර්" පත්‍ර සූක්ෂ්ම චිත්‍රපටි ගත කරනවා. ඒ වගේම විද්‍යොදය පිරිවෙතේ තිබෙන වැදගත් පුස්කොල පොත් චිත්‍රපටි ගත කිරීම දැන් දින කිපයකට පෙර ආරම්භ කළා. ඒ විටියට හැම තැනම තිබෙන, විහාරස්ථානවල තිබෙන, පුද්ගලයන් අතේ තිබෙන හැම වැදගත් දෙයක්ම සංස්කෘතියට අදාළ සියලු දෙයක්ම ඡායාරූප ගත කරන්න බලාපොරොත්තු වෙනවා. වෙද පොත්, බණ පොත්, පිරිත් පොත් ආදී සියල්ලක්ම ඒ විටියට චිත්‍රපටි ගත කර ඒවා ආරක්ෂා කරන්නට, තැන්පත් කරන්නට වැඩපිළිවෙලක් ආරම්භ කරනවා. ඒ වාගේම යම් කෙනෙකුට ඒවායේ පිටපත් අවශ්‍ය නම් ඒ පිටපත් ලබා දීමට කටයුතු කරන්නටත් අපි බලාපොරොත්තු වෙනවා. අපේ මිත්‍ර රටවලින් ආධාර ලබා ගෙන, අවශ්‍ය උපකරණ ලබා ගෙන, ඒ ආකාරයට ඒ පිටපත් ලබා දෙන්නට ක්‍රියා කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

තවත් ගරු මන්ත්‍රීවරුන් කීප දෙනෙක් ප්‍රකාශ කළා, අපේ පැරණි පුස්කොල පොත්, පරණ ඇඳුම් කට්ටල් යනාදිය විදේශිකයන් විසින් පිටරටවලට ගෙන යනවාය කියා, එනෙම නැත්නම් ඒවා එසේ ගෙන යන්නට සුදනම් කර තිබෙනවාය කියා. 1977 ට පෙර ඕනෑම කෙනෙකුට පුස්කොල පොතක් කැලිවලට කපා පිටරට ගෙනයන්න අවස්ථාවක් තිබුණා. ඒ නිසා විදේශිකයන් ඒ වාගේ දේවල් අලෙවි කරන පුද්ගලයන්ගෙන් ඒ පුස්කොල පොත් ලබා ගෙන ඒවා දෙකට කපා කැලි වශයෙන් පිටරටවලට ගෙන යාමට අවසර පත් ලබාගෙන තිබෙනවා. ඒ විටියට කැලි වශයෙන් ඒවා පිටරටවලට ගෙන ගොස් තිබෙනවා. නමුත් මා ඇමතිවරයා වශයෙන් පත් වුණාට පසුව එය සම්පූර්ණයෙන්ම නතර කළා. ඒ කැල්ලක්වත් පිටරට ගෙන යන්න දැන් අපි අවසර දෙන්නේ නැහැ. ඒ පිළිබඳව රේගුවේ නිලධාරීන් හා මගේ දෙපාර්තමේන්තුවල නිලධාරීන් සමග සාකච්ඡා කර දැන් වැඩ පිළිවෙළක් ආරම්භ කර තිබෙනවා. එම නිසා සංස්කෘතික වටිනාකම් ඇති අපේ දේවල් පිටරට ගෙන යාම වෙනදට වඩා දැන් අඩාරුයි. නමුත් යම් යම් කුමවේදීන් නවමත් ගෙන යනවා. ඒවා නැවැත්වීම සඳහා දැනට ඇති නීති සංශෝධනය කරන්නට සාකච්ඡා කර ගෙන යනවා. වැඩි කල් යන්නට පෙර එම නීති සංශෝධන ඇමති මණ්ඩලයට ඉදිරි පත් කර ඉන් පසුව මේ ගරු සභාව ඉදිරිපිට තබන්න බව කියන්න කැමතියි.

අපේ ස්වාමීන් වහන්සේලා නිතරම අහන ප්‍රශ්නයක් තමයි, මෙම සංඛ්‍යාවිකරණ පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේ කවදද යන්න. අපට නැකියාවක් තිබුණා, එය මේ අවුරුද්දේම ඉදිරිපත් කරන්නය. නමුත් කිසියම් සංශෝධනයක් කර ඇමති මණ්ඩලයට ඉදිරිපත කළ සැම අවස්ථාවකදීම අපේ ජනාධිපතිතුමා කියනවා, "මෙන්න මේ ප්‍රශ්නය ගැනත් අපේ මහා සංඝරත්නයේ ඒවාගේම බෞද්ධ ආයතනවල අදහස් දැනගෙන නැවත වරක් ඇමති මණ්ඩලයට ඉදිරිපත් කරන්න" යි කියා. ඒ අනුව අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමා අපේ නායක නිම්පාණන් වහන්සේලා සමගත් බෞද්ධ කටයුතු පිළිබඳ කොමසාරිස්තුමා සමගත් සාකච්ඡා කර, දැන් එම සංශෝධන සියල්ලක්ම ගරුතර මහා සංඝයා වහන්සේලාත් විලිගින අවසාන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඒ. එල්. බී. ගුරුල්ලේ මහතා]

බව මම ඉතා සන්තෝෂයෙන් ප්‍රකාශ කරනවා. එම නිසා වැඩි කල් යන්නට පෙර, තව සතියක්-දෙකක් ඇතුලතදී එම සංශෝධන ඇතුව සංඝාධිකරණ පනත් කෙටුම්පත ඇමති මණ්ඩලයට ඉදිරිපත් කරන්නටත් ඊට පසුව මේ ගරු සභාවට ඉදිරිපත් කරන්නටත් මම බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ ස්වාමීන් වහන්සේලා උසාවිවල කාලය ගත කිරීම කිසිසේත් සුදුසු නැති බව අප පිළිගන්නවා. ඒක සංඝ ගෞරවයට කිසිසේත් ගැලපෙන්නේ නැහැ. එම නිසා මෙම සංඝාධිකරණ පනතෙන් අපි බලාපොරොත්තු වෙන්නේ එවැනි දේවල් පවා නතර කරන්නටයි. හැබැයි මෙහිදී එකක් කියන්න ඕනෑ. ගිහියකුත් ස්වාමීන් වහන්සේ තමකත් අතර ඉඩම් ප්‍රශ්නයක් සම්බන්ධයෙන් තඩුවක් ඇති වුණොත්, එහෙමතම් ඒ තඩුව ඉදිරිපත් කරන්නට වෙනවා, සිවිල් උසාවියකට. විශේෂයෙන්ම ගිහියකුට සිවිල් උසාවියක් ඉදිරියට යන්නට මානුෂික අයිතිවාසිකමක් තිබෙනවා. නමුත් සංඝයා වහන්සේලා දෙනමක් අතර කිසියම් ආරාවුලක් ඇති වුණොත්, එසේ නැතිනම් විනය කඩ කිරීමක් ඇති වුණොත්, එවැනි අවස්ථාවලදී සංඝාධිකරණය හමුවට පමුණුවා, ඒ සම්බන්ධයෙන් විභාග කර කිසියම් තීරණයක් දෙන්න පුළුවනි.

අ. හා. 7.45

බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව ගැන සඳහන් වුණා. ඒක නව දෙපාර්තමේන්තුවක්. දැනටමත් මේ මගින් වැඩ රාශියක්ම කර තිබෙනවා. බෞද්ධ විහාර දේවාලගම් පනතට 1931 සිට මේ දක්වා සුළු සුළු සංශෝධන යන් කළා හැරෙන්නට අවශ්‍ය සංශෝධන මෙතෙක් කර නැහැ. අවශ්‍ය සංශෝධන සම්බන්ධයෙන් සාකච්ඡා කර ඇමති මණ්ඩලය එම සංශෝධන පිළිගෙන නීති සකස් කිරීම සඳහා නීතිපතිට ඉදිරිපත් කර තිබෙනවා. අපි බලාපොරොත්තු වෙනවා, ලබන මාසයේ හෝ ඊළඟ මාසයේ එම නීති පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර මන්ත්‍රීතුමන්ලාගේ සහයෝගය ඒ සඳහා ලබා ගන්නට.

තවත් වෝදනාවක් කළා යම් යම් කෘතීන් මුද්‍රණය කිරීම ගැන අපි වැඩි සැලකිල්ලක් දක්වන්නෙ නැහැ කියල. ඒක වැරදි බව මා කියන්නට කැමතියි. සැම විටම අපි ඒවා මුද්‍රණය කරන්නට උත්සාහ දරනවා. අගහිඟකම් තිබෙන ලේඛකයන්ට තමන්ගේ වටිනා ලේඛන මුද්‍රණය කරන්නට මුදල් නැති බව මට පෙණුනා. අපට රජයෙන් වෙන් කරන මුදලුත් මදි ඒවාට ආධාර කරන්නට. එම නිසා අපට—සංස්කෘතික අමාත්‍යාංශයට—මුද්‍රණාලයක් දෙන්නය කියා මා "යුනෙස්කෝ" සංවිධානයෙන් ඉල්ලීමක් කළා. ඒ මුද්‍රණාලය ලැබී තිබෙනවා. ඒ වාගේම අපි සීමාසහිත ප්‍රකාශන සමාගමකුත් ආරම්භ කර අවසානයි. මා ආයාචනයක් කරනවා සියලු දෙනාටම ඒ සමාගමේ කොටස් ගන්නය කියල. ලේඛකයන්ට කලා කරුවන්ට යහ වෙනත් අයටත් තමුන්නාන්සේලාටත් මා ආරධනා කරනවා ඒ සමාගමේ කොටස් ගන්නය කියල. එක කොටසක් රු. 100 යි. ඒ මුද්‍රණාලය අංග සම්පූර්ණ කරන්නට තවත් උපකරණ ස්වල්පයක් අවශ්‍ය වී තිබෙනවා. ඒවාටත් ආධාර ලබා ගන්නට මා බලාපොරොත්තු වෙනවා. අපට ලැබුණු මුද්‍රණාලය දැනට තිබෙන්නේ රජයේ මුද්‍රණාලයේ. ඒක දැන් එතැන ක්‍රියාත්මක වෙනවා. අපේ ප්‍රකාශන තිබෙනවා නම් ඒවාට ප්‍රමුඛත්වය දී ඒවා මුද්‍රණය කර අපට දෙනවා. අපේ මුද්‍රණ නැත්නම් රජයේ මුද්‍රණාලයේ කටයුතුවලට ඒක යොදා ගන්නවා. ඒ ආකාරයටයි දැනට ඒ පාවිච්චි වෙන්නේ. ඒ අනුව එය නඩත්තු කිරීම සඳහා අපෙන් කිසිම වියදමක් යන්නේ නැහැ. නමුත් අඩු යන්ත්‍ර ටික ලැබුණාට පසු අපි ඒ මුද්‍රණාලය ආපසු ලබාගෙන වෙනත් ස්ථානයකට ගෙන ගොස් ඒක අර දැන් පිහිටුවා තිබෙන සීමාසහිත ප්‍රකාශන සමාගමට භාර දෙන්නයි බලාපොරොත්තු වෙන්නේ.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ගැන වචනයක් මතක් කරන්නට ඕනෑ. 1977 න් පසු අපි ආරම්භ කර තිබෙනවා අදුන් කැණීම් ස්ථාන 100 ක් පමණ. ලංකාවේ අස්සන් මුල්ලක් තැර දැන් තිබෙනවා කැණීම් ස්ථාන 150 ක් පමණ. ඒ කැණීම් ස්ථාන අතුරෙන් උතුරේ සහ නැගෙනහිර කුවවේලි, තිරියාය, මුහුදු මහ වෙහෙර, මහුල් මහ වෙහෙර ආදී ස්ථාන ගැන මා විශේෂයෙන්ම මතක් කරන්නට කැමතියි. කෝවිල් බැද තිබුණු බෞද්ධ සිද්ධස්ථාන දෙකක් මා තහනම් කළා. ඒ ස්ථාන පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට භාර අරගෙන අපට පුළුවන් වුණා කැණීම් කර ඒ ස්ථාන සංරක්ෂණය කරන්නට. ඔය විධියට අපි ඒ වැඩ පිළිවෙල ගෙන යනවා.

සංස්කෘතික ත්‍රිකෝණය තව පුළුල් කරන්නය කියා ගරු මන්ත්‍රීවරු මගෙන් ඉල්ලීමක් කළා. මා එතුමන්ලාට කියන්නට යතුටුයි, ළඟදී ඇමති මණ්ඩලය ඒ සම්බන්ධව තීරණයක් ගෙන තිබෙන බව. සංස්කෘතික ත්‍රිකෝණයට පිටස්තර කොටසකුත් එකතු කර ඒ ස්ථානවලත් කැණීම් කටයුතු කර ඒ ස්ථානත් සංරක්ෂණය කරන්නට තීරණය කර තිබෙනවා. පුරා විද්‍යාත්මක වශයෙන් වටිනා තවත් නුහක් ස්ථාන අපේ රටේ තිබෙනවා. නමුත් මුදල් තත්ත්වය සතුටුදායක නැති නිසා ඒ සියලුම ස්ථාන ගැන එකවර කටයුතු කරන්නට අපට පුළුවන් තමක් නැහැ. තිලඩාරිතුත් මදි. ඒ නිසා මේ බෞද්ධ සමාගම්වලට මුදල් වැය කර තමන්ගේ කම්කරුවන් යොදා පුරා විද්‍යා දෙපාර්තමේන්තුවේ පාලනය යටතේ පුරා විද්‍යා දෙපාර්තමේන්තුවේ උපදෙස් අනුව ඒවායේ කැණීම් කටයුතු කර ගෙන යනවා.

නාට්‍ය තරග ගැන මම කියන්න කැමතියි. අපි සෑම දිස්ත්‍රික්කයකම නරග පවත්වා දිස්ත්‍රික් මට්ටමෙන් තැගි දී ඊට පසුව සමස්තයක් වශයෙන් ලංකාවේ සුදුස්සන් අතර තරග ඇති කර ත්‍යාග ප්‍රදානය කර අවසානයි. නමුත් කණගාටුවට කාරණයක් තිබෙන්නේ මගේ අමාත්‍යාංශයට සෑම අංශයක්ම හාරව තිබියදී අපට පුළුවන් වුණා දුවිඩ අංශයෙන් තරග තබා ත්‍යාග ප්‍රදානය කරන්න. දෙමළ සාහිත්‍ය කෘතිවලට දෙමළ නාට්‍යවලට තරග ඇති කර අපට පුළුවන් වුණා ත්‍යාග ප්‍රදානය කරන්න. නමුත් එවැන්නක් මෙවර සිදු වුණේ නැති එක ගැන කණගාටුයි.

කෞතුකාගාර දෙපාර්තමේන්තුව ගැන මම කියන්න කැමතියි. කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ අලුත් අධ්‍යක්ෂතුමියක් ඉන්නවා. හිටපු අධ්‍යක්ෂතුමාත් කෞතුකාගාර දෙපාර්තමේන්තුවට විශේෂ සේවයක් කර තිබෙනවා. ඒ නිසා ඒ මහතා ගැනත් මතක් කළ යුතුයි. දැනට ඒ අධ්‍යක්ෂතුමිය යටතේ අපි දැන් පාසල් කෞතුකාගාර කීපයක් ආරම්භ කර තිබෙනවා. පසුගිය අධ්‍යක්ෂතුමා සිටින කාලයේ බස් රියක් අරගෙන ජංගම කෞතුකාගාරයක් ඇති කර තිබුණා. ඉල්ලීමක් තිබෙනවා නම් ඕනෑම ප්‍රදේශයක පාසලකට ඒ ජංගම කෞතුකාගාරය යවන්න අපි ලැහැස්තියි.

පසුගිය ආණ්ඩු කාලයේදී කෞතුකාගාරය සඳහා නව ගොඩනැගිල්ලක් තැනීම ආරම්භ කර තිබුණා. ඒකෙන් තට්ටු දෙකක් නිමාවට පත් කොට ලබන අවුරුද්දේ මුල් භාගයේදී එය විවෘත කරන්න බලාපොරොත්තු වෙනවා.

ඊළඟට දහම් පාසල් ගැන කරුණු කීපයක් සඳහන් කළ යුතුයි. මම කියන්න සතුටුයි වෙනදට වඩා උනන්දුවෙන් දහම් පාසල් ක්‍රියාත්මක වන බව. ඒ වාගේම 1977 කාලයට වඩා එහි විශාල ප්‍රගතියක් ඇති වී තිබෙනවා. මා විසින් ඇමති මණ්ඩලයට ඉදිරිපත් කරන ලද සංදේශයක් අනුව, දහම් පාසල් අවසාන සහතික පත්‍රය තිබෙන සහ ධර්මාචාර්ය සහතික පත්‍රය තිබෙන අය ගුරු පත්වීම් සඳහා ඉල්ලන අවස්ථාවලදී ඒ සහතික සඳහා විශේෂ ලකුණු දී ගුරුවරුන් වශයෙන් ඒ අය බඳවා ගැනීම ප්‍රතිපත්තියක් වශයෙන් දන් පිළිගෙන තිබෙනවා. ඒ වාගේම අධ්‍යාපන ඇමතිතුමාත් මමත් සාකච්ඡා කර වැඩි කලක් යන්නට මත්තෙන් ආගමික අධ්‍යාපනයක් කොයි ආකාරයෙන් දිය යුතුද ඒ්‍යා විමසා බලා වඩා ප්‍රයෝජනවත් වන විධියේ ක්‍රියා මාර්ගයක් ගැනීමට බලාපොරොත්තු වෙනවා. බුද්ධාගම පමණක් නොවෙයි අනික් ආගම්ද පාසල්වල උගන්වන්නට බලාපොරොත්තු වන බව මම මතක් කරන්න කැමතියි.

අපේ කඹුරුපිටියේ ගරු මන්ත්‍රීතුමා (වත්දුකුමාර විජේගුණවර්ධන මහතා) මතක් කළා මාතර කොටුව සහ නුපේ වෙළඳපොළ ගැන. මාතර කොටුව ගැන කියන්න තිබෙන්නේ අපි දැන් එහි සංරක්ෂණ කටයුතු ආරම්භ කරන්නට බලාපොරොත්තු වන බවයි. නුපේ වෙළඳ පොළ සඳහා මම අවුරුදු ගණනාවක් තිස්සේ මුදල් වෙන්කළා. මෙය වටිනා ගොඩනැගිල්ලක්. එය දැනට අලුත්වැඩියා වෙමින් පවතින බව තමුන්නාන්සේලා දන්නවා. එය අවසාන වුණාට පසු මගේ බලාපොරොත්තුව තිබෙන්නේ මේ ගොඩනැගිල්ල සංස්කෘතික මධ්‍යස්ථානයක් වශයෙන් පාවිච්චි කරන්නටයි. ඒ අවට සංචාරක හෝටල් රාශියක් තිබෙන බව බද්දේගම ගරු මන්ත්‍රීතුමා (අමරසිරි දොඩම්ගොඩ මහතා) දන්නවා. මගේ බලාපොරොත්තුව, දකුණු පළාතේ, රුහුණු කලාකරුවන්ට, ඒ්‍යාගේම කැටයම්කරුවන්ට බිරළු, රේන්ද වික්‍රමණ අයට ඒ ස්ථානය දී එතැනම ඒවා සකස් කර අලෙවි කිරීමේ අවස්ථාව ලබා දෙන්නයි.

නැටුම් කලාව විකෘති කිරීම ගැන මහතුවර දිසා ඇමතිතුමා කරුණු සඳහන් කළා. ඒ සම්බන්ධයෙන් අපි දැනටමත් විශිෂ්ට ගුරු පරම්පරා හතකට අයත් නැටුම් ගුරුවරුන් යටතේ විශිෂ්ට ශ්‍රේණියේ කලායතන හතක් ආරම්භ කිරීමට වැඩ පිළිවෙල සකස් කර තිබෙන බව මම කියන්න කැමතියි. එපමණක් නොවෙයි, දිවයිනේ සෙසු ආගමික උත්සවවලටද සහයෝගය ලබා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දිමට ක්‍රියා කරනවා. දැනට ආධාර ලබන කලායතන දෙසිය තුනක් මේ ජාතික උත්සවයට සහභාගී කරගත්තත් බලාපොරොත්තු වෙනවා. අප බලාපොරොත්තු වන මේ කලායතන තැටුම් කලාව විකෘති නොකරන කලායතන පමණයි. ඒ නිසා ඒ ගැන කිසිම බයක් වෙන්න වුවමනා නැහැ. අපි ඒවා ආරක්ෂා කරනවා, ඒවාට සහයෝගය දෙනවා, ආධාරදෙනවා.

අවසාන වශයෙන්, මගේ අමාත්‍යාංශයේ කටයුතු මේ ආකාරයට කරගෙන යෑමට මට සහයෝගය දුන් ලේකම්තුමාගේ සිට අත්තිම සේවකයා දක්වා ඇති සියලුදෙනාටම මගේ ස්තුතියත් ගෞරවයත් පිරිතමන අතර ලබන වර්ෂයේදීත් මට මේ ආකාරයටම ඒ අයගේ සහයෝගය ලැබෙවායි ප්‍රාර්ථනා කරනවා.

"162 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 89,22,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

162 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන. පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"තීරුව 162, නිකුත්ත්‍යිත්තිට්ටම් 1, මීන්ටුවරුම් සෙලවුක්කාන රූපා 89,22,000 අට්ටවණෙයිර් සේර්ක්ප්පටුමාක" එන්‍රුම් විනා විටුක්ප්පට්ටු ඒර්‍රුක්කොළ්ළප්පට්ටදු.

තීරුව 162, නිකුත්ත්‍යිත්තිට්ටම් 1, මීන්වරුම් සෙලවු අට්ට වණෙයින් පකුදියාක ඉරුක්කක් කට්ටලෙයිටප්පට්ටදු.

Question, "That the sum of Rs. 8,922,000, for Head 162, Programme 1, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 162, Programme 1, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

1 වන වැඩ සටහන.—සාමාන්‍ය පරිපාලන හා කාර්ය මණ්ඩල සේවා, මූලධන වියදම්, රු. 80,00,000

නිකුත්ත්‍යිත්තිට්ටම් 1.—පොදු නිර්වාකමුම් පදවියිනර් සේවෙකළුම්—ආක්කප්පොරුට් සෙලවු, රූපා 80,00,000

Programme 1. General Administration and Staff Services Capital Expenditure Rs. 8,000,000

"162 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම් සඳහා රු. 80,00,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

162 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"තීරුව 162, නිකුත්ත්‍යිත්තිට්ටම් 1, ආක්කප්පොරුට්සෙලවුක්කාන රූපා 80,00,000 අට්ටවණෙයිර් සේර්ක්ප්පටුමාක" එන්‍රුම් විනා විටුක්ප්පට්ටු ඒර්‍රුක්කොළ්ළප්පට්ටදු.

තීරුව 162, නිකුත්ත්‍යිත්තිට්ටම් 1, ආක්කප්පොරුට් සෙලවු අට්ට වණෙයින් පකුදියාක ඉරුක්කක් කට්ටලෙයිටප්පට්ටදු.

Question, "That the sum of Rs. 8,000,000, for Head 162, Programme 1, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 162, Programme 1, Capital Expenditure, ordered to stand part of the Schedule.

163 වන ශීර්ෂය.—ජාතික කොතුකාගාර දෙපාර්තමේන්තුව

1 වන වැඩ සටහන.—කොතුකාගාර සේවා පරිපාලනය—පුනරාවර්තන වියදම්, රු. 35,93,000

තලිප්පු 163.—தேசிய நூதனசாலைகள் திணைக்களம்

නිකුත්ත්‍යිත්තිට්ටම් 1.—நூதனசாலைச் சேவைகளின் நிருவாகம்—මීන්ටුවරුම් සෙලවු, රූපා 35,93,000

HEAD 163. DEPARTMENT OF NATIONAL MUSEUMS

Programme 1. Administration of Museum Services–Recurrent Expenditure, Rs. 3,593,000

"163 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 35,93,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

163 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"තීරුව 163, නිකුත්ත්‍යිත්තිට්ටම් 1, මීන්ටුවරුම් සෙලවුක්කාන රූපා 35,93,000 අට්ටවණෙයිර් සේර්ක්ප්පටුමාක" එන්‍රුම් විනා විටුක්ප්පට්ටු ඒර්‍රුක්කොළ්ළප්පට්ටදු.

තීරුව 163, නිකුත්ත්‍යිත්තිට්ටම් 1, මීන්වරුම් සෙලවු අට්ට වණෙයින් පකුදියාක ඉරුක්කක් කට්ටලෙයිටප්පට්ටදු.

Question, "That the sum of Rs. 3,593,000, for Head 163, Programme 1, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 163, Programme 1, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

164 වන ශීර්ෂය.—පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

1 වන වැඩ සටහන.—පුරාවිද්‍යා සේවා, පුනරාවර්තන වියදම්, රු. 79,32,000

තලිප්පු 164.—தொல்பொருளியல் திணைக்களம்

නිකුත්ත්‍යිත්තිට්ටම් 1.—தொல்பொருளியற் சேவைகள்—මීන්ටුවරුම් සෙලවු, රූපා 79,32,000

HEAD 164. DEPARTMENT OF ARCHAEOLOGY

Programme 1. Archaeological Services Recurrent Expenditure, Rs. 7,932,000

"164 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 79,32,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

164 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"තීරුව 164, නිකුත්ත්‍යිත්තිට්ටම් 1, මීන්ටුවරුම් සෙලවුක්කාන රූපා 79,32,000 අට්ටවණෙයිර් සේර්ක්ප්පටුමාක" එන්‍රුම් විනා විටුක්ප්පට්ටු ඒර්‍රුක්කොළ්ළප්පට්ටදු.

තීරුව 164, නිකුත්ත්‍යිත්තිට්ටම් 1, මීන්වරුම් සෙලවු අට්ට වණෙයින් පකුදියාක ඉරුක්කක් කට්ටලෙයිටප්පට්ටදු.

Question, "That the sum of Rs. 7,932,000, for Head 164, Programme 1, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 164, Programme 1, Recurrnt Expenditure, ordered to stand part of the Schedule.

1 වන වැඩ සටහන.—පුරාවිද්‍යා සේවා, මූලධන වියදම්, රු. 1,15,23,000

නිකුත්ත්‍යිත්තිට්ටම් 1.—தொல்பொருளியற் சேவைகள் — ஆக்கப் பொருட் செலவு, රූපා 1,15,23,000

Programme 1. Archaeological Services–Capital Expenditure Rs. 11,523,000

"164 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම් සඳහා රු. 1,15,23,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

164 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, මූලධන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"තීරුව 164, නිකුත්ත්‍යිත්තිට්ටම් 1, ආක්කප්පොරුට් සෙලවුක්කාන රූපා 1,15,23,000 අට්ටවණෙයිර් සේර්ක්ප්පටුමාක" එන්‍රුම් විනා විටුක්ප්පට්ටු ඒර්‍රුක්කොළ්ළප්පට්ටදු.

තීරුව 164, නිකුත්ත්‍යිත්තිට්ටම් 1, ආක්කප්පොරුට් සෙලවු අට්ට වණෙයින් පකුදියාක ඉරුක්කක් කට්ටලෙයිටප්පට්ටදු.

Question, "That the sum of Rs. 11,523,000, for Head 164, Programme 1, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 164, Programme 1, Capital Expenditure, ordered to stand part of the Schedule.

165 වන ශීර්ෂය.—ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව

1 වන වැඩ සටහන.—ලේඛනාරක්ෂණ සේවා—පුනරාවර්තන වියදම්, රු. 25,30,000

තලිප්පු 165.—தேசிய சுவடிகள் திணைக்களம்

නිකුත්ත්‍යිත්තිට්ටම් 1.—சுவடிச் சேவைகள்—මීන්ටුවරුම් සෙලවු, රූපා 25,30,000

HEAD 165. DEPARTMENT OF NATIONAL ARCHIVES

Programme 1. Archives Services Recurrent Expenditure, Rs. 2,530,000

"165 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 25,30,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

165 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

"தலைப்பு 165, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 25,30,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 165, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 2,530,000, for Head 165, Programme 1, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 165, Programme 1, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

166 වන ශීර්ෂය.—බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව

1 වන වැඩ සටහන.—බෞද්ධාගමික කටයුතු වර්ධනය.—පුනරාවර්තන වියදම්. රු. 78,28,000

தலைப்பு 166.—பௌத்த அலுவல்கள் திணைக்களம்

நிகழ்ச்சித் திட்டம் 1.—பௌத்த சமய முயற்சிகளின் மேம்பாடு—மீண்டுவருஞ் செலவு, ரூபா 78,28,000

HEAD 166. DEPARTMENT OF BUDDHIST AFFAIRS

Programme 1. Promotion of Buddhist Religious Activities–Recurrent Expenditure, Rs. 7,828,000

"166 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම් සඳහා රු. 78,28,000 ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

166 වන ශීර්ෂයෙහි 1 වන වැඩ සටහන, පුනරාවර්තන වියදම් උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 166, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 78,28,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 166, நிகழ்ச்சித் திட்டம் 1, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 7,828,000, for Head 166, Programme 1, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 166, Programme 1, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

එකල්හි වේලාව අ. භා. 8 වූයෙන්, පාර්ලිමේන්තුවට ප්‍රගතිය වාර්තා කරනු පිණිස සභාපතිතුමා මුලාසනයෙන් ඉවත් විය.

කාරක සභාව ප්‍රගතිය වාර්තා කරයි; නැවත රැස්වීම් 1983 දෙසැම්බර් 21 වන බදාදා.

நேரம் பி. ப. 8 மணியாகிவிடவே, குழுவின் பரிசீலனை பற்றி அறிவிக்கும் பொருட்டு தலைவர் அக்கிராசனத்திலிருந்து நீங்கினார்

குழுவினது பரிசீலனை அறிவிக்கப்பட்டது; மீண்டும் கூடுவது, புதன்கிழமை 21 டிசம்பர் 1983.

It being 8 p.m., the Chairman left the Chair to report Progress.

Committee report Progress; to sit again on Wednesday, 21st, December, 1983.

පරිපූරක මුදල: ග්‍රාමාරක්ෂක යෝජනා ක්‍රමය

குறைநிரப்புத் தொகை: உள்நாட்டுக் காவற்சேவைத் திட்டம்

SUPPLEMENTARY SUPPLY: HOME GUARD SCHEME

එම්. විත්සන්ට් පෙරේරා මහතා (පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා ඇමතිතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)

(திரு. எம். வின்சன்ற் பெரேரா — பாராளுமன்ற அலுவல்கள், விளையாட்டுத்துறை அமைச்சரும் பிரதம அரசாங்கக் கொறடாவும்)

(Mr. M. Vincent Perera Minister of Parliamentary Affairs & Sports and Chief Government Whip)

On behalf of the Hon. Prime Minister and Minister of Local Government, Housing and Construction and Minister of Highways, I move,

"That a Supplementary Sum not exceeding Rupees One million and seven hundred thousand (Rs. 1,700,000) be payable out of the consolidated Funds of the Government of the Democratic Socialist Republic of Sri Lanka, or any other fund or monies of, or at the disposal of the Government of the Democratic Socialist Republic of Sri Lanka or from the proceeds of any loans obtained by the Government of the Democratic Socialist of Sri Lanka for the Service of the Financial Year beginning on 1st January, 1983 and ending on 31st December, 1983

(*a*) In settlement of the Advance No. 03 made fom the Contingencies Fund in the Financial Year 1982 ; and

(*b*) for further expenditure necessary on the service specified in the Schedule hereto :

Schedule

	Rs.
Head 38 : Minister of Defence	
Programme 1 General Administration and Management of Defence	
Rcurrent Expenditure	900,000
Capital Expenditure	800,000
	1,700,000"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Question put, and agreed to.

පරිපූරක මුදල: සෙබලියන්ට නිවාස ආදිය

குறைநிரப்புத் தொகை : பெண்கள் சிறப்பணி தங்கிட வசதி ஆதியன

SUPPLEMENTARY SUPPLY : ACCOMMODATION BLOCK FOR THE WOMEN CORPS, ETC.

එම්. විත්සන්ට් පෙරේරා මහතා

(திரு. எம். வின்சன்ற் பெரேரா)

(Mr. M. Vincent Perera)

On behalf of the Hon. Prime Minister and Minister of Local Government, Housing and Construction and Minister of Highways, I move,

"That a Supplementary Sum not exceeding Rupees Fifty four million nine hundred thousand only(Rs. 54,900,000) be payable out of the consolidated Fund of the Democratic Socialist Republic of Sri Lanka, or any other funds or monies of, or at the disposal of the Government of the D. ocratic Socialist Republic of Sri Lanka, or from the proceeds of any other loans obtained by the Government of the Democratic Socialist Republic of Sri Lanka for the Service of the Financial Year beginning on January 01, 1983 and ending on December 31, 1983 and that the said sum may be expended an specified in the Schedule hereto :

Schedule

	Rs.
Head 39 : Sri Lanka Army	
Programme 1–command and Management–	
Capital Expenditure	3,500,000
Progrmme : 2–Military Operations–	
Recurrent Expenditure	51,400,000
	54,900,000"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Question put, and agreed to.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිපූරක මුදල: භූමිතෙල් මුද්දර යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම

குறைநிரப்புத் தொகை: மண்ணெய் முத்திரைத் திட்டச் செயற்பாடு

SUPPLEMENTARY SUPPLY: OPERATION OF THE KEROSENE STAMPS SCHEME

එම්. විත්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)

On behalf of the Hon. Minister of Agricultural Development and Research and Minister of Food and Co-operatives, I move,

"That a Supplementary Sum not exceeding Rupees One hundred and thirty seven million (Rs. 137,000,000) be payable out of the Consolidated Fund of the Government of the Democratic Socialist Republic of Sri Lanka, or any other Fund or monies of, or at the disposal of the Government of the Democratic Socialist Republic of Sri Lanka or from the proceeds of any loans obtained by the Government of the Democratic Socialist Republic of Sri Lanka for the Service of the Financial Year commencing on 1st January, 1983 and ending on 31st December, 1983 and that the said sum may be expended as specified in the Schedule hereto

Schedule

	Rs.
Head 171 : Department of the Food Commissioner	
Programme 1 Implementation of the Food and Kerosene Stamps Scheme	
Rcurrent Expenditure	137,000,000"

ප්‍රශ්නය විමසන ලදින්, සහ ඇමතුම විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පරිපූරක මුදල: දුම්රිය ප්‍රවාහන සේවා

குறைநிரப்புத் தொகை: புகையிரதப் பகுதி: போக்குவரத்துச் சேவைகள்

SUPPLEMENTARY SUPPLY: RAILWAY TRANSPORTATION SERVICES

එම්. විත්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)

On behalf of the Hon. Minister of Transport and Minister for Transport Board and Minister for Private Omnibus Transport, I move,

"That a Supplementary sum not exceeding Rupees Fifty eight million one hundred thousaand eighty seven thousand and ninety one (Rs. 58,187,091) be payable out of the Consolidated Fund of the Democratic Socialist Republic of Sri Lanka, or any other fund or monies of, or at the disposal of the Government of the Democratic Socialist Republic of Sri Lanka or from the proceeds of any loans obtained by the Government of the Democratic Socialist Republic of Sri Lanka for the Service of the Financial Year beginning on January 1, 1983 and ending on December 31, 1983 and tht the said sum may be expended as specified in the Schedule hereto :

Schedule

	Rs.
Head 114 : Railway	
Programme 1–General Administration and Staff Services	30,000,000
Programme 2–Transportation Services	14,187,091
Programme 3–Boiling Stock (Purchasing over hauling and Maintenance)	14,000,000
	58,187,091"

ප්‍රශ්නය විමසන ලදින්, සහ සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කල්තැබීම

ஒத்திவைப்பு

ADJOURNMENT

එම්. විත්සන්ට් පෙරේරා මහතා
(திரு. எம். வின்சன்ற் பெரேரா)
(Mr. M. Vincent Perera)

I move,

"That the Parliament do now adjourn."

ප්‍රශ්නය විමසන ලදින්, සහ සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 8.01 ට 1983 දෙසැම්බර් 7 වන දින පාර්ලිමේන්තු සම්මතිය අනුව, 1983 දෙසැම්බර් 21 වන බදාදා පූ. භා. 10 වන තෙක් කල් තියේය.

இதன்படி பி. ப. 8.1 க்கு, பாராளுமன்றம் அதனது 1983 டிசம்பர் 7 ஆம் திகதிய நிர்மாணத்திற் கிணங்க, 1983 டிசம்பர் 21, புதன்கிழமை மு. ப. 10 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Adjourned accordingly at 8.01 p.m. until 10 a.m. on Wednesday 21st December 1983, pursuant to the Resolution of the Parliament of 17th December 1983.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සැ. යු.

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා සටහන් කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන එහි ඒවා පැහැදිලිව දක්වා එම පිටපත හැන්සාඩ් සංස්කාරක වෙත

1984 ජනවාරි 3 වන අහහරුවාද

කොඉක්මවා ලැබෙන සේ එවිය යුතුයි.

குறிப்பு

அங்கத்தவர்கள் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை அறிக்கையிற்றெளிவாகக் குறித்து பிழை திருத்தங்களைக் கொண்ட பிரதியை ஹன்சாட் பதிப்பாசிரியருக்கு

1984 ஜனவரி 3, செவ்வாய்க்கிழமைக்குப் பிற்தாமற்

கிடைக்கக்கூடியதாக அனுப்புதல் வேண்டும்.

NOTE

Corrections which Members suggest for the Final Print should be clearly marked in this Report and the *copy containing the corrections must reach* the Editor of HANSARD,

not later than

Tuesday, 3rd January 1984

Contents of Proceedings	:	**From 10.00 a.m. to 8.01 p.m. on 20.12.1983**
Final set of manuscripts received from Parliament	:	**9.25 p.m. on 21.12.1983**
Printed copies despatched	:	**22.12.1983 evening**

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 200/- කි. (අශෝධිත පිටපත් සඳහා නම් රු. 175/- කි). පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 2.50 කි. තැපැල් ගාස්තුව ශත 90 කි. කොළඹ 1, තැ. පෙ. 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබාගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම්පත් භාරගනු නොලැබේ.

சந்தா : ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 200/- (திருத்தப்படாத பிரதிகள் ரூபா 175/-) ஹன்சாட் தனிப்பிரதி ரூபா 2·50. தபாற் செலவு 90 சதம். வருடாந்த சந்தா முற்பணமாக அத்தியட்சர், அரசாங்க வெளியீட்டலுவலகம், த. பெ. இல. 500, கொழும்பு 1 என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவெம்பர் 30 ந் தேதிக்குமுன் சந்தாப் பணம் அனுப்பப்படவேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

Subscriptions : The annual subscription for Official Report of Hansard is Rs. 200/- (For uncorrected copies Rs. 175/-). A single copy of Hansard is available for Rs. 2.50. (Postage 90 cts.) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box, 500 Colombo 1. The fee should reach him on or before November 30 each year. Late applications for subscription will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org